

# සිඛවළඳ හා
# සිඛවළඳ විනිස.

# සිඛවලඳ හා සිඛවලඳවිනිස.

ශාස්ත්‍රාචාර්ය්‍ය ඩී. බී. ජයතිලක

අභිනීතිඥ මහතා

විසින්

ප්‍රස්තාවනා ගැටපදවිවරණාදියෙන්

සමන්විතකොට

සකස්කරනලදී.

මහාබොධි යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

ශ්‍රී: බු: ව: 2468

1924

# ප්‍රස්තාවනා.

උපසම්පන්න නවක භික්ෂූන් විසින් ආදියෙහිම හික්මියයුතු විනයපිටකයට ඇතුළත් ප්‍රධාන ශික්ෂාවන් සංග්‍රහකොට කරනලද සිඛවළඳ හා සිඛවළඳවිනිස යන මේ පොත් දෙකම එක ආචාර්‍ය්‍යකෙනකුන්ගේ කෘතිබැව් සිඛවළඳවිනිස අවසාන පාඨයෙහි කියනලදී. මූල්සිඛ හෙවත් මූලසික්ඛා නම් පාලි පොතද ඒ කර්තෘවරයන් විසින්ම සංගෘහිත බැවද ඒ පාඨයෙන්ම පැනේ. මේ පොත් කළ ආචාර්‍ය්‍යවරයෝ කවරහුද කවර කාලෙක කොතැන්හි විසූවෝද යන ප්‍රශ්න විසඳීමට උපකාරී වන කිසිම ප්‍රවෘත්තියක් මේ පුස්තකත්‍රයෙහි හෝ ග්‍රන්ථාන්තරයෙහි හෝ නොදක්නා ලැබේ. එහෙයින් මේ පොත් කරනලද කාලය වර්‍ෂ වශයෙන් නියම කළ නොහැකියි. එසේද වුවත් ඇතැම් ඓතිහාසාගත කරුණු හා මේ පොත්වල භාෂා රීතියත් තැන සලකා බැලීමෙන් ග්‍රන්ථ නිර්‍මාණ කාලය ශතවර්‍ෂ වශයෙන් නිශ්චය කරගැන්ම බැරිනොවේ. ශ්‍රී බුද්ධ වර්‍ෂ* 1696 වන්නෙහි ලඞ්කාරාජ්‍යපදප්‍රාප්ත මහා පරාක්‍රමබාහු මහරජාණන් දවස දිඹුලාගල කාශ්‍යප මහාස්වාමීන් ප්‍රමුඛ මහාසංඝයාවහන්සේ විසින් කරන ලදුව පොළොන්නරුවේ ගල්වෙහෙර ශෛලමය භිත්තිපාර්ශ්වයෙහි කොටවන ලද කතිකාවතෙහි† ගණදෙටු තෙරවරුන් විසින් ස්වකීය අන්තෙවාසික සද්ධිවිහාරිකයන් අතුරෙහි ග්‍රන්ථධුරයෙහි යෙදෙන්නවුන් ලවා "යැටත් පිරිසෙයින් විනයෙන් ඛුදුසිඛ හා පාමොක්ද සුතතින් දසධම් සූත්‍රය හා අනුමාන සූත්‍රයද වනපොත්" කරවිය යුතු බවත් "ග්‍රන්ථධුරයෙන් වැඩියක් කොටගත නොහෙන අන්තෙවාසික සද්ධිවිහාරිකයන් ලවා මූල්සිඛ සෙඛියා වනපොත් කරවා සිඛවළඳවිනිස අස්වා සම්සින් සමස ආඥානනකොටැ සමනා විචාළ තැනක් කියන්ට පොහොසත්" කරවියයුතු බවත් ව්‍යවස්ථාකරන ලදී. මූල්සිඛ, සිඛවළඳ, සිඛවළඳවිනිස යන පොත් තුනම මහාපරාක්‍රමබාහු මහරජාණන්ගේ කාලයට පූර්‍වයෙහි කරනලද බව මේ කතිකාවත් පාඨයෙන් ස්ඵුටවේ. ශ්‍රී බුද්ධ වර්‍ෂ 1490 පමණෙහිදී සිංහාසනාරූඪවූ සතරවැනි මිහිඳු මහරජතුමන් විසින් මිහින්තලේ මහා

---

* මේ ලිපියෙහි වර්‍ෂ යෙදීම නිකාය සම්ප්‍රදායට අනුව කරනලදී.

† කතිකාවත් සඟරාවෙහි 1-5 පිටු බලනු.

විහාරය සම්බන්ධ ව්‍යවස්ථා ඇතුළත්කොට ඒ විහාරභූමියෙහි
පිහිටුවන ලද මාහැඟි ශිලාලිපියෙහි* "සිඛකරණිහි කිලු
සෙයින් සිවුර් හැඳෑ පෙරෙවැ" යනාදී පාඨයක් පැනේ. මේ
කියනලද සිඛකරණීය සිඛවළඳවිනිස 77 වෙනි පිටේ "සිඛකරණී
නම් කවරයත්? සැබෙවින් කියනෙම්" යනුවෙන් ආරම්භකොට
83 වැනි පිටේ "සිඛකරණී නිමි" යන්නෙන් අවසන්කළ විත
යෙහි "සෙඛියා" නමින් දක්වනලද පන්සැත්තෑවක් පමණවූ
ශික්ෂාපදයන් පිළිබඳ අර්ථවර්ණනාවම බැව් නිසැකයි. එබැවින් සිඛ
වළඳ විනිස හා ඊට මූල් පොත්වූ සිඛවළඳත් මිහිඳු රජහුගේ
කාලයට පෙර සම්පාදිත බැව් පිළිගත යුතුයි. "අටුවාපාඨ උදෙස්
බලා" මේ පොත් කළ බැව් කතෘවරයන් විසින්ම කියන
ලද හෙයින්ද සිඛවළඳ හා සිඛවළඳවිනිසයෙහි සමන්තපාසා
දිකා විනය අටුවාවෙන් උපුටාගත් පාඨ සඳැහීන හෙයින්ද මේ
ග්‍රන්ථය ශ්‍රී බුද්ධ වර්ෂ 953 පමණෙහිදී රාජ්‍යශ්‍රීපදප්‍රාප්ත ශ්‍රී නිවාස
මහානාම රජු දවස බුද්ධඝෝෂ ආචාරීන් වහන්සේ විසින් සිංහල
අර්ථකථා පාලිභාෂාවට නැගූ කාලයට පසුව ලියනලද බැව් නිශ්
චිතවේ. මේ සීමාවය අතර—එනම් මහානාම රජු දවස පටන්
සතරවැනි මිහිඳු රජහුගේ රාජ්‍යාදය දක්වා මෙදුතුරෙහි—
කාලපරිමාණය පන්සිය හවුරුද්දෙක් පමණ වේ. මේ දීර්ඝකාල
පරිච්ඡෙදයෙහි කොයි කොටසට මේ පොත් ඇතුළත්දැයි මීළඟව
පරීක්ෂා කටයුතුයි. යථොක්ත පංචශතසංවත්සරය තුළද ඊට පූර්
වෙහිද සිංහල භාෂාවේ පැවැත්ම ගැන සලකා බැලීම මේ විමං
සනයේදී ආවශ්‍යකමැයි. එසේද වුවත් එබඳු පරීක්ෂණයකට වුව
මනා කරුණු සුලභ නොවන බැව් කියයුතුයි. සිංහල රාජ්‍යයේ
ආදි කර්තෘවූ විජයකුමාරයා සහ පිරිස ලක්දිවට පැමිණි කාල
යෙහි ඔවුන් කථාකළ භාෂාවෙන් ලියනලද වචන මාත්‍රයක්වත්
මෙකල අවිද්‍යමාන හෙයින් ඒ භාෂාව කුමක්දැයි නිශ්චය කර
ගැන්ම උගහටයි. එතකුදුවුවත් ඒ මූල් සිංහල භාෂාව මාගධ
කොශලාදී දෙශවල එකල පැවැතුණු ප්‍රාකෘත භාෂා සඞ්ඛ්‍යාවට
ඇතුළත් බැව් සිතිය හැකියි.

විජයරජහු පටන් අවුරුදු දෙසියගණනක් ගියතැන රජ
පැමිණි දෙවානංපිය තිස්ස රජතුමාගේ කාලයේදී සම්බුද්ධශාස
නය ලක්දිව පිහිටුවනලදි. ඒ සඳහා මගධදෙශයෙන් වැඩි මිහිඳු
මාහිමියන්වහන්සේ මෙහි පැමිණි දවස්හිම සිංහල භාෂාවෙන්

* කාතිකාවත්සඟරාවෙහි 35-42 පිටු බලනු.

ධර්මදෙශනාකළ බව මහාවංශාදි ඉතිහාස ග්‍රන්ථයන්හි ප්‍රකාශිතයි. තවද උන්වහන්සේ විසින් අට්ඨකථා සිංහල භාෂාවට පෙරළනලදි. මේ ආදී කරුණු ගැන සලකා බලනවිට ලඞ්කාශාසන ප්‍රතිෂ්ඨාපක මහතෙරුන්වහන්සේලාගේ ජන්මභාෂාවත් එකල පැවැති සිංහල භාෂාවත් අතර යම්කිසි සමානත්වයක් සම්බන්ධත්වයක් තිබුණු බැව් වැටහේ. මහානාමරජු දවස බුද්ධඝොෂ මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් අටුවා පාලිභාෂාවට නැඟූ පසු මිහිඳු මාහිමියන් විසින් කරනලද සිංහල අට්ඨකථා ක්‍රමයෙන් අභාවිතව ගොස් පොළොන්නරු කාලයෙන් පසු සම්පූර්ණයෙන් නෂ්ටප්‍රාප්තවිය. එසේහෙයින් ලක්දිව සසුන් පිහිටුවූ කාලයෙහි පැවැති සිංහලභාෂාවේ ස්වභාවයද නිශ්චයවශයෙන් දැනගැන්මට මාර්ගයක් නොමැතියි. එසේද වුවත් එකල මගධ දෙශයෙහිද අවට ප්‍රදෙශවලද ව්‍යවහාරවූ භාෂාවේ තත්වය දැනගන්නට පිළිවන්ව තිබේ. මිහිඳු මාහිමියන්ගේ පියාණන්වන ධර්මාශොක මහාරාජොත්තමයාණන් විසින් දඹදිව නොයෙක් තන්හි පිහිටුවනලද ශිලාලෙඛන මේ අවබොධයට ඉවහල්වේ. මේ ශිලාලිපිවල* ආධාරයෙන් ශාසනප්‍රතිෂ්ඨාපන කාලයෙහි සිංහල දෙශවාසීන් කථාකළ භාෂාව කෙබඳුදැයි අනුමානවශයෙන් සලකාගතහැකියි.

---

* මේ අශොක ශිලාලිපිවල ස්වභාවය හඳුන්වනු පිණිස එයින් දෙකක් මෙහි පහත දක්වමු. ධර්මාශොක මහරජතුමන් විසින් මාගධ සංඝයාවෙත යවනලද සන්දෙශයක් ඇතුළත් ලිපිය මෙසේයි:—

"පියදසි ලාජා මාගධං සංඝං අභිවාදෙතූනං ආහා අපාබාධතංච ඵාසුවිහාලතංචා. විදිතෙ වෙ භංතෙ ආවතකෙ හමා බුධසි ධංමසි සංඝසීති ගාලවෙච පසාදෙච. එ කෙචි භංතෙ භගවතා බුධෙන භාසිතෙ සවෙ සෙ සුභාසිතෙ වා, එ චු ඛො භංතෙ හමියා යෙ දිසෙයා හෙවං සධංමෙ චිලඨිතිකෙ හොසතීති අලහාමි හකං තං වතවෙ. ඉමානි භංතෙ ධංමපලියායානි විනයසමුකසෙ අලියවසානි අනාගතභයානි මුනිගාථා මොනෙයසූතෙ උපතිසපසිනෙ එ චා ලාඝුලොවාදෙ මුසාවාදං අධිගිච්‍ය භගවතා බුධෙන භාසිතෙ. එතානි භංතෙ ධංමපලියායානි ඉච්ඡාමි කිංති (?) බහුකෙ භිඛුපායෙ චා භිඛුනියෙ චා අභිඛිනං සුනයු චා උපධාලෙයෙයු චා හෙවං මෙවා උපාසකා චා උපාසිකා චා එතෙනි භංතෙ ඉමං ලිඛාපයාමි අභිහෙතං ම ජානංතූති."

මහාබොධිසත්වයන්වහන්සේ මව්කුසින් බිහිවූ ලුම්බිනී වනය දක්නට ගොස් පසුව ඒ ශුද්ධභූමියෙහි ධර්මාශොක මහරජතුමන් විසින් පිහිටුවනලද ශිලාස්තම්භයෙහි කොටවනලද ලිපිය මෙසේයි:—

"දෙවාන ංපියෙන පියදසින ලාජින වීසතිවසාභිසිතෙන අතන ආගාච මහීයිතෙ හිද බුධෙ ජාතෙ සක්‍යමුනීති සිලාවිගඩභීචා කාලාපිතා සිලාථභෙ ච උසපාපිතෙ හිද භගවං ජාතෙති ලුංමිනිගාමෙ උබලිකෙ කටෙ අඨභාගියෙ ච."

දඹදිව මෙන්ම ලඞකාවේද දක්නට ලැබෙන ඉතා විරතාතන ලිපි නම් ශිලාලෙඛනයි. මේ ශිලාලෙඛන අතුරෙනුත් ගල්ලැන්වල කොටවන ලද ලිපි වඩාම පැරණි බැව් පිළිගත හැකියි. සසුන් පිහිටුවීමෙන් පසු තවාරම් කොටා සාංඝිකකොට පූජ කිරීම මේ රටෙහිද ක්‍රමයෙන් පුරුදුවූ බැව් හැඟේ. එසේ පූද කරනලද ගල්ලැන්වල දායකයන්ගේ නාම් කොටවා තැබීමද බහුලව පැවැති සිරිතකි. මෙයින් වැඩිකොටසක් ඉතිහාසාරූඪ නොවූ අප්‍රසිඬ පුද්ගලයන්ගේ නම්වේ. කීපයක පමණක් රජුන්ගේ නම් සඳහන්ව තිබේ. මේ ප්‍රසිඬ නාම්වල අනුසාරයෙන් ඒ ලිපිවල කාලය නිශවය කරගතහැකියි. මේ 'ගුහා" ලිපි ආදි පැරණි ශිලාලෙඛනවල අකුරු දඹදිව බ්‍රාහ්මී ලිපි හෙවත් අශොකාක්‍ෂර යන නාමයෙන් ප්‍රසිඬ අක්‍ෂර වර්ගයට අයත්ව තිබීමත් මේ විනිශවයට ආධාරයකි. ගල්ලැන්මලද පිහිටි ගල්වලද පසු කාලයෙහි නිර්මිත ගල්පුවරු හා ගල්කණුවලද කොටවන ලද මේ ශිලාලෙඛන පරීක්‍ෂාකර බැලීමෙන් සිංහල භාෂාව පිළිබඳව කාලාන්තරයෙන් ඇතිවූ විපර්‍යාසයන් සංවර්ධනයන් තරමක් දුරට අවබොධ කරගත හැකියි. ඒ සම්බන්ධ විස්තරයක් මේ ප්‍රස්තාවේදී ලිවීම ප්‍රපඤ්චහෙයින් අප ආරම්භකළ විමංසනයට වුවමනා කරුණු ස්වල්පයක් පමණක් මෙහි දක්වනු ලැබේ.

ඉතා පැරණියයි සලකනු ලබන සිංහල ශිලාලිපි* කීපයක් මෙසේයි:—

(1) දෙවන පිය මහරජහ ගමිණිතිසහ පුත දෙවන පිය තිස අ[බය]හ ලෙණෙ අගත අනගත චතුදිස සගස දි[නෙ].

(2) දමරකිත තෙර(ස) අගත අනගත චතුදිස සගස අනිකට සොණ පිතහ බරිය උපසික තිසය ලෙණෙ

(3) මහමත බමදත පුත පුරුමක බහිකෙ පුරුමක පුස ගුතෙ පුරුමක මිතෙ පුරුමක තිසෙ එතෙහි තරිතෙ අරිට මහ ගම.

(4) මහරජහ වහබයහ මණුමරක තිසමහරජහ පුති මහරජී ගමිණී අබෙය උපල විබජකහි වඩමනක වවි පවසගහි කනකවණ දරිය කණවය තුබරබ බුකසගහවය චතිරි පවෙති පරි[බුජ නක කොටු දිනි].

---

* ආචාර්‍ය වික්‍රමසිංහ මහතා විසින් සම්පාදිත "සිංහල දෙශීය ශිලාලිපි" (Epigraphia Zeylanica) නම් පොත්කලාපවලින් උපුටාගන්නාලදී.

(5) නාකමහරජහ පුත මළුතිස මහරජ් තිලරජිය ගමිණි තිස[වවි කා]රවය දක පතියව බොජිය පතියව තරකඩය අබය ගිරි මහවිහරහි මහ මහපකාවටන (උවත)හ කොටු දිනි. නක මහරජහ පුත මළුතිස මහරජි වතරහි(ණි)කිල අස (වක) අසන හල කරවය ජිණ පටිසනිරිය කරණක කොටු මහලෙ කෙත කගි දෙළස කරිහිව............යහි දෙළස කරිහිව දෙපතිව උත කුබුර කර කඩය (දිනි.)

පළමුවැනි ශිලාලිපියෙහි සඳහන්වන 'ගමිණිතිස' යන්නෙන් සද්ධාතිස්ස මහරජතුමාත් 'තිස අබය' යන්නෙන් ඒ රජහුගේ පුත්‍රවූ ලඤ්ජතිස්ස රජතුමාත් දක්වනලද බැව් ආචාර්ය වික්‍රමසිංහ මහතාගේ කල්පනාවයි. මහාවංශාදි ඉතිහාස පොත්වල මේ රජුන්ගේ නම් මීට වෙනස්ව පැනෙන නමුත් මේ කල්පනාව නිවරදයයි පිළිගත යුතුබැව් හැගේ. එසේ ගත් කල මේ ශිලාලිපිය ශ්‍රී බුඩ වර්ෂ 405 වන්න පමණේදී—සසුන් පිහිටුවීමෙන් අවුරුදු 160 කට පසුව—කොටවන ලද්දක් විය යුතුයි. දෙවැනි තුන්වැනි ලිපිවල කාලය නිසැකව නිශ්චය කළ නොහැකි වුවත් පළමුවැන්නට සමීපකාලයේදී වියයුතුයි. තුන්වැන්න වඩා පැරණියයි සිතන්ට කරුණු තිබේ. සතරවැනි ලිපිය වසභරජහුගේ මුණුබුරුවූද වංකනාසික තිස්ස රජහුගේ පුත්‍රවූද ඉතිහාසයෙහි ගජබාහු නාමයෙන් ප්‍රසිඩවූ ගාමණී අභය මහරජහු විසින් කරවා සංඝයාට පූදකරනලද වැවක් සම්බන්ධව ශ්‍රී බුඩවර්ෂ 660 සහ 676 ට අතර කාලයෙහි කොටවන ලද්දකි. පස්වැනි පාඨය ශ්‍රී බුඩවර්ෂ 712 පමණේදී රජපැමිණි මළුතිස් හෙවත් කනිඨතිස්ස රජහුගේ ශිලාලිපියක අවසන් කොටසයි. මීළඟ ශතවර්ෂයක් පමණ කාලයට අයත් ශිලාලෙඛන දක්නට ලැබෙන්නේ විරලවශයෙනි. මේතාක් පළවී තිබෙන සංඛ්‍යාවද ඉතා සවල්පයි. එයිනුත් වැඩිකොටස අසම්පූර්ණයි. එබැවින් යථොක්ත ශත සංවතසර කීපයතුළ සිංහල භාෂාව සංවර්ධනය වූ පරිදි අවසථාවශයෙන් අවබොධකරගැන්ම පහසුනොවේ. බුඩවර්ෂයෙන් පසළොස්වන ශතසංවතසරයාගේ ආරම්භයෙහි පටන් ශිලාලෙඛන පිහිටුවීම නැවතත් බහුලව ඇතිවූබැව් පැනේ. මුගසින්සෙන් මහරජහුපටන් සතරවැනි මිහිඳු රජහුගේ රාජ්‍යාවසානය දක්වා හවුරුදු එකසිය පනසක් පමණවූ කාලය සිංහල ශිලාලිපි සම්බන්ධ විශිෂට සමය ලෙස සැලකිය හැකියි. ඒ කාලයට අයත් ශිලාලිපියක කොටසක් නිදර්ශන වශයෙන් මෙහි බහාලමු:—

"මගුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසිතසිතෙන් රුපු වරණන් ඇඩි මඳ සිඳෑ සී පැරුක්මෙන් වැජැඹැ අතත් අපිරිසෙය් සොමි නිමල ගුණ වතුරෙන් ජිගල් සතහය් සසුන් අරිහු ලක්දිව් පොළොව් මෙහෙසන පරපුරෙන් හිමි මපුරුම් බුද්දස් සිරි සඟ්බොය් අබහය් මහරජ්හට් ජ සඟ්බඩය් අප බිසෙව් රැජ්නැණියන් කුස්හි හෙවැ දුනු සැණැහි මෙ යුවරජ් බිසෙව් සිරි පැමැණැ යස තෙජ් හිර් සනද්නෙන් ලොව පහයය් සිය වික්මෙන් සතුරන් මැඩැ පළ නිමල කිත් වතුරෙන් ලො වත් පතුල් දෙබිසෙවැ ජ සලමෙය්වන් අබහය් මහරජ්යුනාර් මිරිසිවිටි සඟ්සෙන්අරම් කසුබ්රජ් මහවෙහෙර් කරය් අරී පන් සීයන් වසවය් සුලබ් සතර් පසයෙන් පුජය් සසුන් කොත් හුමය් ඇතිනකරු මගුල් මහවෙයැ දකුණ් දෙර් අසන්හි රජ්වෙද්හල් කරය් රෙව් බීය සමය් පොදෙනවුලු පුලුඩාවුලුයෙන් කෙත් කම් සුලබ් කොට් සිරි ලක් ලොනුර්වය් සාබිය තිවය් රව් සො යය් සැත් බිය තෙරු නන් ජැයින් නන්සෙසි බුද් බනද් කරය් සියල් ඉසිරුයෙන් පුජය් ද සැණෙන් බුද්රුවන් අරියය් ධමු රුවන් කවරිසෙයෙකින් පුජනෙමි හො යන අදහස් පුරය් අභි ධම් දෙසුන් කසුන් පත් අරවය් මහ පුජැ කොට් සසුන් සිව් වම් යන සිත් දෙල්නෙන් ඇජර පය හමුයෙහි එ මෙ ධම් දෙසුන් වියක්හන් කළ සිය බස්නෙන් බුද් ගුණ වැනූ රිව් අන්වයෙන් බට් සැහැකුල කොත් ඔකා රජ්කුලට් තලාටික් අප පුරුමුවො තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි අබහය් ගිරි වෙහෙරු කපාරමුලට් සලමෙය්වන් පවු කරය් සඟුන් වසවය් සතර පස සුලබ්කොට් මෙම නකය් අබදි අවසට් මෙ සිරිත් තැබැවූහු."

මේ ශිලාලෙඛනයේ භාෂාවත් යට දක්වූ පැරණි ශිලාලිපිවල භාෂාවත් සමතර බැලූවිට හවුරුදු සත්අටසියයක් ඇතුළත සිංහල භාෂාව සම්බන්ධව ඇතිවූ වෙනස සලකාගතහැකියි. මේ විපර්‍යාසය විශාල වූවත් මෙය අමුතුභාෂාවක් නොව තථා ව්‍යවහාරයෙහි පැවැතීමෙන් කාලාන්තරයෙන් වෙනස් බවට පැමිණුණු ඒ චිරන්තන ලිපිවල පැනෙන මුල් සිංහල භාෂාවම බැව් ද ප්‍රත්‍යක්ෂවියයුතුයි. ද්‍රාවිඩාදී අන්‍ය භාෂාවලට අයත් ශබ්ද හා ව්‍යාකරණ විධි ආදිය පවා මෙ කාලය තුළත් ඊට පසුවත් සිංහල භාෂාවට ඇතුල්වුවත් එහි මූලාධාරය ප්‍රාකෘතභාෂා විශෙෂයක්ම බව නිශ්චය කරගැන්මට මේ ශිලාලිපි පිළිබඳ පරීක්ෂණය තරමක් දුරටවත් උපකාරීවේයයි හඟිමු.

අනතිමව නිදර්ශිතවූ ශිලාලේඛන පාඨයෙහි සඳහන්වන "දෙබිසෙවැ ජා සලමෙය්වන් අබහය්" රජතුමා නම් ශ්‍රී බුද්ධවර්ෂ 1445 වන්නෙහිදී ලංකා රාජ්‍ය ශ්‍රී සද ප්‍රාප්ත පස්වැනි කාශ්‍යප මහරජාණෝයි*. ඒ රජහුගේ පියාණෝ නම් "බුදුදස් සිරිසඟ්බෝය් අබහය්" යන විරුද නාමයෙන් ශිලාලේඛනයෙහි නිදර්ශිතවූ මුගසින් සෙන් මහරජ්ජුරුවෝයි. මවු "සඟ්බඩය්" හෙවත් සංඝා නම් බිසෝ රැජිනියයි. මෝ තොමෝ දෙවරක් අභිෂේකලත් හෙයින් "දෙබිසෙවු" යි නම් ලද්දීය. ඒහෙයින් ඈයගේ පුත්‍රවූ කසුප් මහරජ ශිලාලේඛනයෙහි "දෙබිසෙවැජා" යන්නෙන්ද මහාවංශයෙහි "උභයාභිසෙකා සංජාතො" යන්නෙන්ද වෙසෙසා දක්වනලදී. එබැවින් දම්පියා අටුවා ගැටපදය අවසානයෙහි පැනෙන "දෙබිසෙවැජා අභාසලමෙවන් මහරජහු දහම් පියා අටුවාවට කළ සන්‍නයයි" යන කර්තෘ සන්දර්ශිත පාඨයෙන් දක්වන ලද්දේත් මේ පස්වැනි කාශ්‍යප මහරජතුමාම බැව් නිශ්චිතයේ. දම්පියා අටුවා ගැටපදයත් සිඛවලඳ හා සිඛවලඳවිනිසත් භාෂාවෙන් බොහෝසෙයින්ම සමානබැව් මේ පොත් කියවන කාටත් වැටහේමැයි. එහෙයින් මේ පුස්තකත්‍රය සමකාලීනබැව් පිළිගත යුතුයි. සියුම්ලෙස පරීක්ෂාකර බැලූකල දම්පියා අටුවා ගැටපදයේ භාෂාව මඳක් වෘද්ධතරබැව් හැඟෙතතමුත් ඊට හේතුව පොත් කරනලද කාලය පිළිබඳ වෙනස නොව සමකාලීන ග්‍රන්ථකර්තෘන්ගේ වුවත් භාෂාරීතියෙහි ඇතිවන විශේෂය වියහැකියි. ඒ කෙසේ වුවත් පස්වැනි කාශ්‍යප මහරජහු පටන් සතරවැනි මිහිඳුරජහු දක්වා ගතවූ අර්ධශතසංවත්සරයතුළ සිඛවලඳහා සිඛවලඳවිනිසද මුල්සිඛද කරනලදූයි නිශ්චය කරගැන්ම යුක්තියුක්තයයි හඟිමු.

මෙසේ හවුරුදු දහසකට පමණ පූර්වයෙහි සම්පාදිතවූ මේ ග්‍රන්ථය ඒ කාලයෙහිත් ඉන් මොබ්බෙහිත් ශාසනපාලක මහා ස්ථවිරවරයන් විසින් භික්ෂූන්ගේ හික්මීම සඳහා ගරුකොට සැලකූබව යටදැක්වූ මිහින්තලේ ශිලාලේඛන පාඨයෙන් හා මහා පරාක්‍රමබාහු කතිකාවතින්ද ස්ඵුටවේ. සිඛවලඳවිනිස පාලිභාෂාවට නඟා කරනලද සික්ඛාපදවලඤ්ජනය දඹදෙණිකාලයෙහි විසූ මහාපණ්ඩිතයෙක්වූ පචමූල පරිවේණාධිපති තෙරුන්වහන්සේගේ කෘතියයැයි සමහරු කල්පනා කෙරෙති. අපට දක්නට ලැබුණු සික්ඛාපදවලඤ්ජන පුස්කොළපොත්වල හෝ අන්‍ය පොතපතක හෝ කර්තෘවරයාගේ නාමය සඳහන්ව නැති හෙයින් මේ

* මේ රජුන් පිළිබඳ ප්‍රවෘත්ති මහාවංශයෙහි 50-52 වැනි පරිච්ඡේදවල ප්‍රකාශිතයි.

මතය ජනශ්‍රැතිමාත්‍රයක් බැව් හැඟේ. ඒ කෙසේ වෙතත් මේ පාලි පොත සම්පාදනය කරනලද්දේ ශාස්ත්‍රාගමධාරී පණ්ඩිතොත්තම කෙනකුන් විසින් බව නොඅනුමානයි. ත්‍රිපිටකධාරී මහා පණ්ඩිතරත්නයන්ගෙන් බැබළුණාවූ ජයවර්ධන කෝට්ටේ රාජධානි කාලයෙහිද ලඞ්කාවේ ප්‍රසිද්ධ පිරිවෙන්වල විනයධර්මාවබෝධය සඳහා භික්ෂූන් විසින් මේ පොත් පරිශීලනය කළ බැව් මහරතන සංඝරාජ මාහිමියන්ගේ ආධිපත්‍යයෙන් පැවැතුණු කැරගල පද්මවතී පිරිවෙන සම්බන්ධ වර්ණනාවෙහි පැනෙන

“මෙත් ස ත කිරඹ පිරිසුදු කැරැ සිල් ගු ණ ය
ඉ න් සැ ත නොවී සාරනුව සසර කර ණ ය
න න් සි ත පද නිබඳ රකිනා ලෙස ය ණ ය
*මූ න් සි ත සිකවලඳ විමසන සඟ ය ණ ය”

යන හංස සන්දේශ කාවෙන් ප්‍රකාශිතයි.

දීර්ඝකාලයක් මෙසේ ගරුසම්භාවනීයව පැවැතුණු මේ පොත් ප්‍රතිකාල්මරුන්ගේ ලක්දිවට පැමිණීමෙන් පසු ඇතිවූ ශාස්ත්‍ර පරිහානිය හේතුකොටගෙන ක්‍රමයෙන් අභාවිතප්‍රාය බවට පැමිණීයෙන් මෙකල උගත් බොහෝදෙනාට පවා නාම මාත්‍රවී තිබේ. පැරණි පුස්කොළපොත් ඉතා දුර්ලභයි. ලැබෙනතාක් පොත්ද ලිපිදොසින් ආකුල ව්‍යාකුලව තිබේ. මෙකල විනය ශික්ෂාවන් පාලි ග්‍රන්ථවලින් ඉගෙනගැන්ම වඩා පහසුවුවත් සිඛවලඳ හා සිඛවලඳවිනිස පමණ පෙර සිංහල භාෂාව පැවැති තත්වය අවබෝධකරගැන්මට උපකාරීවන පොත් නොමැතියි. එසේ හෙයින් මේ පුස්තකවය පළකිරීම කාලානුරූප ශාස්ත්‍ර සංග්‍රහයක් වියහැකි බැව් සැලකූ අපි මීට අවුරුදු කීපයකට ප්‍රථම එංගලන්තයේ නැවැතීසිටි කාලයේදී ලන්ඩන් නුවර බ්‍රිතාන්‍ය මහා කෞතුකාගාරයට අයත් විශාල පුස්තකාලයෙහි තුබූ පුස්කොළ පොත් සතරක් සමවලෝකනය කොට සුපරීක්ෂාවෙන් පිටපතක් ලියාගෙන අවුත් මෙහිදී සපයාගත් තවත් පොත් දෙකක ආධාරයෙන් එය යථාශක්තීන් සංශෝධනයකොට අප විසින්ම සම්පාදිතවූ ග්‍රන්ථපදවිවරණයකුත් සමඟ මෙසේ පළකරවීමු. ශාස්ත්‍රාගම නොකුසල ලේඛකයන් විසින් බහාලනලද අපශබ්දයෙන් දූෂිතව ශතවර්ෂ ගණනක් අභාවිතව යටපත්ව තුබූ මෙබඳු චිරන්තන ග්‍රන්ථයක් එනැවරම යථාස්ථානයට පැමිණවීම අති

* මූල්සික.

දුෂ්කරබැව් කාටත් ප්‍රත්‍යක්ෂවියයුතුයි. හැකිපමණ පිරිසුදුවූ පොතක් මහාජනයා අතට පැමිණවීමට අපේ බලවත් උත්සාහය වුවත් ඒ ප්‍රයත්නය මේවතාවේ සම්පූර්ණයෙන්ම සඵලවීයැයි කියනොහැකියි. මෙහි ඇතැම් තැන් තවත් සැකසහිතයි. එබඳු සංශයස්ථාන පිළිබඳව ශාස්ත්‍රඥයන්ගේ මත ප්‍රකාශවීම මේ පොත් ඉගෙනීමෙහි යෙදෙන්නන්ට කරන සංග්‍රහයක් වේමැයි.

පොත මුද්‍රිතවූ පසු අපට ලැබුණු රිදීවිහාරයට අයත් පැරණි පුස්කොළපොත හා මහනුවර ප්‍රාචීන පුස්තකාලයෙහි තුබූ පොතක්ද ශුද්ධිපත්‍රය තැනීමේදී ඉතා ප්‍රයෝජනවත්වූ බව කියමු.

සිඛවළඳහා සිඛවළඳවිනිස පොත් දෙකට පුරාණ ගැටපද දෙකක් තිබේ. මේ ගැටපදවල පැනෙන ඇතැම් අර්ථවර්ණනා අපේ ග්‍රන්ථපදවිවරණයට ඇතුළත් කෙළෙමු. එසේ උපුටාගත් පාඨ " " මේ ලකුණින් වෙන්කොට දැක්වීමු.

මේ ග්‍රන්ථපදවිවරණය සම්පාදනය කිරීමේදී විද්‍යාලංකාර පරිවෙණාධිපති අතිගෞරවාර්හ ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන නායක ස්ථවිරපාදයන් වහන්සේ වෙතින් ඇතැම් පාඨ පිළිබඳව සංශය නිරාකරණවශයෙන් ආධාර ලබාගත්බව ස්තුති පුරස්සරව සඳහන් කරමු.

තොබෝද කාලුරියකළු බටුවිට ඩී. ජී. අභයගුණරත්න පණ්ඩිත මහතාගෙන් මේ සංශෝධන කාර්යය සඳහා අපට ලැබුණු ආධාරයද මෙහිදී සිහිපත්කිරීම අපේ යුතුකමකි. උගත් ගුණවත් මේ මහතාගේ මරණයෙන් සිංහල භාෂාශාස්ත්‍රයට පිරිමසාලියනොහැකි හානියක් වූබැව් කියයුතුමැයි.

පොත්පත් සපයා දීමෙන් අපට උපකාරීවූ මහනුවර මල්වතුවිහාරවාසී තිබ්බොටුවාවේ සරණංකර ස්ථවිරයන්වහන්සේටද ප්‍රාචීන පුස්තකාලයෙහි නියුක්ත පලිපාන රතනජෝති ස්වාමීන්වහන්සේටද බලවැන්තෙන් කාවිධජ ස්වාමීන්වහන්සේටද අපගේ ස්තුතිය මෙහිදී පළකරමු.

D. B. J.

1924 ජූලි මස 12 වෙනි
දින කොළඹදීය.

# ශුද්ධිපත්‍රය.

## සිඛවලඳ.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 6 | සඤ්ඤදුයෙන්* | සඤ්ඤදුයෙන් |
| 4 | 2 | අසිරිත්වූ | අසිරිත්නුවු |
| 5 | 16 | ඇඩැරුව | ඇඩැරුව |
| 7 | 10 | පෙරවැ | පෙරවැ එවු |
| 12 | 25 | නවෙළුපොසථා | නවෙඩුපොසථා |
| ,, | 28 | සංඝො | සංඝෙ |
| ,, | ,, | ගණො | ගණෙ |
| ,, | 31 | අභිඣානොච | අභිඣානොති |
| ,, | 33 | අභිඣානමනොකාසස | අභිඣානමචෙකාසස |
| 16 | 9 | වස්සූපගමනංවාපි | වස්සූපගමනංවාපි |
| ,, | 10 | තෙමාසචවසිත්වාන | තෙමාසමවසිත්වාන |
| ,, | ,, | විරතස්සාපි* | චරන්තස්සපි. |

## සිඛවලඳවිනිස.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 17 | 24 | නැවත | නැත |
| 18 | 14 | ඇති | කැ |
| ,, | 30 | සම්නනාපතති | සාමනනාපතති |
| 19 | 10 | කාවිසිපිශයාවි...විසිපි | කාවිසි පිංයෝහි [මයෝහි |
| 20 | 20 | ධුරතිකඛපො | ධුරතිකෙඛපො, |
| 23 | 32 | නොහසුරැනම්වන | නොහැසුරැම්වන |
| 24 | 24 | තමාකොරෙහි* | තමාසතන්හි |

* මේ ලකුණින්යුත් පාඨ ඇතැම් පොත්හි පැනනා විසදෘශ පාඨ වශයෙන් සැලකියයුතුයි.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 24 | 25 | සමවජම් | සමවජම් |
| 27 | 5 | [1]කය | [1]කයින් |
| ,, | ,, | කාපිළිබද්දෙන් | කාපිළිබද්දෙහි |
| ,, | අධොලිපිය | 1කයින් | 1කය |
| 27 | 7 | යක්පේපඬුතිරිසන් | යක්පේපඬුපිරිමිනීතිරිසන් |
| ,, | 14 | විපරිත | විපරීත |
| 33 | අධොලිපිය | සික්ඛාපදවලඤ්ජනි† | සික්ඛාපදවලඤ්ජන |
| 34 | 13 | පරිජී ඇවැත්* | පරිජී ආදී ඇවැත් |
| ,, | 32 | අරුණු නඟන විගස | අරුණු නැඟෙන විගස |
| 36 | 33 | නුදුන් | දුන් |
| 37 | 17 | උකට ප නම් | උකට පා නම් |
| 39 | 6 | [1]උග්හු පිළිග්හු | [1]උග්ගු පිළිග්ගු |
| ,, | 7 | උග්හු | උග්ගු |
| ,, | 9 | පිළිග්හු | පිළිග්ගු |
| ,, | 33 | නිරාමිසමෙ | නිරාමිසවැමෙ |
| ,, | අධොලිපිය | 1උග්ගුහු පිළිග්ගුහු | 1උග්හුපිළිග්හු,උග්ගුහුපිළි |
| 40 | 4 | කිරිආදියට | කිරි ආදී යටකි [ග්ගුහු |
| ,, | 6 | එවු | එවැ |
| ,, | 10 | පෙරව ැපස් | පෙරවරු පස්වරු |
| ,, | 22 | නොකකාළුත්* | නොකකාළදු |
| 47 | 24 | කොට | නොකොට |
| 65 | අධොලිපිය | නිළුඹුවා | නිළුඹුවා |
| 67 | 2 | [2]අතවැසි සිරියනට | [2]අතවැසිසැකැරියනට |
| ,, | අධොලිපිය | 2අතවැසි සැකැරියනට | 2අතවැසි සිරියනට |
| 81 | 11 | සප්පැහැරු* | සප් පැහැරු පැහැරු |
| ,, | 12 | උරු* | උරවා |
| ,, | 22 | [3]සත්ගත්අත්ඇත්තාහට | [3]සැත්ගත්අත් ඇතිෂාහට |
| ,, | 23 | බැරුවනට* | ඇබැරුවාහට |
| 82 | 10 | වසා* | වටා |
| ,, | 21 | වැළුත | වැළැතැ |
| 83 | 2 | නොඉවැසිව* | නොඉසව |

*මේ ලකුණින්යුත් පාඨ ඇතැම් පොත්හි පැනෙන විශුද්ධ පාඨ වශයෙන් සැලකියයුතුයි.

†අනික් තැන්වලද මෙසේ ශුද්ධකරගතයුතුයි.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 83 | 7 | නොඉවැසිවුව* | නොඉසවුව |
| ,, | 12 | සිල්කැමැති* | සිල්කැමි |
| ,, | 23 | දූහිටි | සෑ දූහිටි |
| 84 | 13 | බිහිගමුදු* | බිහිසිමිදු |
| ,, | 16 | බෙහෙදුද | බෙහෙදුදු මෙහෙයුණ් |
| ,, | 24 | කරත | කරත කොමාදිදු |
| ,, | ,, | කොමාදීන් | කොමාදිදු |
| ,, | 26 | පාන් | පැන් |
| 85 | 7 | කියන්නෙ* | කියා දෙසන්නෙ |
| ,, | 10 | සසික්සී | දවස් විසින් සසික්සී |
| ,, | ,, | කරවත විසින්* | කරුවන් විසින් |
| ,, | 13 | සුතතුදෙදස* | සුත්උදෙස් |
| 86 | 12 | මාගම්පැවිජ්ජන්කොරෙ | මාගම් පැවිජ්ජන් කොරෙ |
| ,, | 13 | කොනකුන් විසින්* | කොනකුන් ඇත [න් |
| 86 | 21 | නව පවුරුණු | නවපවුරුණී |
| ,, | 25 | පවාරණො | පවාරණා |
| ,, | 31 | එකවාචිකනම් | එකවාචික පවුරුණුනම් |
| ,, | 34 | මුල්සිබයෙහි | මුල්සිබ |
| 87 | 1 | වසාවසනවිධි | වසාවන විධි |
| ,, | ,, | සවන | වසාවන |
| ,, | 6 | පරිතනසිබය | පරිණත සිබය |
| ,, | 8 | පදසොබම්සිබයැ | පදසොඩම් සිබයැ පස්වන සහසෙය්‍ය සිබයැ සත්වන මාගමට බණකියන සිබයැ |
| 87 | 8 | එකොළොස්වන | එකොළොස් දොළොස්වන |
| ,, | 20 | කුඹවර | කොඹවර |
| ,, | 21 | පියන | පියන පියවන |
| ,, | 35 | මුල්සිබවළඳ | මුල්සිබ හා සිබවළඳ |
| ,, | 37 | විනයධරයන්* | වනධැරුන් |

---

* මේ ලකුණ යෙදුනු පාඨ ඇතැම් පොත්හි පැනෙන විපර්‍යාස පාඨ වශයෙන් සැලකියයුතුයි.

# ග්‍රන්ථපද විවරණය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 94 | 28 | තුඩපට | තුඹපට |
| 95 | 23 | ඊයීයපථ | ඊයෂීාපථ |
| 98 | 25 | ශ්‍රොත්‍රධාතුවෙන් | ශ්‍රොත්‍රැධාතුයෙන් |
| 99 | 23 | පත්ති | පත්තී |
| 101 | 28 | නිරාමිසවෙ | නිරාමිසවැමෙ |
| 103 | 26 | වෙරකාස් ආදි තැන්හි, ශරීරයෙහි කැසීම්ඇති තැන්හි. | වෙරැපස් ආදි තැන්හි "විවරආදි තැන්හි, ඡිතන තවාකාදි තැන්හි." |
| 104 | 1 | පරණලා මහසල් ලසල්ලිය | පරණලා මාහැල්ල සම්ලිය |
| 109 | 18 | 26 හතිමෙ හස්තායම(?)(ලොප්කළ යුතුයි.) | |
| 110 | 33 | ඇදූරීම්,* ආදර කිරීම් | ඇ..රීම්, ඉසිලීම්. |

# සූචිපත්‍රය.


| | | | | පිට. |
|---|---|---|---|---|
| ප්‍රස්තාවනා | ... | ... | ... | iii |
| ශුද්ධි පත්‍රය | ... | ... | ... | xi |
| සිඛවලඳ | ... | ... | ... | 1 |
| සිඛවලඳවිනිස | ... | ... | ... | 17 |
| ග්‍රන්ථිපදවිවරණය | ... | ... | ... | 92 |
| පරිශිෂ්ටසංග්‍රහය | ... | ... | ... | 116 |

# සිඛවලඳ.

තුන්ලොවට උතුම් රුවන්තියා කා විසි මුනු[1] තුන්දෙරින් සකාසා වැඳැ උපසපුව ලද පැවිජ්ජා පටන් හික්මියැයුතු සරිත්වරිත් සිඛ සැබෙවින් කියනෙම්:—

1. මිනිස් අමිනිස් තිරිසනුන්ගෙ[2] මඟතියායෙහි සෙවියැවි සිතින් තමා මඟ මෙහෙයුව පරිජි වෙ.෴මෙ හැම මෙවුන්ධම් පරිජි නම්.

2. පරමිනිසක්හු[3] අයත් පල් පොහොනා වතක් සොරසිතින් ගත පරිජි වෙ.෴මෙ හැම අඝිනාදන් පරිජි නම්.

3. මව්කුස්හි පටා[4] මිනිස්සතක්හු මැරියැවිසිතින් දිවි ගැලැ වුව පරිජි වෙ.෴මෙ හැම මිනිස්විකා පරිජි නම්.

4. තමාකෙරෙහි නැති උතුරුමිනිස්ධම් අතික් මිනිස්සතක්හට බුහුමන්කැමැතිසිතින් ඉඳුරා කිව ඔහු එවිගස දත පරිජි වෙ.෴මෙ හැම උතුරුමිනිස්ධම් පරිජි නම්.

෴ මෙ සතරපරිජි නම් ෴

5. සුකුරුමිඳියැවිසිතින් සිහිනෙන් විනා අද ඇති බැහැරි වත්හි තමා හඳන්[5] සටා සුකුරු මිඳුව සඟවෙසෙස් වෙ.෴ මෙ හැම සුක්විසැටි[6] සඟවෙසෙස් නම්.

6. කාසසඟරුයෙන් මිනිස්මාගමකෙරෙ මාගම යන සඤ්[7] ඇතියා වැ සමරුවන් වන සිතින් කාඝින් කාහි පහරී නම් සඟවෙසෙස් වෙ.෴මෙ හැම කාසසඟරුසඟවෙසෙස් නම්.

7. තුළුල්තෙපුල් කියැවි රුයෙන් මිනිස්මාගමකෙරෙ මාගම යන සඤ් ඇතියා වැ වසමඟ පසමඟ මෙවුන්ධම් අරහයා තුළුල්තොපුල් කියා නම් ඇ එවිගස දත සඟවෙසෙස් වෙ.෴ මෙ හැම දුටුල්වසුසඟවෙසෙස් නම්.

8 මෙවුන්රුයෙන් මිනිස්මාගමකෙරෙ මාගම යන සඤ් ඇතියා වැ තමහට මෙවුන්ධමින් මෙහෙ කිරීමෙහි ගුණ කියා නම් ඇ එවිගස දත සඟවෙසෙස් වෙ.෴මෙ හැම අතනකාමපාරිචරියාසඟවෙසෙස් නම්.

---

1 මුනි. 2 තිරිසන් මාගම් පිරිමිනිත්ගෙ. 3 මිනිස්සතක්හු. 4 පටන්. 5 හඳන්. 6 සුක්විසටි. 7 සංඥ.

9. මිනිස්මාගමකාවිසින් එවූ පිරිමිනියක්හුවිසින් එවූ කෙලෙස් පිළිබඳ් කොටින් කී හසුන් පිළිගෙනැ පරහට ඇරොජ[1] පූන හැරැ ඇරැජුව මෙ තුන්අඟින් සඟවෙසෙස් වෙ෴මෙ හැම සසුරැතු සඟවෙසෙස් නම්.

10. දුකුම් ඇසුම් සැකකිරීම් නැතියා වැ උපසපන්පැවිජ්ජක්හු සස්නෙන් ගැළවියැටිසිත් ඇතියා වැ වැළැනැ සිටැ පරිජිවතින් සොයා එවු සොයවා එවු ඔහු එවිගස දන සඟවෙසෙස් වෙ෴මෙ හැම අමූල්සඟවෙසෙස් නම්.

11. උපසපන්පැවිජ්ජක්හු සස්නෙන් ගැළැවියැටිසිත් ඇතියා වැ අතිකක්හු කිරීම් දැකැ එලෙස් ගෙනැ වැළැනැ සිටැ පරිජිවතින් සොයා එවු සොයවා එවු ඔහු එවිගස දන සඟවෙසෙස් වෙ෴මෙ හැම අඤ්ඤභාගි සඟවෙසෙස් නම්.

෴ සත්සඟවෙසෙස් නිමි ෴

---

12. නොඉටා නොවිකපා අයල් සිවුරැ දස දවසක් ඉකුම්වා නම් නිසැගි[2] වෙ.

13. මහණසම්මුති නැතියා වැ නො හල්ගි සිවුරැ නමින් ඉටූ තුන්සිවුරෙන් වියෝවැ එක් අරැණකුදු ඉකුම්වා නම් නිසැගි වෙ.

14. නොනෑ මාගම්පැවිජ්ජ ලවා පොරණ සිවුරැ දෙවා එවු රජන්කරවා එවු කොළවා එවු නිසැගි වෙ.

15. නොනෑ මාගම් පැවිජ්ජ අතින් සිවුරැ කිසි වතක් නොදී ගනීනම් නිසැගි වෙ.

16. නොනෑ නොපැවැරැ ගිහිමිනිසක්හු අයත් සිවුරැ විනවා ගනී නම් නිසැගි වෙ.

17. රන් රිදී මසු කහවණු ගනී එවු ගන්වා එවු එළවූවා පිළිබෙව්[3] කොට සිතින් ඉවසා එවු ගනී නම් නිසැගි වෙ.

18. රන් රිදී මසු කහවණු වැවහරකරත් නිසැගි වෙ.

19. පස්සහඩැම්යන් හා මිසැ කැපවතින් බැවහර කරත් නිසැගි වෙ.

20. නොඉවූ නොවිකැපූ පමණින් සුත් පා දස දවසක් ඉකුම්වා නම් නිසැගි වෙ.

---

1 අරෙජ. 2 'නිසඟි' යනුත් පාඨයි. 3 පිරිබෙවූනොකොට,

21. උනුපස්බාන් ඇතියා වැ අතික් පයක් විනවා ගනී නම් නිසැගි වෙ.

22. වැළැඳියැයුතු ගිතෙල් මී වෙඬුරු[1] තෙල් සකුරු පිළිගන්වා ගෙනැ සත්දවසක් ඉකුම්වා නම් නිසැගි වෙ.

23. උපසපන්පැවිජ්ජක්හට සිවුරුදී නොවිසියමනා වැ සකසඤ්ඤයෙන් අසිඳැ එවු අසිඳුවා එවු ගනී නම් නිසැගි වෙ.

24. නො නැ නො පැවැරු ගිහින් අයත් හූ විනවා ගෙනැ විනපුන් පොගොනා සිවුරක් නොනැ නොපැවැරු පෙහෙරක්හු ලවා වියවුව නිසැගි වෙ.

25. සඟනට පිරිණැමූණු ලාභයක් දැනැ දැනැ තමහට පිරිණැමූව නිසැගි වෙ.

**තුදුස් නිසැගි නිමි**

---

26. වසැකි සාවැව් වැ මුසවා කිව මෙරමා දන පචිති වෙ.
27. උපසපන්පැවිජ්ජක්හු හවා නම්—
28. පිසුනු කියා නම්—
29. අනුපසපනක්හට පදසොධම් කියා නම්—
30. අනුපසපනක්හු හා එක්වැ තුන්අරුණක් ඉකුම් වා පුනරු එක් වැ බැසැ හොවී නම්—
31. මාගමකා හා එක අස්නෙහි රැ එක් වැ බැසැ හොවී නම්—
32. විඤ්ඤුවක්හු නැතියා වැ මාගමකාට සපෙදෙන් වඩා බණ කියා නම්—
33. මහණසම්මුති නැතියා වැ උපසපන්පැවිජ්ජක්හුගෙ තුළුල් ඇවැතක් අනුපසපනක්හට කියා නම්—
34. පොළෝ කාණනු කාණවනුආදී කෙරේ නම්—
35. ගස් තුරු ලිය ආදී කළකිරුවා නම්—
36. බික්සඟහු අයත් හැඳපුටුආදී අබවසැ අතුට එවූ අතුරුවා එවූ සඟවනු ආදී නො කොට යේ නම්—
37. පණුවන් ඇති දිය බව් දැනැ දැනැ පරිභොගකෙරේ නම්—
38. නොනැ මාගම්පැවිජ්ජක්හට සිවුරු කිසිවතක් නොගෙනැ දේ නම්—
39. නොනැ මාගම්පැවිජ්ජගෙ සිවුරු ගෙත්තම්කරනු කරවනු කෙරේ නම්—

---

1. වෙඬරු.

40. පැවැරි වැ අසිරිත්[1] නුවූ බොජුනක් පරගලා කෙරේ නම්—
41. පැවැරි වූ පැවිජ්ජක්හු සටහ රිසින් අසිරිත්වූ බොජු
නෙන් පැවැරි වැ එ බුදී නම්—
42. විකල්බොජුන් පරගලා කෙරේ නම්—
43. සන්නිධිබොජුන් පරගලා කෙරේ නම්—
44. නො ගිලන් වැ පිණ්ඩිබොජුන් විනවා බුදී නම්—
45. දැහැටිදිය තබා සෙසු නො පිළිගත් වතක් පරගලා කෙරේ
නම්—
46. තිථයක්හට පරගලාකටයුතු වතක් තමා අතින්දේ නම් —
47. මාගමක හා නොරඹුරෙහි රහස්කැමැති වැ උදකලා වැ
හිදී නම්—හොවී නම්—
48. රහමෙර පරගලා කෙරේ නම්—
49. ගිරිති කවා නම්—
50. දියෙහි කෙළී නම්—කෙල ලා නම්—
51. අනදුරු කෙරේ නම්—
52. උපසපන්පැවිජ්ජක්හු බවා නම්—
53. නොගිලන්වැ—කරුණු නැතියා වැ—ගිනි එළනු එළවනු
කෙරේ නම්—
54. අලුත් සිවුරු කප්බිඳු නො බා පරිහොග කෙරේ නම්—
55. උපසපන්පැවිජ්ජක්හුගෙ පාසිවුරු ආදී පිරිකර කෙළනා
රිසින් පැවි කරනු කරවනු කෙරේ නම්—
56. මැරියැවි සිතින් තිරිසනකුදු දිවි ගළවා නම්—
57. උපසපන්පැවිජ්ජක්හුගෙ තුළුල්ඇවැතක් පිළිසොයන
රිසින් පිළිසොයා නම්—
58. මාගමක හා සසඳැ එක්මහ පිළිපැදු ගම්අතුරකටයෙ නම්—
59. උපසපන්පැවිජ්ජක්හු දැහැ වැ පහරි නම්—උපසපන් පැවිජ්
ජක්හට දැහැවැ අත්සැත් කියපා[2] නම්—
60. උපසපන්පැවිජ්ජක්හු මුල් නැති සඟවෙසෙස්නන්
සොයා නම්—
61. කුරුස්නානක් කමැති වැ උපසපන්පැවිජ්ජක්හට කුකුස්
උපයා නම්—
62. කලහ කමැති වැ උපන් කලහ ඇත්තවුන් අබියෙසැ සිටැ
නොදක්වා කියනු අසා නම්—

---

1. අසිරත්. 2 කියවා, කියපෑ.

63. සඟනට පිරිණැමුණු ලාභයක් දැනැ දැනැ පුහුලක්හට පිරිණමා නම්—

64. එබඳුකරුණක් නැතියා වැ වැළැනැ සිටි පැවිජ්ජක්හට නොඇවිසැ විකාල් ගම් වදී නම්—පචිති වෙ.

**එක්සාලිස් පචිති නිමි**

---

65. ඉසුරුපමුණුවා සඟසතු ගුරුබඩ අන්නට දේ නම් දුලැසි වෙ

66. සොරසිතින් දුත[1] බඩු තුබූ සෙසින් පරිජ් ආදී වෙ.

67. කුස වැහිරි පුවරු පෙළුදු කෙස්වල්මුවා පලසුදු තිය ඇති දුන්[2] දිවිසමුදු මහමුහුණුපියාදු තිඵලද නොගෙනැ ධරත් දුලැසි වෙ.

68. සැත්කම් වත්කම් කරවා නම් දුලැසි වෙ.

69. තමා හඳන් සාපත් දුලැසි වෙ.

70. මිනිස් මස් ලේ ඇට සම් ලොම් පරගලා කළ දුලැසි වෙ.

71. කේල්වාපිළිදු එරුපත්පිළිදු තියදින්කළ සැතිරිකඩුදු සබබ නීල පීත ලොහිත ඔදත මජෙඨාදි පිළිදු ඈ ධැරුව දුකුළා වෙ

72. ඇත් අස් වලස් තරස් සිහ වග දිවි බලු දික්දැ මසුදු මෙතොක්දෙනාගෙ ඇටිදු සමුදු ලේදු බික්සගුන් අවක්සා මැරූ මසුදු නුපුළුවුත් මසුදු වැළැඳුව දුකුළා වෙ.

73. නහනතොට සුළුදියවටන්හිදු පියෙවි ගෙහිදු නුදුන් සමුයෙන් ආ පිළිවෙළ ඉකුම් වා නම්—

74. සුළුදියවටන්හිදු පියෙවිගෙහිදු උකැසි නොපැහැරැ වදී නම්—

75. පාදුකායෙන් බැහැරැ සිටැ සිවුරු නගා නම්—බහා නම්—

76. වස්පවත්වමින් නතනා නම්—දැහැටු කා නම්—

77 පුප්වළ පුසන් ලා නම්—

78. කොරෙස්පුසනින් පුසන්කිස සාහා නම්—

79. වස්දෙණියෙහි කෙළ ලා නම්—

80. බැහැරැ කෙළෙසීගියා නො හරී නම්—නොහරවා නම්— නෙමෙ කෙළෙසා නම්—

81. එහි කසළ දුම නො හරී නම්—නො හරවා නම්—

---

1 දේනම් ගනීනම්. 2. අඳුන්.

82. ලා හෙළා ලා වදී නම්—නික්මේ නම්—

83. හඬවා දිය කිස සාහා නම්—දුකුළා වෙ.

84. මහල්ලන් නො පිළිවිසැ[1] පාමොක් උසුරුවා නම්—බණ කියා නම්—පැන පුළුවුසී නම්-විසඳුන් කෙරේ නම්-හඳුරා නම්—කියා නම්—කියවා ගනී නම්—පහන් දල්වා නම්—නිවා නම්—දොරකවුළු වරී නම්—පියාලා නම්—දුකුළා වෙ.

85. ලිහිණි වැ වදී නම්—වැදුම් ගනී නම්—ගමන් යේ නම්—බොජුන් බුදුනාදී කෙරේ නම්—දියෙන් බැහැර සිටැ තමහට පිරියම් කෙරේ නම්—සාරවා නම්—අත්තම තෙමෙ කෙරේ නම්—දුකුළා වෙ.

86. නහන සඳැ තොට කොඩවර පුවරුවැම්හි රුක්හි නහන තෙන ඕදුවූ කොරොස් පුවරුයෙහි තමා සිරුරු ගහා උලා නම්—දඹුපෙණෙනුදු කුරුඳුවැළිනුදු අනන්මන සිරුරු ගහා උලා නම්—දුකුළා වෙ.

87. නොගිලන් වැ අරමින් බැහැර වහන් ලා යේ නම්—සබ්බ නීල පීත ලොහිතාදි වහන් ලා නම්—රුසිතින් මිනිස් අමිනිස් තිරිසන් මාගමුන් නිමිත් බලා නම්—බික් දෙන්නිය මුහුණ බලා නම්—උජ්ඣානසඤ්ඤ ඇතියා වැ අනුන් සතප්නා පා ආදී බලා නම්—කැටපත් දිය ආදියෙන් තමා මුහුණ බලා නම්—උසසුන් මහඅස්නෙ හිඳී නම්—හොවී නම්—දුකුළා වෙ.

88. උක්ඛිත්තකයා අනුපසපනක්හු නානාසංවාසකයා මාගම් පඬු ගරුකඑකයා වදී නම්—

89. පඬු මාගම් උභතොබ්‍යඤ්ජනකයා හා එකඅස්නෙහි හිඳීනම්—හොවී නම්—දුකුළා වෙ.

90. අසමානාසනිකයා හා නොදික්අස්නෙහිදු හැඳපුටුයෙහිදු හිඳී නම්—හොවී නම් දුකුළා වෙ.

91. මල්පක්ආදී කුලන් සගන්නා සඳහා දේ නම් දුකුළා වෙ.

92. මල් ගොතනු ගොතවනු ආදී කෙරේ නම්—

93. බුදුන් වැරූ තාක් පස වළඳා නම්—

94. නිසපිළිබැදියා වැ නිස නොගෙනැ වෙසේ නම්—

95. අනුදත්තන් තබා සෙස්සනට පිළියම් කියා නම්—කෙරේ නම්—

96. සාපත්තික වැ පොහෝපවුරුණු කෙරේ නම්—

---

1. නො පිළිවිසා

97. දෙරවටුආදි පිරිවැටෙන දොර ඇති සෙනස්නෙහි දොර නොපියා නොපිළිපයා ආභොග නොකොට දවහල් බැසැ හොවී නම්—

98. හැමරුවනුදු හැමධඤ්ඤයදු මාගම්සැව්රුදු මාගම්පලඳ නාදු අවුස්බඹුදු ආයුධබඹුදු ගස්හි තුබූ කැයුතු පකා පැකිදු පුබ්බණ්ණ අපරණ්ණයෙහිදු පිරිමදී නම් දුකුළා වෙ.

99. පෙණෙහෙන් එවු අන්පෙණෙහෙන් එවු දියමූසු ඉටි මුසු තෙලින් එවු කෙස් මටකෙරේ නම්-කරවා නම් දුකුළා වෙ.

100. නොඑක් පැවිජ්ජෙ එක් හැඳැ එවු එක්අතුරා එවු එක් පෙර වැ හොවිත් නම්—

101. එකබදනෙන්[1] දෙදෙනෙක් බුදිත් නම්—

102. වඩුඅඟුලෙන් ව්ට අටඟුලෙන් දික් දැහිවි කා නම්—

103. නටනු ගනු වයනු බලනු අසනු යොදනු යොදවනු කෙරේ නම්—

104. කොඩවරපවුරෙන් බැහැරැ දියටනු ආදී පියනු පියවනු කෙරේ නම්—

105. ගොයම් ආදී තන්හි දියටනු ආදී පියනු පියවනු කෙරේ නම්—

106. දික්කෙස් නිය නැහැලොම් නොහරී නම්—නොහරවා නම්—

107. නොගිලන් වැ කැසැ අඬුපියෙසැ ලොම් හරී නම්—හරවා නම්—

108. නිය මට කෙරේ නම්—කරවා නම්—

109. පිරියම්කළ බිමැ තෙත්පයින් එවු වහන්ඇති පයින් එවු ඇක්මෙම් නම්—

110. සඟසතු හැඳ පුටු පිරියම්කළ බිතතුදු වෙරින් පහරී නම්—

111. සඟළ සිවුරෙන් අකාවටු අමුඑවා හිදී නම්—

112 සිවුරු දූපපරිභොග කෙරේ නම්—

113. කහබහන් නො බැදැ ගම් වදී නම්—

114. සිරුරු කිස කොට ඇතිදියෙහි දියකිස නොසාහා නම්—

115. අයපයෙහි සමුදන් කරවා නම්—

116. සභාගාපත්තිදෙසා නම්-පිළිගනී නම්-ඇරොජ නම්—

117. ගුඩසිතින් පව්සසව වසකි කෙරේ නම්—

---

1 බදනෙක:

118. වස් නොවෙසේ නම්—

119. නො කරුණෙහි සති කරුණෙන් යේ නම්—

120. උවදුරු නැතියා වැ බඹයෙන්මත්තෙ රුකට නැගේ නම්—

121. පෙරහන් නැතියා වැ අධන්මග පිළිපදී නම්—

122. මඟහිලා පෙරහන් නැත්තක්හු පෙරහන් ඇරුවුව නොදේ නම්—

123. තමා මරු නම්—මරවා නම්—

124. සිත්තම් පොත්රූ කෙරේ නම්—කරවා නම්—

125. බුදුනක්හු උනස්නෙන් නහා නම්—

126. බුදුනාගෙහි ආ මහල්ලනට අවසර නො පැ හිඳී නම්—

127. නොගිලන් වැ පිරිමිනින් උසුලනා හිදෙළ[1] ඈ යානායෙහි හිඳී නම්—ඉහාවී නම්—

128. රුවන්තියා අරහයා කෙළී නම්—

129. අනුන්ගෙ පිරිස් ඔසවා නම්—

130. සිවුරු නගා කළවේ ඈ මාගම්පැවිජ්ජට පවි නම්—

131. ලොකායත[2] උගනී නම්—උගන්වා නම්—

132. තරකෙස් ගනී නම්—ගන්වා නම්—

133. තඹලොහොආදීන් කළ පාතටුමත්තෙ පා තබා බුදී නම්—

134. ඉටන්පොහොනා පා අතින් ගෙනැ දොර කවුළු වරී නම්—පියා ලා නම්—

135. තෙත්පා සඟවා නම්—නොවියළා නම්—

136. අව්වෙ තබා ඉතා හුණුකෙරේ නම්—

137. කිසිවතක් නො ලා බිමැ තබා නම්—

138. හැඳපුවුයෙහි ඔර පිටිපය සැත තිසවත්තෙහි පිළස්හි තබා නම්—

139. පියැසුතු කටුඇටආදී පය ලා නම්—

140. පාමත්තෙහි අත් දෙවී නම්—

141. ඉඳුල්දිය පසින් ගෙනැ යේ නම්—

142. අකැප පා පරිභොග කෙරේ නම්—

143. අනුන් කිවුම ආ වඩා නම්—

144. අනාදරිය පිණිස සිඛකරණිය නොහික්මේ නම්—දුකුළා වෙ.

145. බඩැරිසිසයෙන් ගිහිමිනිසුන් අයත් සඟවා නම් පචිති වෙ.

146. කෙළනා තිසා දූ නම් ගොත් කියා නම් දුබැසි වෙ.

**පකිණ්ණක නිමි.**

---

1. ඉදළ. 2 ලොකායතන.

147. ඇඳුරුවත්, තෙරවත්, ආගන්තුකවත්, ගමිකවත්, සෙන සුන්වත්, ගිලන්වත් පිරියැ යුත්තේ සි.

148. අත්පසැ සිටැ එසවියැ හැක්කක් කයින් එවූ කාපිළිබද්දෙන් එවූ නිසග්ගෙන් එවූ දෙන්නා ගන්මි සි යන සිත්ඇතියා වැ ගන්නේ සි.෴ මෙ හැම පිළිගන්නාසේ සි.

149. අත්පසැ වුව—"ඉමං සඞ්ඝාටිං—ඉමං උත්තරාසඞ්ගං—ඉමං අන්තරවාසකං අධිට්ඨාමි"—සි—

අත්පසින් දුරු වුව—"එතං සංඝාටිං—එතං උත්තරාසංගං—එතං අන්තරවාසකං අධිට්ඨාමි"—සි.෴ තුන්සිවුරු මෙසෙයින් ඉටන්නේ සි.

"ඉමං සංඝාටිං පච්චුද්ධරාමි"සි යනාදීන් තුන්සිවුරු මෙසෙයින් [1]පසුදුරන්නේ සි.

ඉමං-ඉමානි, එතං-එතානි චීවරානි— පරික්ඛාරචොළානි අධිට්ඨාමි"-සි.෴ පිරිකරසොළ මෙසෙයින් ඉටන්නේ සි.

ඉමං-ඉමානි, එතං-එතානි චීවරානි පරික්ඛාරචොළානි පච්චුද්ධරාමි"-සි.෴ පිරිකරසොළ මෙසෙයින් [1]පසුදුරන්නේ සි.

"ඉමං පත්තං-එතං පත්තං අධිට්ඨාමි"සි.෴ පා මෙසෙයින් ඉටන්නේ සි.

"ඉමං පත්තං—එතං පත්තං පච්චුද්ධරාමි"සි.෴ පා මෙසෙයින් [1]පසුදුරන්නේ සි.

---

150. පණ්ණරසී වුව—"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො අධිට්ඨාමි"සි—චාතුද්දසීවුව"-අජ්ජ මෙ උපොසථො චාතුද්දසො අධිට්ඨාමි"සි-෴ එකක්හු වුව ඉටන් පොහෝ කරන සේසි.෴

දෙදෙනකු වුව—"පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මං ධාරෙහි"—සි.෴ මහල්ලන් මෙසෙයින් තුන්යලක් කියන්නේසි.෴ "පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙහි"—සි.෴ සඟහු මෙසෙයින් තුන්යලක් කියන්නේසි.෴ මේ දෙදෙනා අනන්මන පොහෝ කරනසේ සි.෴

තුන්දෙනකු වුව—"සුණන්තු මෙ ආයස්මන්තා, අජ්ජුපොසථො පණ්ණරසො, යදායස්මන්තානං පත්තකල්ලං, මයං අඤ්ඤ

---

1 පසදුරන්නේ සි.

මඤ්ඤං පාරිසුද්ධිං උපොසථං කරෙය්‍යාම"–සි–මෙසෙසින් සඳහන් පිහිටුවා–"පරිසුද්ධො අහං ආවුසො, පරිසුද්ධොති මං ධාරෙහි"–සි.
මෙසේ මහල්ලන් තුන්යලක් කියන්නේ සි. සඟනුදු පිළිවෙළින්–"පරිසුද්ධො අහං භන්තෙ, පරිසුද්ධොති මං ධාරෙථ"සි–මෙසෙසින් තුන්යලක් කියන්නේ සි. මේ තුන්දෙනා පොහෝකරනසේ සි.

සඟහු විසින් පාමොක් උසුරුවා පොහෝ කරන්නේ සි.

ඉටන් ආදි පොහෝ ද මතු කියන පවුරුණු ද පූකිස පූකරණීය නිමවා කරන්නේසි.

---

151. "අජ්ජ මෙ පවාරණා පණ්ණරසී අධිට්ඨාමි"සි "අජ්ජ මෙ පවාරණා චාතුද්දසී අධිට්ඨාමි" සි. මෙසෙසින් එකක්හු වුව පවරනසේසි.

දෙදෙනා පවරත් මහල්ලන් විසින්—"අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි"—සි. මෙසෙසින් තුන්යලක් කියා පවරන්නේ සි. සඟහුදු "අහං භන්තෙ ආයස්මන්තං පවාරෙමි" යනාදීන් තුන්යලක් කියා පවරන්නේසි. මේ දෙදෙනා පවරනසේසි.

තුන්දෙනා, සතරදෙනා වුව–"සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජ පවාරණා පණ්ණරසී යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම"යනාදීන් මහල්ලන් මෙසෙසින් තුන් යලක් කියා පවරන්නේසි. සඟනුදු පිළිවෙළින්—"අහං භන්තෙ ආයස්මන්තො පවාරෙමි"–යනාදීන් තුන්යලක් කියා පවරන්නේ සි.

පස්දෙනා හෝ අසිරු පස්දෙනා වුව—මහල්ලන් විසින්—"සුණාතු මෙ ආවුසො සඞ්ඝො, අජ්ජ පවාරණා පණ්ණරසී යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො පවාරෙය්‍ය"සි—මෙසෙසින් සඳහන් පිහිටුවා—"සඞ්ඝං ආවුසො පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි"—සි. මෙසෙසින් මහල්ලන් තුන් යලක්කියා පවරන්නේසි, සඟනුදු පිළිවෙළින්—"සඞ්ඝං භන්තෙ පවාරෙමි"—යනාදීන් තුන්යලක් කියා පවරන්නේසි.

**පොහෝ පවුරුණු නිමි.**

---

152. "අත්ථතං භන්තෙ සඞ්ඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො කඨිනං අනුමොදාමි" සි. මෙසෙසින් තුන්යලක්කියා අනුමොවන්නේසි.

**මෙ කෙළින්සිවුරු අනුමොදනාසි**

"ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහි" සි.

**මෙ සැද දෙනසේ සි**

"පාරිසුද්ධිං දම්මි, පාරිසුද්ධිං මෙ හර, පාරිසුද්ධිං මෙ ආරොචෙහි"෴යි.

෴ මෙ පිරිසුදුදෙනසේ යි ෴

"පවාරණං දම්මි, පවාරණං මෙ හර, පවාරණං මෙ ආරොචෙහි"෴යි෴මම ඡන්දාය පවාරෙහි෴යි.

෴ මෙ පවුරුණු දෙනසේ යි ෴

"ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි ඉධ වස්සං උපෙමි"—යි—චිත්තුප්පාදෙන් ආලයො.

෴ මෙ වස්වසනසේ යි ෴

---

153. සිඛවළඳ කී සිඛයෙහි සචිත්තක අචිත්තක මෙ කියන සෙයින් දතයුතු:—

සත්සඟවෙසෙසැ සසුරුතුසඟවෙසෙස අචිත්තකයි෴

සෙසු සඟවෙසෙසුදු හැම පරිජිදු සචිත්තකයි෴

තුදුස් නිසග්ගෙහි දෙළොස්වන අසිඳුනා සිඛය හා තුදුස්වන පරිණතසිඛය හා මෙ දෙසිඛය සචිත්තකයි෴

සෙසු දෙළොස්නිසැගි අචිත්තකයි෴

එක්සාලිස් පචිත්තෙහි සතරවන පදසොධම්සිඛය හා පස්වන සවන සහසෙය්‍ය සිඛය හා සත්වන මාගමට බණ කියන සිඛය හා එකළොස් වන දෙළොස්වන සෙනසුන් සිඛය හා පසළොස්වන සිවුරු ගෙත්තම් කරන සිඛය හා සොළොස්වන පැවිරිසිඛය හා අටළොස්වන විකල්බොජුන් සිඛය හා එකුන්විසිවන සන්නිධිසිඛය හා විසිවන පිණ්ඩිබොජුන් සිඛය හා එක්විසිවන දන්තපොණකසිඛය හා දෙවිසිවන තිඹුයක්හට තමා අතින් දෙන සිඛය හා සූවිසිවන සුරාපානසිඛය හා අටවිසිවන ගිනිතපනා සිඛය හා එකුන්තිස්වන කප්බිඳුසිඛය හා එක්සාලිස්වන විකල්ගම්වදනා සිඛය හා මෙ සතළොස්සිඛය අචිත්තකයි෴සෙසු සූවිසිපචිති සචිත්තකයි.

පකිණ්ණකයෙහි බික්සඟුන් අවක්සා මැරූ මස් කී සිඛපද තබා සෙසුහැම මස් කී සිඛපද ද දෙපැවිදිනෙනකුන් එක්හැඳැ හෝනා සිඛද දෙදෙනා එක් ඇතිරි අතුරුවා හෝනා සිඛද දෙදෙනා එක් පෙරව හෝනා සිඛද දෙදෙනා එකබදනෙන් බුදුනා සිඛද නැවුම් ආදී බලන සිඛද කොඩවරපවුරෙන් බැහැරැ දියටනු ආදී පියන පියවන සිඛද ගොයම් ආදි තන්හි දියටනු ආදී පියන පියවන සිඛද දික්කෙස් නිය නැහැලොම් ඇ ධරන සිඛද කැසැ හඹු පියෙසැ ලොම් හරනා සිඛද නිය මටතරන තරවන සිඛද සඟසතු හැඳ පුමු බිනතුදු

මෙරින් පහරන සිබද සඟසතු පිරියම්සාළ බිමැ නෙත්පසින් එවු වහන් ඇති පසින් එවු ඇක්මෙන සිබද, කහබහන් නොබැඳැ ගම් වදනා සිබද ඉටන් පොහොනා පා අතින් ගෙනැ දෙරකවුළු වරන පියාලන සිබද යන මෙතෙක් සිබ අචිත්තකයි෴ සෙසු හැම සිබ සචිත්තකයි෴

මෙකීසෙයින් සචිත්තක අචිත්තක ඇවැත් දතයුතු෴

සිඛපද දත නොදත විකුම් දත විකුම් සිඬ වුව සචිත්තක ඇවැත් අවදී, නොදත නො අවදී.

සිඛපද දත විකුම් සිඬ වුව අචිත්තක ඇවැත් අවදී—නොදත නොඅවදී෴මෙසෙයින් සචිත්තක අචිත්තක ඇවැත් ඇවැදුම් දතයුතු෴මෙහැම අටුවා පාළියෙහි තුඹූසෙයින් බලා දන්නේයි.

---

154. සමමජජනී පදීපො ච උදකං ආසනෙන ච
උපොසථසස එතානි පුබබකරණනති වුචචති.

ඡනදපාරිසුඬිඋතුකඛානං භිකඛුගණනා ච ඔවාදො
උපොසථසස එතානි පුබබකිචචනති වුචචති.

උපොසථො යාවතිකා ච භිකඛූ
කමමපපතතා සභාගාපතතියො ච
න විජජනති වජජනීයා ච පුගගලා
තසමිං න හොනති පතතකලලනති වුචචති.

පූර්වකරණ පූර්වකෘත්‍ය නිමවා දෙසූ ඇරැජූ ඇවැත්ඇති සමඟමහාසංඝයාවහන්සේගෙ අනුමතියෙන් පාමොක් උසුරැවන්නට ආරාධනා කෙරෙම්෴

---

155. දිනකාරකකතතබබා කාරානං තු වසා පන
න වෙ උපොසථා වුතතා බුඬෙනාදිචචබනධුනා.

චාතුදදසො පණණරසො සාමගගී ච උපොසථො
දිවසෙනෙව නිදදිටඨා තයොපෙතෙ උපොසථා.

සංඝෙ උපොසථො චෙව ගණෙ පුගගලූපොසථො
කාරකානං වසෙනෙව තයො වුතතා උපොසථා.

සුතතුදදෙසාභිධානො ච පාරිසුඬි උපොසථො
අධිටඨානො ච නිදදිටඨා තයො කමමෙනුපොසථා.

සංඝසස පාතිමොකඛො ච පාරිසුඬිගණසස ච
අධිටඨානමෙකසස නිදදිටඨමපන සතථුනා.

චාතුද්දසීපොහොයැ, පණ්ණරසීපොහොයැ, සමගපොහොයැයි දවස් හෙයින් තුන් පොහොයක් හා—සඟපොහොයැ, ගණපොහොයැ, පුගුල්පොහොයැ යි කරන්නවුන්ගෙ වශයෙන් තුන් පොහොයක් හා—සූත්‍රොද්දෙශපොහොයැ, පිරිසුදුපොහොයැ, ඉටන්පොහොයැ යි ක්‍රියාවශයෙන් තුන් පොහොයක් හා—මෙසේ නවපොහොයෙක් වෙ෴

චාතුද්දසීපොහෝ නම්: [1]පියෙවි සිරිත්හෙයින් එකිඑකි සෘතුයෙහි තුන්වන සත්වන පක්‍ෂයෙහි තුදුස්වක කරන පොහොයයි෴

තුන්සෘතුයෙහි චාතුද්දසීපොහෝ සයෙක, නොහොත් නෙවාසිකයන් තුදුස්වක් පොහෝ කරනද පණ්ණරසී පොහෝ කරන ආගන්තුකයො මඳ වැ අවු නම් එදවස් නෙවාසිකයන් හා එක් වැ චාතුද්දසී පොහෝ කටයුතුයැ යනාදීන් දක්වා කරනලද පොහෝයි෴

පණ්ණරසීපොහෝ නම් [1]පියෙවි සිරිත්හෙයින් එකි එකි සෘතුයෙහි තුදුස්වක්පොහොයට හළ දෙදෙපොහොය හැර සෙසු පොහෝ සයක් සයක් බැගින් අටළොස් පොහොයෙක, නොහොත් තුදුස්වක් පොහෝ කරන්නට නියමවූද පොහොයට කිසි බාධාවක් දැක සෙට පණ්ණරසී පොහෝ කරම්හයි කරන පොහෝ ආදිය යි෴

සමග පොහෝ නම්: කලහයෙන් පොහෝ නො කොට බිඳුණු සංඝයා සමඟ වූ යම් කිසි දවසෙක—"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජපොසථො සාමග්ගී යදි සංඝස්ස පත්තකල්ලං සංඝො උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍ය"—යනාදීන් පාමොක් උසුරුවා කරන පොහෝයි෴

සඟපොහෝ නම්: යටත්පිරිසෙයින් සතරදෙනකු කෙරෙහි පටන්[2] කරන පොහෝයි෴

ගණපොහෝ නම්: දෙදෙනා තුන්දෙනා කරන පොහෝයි෴

පුහුල්පොහෝ නම්: [3]උදෙකලා වැ කරන පොහෝයි෴

සුත්තුද්දෙසපොහෝ නම්: පාමොක් උසුරුවා කරන පොහෝයි෴

පිරිසුදුපොහෝ නම්: ඤත්ති තබා තුන්දෙනා කරන පොහොය හා—ඤත්ති නොතබා දෙදෙනා කරන පොහොයයි෴

---

1 පියෙවි. 2 සතරදෙනකු පටන්. 3 උදෙකලා.

ඉටත්පොහෝ නම්: "අජ්ජ මෙ උපොසථො චාතුද්දසී"–කියා හෝ—"අජ්ජ මෙ උපොසථො පණ්ණරසී" කියා හෝ [1] උදෙකාලා වැ කරන පොහොයයි.

---

156. චාතුද්දසී පණ්ණරසී සාමග්ගි ච පවාරණා
තෙවාචී ද්වෙවාචී ච සංඝෙ ච ගණපුග්ගලෙ.

එතා පන මුනින්දෙන වුත්තා නව පවාරණා
පුබ්බකිච්චං සමාපෙත්වා එකාවාසෙ වසන්ති චෙ.

ඤත්තිං ඨපෙත්වා පවාරෙය්‍යුං චත්තාරො වා තයොපි වා
අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යුං විනා ඤත්තිං දුවෙ ජනා.

අධිට්ඨානෙ පනෙකොපි සෙසා සංඝ පවාරණා
එතා පන මුනින්දෙන වුත්තා නව පවාරණා.

චාතුද්දසී පවුරුණුයැ, පණ්ණරසී පවුරුණුයැ, සමඟ පවුරුණුයැ යි දවස්හෙයින් තුන්පවුරුණක් හා—තෙවාචිකපවුරුණුයැ, ද්වෙවාචිකපවුරුණුයැ, එකවාචිකපවුරුණුයැයි ක්‍රියා හෙයින් තුන්පවුරුණක් හා—සඞපවුරුණුයැ, ගණපවුරුණුයැ, පුඟුල් පවුරුණුයැයි කරන්නවුන්ගෙ වශයෙන් තුන්පවුරුණක් හා— මෙසේ නවපවුරුණෙක් වෙ.

චාතුද්දසී පවුරුණු නම්: එබඳු කරුණක් ඇතියාවැ පවුරුණු පසුබා වප අනතයේ තුදුස්වක්ද කරන පවුරුණු හෝ—නොහොත් සෙටවැනි දවස් කරන පණ්ණරසී පවුරණට කාලඟ ආදීන් බාධාවක් නොවනතෙක් අද මැ කරන චාතුද්දසී පවුරුණු ආදියයි.

පණ්ණරසී පවුරුණු නම්: පෙරවස් පස්වස් විසූවන් පස ළොස්වකට කරන පවුරුණුයි.

සමඟ පවුරුණු නම්: කාලඟයෙන් බුන් සඞයා වප මැදි පොහොයෙහි සිටැ හිලැ මැදිපොහොය දක්වා දැතුරෙහි සමඟවූ යම්දවස්—"සුණාතු මෙ භන්තෙ සංඝො අජ්ජ පවාරණා සාමග්ගී යදි සංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍ය"—යි—කියා ඤත්ති තබා කරන පවුරුණුයි.

තෙවාචික පවුරුණු නම්: "සංඝං භන්තෙ පවාරෙමි"— යනාදීන් පාඨ තුන්යලක් කියා කරන පවුරුණුයි.

ද්වෙවාචික පවුරුණු නම්: එමැලෙස දෙයලක් කියා පවරන පවුරුණුයි.

---

1 උදකාලා.

එකවාචික පවුරුණු නම්: එමැලෙස එක්යලක් කියා පවරන පවුරුණුයි.

සඝපවුරුණු නම්: පස්දෙනා කෙරෙහි පටන් වැඩි සංඝයා කරන පවුරුණුයි

ගණපවුරුණු නම්: සතරදෙනා ගණඤත්ති තබා කරන පවුරුණු හා—දෙදෙනා ඤත්ති නොතබා කරන පවුරුණුයි.

පුහුල්පවුරුණු නම්: උදෙකලාහු—"අජ්ජ මෙ පවාරණා පණ්ණරසී අධිට්ඨාමි"—කියා කරන ඉටන් පවුරුණුයි.

**නවමොභාගො—නවපවුරුණු නිමි**

---

157. ආසාළ්හිස්ස ච කාළම්හා යාව කත්තිකපුණ්ණමා
වස්සානකාලො විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

කත්තිකස්ස ච කාළම්හා යාව ඵග්ගුනපුණ්ණමා
හෙමන්තකාලො විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

ඵග්ගුනස්ස ච කාළම්හා යාව ආසාළ්හිපුණ්ණමා
ගිම්හානකාලො විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

ඍතු නම්: වස්සාන, හෙමන්ත, ගිම්හාන යන තුන් ඍතුයි.

ඇසළමස අව පෑළවියෙහි පටන් ඉල්මස මැදිපොහොය දක්වා වස්සාන ඍතුයි.

ඉල්මස අව පෑළවියෙහි පටන් මැදිම්දින මැදිපොහොය දක්වා හෙමන්ත ඍතුයි.

මැදිම්දින අව පෑළවියෙහි පටන් ඇසළමස මැදිපොහොය දක්වා ගිම්හාන ඍතුයි.

බ පො නි ව උ න කොළෙ.
වෙ ඇ බි හි දු මැ නොකොළෙ.

ගිම්හාන ඍතුයෙහිදු බග්මස අන්ත පක්ෂය හා පොසොන්මස අන්තපක්ෂය හා මෙදෙපක්ෂයේ පොහෝ චාතුද්දසීයැ. සෙසු පක්ෂයේ පොහෝ පණ්ණරසීයැ'යි දතයුතු.

වස්සාන ඍතුයෙහිදු නිකිණිමස අන්තපක්ෂය හා වප්මස අන්තපක්ෂය හා මෙදෙපක්ෂයේ පොහෝ චාතුද්දසීයැ. සෙසු පක්ෂයේ පොහෝ පණ්ණරසීයැ යි දතයුතු.

හෙමන්ත ඍතුයෙහිදු උඳුවප්මස අන්තපක්ෂය හා නවම්මස අන්තපක්ෂය හා මෙදෙපක්ෂයේ පොහෝ චාතුද්දසීයැ. සෙසු පක්ෂයේ පොහෝ පණ්ණරසීයැයි දතයුතු.

සෘතුවකට චාතුද්දසී පොහෝ දෙකෙකැ, පණ්ණරසී පොහෝ සයෙකැයි සෘතුවකට පොහෝ අටක් බැගින් අවුරුද්දකට තුන් සෘතුයෙහි සූවිසි පොහොයෙක් නම් වෙ.

**පොහෝ පවුරුණු විනිස නිමි**

---

සකුණො රූප සම්පන්නො තීණි සීසා මනොරමා
පාදනි චාදස චෙව පක්ඛානි චතු වීසති--
පුරිමා පච්ඡිමා චාපි දුවෙ වස්සූපනායිකා
ආලයොච වචීභෙදෙ කත්තබ්බා උපගච්ඡතා.

වස්සූපගමනචාපි ජානං අනුපගච්ඡතො
තෙමාසච වසිත්වාන විරතස්සාපි දුක්කටං--
උතුනම්පන තිණ්ණන්නං පක්ඛෙ තතියසත්තමෙ
චාතුද්දසොති පාමොක්ඛං උද්දිසන්ති නායකඤ්ඤුනො.

# සිඛවළඳවිනිස.

තුන්ලොවට උතුම් රුවන් තියා වැඳැ උපසපුව ලද පැවිජ්ජ පටන් [1]හික්මෙනුව වස් කළ සිඛවළඳ විනිස සැඛෙවින් කිය නෙම්.෴

1. මිනිස් අමිනිස් තිරිසන් තුන් මාගම්හුයි෴මොවුන්ගෙ වස මඟ පසමඟ මියෙ යන තුන් තුන් මඟි෴හේ තෙවෙක් වෙ෴

මිනිස් අමිනිස් තිරිසන් තුන් උභතොබ්‍යඤ්ජනකයෝයි෴මොවුන්ගෙ වසමඟ පසමඟ මියෙ යන තුන් තුන් මඟි෴හෙද තෙවෙක් වෙ෴

මිනිස් අමිනිස් තිරිසන් තුන් පඬුවෝයි෴මොවුන්ගෙ වසමඟ මියෙ යන දෙ දෙ මඟි෴හේ සයෙක් වෙ෴

මිනිස් අමිනිස් තිරිසන් තුන් පිරිමිනිහුයි෴මොවුන්ගෙ වස මඟෙ මියෙ යන දෙ දෙ මඟි෴හෙද සයෙක් වෙ෴

මෙදෙළොස් සතුන්ගෙ තිස්මඟ අතුරෙන් එක්තරු මඟෙක්හි පියැලි තුඹු[2]ආදිනෙන් වැසූයෙහි එවූ නොවැසූයෙහි එවූ පියෙවි සුළඟින් නොපහළ තෙත් පියෙස සිඛ නො පස්විතු පැවිජි තමා හඳන් වැසූයෙන් එවූ නොවැසූයෙන් එවූ සෙවුනා යිතින් තල බිජු මාත්‍රයකුද් මෙහෙයා නම් පරිජි වෙ෴සස්නෙන් නටුයෙ යැ යුතැනි෴

හඳන්හි නොනට කායප්‍රසාදඇති සම් එවූ පිළිකා එවූ මෙහෙයා නම් පරිජි වෙ෴නට කායප්‍රසාදඇති සම් එවූ පිළිකා එවූ ලොම් එවූ මෙහෙයා නම් දුකුළා වෙ෴

[3]දිමුනු මිනිසුන්ගෙ නිමිත් උපුළ තැන්හි තියපිටුසා මස් පිඩක් එවූ නහරක් එවූ ඇත එහි මෙවුන්ධම් සෙවී නම් පරිජි වෙ෴නැවත වණ සංඛෙපයෙන් ථුලැයි වෙ෴[3]දිමුනු මිනිසුන්ගෙ ඇස්වළ නැහැ තොලි මියෙ කන්සිදුරෙ වත්කොසැ සැත්ආදීන් කළ වෙණෙහි එවූ මෙවුන්රුයෙන් තලබිජුමාත්‍රයක් තමා හඳන් මෙහෙයා නම් ථුලැයි වෙ෴සෙසු කිසිලි සාළවේ ආදිය මෙහෙයා නම් දුකුළා වෙ෴

ඇත් අස් ගොන් මී ගවර ආදි සතුන්ගෙ නැහැ තොලි වත් කොස්හි මෙහෙයා නම් ථුලැයි වෙ෴හැම තිරිසතුන්ගෙ ඇස්වළ කන්සිදුරෙ වෙණෙහිදු සෙසු සිරුරෙහිදු මෙහෙයා නම් දුකුළා වෙ෴

1 හික්මෙනුවස්. 2 ආදියෙන්. 3 දිමුනු, දිමිනු.

මෙවුන්රූයෙන් බැහැර සටහරිසින් මිනිස් අමිනිස් තිරිසන් මාගම් නිමිත් තමා නිමිතින් සටා නම් ථුලැසි වෙ෴

කාසසගරායෙන් මිනිස් මාගම් නිමිත් තමා නිමිත්හිජු[1] මියෙහිජු පහරී නම් සඟවෙසෙස් වෙ෴

කාසසගරායෙන් මිනිස් පිරිමිනිනුදු හැම තිරිසනනුදු හැම සිරුරු පහරී නම් දුකුළා වෙ෴

පිළිගැණියො මාගමක ලවා සුහුයෙන් විකුම්කරවත්නම් පැවිජ්ජෙ වැජුම් එවු සියලු වන්සඳ එවු නගනසඳ එවු සිව්නාසඳ එවු ඉවසත් නම් පරිජි වෙ෴

මළ අලුත් සිරුරු නොකෑ නිමිත්හිදු මඳක් කෑ නිමිත්හිදු මෙවුන්ධම් සෙවීනම් පරිජි වෙ෴සමහර කෑ නිමිත්හිදු බොහොසු යෙන් කෑ නිමිත්හුදු මෙවුන්ධම් සෙවීනම් ථුලැසි වෙ෴ඉතාමඳ මස්ඇති නිමිත් සෙවීනම් දුකුළා වෙ෴නිමිත් මාත්‍රනබා සෙසු සිරුරු ඇති නිමිත්හි මෙවුන්ධම් සෙවී නම් පරිජි වෙ෴විගඳපත් නිමිත් ආදි සියලු සිරුරු සෙවිය දුකුළා වෙ෴කපා බැහැරහැරපී නිමිත සෙවී නම් දුකුළා වෙ෴

[2]අකාළ මියෙහි තමා හඳන් මෙහෙයා කවරි තැනෙක්හි නොපහරවා නෙරී නම් දුකුළා වෙ෴හුණු දඬු ආදී මේහෙසු නිමිත්හි තමා හඳන් මෙහෙයා කවරිතැනෙක්හි නොපහරවා නෙරී නම් දුකුළා වෙ෴උපුළු තොල් මස් ඇතී දත්හිජු තොලින් බැහැර නිකුත් දත්හිජු ඇතුළු නොවදවා මෙවුන් ධම් සෙවී නම් ථුලැසි වෙ෴ඇටසැකිලි මූළුකොට එහි මෙවුන්රූයෙන් කාසසගරායෙන් මෙවුන්ධම් සෙපී නම් සුකුරු මූඳත තුමූඳත දුකුළා වෙ෴මෙවුන්රූයෙන් මාගම සුඹුනා සිරුරු සිපගන්නා ආදී කල දුකුළා වෙ෴

අපා සතුන්කෙරේ මස්හ දිග්දැහ දීපා සතුන්කෙරේ පරෙවියහ සියුපා සතුන්කෙරේ ගොහ යටත්පිරිසෙසින් මෙවුන්ධමට මොහු වත්හුයි෴සෙවුනා සිත මඟිනි මඟ මෙහෙයීම් යන මෙහි දෙ අඟි෴මෙවුන්ධම් පරිජයට දුකුළා සාමන්තාපත්ති වෙ෴සෙසු තුන්පරිජ්ජට ථුලැසි සමන්තාපත්ති වෙ෴නොදත්හම නොඉවසන්නාහට අනාපත්ති වෙ.

෴පළමුවන පරිජි නිමි.෴

---

2. නෑ නොනෑ පරම්නිසක්හු අයත් පල්පොහොනා වතක් සොරසිත් ඇතියාවැ පස්විසි අවහාරයන් අතුරෙන් එක්තරා අවහාරයෙකින් ගනීනම් පරිජි වෙ෴මෙහි පලෙක්නම් පස්මඳමක් අමූරති෴

---

1 මියෙහිජු. 2 අකාළ.

මෙහි පස්විසි අවහාරය නම් කවරයත්:— නානාභණ්ඩ පඤ්චකයැ එකභණ්ඩ පඤ්චකයැ සාහත්ථික පඤ්චකයැ පුබ්බපයොග පඤ්චකයැ ථෙය්‍යාවහාර පඤ්චකයැ යන මේ පස්පඤ්චකයන් විසින් පස්විසි අවහාරයෝ යි෴

මෙහි නානාභණ්ඩපඤ්චක නම් කවරයත්:—**ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය** යන මෙ පසයි෴

හෙ [1]කිසෙති යත්:—

**ආදියෙය්‍ය** යනු අනුන්ගෙ අරම් ආදී ගන්නට කරන හැම සාවිසි පියොවි෴ විසිපියෝහි දුකුළා වේ෴ හිමියා විමති උපයා නම් ථුලැසි වෙ෴ නොදෙමි යන තමා ධුරනිබෙව්නිජු [2]එසිතයන හිමියා ධුරනිබෙව්නිජු පරිජි වෙ෴ එකක්හු ධුරනිබෙව් නොකළ නොවෙ෴ සටන් තුබූ වතින් පල්පොහොනා වතක් සොරසිතින් ගත පරිජි වෙ෴

**හරෙය්‍ය** යනු අනිකක්හුගෙ පිරිකර ගෙනැ යෙමින් සොරසිතින් පිරිමදී නම් දුකුළා වෙ෴ සොලවා නම් ථුලැසි වෙ෴ ඔත්ස වුත් කෙරේ නම් පරිජි වෙ෴

**අවහරෙය්‍ය** යනු මෙරමා තමාකෙරේ තුබූ පිරිකරක් හිමියා ඇරවූසඳ නොගත්මි යේ නම් අසිනාදන් පූභාබැවින් දුකුළා වෙ෴ හිමියා විමති උපයා නම් ථුලැසි වෙ෴ නො දෙමි යන තමා ධුරනිබෙව්නිජු [2]එසිතයන හිමියා ධුරනිබෙව්නිජු පරිජි වෙ෴ එකක්හු ධුරනිබෙව් නොකළ නොවෙ෴

**ඉරියා පථං විකොපෙය්‍ය** යනු බඩු ගෙනැයන්නහු හා සමග ගතැවි වැ ඉරියවු කොවන පියොවිහි දුකුළා වෙ෴ පියවරක් [3]ඉකුම්සඳ ථුලැසි වෙ෴ දෙවන පියඹර [3]ඉකුම් සඳ පරිජි වෙ෴

**ඨානා චාවෙය්‍ය** යනු අනුන්ගෙ පිරිකරක් සොරසිතින් පිරිමදී නම් දුකුළා වෙ෴ සොලවා නම් ථුලැසි වෙ෴ තැනින් උගුළුවා නම් පරිජි වෙ෴

සවිඤ්ඤාණක අවිඤ්ඤාණක මුසුවූයෙන් මේ නානාභණ්ඩ පඤ්චක නම්෴

**එකභණ්ඩපඤ්චක** නම්:-ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය යන මෙ පස්සෙසින් හුදු සවිඤ්ඤාණක වස්තු ගත එකභණ්ඩපඤ්චක නම් වෙ෴

---

1 කොසෙතියත්. 2 එසිතන. 3 ඉකුත්සඳ.

**සාහත්ථික පචක** නම් සතරයත්:—**සාහත්ථිකො, ආණත්තිකො, නිස්සග්ගියො, අත්ථසාධකො, ධුරනික්ඛෙපො** යන මෙ පසයි෴

මෙහෙ කිසෙති යත්:-

**සාහත්ථිකො** යනු මෙරමාගෙ බඩුවක් තමා අතින් තෙනා ගැන්මි෴

**ආණත්තිකො** යනු අසවල්හුගෙ බඩු තෙනාගැනැයි අනිකක්හට අණැවීමි෴

**නිස්සග්ගියො** යනු [1]සුක්වත් ගන්නා තැන් එවු අනුන්ගෙ බඩු අසෝතැනට ගියසැඳැ ගන්මියි පිරිකැපූ තැන් එවු ඉකුම්වා ගැන්මි෴

**අත්ථසාධකො** යනු අසවල්හුගෙ බඩු අසෝසැඳ තෙනා ගැනැයි අනිකක්හට අණැවූ සඳමැ ගෙ එසැඳැ නොගතහෙම් යේ නම් යම්තාක් තා යෙහෙන සැඳැ ගැනැයි අණැවූව හෙ [2]එකත්තෙන් ගනීනම් අණැවූවාහට අණැවූ කෙණෙහි පරිජි වෙ෴මෙරමාහට ගත් කෙණෙහි පරිජි වෙ෴

නොහොත්—මෙරමාගෙ තෙල්සැළ ආදිය පලක් අගනා තෙල්බොන වහන් ආදී සොරසිතින් බහාලානම් අතින් මූත් කෙණෙහි පරිජි වෙ෴

**ධුරනික්ඛෙපො** යනු අරම් ආදී ගන්නා තැන්හිදූ තමාකෙරේ තුබූ පිරිකරක් නොගත්මී ගන්නා තැන්හිදු තවුකැලිකොට ගත්තා නොදෙන තැන්හිදු තමා නොදෙමි යන ධුර තිබෙව්තිජු එසිතයන හිමියා ධුරතිබෙව්තිජු පරිජි වෙ෴එකක්හු ධුරතිබෙව් නොකල තො වෙ෴මේ සාහත්ථික පචක නම්෴

**පුබ්බපයොගපචක** නම්:-**පුබ්බපයොගො, සහපයොගො, සංවිදාවහාරො, සඞ්කෙතකම්මං, නිමිත්තකම්මං** යන මෙ පසයි෴

මෙහෙ කිසෙතී යත්:-

**පුබ්බපයොගො** යනු අසවල්හුගෙ බඩු තෙනාගැනැයි අණැවූසඳ අණවන ලද්දහු [2]එකත්තෙන් ගනුත් අණැවූවාහට අණැවූ කෙණෙහි පරිජි වෙ෴ගත්තාහට ගත්කෙණෙහි පරිජි වෙ෴

අත්ථසාධක පුබ්බපයොගයෙහි [3]නනස මෙ කියන සෙයින් දන්නෙ:—අණවන ලද්දහු ගන්නා පෙරටවමෙ අණැවූවාහට පරිජි අත්ථ සිඩවන බැවින් අත්ථසාධක නම්෴අණවන ලද්දහු ගන්නා පෙරමවැමෙ අණවූවාහට පරිජි වන බැවින් පුබ්බපයොග නම් වෙ෴

---

1 සු·වත්. 2 එකත්තෙත්. 3 වෙනස.

**සහප්පයොගො** යනු අනුන්ගෙ අරම් ආදි කෙත් ආදි බිම් වඩා ගන්නට කරන පියොල්හි අවසන් පියොව් හා සමඟ පරිජි වෙ෴ හෙ දෙදෙනා ධූරනිබෙවින් වෙ෴

**සංවිදාවහාරො** යනු අසවල්හුගෙ බඩු තෙනාගනුම්හයි අනුන් හා සැසැඳැ ගැන්මී෴ මෙසෙයින් සැසැඳැ ගියවුන් අතුරේ එකක්හිජු එබඩු ඇන්සවුන්කළ හැම ජනයනට පරිජි වෙ෴

**සඞ්කෙතකම්මං** යනු පෙරවරු පස්වරු ආදි කල්හි අසවල් හුගෙ බඩු අසෝ සැඳැ තෙනාගනැයි කියන ලද්දේ සකුල් නොවරදවා ගනී නම් සකුල්කළහට සකුල්කළ කෙණෙහි පරිජි වෙ෴ ගත්තාහට ගත්කෙණෙහි පරිජි වෙ෴

**නිමිත්තකම්මං** යනු ඇසින් තරු බැම නඟන ආදී මාකළ සැඳැ අසවල්හුගෙ බඩු තෙනාගනැයි කියන ලද්දෙ කළ නිමිත් නොවරදවා ගනී නම් නිමිත්කළහට නිමිත්කළ කෙණෙහි පරිජි වෙ෴ ගත්තාහට ගත්කෙණෙහි පරිජි වෙ෴ මේ පුබ්බ පයොග පඤ්චක නම්෴

**ථෙය්‍යාවහාරපඤ්චක** නම් කවර යත්:—**ථෙය්‍යාවහාරො, පසය්හාවහාරො, පරිකප්පාවහාරො, පටිච්ඡන්නාවහාරො, කුසාවහාරො** යන මෙ පසයි෴

හෙ කිසෙති යත්:—

**ථෙය්‍යාවහාරො** යනු උමං බිඳුනා ආදී කොටින් ගනී එවු තුලාකූට මානකූට ආදීවිසින් වඤ්චනා කොටින් එවූ කූළු කහවණු ආදී පෙරළන විසින්.එවු වඤ්චනා කොටින් ගනී නම් පරිජි වෙ෴

**පසය්හාවහාරො** යනු ගම්වොලෝගන්නවුන්සෙයින් පරු අයත් යුහුයෙන් ගනී එවු ගතයුතු කරව්වරින් වඩා ගම්ළද රුජහටයන්සේ ගනීඑවු පරිජි වෙ෴

**පරිකප්පාවහාරො** යනු තෙනන්නට වැදූ පිළීවුව ගන්මි හුවුව නොගන්මි පිරිකපා පීවා නඟාගත් නම් එහි පිළිවුව ඇන්සවුන් කෙණෙහි පරිජි වෙ෴ හුවුව නොවෙ෴ ගෙනැ සිටැ හුබව් දූන ලද්දෙක්මැ මැනැවි නොවෙයි ගෙනැයේ නම් පළමු පියවර ථුලැසි වෙ෴ දෙවන පියවර පරිජි වෙ෴ බිමැ තබා හුබව් දූනැ ගනීනම් ඇන්සවුන් කෙණෙහි පරිජි වෙ෴ හුබව් නොදත් සඳ සොරු සොරු යි අනුබඳනා ලද්දේ පියා පලාගේනම් පරිජි නොවෙ෴ හැම පියෝ හි දුකුළාවෙ෴ පියා පලාගියා හිමියෝ දූනැ ගතිත්නම් මැනැවි෴ අතිකක්හු දූනැ ගත බඩුදීම් වෙ෴

අනුන් නොගත හිමියන් ධුරනිබෙව් නොකොට ගිය පුත තෙමෙමැ අවුදු සොරසිතින් ඒන්සවුන් කොරෙනම් පරිජි වෙ෴සකසඤසැයෙන් පසුල් සඤසැයෙන් ගත ඇවැත්නැති෴බඹුදීම් වෙ෴ධුරනිබෙව් කොටින් ගියා ගනී නම් බඹුදීම් මතුවෙ෴

෴මේ භණ්ඩ පරිකප්ප නමි෴

---

බඹුදීම් නම්—එමැ බඹු හෝ බඹුවටනා මිල හෝ දියැ යුත් තේසි෴

පුත එක්කෙනෙක් අනුන්ගෙ පිරිකර ගෙනැ අසෝනැනට ගියසඳ ගන්මි පිරිකෂා අනුන් දුට දී නොදුට නොදී පිරිකැපූ තැන් ඉක්මවත් නම් පරිජි වෙ෴

මේ ඔකාසපරිකප්ප නමි෴

෴මෙ කීසෙසින් භණ්ඩපරිකප්ප ඔකාසපරිකප්ප දන්නෙ෴

**පටිච්ඡන්නාවහාරෙ** යනු අනුන්ගෙ මුදු ආදී දැකැ ඔවුන් ධුරනිබෙව් නොකළා සොරසිතින්[1] පරණලා ආදියෙන් පිළිසොයා නම් දුකුළා වෙ෴සොලවා නම් ථුලැසි වෙ෴ඒන්සවුන් කොරෙ නම් පරිජි වෙ෴පසුල් සඤසැයෙන් එවු සකාසඤසැයෙන් එවූ ඒන්සවුන්කොරෙ නම් ඇවැත්නැති෴බඹු දීම් වෙ෴ධුරනිබෙවු කළ සොරසිතින් ගත පරිජිනැති—දුකුළාවෙ෴බඹු දීමුදු වෙ෴ හිමියෝ දැකැ අරවත් නම් දියැයුත්තේසි෴නොදුත දෙදෙනා ධුරනිබෙව්තිජු පරිජි වෙ෴මුදු ආදී පියා ඉල්වා නොදැකැ ධුරනිබෙව් නොකොැට ගියා පැවිජි සොරසිතින් එතැනැමැ ගලා මතු කෙළවර පාත්පමුණුවා ඒන්සවුන්කොරෙ නම් පරිජි වෙ.

**කුසාවහාර** නම් කුසපත්ලා සිවුරු ආදී බෙදනසැඳැ තමාගෙ බොහො වටනා කොටසකුදු පෙරළිකොටැ මෙරමාගෙ පල් පොහොනා කොටස තෙනා ගතැවීවැ තමාගෙ කොටස කුසපත් නගා මෙරමාගෙ කොටස ලූසැඳැ පරිජි නැති෴නැවැත මෙරමාගෙ කොටස කුසපත්නගා අතින් ගත්සැඳැ පරිජි වෙ෴පළමු මෙරමාගෙ කුසපත් නගා ගනී නම් තව පරිජි නැති෴තමාගෙ කොටස ලූසැඳ තමාගෙ කොටසින් කුසපත් නගා ගත්සැඳැ පරිජි නැති෴මෙරමාගෙ කොටස ලනසැඳැ අතින්මුත් කොණෙහි පරිජිවෙ.

මේ ථෙය්‍යාවහාරපමකනම්-

෴පස්විසිඅවහාර නිමි෴

---

සකාසඤසැයෙන් ගත අනාපත්ති වෙ෴විස්වසින් ගතද තාව් කැලිකොට ගතදු යක් ජේ පිසස් තිරිසතුන් අයත් ගතදු පසුල් සඤසැයෙන් ගතදු උම්තුආදිවැ නො දැනැ ගතදු අනාපත්ති වෙ෴

---

1 පරඹලා.

අනික් මිනිස් සතක්හු අයත්බැව මෙරමා අයතැයි දන්නා බැවැ වත් පල්පොහොනා බැවැ සොරසිත් ඇතිබැවැ කී පස්විසි අවහාරයන් අතුරෙන් එක්තරා අවහාරයකින් ගත් බැවැ යන මේ අසිනාදන් පරිජ්ජෙහි පසඟි෴

෴අසිනාදන් පරිජි නිමි෴

---

3 මිනිස්සතක්හු මව්කුසැ පිළිසැඳගත් දවස් [1]පමා තවත හඹන බෙහෙද් දෙන ආදි පියොවින් මරු නම් පරිජ්වේ෴

ගොරොක් මුත් සැඳැපටා සාහත්ථික නිසසග්ගිය ආණත්තික ථාවර විජ්ජාමය ඉඩිමය යන මෙ සපියොවුන් අතුරෙන් එක්තරා පියොවකින් මරුනම් පරිජි වෙ෴

මෙහි සාහත්ථික පියෝ නම් කවරයත්—කයින් එවු සිරිරින් නොමුඳා කා පිළිබද්දෙන් එවු පැහැරැ මිනිස්සතක්හු මරු නම් පරිජි වෙ෴

මෙහි නිසැගි පියෝ නම් කවරයත්—සිරිරින් මුඳා කයින් එවු කා පිළිබද්දෙන් එවු මරා නම් පරිජි වෙ෴යමක්හු අවක්සා පහළ ඔහුමැ මළ පරිජි වෙ෴සෙස්සන්• මළ පරිජි නො වෙ෴යම් කවරිවෙක් මියෙවයි පහළ මොහු පහළ යම් කවරිවකු මෙළෙයින් පරිජි වෙ෴එවිහස එවු කලාතුරකින් එවු එ පහරින් මෙ මියේ නම් පහළ කෙණෙහි මැ පරිජි වෙ෴

ආණත්තිකපියෝ නම් කවරයත්—වත් කල් ඔවස් ආයුධ ඉරියවු කිරිම් වෙසෙස යන මෙසෙයින් සවැඳැරුම් වෙ෴

මෙහි වත් නම්—මැරියු පුගුලි෴අසවල්හු මරවයි ඇණැවූ සැඳැ ඔහුමැ මරු නම් ඇණැවූවාහට ඇණවූ කෙණෙහි පරිජ් වෙ෴මැරැවාහට මැරූකෙණෙහි පරිජි වෙ෴අනිකකු මැරැව ඇණැවූයේ මුස්සි෴මැරැවාහට පරිජි වෙ෴මා මරුයි ඇණවුව ඇණැවූවාහට දුකුළා වෙ෴

කල් නම් පෙර බත් ආදි කලි෴අද පෙරවරු මරුයි ඇණවතලද්දේ ඔහු ඇණැවූසේ මරු නම් දෙදෙනාහට මැ පරිජි වෙ෴කීවේලා ඉකුම්වා අනික් වේලෙහාමැ මරු නම් ඇණැවූවා හට පරිජි නැති෴ දවස් මස් හවුරුද්දෙහිදු මෙ මැ නියෙ෴

ඔවස නම්: අසවල් තැනදී මරුයි සථාන නියමකිරීම් ෴

ථාවර නම්: නොහසුරු නම් වන [2]උවාරණින් මැරීම්෴හේ අනෙකකු මැරියැවිවැ වළ කණන වස භෝජන කඩුආදී එළවා තබන රූසදආදි එළවන මරණෙහි ගුණ කියන මරන්නහට [3]උවා දෙන ආදි විසින් නොඑක් ප්‍රකාරයි෴

---

1 පටත්. 2 උවාමරණීන්-හැම. 3 ඔවා.

අසවල් මිනිස් මියේවායි වල කැණීනම් හැමපියොවිහි මෙ දුකුළා වෙ෴ ඔහු එහි හී දුක් විඳුත් ථුලැසි වෙ෴ මළ පරිජි වෙ෴ අතිකකු මළ ඇවැත් නැති෴ එක්තරා මිනිසෙක් මෙහි හී මියේවයි කැණිය එක්තරා මිනිසෙක් එහි හී මෙළේ නම් පරිජි වෙ෴ යක් පේ පිශාචයන් අවක්සා කැණිය කණනා හැම පියොවිහි දුකුළා වෙ෴ ඔවුන් එහි හී දුක් විඳුත් දුකුළා වෙ෴ මළ ථුලැසි වෙ෴ තිරිසතුන් අවක්සා කැණිය කණනා හැමපියොවිහි දුකුළා වෙ෴ ඔවුන් එහි හී දුක් විඳුත් දුකුළා වෙ෴ මළ පචිති[1] වෙ෴

වසයෙජිම් ආදියෙහි වළකැණීමෙහි ශීසෙයින් විනිස දන්නෙ෴

විජ්ජාමය නම්: මරන්නට මතුරැ ජැපීම්෴ ජපනා සැඳැ හැම කාවිසි පියොවිහි දුකුළා වෙ෴ මෙරමා දුක් විඳුනා සැඳැ ථුලැසි වෙ෴ මළ පරිජි වෙ෴

ඉධ නම්: කම් විචා ඉධසි෴ මෙරමා මරන්නට දළ කොළනා දැහැවැ මුහුණු බලනා ආදි පියොවිහි දුකුළා වෙ෴ මෙරමා දුක් [2]විඳුත් ථුලැසි වෙ෴ මළ පරිජි වෙ෴

෴ සාහත්ථිකා ආදි සපියෝ විනිස නිමි ෴

මරනසිත් නැත්තාහට අනාපත්ති වෙ෴ නොදන්නාහටද මරනසිත් නැත්තාහටද උමතු ආදීනටජු අනාපත්ති වෙ෴

මිනිස් සතකුබැවැ සතෙකැ යන සඤ් ඇති බැවැ මරම් යන සිත්ඇති බැවැ මරනා පියෝ ඇතිබැවැ එපියොවින් [3]චුත වීමැ යන මේ මිනිස්විකා පරිජ්ජේහි පසඟි.

෴ මිනිස්විකාපරිජි නිමි ෴

---

4 තමා කෙරෙහි නැති පයමඛිත් තමා කෙරෙහි ඇතී එවූ සමචජම් සමවැජිම් [4]සමවජන්නෙම් එවූ අනික් මිනිස්සතක්හට බුහුමන් කැමැති සිත්නෙන් පරියා මුඳා ඉදුරා කිව [5]වැළුැතැසිමැ මොහු දන්වම්යන මිනිසුන් එවිගස දත පරිජි වෙ෴ නොදත, ලසා දත ථුලැසි වෙ෴ නොමිනිස් සතක්හට ඉදුරාකිව ඔහු එවිගස දත ථුලැසි වෙ෴ නොදත, ලසා දත දුකුළා වෙ෴ දුතියජ්ඣාන ආදි ලොවී ලොවුතුරා උතුරැ මිනිස්ධම් කීමෙහිදු මෙමැ නියෙ෴

---

1 පරිජ්.
2 විඳුනා සඳ.
3 සතුත් මියයාම.
4 සමවත්නෙම්.
5 වැළඅතසිමැ.

පරියායෙන් කියැව්වැ තාගෙ සෙනෙස්නෙහි වසන පැවිජ්ජෝ පය්මක්ඛන් ලදහ යනාදි විසින් කිව මෙරමා එවිගස දත ථුලැසිවෙ෴නොදත, ලසා දත දුකුළා වෙ෴ලදිම් යන අධිමනින් කිව අනාපත්ති වෙ෴

නොකියැවිවැ කිවද උමතු ආදීනටද අනාපත්ති වෙ෴ ඣානාදි ධර්මයන් තමා කෙරෙහි නැතිබැවැ බුහුමන් කැමැතිවැ ඇරැජීමැ අරොජන නෙතැත්තවූ මිනිස්බැවැ පරියාය මුඳැකිමැ ඔහු එකෙණෙහි දැන්මැ යන මේ උතුරුමිනිස්ධම් පරිජ්ජෙහි පසඟි෴

**උතුරු මිනිස්ධම් පරිජි විනිස නිමි.**

**෴සතරපරිජි විනිස නිමි෴**

---

5 නොනිඳන සඳ සුකුරුම්දියැවි සිතින් අදඇති බැහැරි වත්හි සවිඤ්ඤාණ අවිඤ්ඤාණ එක්තරා වතෙක්හි තමා හඳන් තෙමෙ ඝටා එවු අනුන්ලවා ඝටවා එවු සුකුරු මිදුව සඟවෙසෙස් වෙ෴මිදියැවිසිත්නෙන් කළ නැත නොමුත ථුලැසි වෙ෴ මුඳන රිසි නැත්තා හට මිදෙනසඳ එවු මුත්සැඳැ එවු ආසවාද ඉපැදුවුව ඇවැත් නැති෴

මෙවුන්රැයෙන් මාගම් පහරනා සිපගන්නා ආදී කළසැඳැ සුකුරුමුත ඇවැත් නැති෴මාගම පැහැරීම් ආදි පසයෙන් දුකුළා වෙ෴කාසසඟරැයෙන් මාගම් වෙර පහරන ආදි කළසැඳැ සුකුරු මුත ඇවැත් නැති෴පහළ පසයෙන් වන ඇවැත් මත්තේ කාස සඟරැ ඇවැත කියමො෴

කාසන රිසින් හඳන් කාසන සැඳැ සුකුරුමුත ඇවැත් නැති෴ මාගම් හඳන් ආදි බලනසැඳැ සුකුරුමුත ඇවැත් නැති෴රැසිතින් හඳන් බැලූපසයෙන් දුකුළාවෙ෴මාගමහා නොරඹුරේ හිඳිනා ආසවාදයෙන් හුන්සැඳැ සුකුරු මුත ඇවැත් නැති෴හුන් පසයෙන් පචිති වෙ෴

මාගමට තුළුල් තෙපුල් කිසැඳැ සුකුරු මුත ඇවැත් නැති෴ තෙපුල්පසයෙන් වන ඇවැත් මත්තේ දුවුල්වසු සඟවෙසෙසමැ කියමු෴

නැයන් මා නැයහ යන සඤ්ඤායෙන් පහළසඳ සුකුරුමුත ඇවැත් නැති෴පහළ පසයෙන් දුකුළා වෙ෴

මාගමකෙරෙන් අළ මල් පලු ආදී රැසිතින් පිරිමටසඳ සුකුරුමුත ඇවැත් නැති෴පිරමට පසයෙන් දුකුළාවෙ෴මුඳනරිසි නැති සැඳැ සුකුරුමුතද සිහින දක්නා සඳද උමතු ආදීනටද ඇවැත් නැති෴

**෴සුක්විසැටි සඟවෙසෙස්විනිස නිමි.෴**

6 කාසසගරායෙන් මිනිස් මාගමකෙරේ මාගම යන සඤ්ඤ ඇතියා වැ පහරනා සිතින් කයින් කාහි පහරී නම් සඟවෙසෙස් වෙ෴

මිනිස් මාගමකෙරේ මාගම යන සඤ්ඤ ඇතියා වැ තමා [1]කය ඇ කා පිළිබද්දෙන් පහරී එවු තමා කා පිළිබද්දෙන් ඇ සිරුරු පහරී එවු ථුලැසි වෙ෴ මිනිස් මාගමකෙරේ නොමිනිස් මාගම යන සඤ්ඤ ඇතියාවැ එවු පඬුයෙකු තිරිසනෙකු පිරිමිනියෙකු යන සඤ්ඤ ඇතියා වැ එවු මාගම හෝ නොමාගම හෝ යන විමති ඇතියා වැ එවු කයින් කාහි පහරී නම් ථුලැසි වෙ෴ කයින් කා . පිළිබද්දෙහි එවු කා පිළිබද්දෙන් කාහි එවු පහරී නම් දුකුළා වෙ෴ මිනිස් මාගම කා පිළිබද්දෙන් තමා කා පිළිබද්දෙහි එවු නිසග්ගෙන් කාහි එවු කා පිළිබද්දෙන් එවු නිසග්ගෙන් නිසග්ගෙහි එවු පහරී නම් දුකුළා වෙ෴ යක් පේ පඬු තිරිසනුන් පිරිමිනිහුදු කාහි එවු කා පිළිබද්දෙන් එවු නිසග්ගෙන් එවූ පහරී නම් දුකුළා වෙ෴

මාගම තමා පහරනා සැඳැ තෙමෙ නොසෙලවී ඉවසා නමුදු මාගම තමහට ඔකඳ කරන සැඳැ හවා පලවමි යන සිතින් පහළ සඳදු නොජැනැ පහළවාහටදු උමතු ආදීනටදු ඇවැත් නැති෴

ගොරොක්මුත්සඳපටා මිනිස් මාගම කෙරේ මාගම යන සඤ්ඤ ඇතිබැවැ කාසසගරු ඇතිබැවැ පහරනට මිනිස් පියෝ ඇතිබැවැ එපියොවින් ඇ පහළබැවැ යන මේ කාසසගරු සඟ වෙසෙස් පසගි෴

෴ කාසසගරා සඟවෙසෙස් විනිස නිමි. ෴

---

7 තුළල් තෙපුල් කියැවිරුයෙන් නාමනාදන්නා මිනිස් මාගම කෙරේ මාගම යන සඤ්ඤඇතියා වැ වසමඟ පසමඟ මෙවුන්ධමු තුදු අරහයා තුළල් තෙපුල් කියා නම් හිවිගිය මස් ඇත්ති යැයි එවූ මුසුවූ හඳන් ඇත්තියැයි එවු දෙහඳන් ඇත්තියැයි එවු හවා නම් ඇ එවිගසදත සඟවෙසෙස් වෙ෴ නොදත, ලසාදත ථුලැසි වෙ෴ මෙහි වසමඟ පසමඟ හෙතුයැ නො හෙතුයැ සුවඳ විගඳ යනාදි ගුණ අගුණ විසින් කිව තුළල් තෙපුල් වෙ෴

මෙවුන්ධම් නොදෙහි නොලබමොනොයි කීසැඳැ නො පහද නී පහන් සැඳැ මෙවුන්ධම් ලබමොනොයි කීසැඳැ මෙවුන්ධම් දුන දෙවියො පහදිති යනාදි විසින් මෙවුන්ධම යන තෙපුල් හා මුසු කොට කීසැඳැ තුළල් තෙපුල් වෙ෴ හිවී ගිය මස් ඇත්තීයැ මුසුවූ

---

[1] කයින්.

හඳන් ඇත්තීයැ දෙහඳන් ඇත්තීයැ යන මේ තුළුල් තෙපුල් අතුරෙන් එක්තෙරෙකින් තුළුල් තෙපුල් රුයෙන් ගැවුව තුළුල් තෙපුල් වෙ.෴ එක් තුළුල් තෙපුලක් නො එක් මාගම්නට කියා නම් මාගම් ගණනින් සඟ වෙසෙස් වෙ.෴ එක් මාගමකාටද බොහො තුළුල් තෙපුල් කියා නම් තෙපුල් ගණනින් සඟ වෙසෙස් වෙ.෴

මිනිස් මාගමකකෙරේ මාගමක හෝ නොමාගමක හෝ යන විමති ඇතියා වැ එවු යක්පේ පඬු තිරිසන් යන සඤ්ඤ ඇතියාවැ එවු වසමඟ පසමඟ ඇ සපද අතුරෙන් එක් තෙර පෙදෙකින් තුළුල් තෙපුල් කියා නම් හො එවිගස දත්නම් ඵුලැසි වෙ.෴ නො දත, ළසා දත දුකුලා වෙ.෴ යක්පේ පඬුවන් කෙරේ යැකින්නකැ පේතියකැ පඬියෙකැ යන සඤ්ඤයෙන් වසමඟ පසමඟ ආදී අරහයා තුළුල් තෙපුල් කිව ඔවුන් එවිගස දත ඵුලැසි වෙ.෴ නොදත, ළසා දත දුකුලා වෙ.෴ මේ යක් ආදීන් කෙරේ විපරිත සඤ්ඤයෙන් තුළුල් තෙපුල් කිව ඔවුන් එවිගස දත නොදත දුකුලා වෙ.෴ මිනිස් මාගම වසමඟ පසමඟ තබා, අකුයටින් යට දණින් මත්තේ තුළුල් තෙපුල් කියැවි රුයෙන් ගුණ අයුණු කිව ඇ එවිගස දත ඵුලැසි වෙ.෴ නොදත, ළසා දත දුකුලා වෙ.෴

අකුයටින් මත්තෙහිදු දණින් පාත්හිදු ඇ කාපිළිබඳ්ජෙහිදු ගුණ අයුණු විසින් තුළුල් තෙපුල් කිව ඇ එවිගස දත නොදත දුකුලා වෙ.෴

ඔවා දෙමින් එවු බණකියමින් එවු තුළුල් තෙපුල් කියා නමුදු උමතුආදීනටදු ඇවැත් නැති.෴

මිනිස් මාගමක බැවැ මාගම යන සඤ්ඤ ඇතිබැවැ තුළුල් තෙපුල් කියන රු ඇතිබැවැ එරුයෙන් තුළුල් තෙපුල් ඇතිබැවැ ඇ එවිගසදත් බැවැ යන මේ දුටුල් වසු සඟ වෙසෙසැ පසඟි.෴

### ෴ දුටුල්වසුසඟවෙසෙස් විනිස නිමි ෴

---

8 මෙවුන්ධම්රුයෙන් මිනිස් මාගම කෙරේ මාගම යන සඤ්ඤ ඇතියා වැ තමහට මෙවුන් ධමින් මෙහෙකිරීමෙහි ගුණ කියා නම් ඇ එවිගස දත සඟවෙසෙස් වෙ.෴ නොදත, ළසාදත ඵුලැසි වෙ.෴ යක්පේ පඬුවන් කෙරෙහි යැකින්නකැ පේතියකැ පඬියෙකැ යන සඤ්ඤයෙන් තමහට මෙවුන් ධමින් මෙහෙ කිරීමෙහි ගුණකියා නම් ඔවුන් එවිගස දත ඵුලැසිවෙ.෴ නොදත ළසා දත දුකුලා වෙ.෴

මේ යක් ආදීන් කෙරෙහි විපරීතසඤ්ඤයෙන් මෙවුන් ධමින් මෙහෙ කිරීමෙහි ගුණ කියා නම් ඔවුන් එවිගස දතද නොදතද දුකුළා වෙ෴සිවුරුආදි වත්කැමින් මෙහෙකිරීමෙහි ගුණ කියා නම් මෙ සිඛයෙන් ඇවැත්නැති෴නොනැ නොපැවැරුවන් කෙරෙහි ගුණ කිව අඤ්ඤතිකාවිඤ්ඤතාහි සිඛයෙන් දුකුළා වෙ෴

උමතු ආදීනට ඇවැත්නැති෴මිනිස් මාගමක බැවැ මාගම යන සඤ්ඤ ඇතිබැවැ තමහට මෙවුන් ධමින් මෙහෙ කිරීමෙහි ගුණ කියැවි රා ඇතිබැවැ එරායෙන් ගුණ කිමැ ඈ එවිගස දැන්මැ යන මේ අත්තකාම පාරිවරිය සඟවෙසෙසැ පසඟි෴

෴අත්තකාම පාරිචරිය සඟවෙසෙස් විනිස නිමි.෴

9 නැ නොනැ මිනිස් මාගමක විසින් එවු පිරිමිනියක්හු විසින් එවු කෙළෙස් පිළිබැදි කොටින් කි හසුන් පිළිගෙනැ හසුන් දුන් තෙනැ මාගමකට එවු පිරිමිනියක්හට එවු ඔව්නට එකැත් තෙන් කියන අනික් කෙනෙක්නට එවු කියනු හෝ කියවනු කොටින් පුන ඇරැ තමා කියනු එවු අනිකකුලවා කියවනු එවු කළ මෙතුන් අඟින් සඟවෙසෙස් වෙ෴

මෙහි තුනඟ නම්: කීහසුන් පිළිගන්නෙයැ කීතෙනට පිළිපයන්නෙයැ පුන ඇරැ අසුන් කී තැනට ඇරැ ඇරොජීමයැ යනමෙ තුනඟි෴මෙහි දෙ අඟින් ථුලැසි වෙ෴එක් අඟින් දුකුළා වෙ෴යක්පේ පඬුවන් කෙරේ තුන් අඟින් ථුලැසි වෙ෴දෙ අඟින් එක් අඟින් දුකුළා වෙ෴

කලහකොට නොපීවවුන් සමඟ කළ ඇවැත් නැති෴මහසැ මහබෝ සඟ ගිලන්පැවිජ්ජන්ගෙ හසුන් ගෙනැයතුදු උමතුආදීනටදු ඇවැත් නැති෴

මාගම්පිරිමිනින් මිනිස්බැවැ මාගම්පිරිමිනිහු නොපිළිබැදි බැවැ හසුන්පිළිගත්බැවැ ඇරැපිබැවැ පුන ඇරැ ඇරැජූබැවැ යන මෙ සසුරැතුසඟවෙසෙසැ පසඟි෴

෴සසුරැතුසඟවෙසෙස් විනිස නිමි.෴

10 අමූලුසඟවෙසෙසැ සූවිසිපරිජි දතයුතු. හෙ කිසෙනි යත්?

මාගම්පැවිජ් කාසසඟරායෙන් තෙත්තී තමා අකුඇවින් යම දණින් මත්තේ කාසසඟරායෙන් තෙත් පිරිමිනිහු කයින් කාහි පහරනා ඉවසා එවු තමාගෙ සිරිරින් ඔහු පහරී එවු පරිජ් වෙ.

෴මේ උබ්භජාණුමණ්ඩලිකා පරිජි නාම.෴

සස්නෙහි සිටැ පරිජිඅවන් අතික් මාගම්පැවිජ්ජකගෙ පරිජි ඇමැක් නොමො දැනැ පිළිසොයානම් අන්නට නො කියම් බුරතිබෙව් කළනම් පරිජි වෙ෴

෴මේ වජ්ජපටිච්ඡාදකපරිජි නම්෴

මාගම්පැවිජි උබෙව්නීකම් කළ පැවිජ්ජි ලද ගෙනැ ඔහු අනු වැ සිටැ සැතනිසතරවනකම්වදන් කියවනතාක් නොපියා නම් පරිජි වෙ෴

෴මේ උක්ඛිත්තානුවත්තකාපරිජි නම්෴

කාසසගරුයෙන් තෙත් මාගම්පැවිජි කාසසගරුයෙන් තෙත් පිරිමිනිහු අතගැනුම් ඉවසා එවු සිවුරෙහි ගැනුම් ඉවසා එවු ඔහු වැළැනැ සිටිනම් එවු වැළැනැ සිටැ බෙණේනම් එවු ඔහු කී තැනට යේ නම් එවු තමාකරා ඔහු ඊම් ඉවසා නම් එවු ඔහු හා පිළිසන් තැනට වදීනම් එවු තමා සිරුරැ ඔහු කරා එළවානම් එවු මෙ අටවත් සපිරුණුසඳ පරිජි වෙ෴

෴මේ අඨවත්ථුකාපරිජිනම්෴

මාගම්පැවිජි ගිහි වියැටි වැ හෙළ පිළි හඳීනම් පරිජි වෙ෴

෴මේ රුස්වා [1]හෙළිහන් පරිජි නම්෴

මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, සංඝභෙදක, ලොහිතුප්පාදක, පණ්ඩක, උභතොබ්‍යඤ්ජනක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, භික්ඛුනීදූසක, තිරච්ඡානගත යන මේ එකොළොස් [2]අභබ්බපුගුලෝයි෴ මෙහි මාතුඝාතක නම් තෙමෙ මිනිස්වැ මිනිස්මවක මැරූයේයි෴ පිතුඝාතක නම් තෙමෙ මිනිස් වැ මිනිස්පියකු මැරූයේයි෴ අරහන්තඝාතක නම් තෙමේ මිනිස් වැ මිනිස්රහතකු මැරූයේයි෴ සංඝභෙදක නම් තෙමෙ උපසපන් පැවිජි වැ සමගසඟහු බින්නේයි෴ ලොහිතුප්පාදක නම් දුෂ වැ වධකසිතින් බුදුන් සිරිරින් ලේ සෙලවූයේ යි෴ පණ්ඩක නම් නොමාගම් නොපිරිමිනි නිපුසඳු බිජු හැරූ නොපිරිමිනි කෙළෙ සිඳූ෴ උභතොබ්‍යඤ්ජනක නම් මාගම්පිරිමිනී දෙහඳන් ඇත්තෝයි෴ ථෙය්‍යසංවාසක නම් පැවිජිනොතකුන් තුදුන් [3]තක ගෙනැ සෙරියෙන් හෙරණපැවිජිවූ ලිංගත්ථෙනකයෑ, ඇජුරන් විසින් හෙරණපැවිජිකරනලදු වැ [4]පිළිගනු කැපකරනු ආදි මාළු පැවිජි කිස කළ සංවාසත්ථෙනකයෑ, යන මෙදෙන සමග කළ උභයත්ථෙනකයෑ යන මෙසෙයින් ථෙය්‍යසංවාසකය තුන්වැදෑරුම් වෙ෴ තිත්ථියපක්කන්තක නම් මාළුපැවිජියෙහි සිටැ තිථියන් ගෙ ලද ගෙනැ ඔවුන්ගෙ වෙස් ගත්තෝයි෴ භික්ඛුනීදූසක නම් [5]පුවතත් මාගම්පැවිජ්ජ තුන්මග අතුරෙන් එක්තරා මගෙනැ මෙවුන්දම් සෙවියේයි෴ තිරච්ඡානගත නම් නාරදගුරුළු ආදි තිරිසන්හුයි෴

---

1 පිළිගත්. 2 අභබ්බපුග්ගලයෝයි, අභව්‍යපුගුලෝයි. 3 කා. 4 පිළිගන්වනු. 5 පුම්තක්.

මේ මාතුඝාතකාදී එකොළොස් අභව්‍යපුගුලනට සෙරණ පැවිජ්දු නැති෴

---

මොලොක්පිටුපරිජ් ලම්බිපරිජ් මියෙන්ගන්නාපරිජ් මෙරමා නිමිත්ගිදිනාපරිජ් ජ යන මෙ සතරඅනුලොම්පරිජ් නම්෴

මොලොක්පිටුඇත්තේ තමාහදන් තමාමියෙන් ගනී එවූ තමාවසමගැ මෙහෙයා එවු පරිජ් වෙ෴

෴මේ මොලොක්පිටුපරිජ් නම්෴

දික්හදන් ඇත්තේ තමාහදන් මියෙන්ගනී එවු වසමගැ මෙහෙයා එවු පරිජ් වෙ෴

෴මේ ලම්බි පරිජ් නම්෴

අනිකක්හු නිදන්තහුගෙ එවු මළාක්හුගෙ එවු හදන් පැවිජ් තමා මියෙන් ගනීතම් පරිජ් වෙ෴

෴මේ මියෙන්ගන්නා පරිජ් නම්෴

අනිකක්හු නිදන්තහුගෙඑවු නොනිදන්තහුගෙඑවු තම්ම ණාවූනිමිත් තමාගෙ වසමගින් ගිදීතම පරිජ් වෙ෴

෴මේ මෙරමානිමිත්ගිදිනාපරිජ් නම්෴

මෙහි කී මෙවුන්ධම්පරිජ්ජ අදින්නාදන්පරිජ්ජ මිනිස්විනා පරිජ්ජ උතුරුමිනිස්ධම්පරිජජ යන සතර හා මෙ කී අනුලොම් පරිජ් හා මෙ සූවිසි පරිජ්෴

දකුම් ඇසුම් සැකකිරීම් නැතියා වැ උපසපන්පැවිජ්ජක්හු සස්නෙන් ගැලැවියැපිසිත් ඇතියා වැ දෙළොස්රියතින් ඇතුළු වැ සිටැ මෙහි කී මාතුඝාතක පිතුඝාතකාදී එකුන්විසිපරිජ්ජන් අතුරෙන් එක්තරා පරිජ්ජකින් යතෙමෙ සොයා එවු අනිකක්හු ලවා සොයවා එවු ඔහු එවිගස දත සනවෙසෙස් වෙ෴ මෙහි දකුම් නම් තමා මසැසින් එවු දිවැසින් එවු දුටුයේයි෴ ඇසුයේ නම් තමා පිණෙවිතතින් එවු [1]දිවසොයින් එවු ඇසුයේයි෴ සැකකිරීම් නම් තුන්වැදෑරුම් වෙ—මාගමක හා පැවිජ්ජන් හා පිළිසන්තැනැ දකැ එවූ පිළිසන්තැනින් නික්මෙන්නා දකැ එවූ මොහු පරිජ්අවන්නාහුවෙති සැක කිරීම, පිළිසන්නෙන මාගමක හා පැවිජ්ජන් හා බණන තෙපුල් අසා එහි අනුන් ඇතිබැවැ නොදකැ මොහු පරිජ්අවන්නාහු වෙති සැකකිරීම, පැවිජ්ජන් සිරුරෙහි එවු වසනතැනින් එවු [2]මල් ආදිය සුවඳ අසා මාගමක හා මොහු පරිජ්අවන්නාහු වෙති සැක කිරීම යන මෙසසින් සැකකිරීම් දකුම් ඇසුම් [3]සමරවීම් විසින් තුන්වැදෑරුම් වෙ෴ මෙහි දකුම් ඇසුම් සැකකිරීම් නැතියාවැ

---

1 දිවසෝබසින්, දිවසොතසින්. 2 මල්ගඳහුර. 3 සැමරුම්.

සස්නෙන් ගැලවියැපිසිත්ඇතියාවූ වැළැනූ සිටූ පරිජ්වතින් තෙමෙ සොයා එවු අනිකකු ලවා සොයවා එවු ඔහු එවිගස දත සඟ වෙසෙස් වේ෴ සඟවෙසෙසින් සෙවුව පවිති වේ෴ මුලැසිපවිති වතින් පිළිඳෙස්නී දුකුළා දුබැසියෙන් සොයා නම් දුකුළා වේ෴ මෙකී පරිජිආදී සත්ඇවැත්කඳින් හවනුනිසා සොයා නම් පවිති වේ෴ දුකුම් ඇසුම් සැකකිරීම් ඇතියාහටද උමතුආදී නටදු ඇවැත්නැති෴ තමා විසින් සොයන පැවිජ්ජා මහලු පැවිජ්ජ යන වැවහරඇතිබැවූ ඔහු නොපිරිසුදුවද පිරිසුදු යන සඤ් ඇතිබැවූ දුකුම් ඇසුම් සැකකිරීම් නැතියාවූ පරිජ්වතින් සෙඳුබැවූ සස්නෙන් ඔහු ගැලැවීයැපිබැවූ ඔහුඑවිගස දත්බැවූ යන මේ අමූලුසඟවෙසෙසැ පසඟි෴

෴ අමූලුසඟවෙසෙස් විනිස නිමි. ෴

11 උපසපන් පැවිජ්ජක්හු සස්නෙන්ගැලැවියැපිසිත්ඇතියාවූ පරිජි අවදනා අනික් කැනයක්හු දූකැ නො කැනයෙහි, පරිජි අවන්නෙහි මෙ කැනලෙසින් වැළැනූ සිටූ පරිජ්වතින් තෙමෙ සොයා එවු අනුන්ලවා සොයවා එවු ඔහු එවිගස දත සඟ වෙසෙස් වේ෴

මෙහි ලෙස් නම්:— [1]දූ නම් ගොත් ලිඟු ඇවැත් පා සිවුරු වත්තෙරුන් ඇදුරුතෙරුන් සෙනසුන්ලෙසයන මෙ දස ලෙසි෴ මෙහි එක්තරලෙසකිනුදු සෙවුව සඟවෙසෙස් වේ.

෴ අඤ්ඤභාගියසඟවෙසෙස්විනිස නිමි. ෴

සඟවෙසෙස් ඇවැදූ මා අවන්නේ සඟවෙසෙසකැයි දූනැ එවු මෙ බික්සඟනට නොවටී දූනැ එවු මොහු අපට ගොරොක් හයි එවු නැහයි එවු නොඇරෙජා පිළිසෙවිය [2]සිතින් අනතරයක් නැති වූ අරුණු නැඟුව ඇවැත්පිළිසෙව්වා වේ෴ දුකුළාඇවැතුදු වේ෴ මෙ මා කළ වරද සඟවෙසෙස් හෝ වෙයි නොවේ හොයි එවු අනික් ඇවැතෙක් වේ හොයි එවු ඇවැත් නැති යන සඤ ඇතියා වූ එවු ඇරෙජියැයුතු කෙනකුන් නොලදින් එවු අනතරයෙකින් එවු නොඇරජුව ඇවැත්පිළිසෙව්වා නො වේ෴

"නිකඛිතතකාලතො පඨාය පකතතඨානෙ තිඨති" යූ බැවින් සඟවෙසෙසට පිළියම් කෙරෙමින් සිටූ නොනිපන්සඳ මියත් එමුල්තෙන් සඟට මොකට [3]ඩැහැ නැති෴ වත්තුබූසඳ පොෂො පවුරුණුව ඩහක් නො ද ඇති෴

෴ සක්සඟවෙසෙස්විනිස නිමි ෴

12 නොඉටු නොවිකැපූ නොකල්හි සිවුරු දසදවසක් ඉකුම්වා නම් නිසැගි වේ෴ මෙහි ඉටන් දෙවැදූරුම් වෙ,—කයින් ඉටීම්

---

1 දූ ලෙස්. 2 විසින්. 3 ඞහයක්.

තෙපුලෙන් ඉටීම්෴ කයින් ඉටීම් නම්:- [1]පොරණ සඟළ "ඉමං සංඝාටිං පච්චුද්ධරාමි"යි පසුදුරා අලුත්සඟළ අතින් ගෙනැ මඳක් සොලවා "ඉමං සංඝාටිං අධිට්ඨාමි"යි සිතින් සිතන්නේ෴ "ඉමං උත්තරාසඞ්ගං"- "ඉමං අන්තරවාසකං පච්චුද්ධරාමි"යි [1]පොරණ සිවුරු පසුදුරා අලුත්සිවුරු අතින්ගෙනැ මඳක් සොලවා- "ඉමං උත්තරාසඞ්ගං"-"ඉමං අන්තරවාසකං අධිට්ඨාමි"යි වෙන වෙන මැ සිතින් ඉටන්නේ෴

෴මේ කයින්ඉටනසේයි.෴

තෙපුලෙන් ඉටනසඳ සිවුරු අත්පසැ වුව "ඉමං සංඝාටිං" "ඉමං උත්තරාසඞ්ගං" "ඉමං අන්තරවාසකං අධිට්ඨාමි"යි වෙන වෙන විසිබේකොට ඉටන්නේ෴සිවුරු දෙළොස්රියනින් දුරු වුව-"එතං සංඝාටිං" "එතං උත්තරාසඞ්ග" "එතං අන්තරවාසකං"යි විසිබේ කොටින් ඉටන්නේ෴

෴මේ තුන්සිවුරුඉටනසේයි.෴

පිරිකරසොළ නමින් ඉටා තුබූ පිළී ගෙනැ කළ සිවුරු තුන් සිවුරු නමින් ඉටියැපි වුව පසුදුරා පමණින්යුත් සිවුරු "ඉමං සංඝාටිං අධිට්ඨාමි" යනාදි විසින් ඉටන්නේ෴මෙහි පමණ නම්:— සඟළ උතුරුසඟලටද යටත්පිරිසෙයින් දිග මිටිපස්රියන් පුළුල මිටිතුන්රියන්, උඩත්පිරිසෙයින් බුදුන් සිවුරට උනු වැ වටී෴ අතුරුවසා සිවුරට දිග මිටිපස්රියන් පුළුල දෙරියන්වියත්෴ දෙරියනිදු වටී෴මෙකී පමණින් උනු වුව අධික වුව පිරිකර සොළ නමින් ඉටන්නෙ෴ පිරිකරසොළ නමින් ඉටනසඳ අතින් ගෙනැ මඳක් සොලවා එකක් වුව-"ඉමං චීවරං පරික්ඛාර චොළං අධිට්ඨාමි"යි සිතින් සිතන්නෙ෴ බොහෝ වුව-"ඉමානි චීවරානි පරික්ඛාර චොළානි අධිට්ඨාමි"යි සිතින් ඉටන්නෙ෴ තෙපුලෙන් ඉටනසඳ අත්පසැ වුව-"ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි"යි විසිබේ කොටින් ඉටන්නෙ෴බොහො වුව-"ඉමානි"- යි ඉටන්නෙ෴දුර එක් සිවුරක් වුව-"එතං"යි-ඉටන්නෙ෴ බොහො වුව- "එතානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි"-යි- විසිබේ කොටැ ඉටන්නෙ෴[2]තුන්සිවුරු වුව පරිභොග නිසා පිරිකරසොළ නමින් ඉටන්නෙ෴එබැවින් පිරිකරසොළ නමින් ඉටූ සිවුරු [3]ඇත්තනු [4]දුවඟසමාදන්කළ තෙසිවිරි නම් වෙ෴ සිවුරු කීපමණින් උනු වැ මැද සිල් වුව අත්පසින් වියෝ වැ අරුණු නැඟුව වරද නැති෴දූ විසින් සසිවුරි—කොමුමුවා සිවුරු කපුමුවා සිවුරු තිහිරිමුවා සිවුරු පලස්මුවා සිවුරු සැණමුවා සිවුරු කොමුආදී මුසුකොටකළසිවුරුයි. පමදු නෙත්‍රදු දෙවාඟදු අනුලොම්සිවුරි෴වඩුරියනින්දිග රියන්පුළුල වියත්කඩ

1 පොරෝනා. 2 තන්සිවුරු. 3 ඇත්තාහුදු. 4 අංගසමාදන්කළ

[1]පත්තිපෙරහන්ආදී පිරිකරසොළනමින් ඉවියැයුතු෴[3]රියතින් උනුවූ කඩආදිදු කන්වසින් බිසි කොදු හිදෙලූ පම පවුරු සෙනසුන් සිවුරු දත් දෙන්නට පුදන්නට තුබූ පිළී නොඉවූව වරද නැති෴අනිකක්හට දීමෙන් අනිකකු විස්වසින් ගැන් මෙන් අසිඳ ගැන්මෙන් කළුරියකිරීමෙන් ලිඟුපෙරළීමෙන් පසුදිරීමෙන් [3]ගිහිවීමෙන් පැවිජ්ජන් සිඛපස්විකුමෙනුදු ඉවත් [4]බිදෙ෴තෙසිවුරුනමින් ඉවූ තුන්සිවුරු දිගත් වියතින් ඇතුළු සඟළ උතුරුසඟළ සිවුරු [5]පුළුලයේ අටගුලෙන් ඇතුළු අතුරුවසාසිවුරු දිග වියතින් [5]පුළුලයේ සතරගුලෙන් ඇතු ළත් සිල්තිදු ඉවත් බිදෙ෴මෙහි සිල් නම් සුලැඟිලිනියපිටු සා අතුරේ හූ නැති සිල්෴පමණින් යුත් පයක් අතින් ගෙනැ මඳක් සොලවා-"ඉමං පත්තං අධිඨාමි"-යි සිතින් සිතන්නේයි෴

෴මේ කයින් ඉවන සේ යි෴

දෙළොස්රියතින් වැළැනැ තුබූ පයක් අතින් නොගෙනැ-"ඉමං පත්තං අධිඨාමි"-යි විසිබේ කොටින් ඉවත්නෙ෴දුරු වූව-"එතං පත්තං"-යි ඉවත්නෙ෴මේ විසිබේ කොටින් ඉවන සේ යි

෴ඉවනවිධි නිමි෴

---

විකපුන් නම්: විකපුන් දන්නා පැවිජිකෙනෙක්හට මැ නොඉවූ එක්සිවුරක් වූව-"ඉමං චීවරං තුය්හං විකප්පෙමි"-යි විකපන්නෙ෴මෙසේ විකැපූ සිවුරු නොඉවා තබත් ඇවැත් නැති෴පරිභොග කරත් අන්හට දෙත් ඉවත් නො වටී෴විකපලද පැවිජ්ජන්විසින්-"මය්හං සන්තකං පරිභුඤ්ජෙහිවා විස්සජ්ජෙහිවා යථාපච්චයං කරොහි"-යි මෙසේ පසුදුළසඳ පරිභොග ආදි වටී෴නොපසුදුළසඳ පරිභොග කරත් පචිති වෙ෴නොපසු දුළ විස්වසින් පරිභොගආදී කරත් වටී෴බොහො වූව-"ඉමානි" යි විකපන්නෝ෴දුරුවූව-"එතං"-"එතානි චීවරානි"-යි විකපන් නෙ෴පසුදුරන්නහුදු බොහො වූව-"මය්හං සන්තකානි පරිභුඤ්ජෙහිවා විස්සජ්ජෙහි වා"-යනාදිවිසින් පසුදුරන්නෙ෴පයට ද මෙ මැ නියම්෴"ඉමං පත්තං විකප්පෙමි"-යනාදි නම්මතු නොර෴

෴විකපනවිධි නිමි.෴

---

වප්මස මැදිපොහොයින් හිල්මසමැදිපොහෝ දක්වා මෙ මසක් දවස් කිළින් නොඅතුළ වෙහෙර සිවුරම කලි෴සෙනු එකළොස්මස් නොකලි෴කිළින් අතුළ හිමත් සාරමස්ලා මෙපස්

---

1 'පත්තථවිකං'-සික්ඛාපදවලඤ්ජනි. 2 රියතින් වියතින්
3 මාගම්පැවිජ්ජ ගිහිවීමෙන්. 4 බිදෙ. 5 පුළුලයෙන්.

මස සිවුරට කලි෴ සෙසු සත්මස නොකලි෴ මෙ නොකල්හි උපන් සිවුරැ ලද්දවස් එතැ සි ගැණැ දසදවසක් ඉකුම්වා එකළොස් වන අරුණු නැඟුව නිසැගි වෙ෴

කල්හිදු සඟහටද අයල්සිවුරුැනමින් උපන්නෙසිදු ගණසතු පුඟුල්සතු නැපැවැරුැවන්කෙරෙන් ලද්දෙසිදු පසුල්විසින් ලද් දෙසිදු දසදවසක් ඉකුම්වුව නිසැගි වෙ෴

නිසැගිවූ සිවුරු පැවිජ්ජිකෙනෙක්නට “ඉදං මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි”–සි නිසද ඇවැත් දෙසන්නෙ෴ මෙසේ නිසදු සිවුරු–“ඉමං චීවරං ආයස්මතො දම්මි”–සි හිමියාහට මැ දියැයුත්තේසි෴ ‘මට දුන් නොයැ’සි සතසක්‍ෂුයෙන් නොදේ නම් දුකුළා වෙ෴

සතසක්‍ෂු නැතියා වැ ලෙසින් ගනී නම් දෙදෙනා ධුරනි ඛෙවින් බඩු තුබූසෙසින් පරිජිඇවැත් වෙ෴

නිසැගි වුව නොනිසජ පරිභොග කොරේ නම් දුකුළා වෙ෴

ඇතුළුදසදවස අන්නට නිසජුව අනුන් විස්වසින් ගන්නම ඉටුව විකැපුව ඇවැත් නැති෴ උමතුආදීනටදු ඇවැත් නැති෴

සඟහුවිසින් ගිලන්පැවිජ්ජට තුන්සිවුරෙන් වියෝ වැ විසුව වරද නැති සි දුන් සම්මුතිනැතියා වැ කිළින් නොඅතුළ නොක ලැසි ගත් එකළොස්මස එවු කිළින්අතුළ නොකල්වූ සත්මස එවූ තුන්සිවුරෙන් සිවුරකුදු අත්පසින් වියෝ වැ එක්අරුණකුදු ඉකුම්වූව නිසැගි වෙ෴

මෙහි අත්පස් නම් [[1] යෙළරියනි ] එක්පුහුලක්හුගෙ සෙනසුන් වී නම් වටාලූ වැටපවුරුැආදි පිරිබෙව් ඇත්නම් ඇතුළුසෙනස්නෝ සිවුරු නබා කැමැතිනෙනෙකැ දවස් ලත් වටී෴ පිරිබෙව් නැති වුව සිවුරුතුබූ ගැබැ හෝ විසියැයුත්තේසි෴ ගබ්හි දෙරියන්වියත් අත්පස්හි හෝ විසියැයුත්තේසි෴ නොඑක්පුහුලන්ගෙ සෙනසුන් වුව පිරිබෙව්දු ඇත සිවුරුතුබූ ගබ්හි එවූ ගබ දෙරියන්වියත්අත් පස්හි එවූ [2] සර්වසාධාරණ දොරමුල්ලෙහි එවු දොරඅත්පස්හි එවූ විසියැයුත්තේසි෴ පිරිබෙව් නැත සිවුරු තුබූ ගබ්හි එවූ ගබඅත් පස්හි එවූ විසියැයුත්තේසි෴

෴ මේ [3] ගැමින් බැහැර සෙනස්නෙන් විනිසයැ ෴

සෙනසුන් අත්පස් තරනු [4] ඇත්ගම්හි මිසැ [5] ගැමින් බැහැර නො ලැබෙ෴ අරුණු නඟනවිගස සිවුර අත්පස නොකටහොත්

---

1 වළඤ්ජපාසො නාම අඩ්ඪතෙය්‍යහත්ථො-සික්ඛාපදවලඤ්ජනී.
2 සබ්බසාධාරණොනාමූලෙ-සික්ඛාපදවලඤ්ජනී. සර්වසාධාරණ.
3 ගැබින්. 4. ඇත්ගබ්හි. 5 ගැබින්.

පසුදුරා අල්ලේ ඉටාගන්නේ වරී෴නිසැගි වූව–“ඉදං මෙ භන්තෙ චීවරං රත්තිං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි”–යි නිසද ඇවැත් දෙසන්නේ෴දෙමාපියන්ආදි නෑයන් හා සිය ලේනෑකම් නැති උභතොසඞ්ඝ උපසපන් මාගම්පැවිජ්ජ ලවා එක්වවෙක්හිදු පරිභොගකළ රුදූ පොරණසිවුරු දෙවා නම් රදන් කරවා නම් කොළවා නම් නිසැගිපචිති වෙ෴දෙවනුආදී දෙක් කැරු වුව නිසැග්ගෙක් හා දුකුළා වෙ෴දෙවනුආදී තුනක් කැරුවුව නිසැග්ගෙක් හා දෙදුකුළෙක් වෙ෴“ඉදමෙමභන්තෙ පුරාණ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි”–යි නිසජා ඇවැත් දෙසන්නෙ෴යටකී සලකුණුඇති නොනෑ මාගම්පැවිජ්ජඅතින් යටත්පිරිසෙයින් ඉටන්පොහොනා සිවුරක් අරළුපකක්මාත්‍රා නොදී ගනීනම් නිසැගි වෙ෴අනුපසපනක්හු අත්හි දී එවූවා එවු ඈ බැර පීවා පසුල්සඤ්ඤායෙන් එවු කිසිවතක් දී එවු· දෙම් යන ආභොග ඇතියාවැ එවු විස්වසින් තව්කැලිකොවින් එවු ගනීනම් ඇවැත් නැති෴“ඉදමෙම භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථ තො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවට්ටකා නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි”–යි නිසජා ඇවැත් දෙසන්නේයි෴පස් සහධැමියන් තබා නොනෑ නොපැවැරූ ගිහිමිනිසක්හු අසුන් සිව්රි නටසිව්රි නොවැ අරවාගනීනම් නිසැගි වෙ෴අසුන්සිව්රි වැ හෝ නටසිව්රි වැ හෝ හදනාපොරෝනාමාත්‍රයක් අරවාගත ඇවැත් නැති෴නිසජනසඳ “ඉදමෙම භන්තෙ චීවරං අඤ්ඤාතිකං ගහපතිකං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි”–යි නිසජා ඇවැත් දෙසන්නේ෴අති කක්හු තකා විනවත් එවු තමානෑපැවැරුවන් එවූ ඔහුනෑපැවැ රුවන් එවු විනවත් ඇවැත් නැති෴

රත්රිදීමසුකහවණුහි එක්තරුවතක් [1]කිහිවක්හු තමහව තකා [2]දෙනුලබන්නා තෙමෙ ගනි එවු තමහට තකා අතිකකු ලවා ගන්වා එවු හම්යේ එවු පරවිවිලියෙහි එවු තුබූවාක් මෙ තොපට දෙම් යි කියනලද්ද තො වරී නොකියා සිතින් ඉවසා එවු ගත නිසැගි වෙ෴ගතැවි වැ ද මෙ නො වරි යි කියා නම් වරද නැති෴නොගතැවි වැ මෙ නො වරී නො කියා නම් වරද නැති෴රත්රිදීමසුකහවණුහි යමක් යමක් ගත වත්ගණ තින් නිසැගි වෙ෴නිසදනසඳ–“අහම්භන්තෙ රූපියං පටිග්ග

1 කහිවක්ඛු, කිසිවක්ඛු. 2 දෙන්නා.

හෙසිං ඉදං මෙ නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමි"–යි මෙසේ සඟමැදමෙ නිසජා පැවිජ්ජෙනකුන්කෙරෙ ඇවැත් දෙසන්නේ෴

මුතු මැණික් වෙරළු මිණි රන්කසුකම්කළ සක් සල පබළු රත්මිණි විරිවන්මිණි හැල් ආදි හැමධඤ්ඤදු දස් දූසි ගෙරි සරක්ආදි මෙ දුකුලාවත් තමහට ගනී නම් දුකුලා වෙ෴මෙ දුකුලාවතුදු කැලකී රන්ආදිනිසැගිවතුදු අතික් පුහුල් සඟ ගණ මහසැ නවාමටද තකා ගනීනම් දුකුලා වෙ෴නිසැගිවත් දුකුලාවත් මහසැයට නවාමට දෙමි–යි කිව. පිළිබෙව් නොකොට ඇරැම්ආදිනට මොහු මෙසේ කියතී කියත් වටී෴රන්රිදී ආදිවත් මොහු ගත්හයි කුකුස් කරන අරම්ආදිතැන පියාගියා හිමියනට දෙමී ගෙනැ තබත් වටී෴උමතුආදීනටත් වරද නැති෴

නිසැගිවතින් උපන් රුක්සේවළල්ලෙහිජු [1]පිළිගත් පැවිජ්හිදී නම් දුකුලා වෙ෴

රන් රිදී මසු කහවණු යන මෙ නිසැගිවතින් නිසැගිවත්එවු දුකුලාවතින් දුකුලාවත් එවු කැපවත් එවු බැවහර කළ නිසැගි වෙ෴මෙහි කැපවත්නම් සාල් උඳු මුඟු සිහිවැල් කපුආදියි෴ දුකුලාවතින් කැපවතින් නිසැගිවත් බැවහර කළ නිසැගි වෙ෴ දුකුලාවතින් දුකුලාවත් එවු කැපවත් එවු බැවහර කළ දුකුලා වෙ෴කැපවතින් දුකුලාවත් බැවහර කළ දුකුලා වෙ෴කැපවතින් කැපවත් දුකුලාවත් බැවහර කළ දුකුලාවෙ෴බැවහර මත්තෙහි සිඛයෙහි කියනුලැබෙ෴මෙකී සිඛයෙහි කීයේ පස්නිසැග්ගෙක්හා තුන් දුකුලාවෙක් වෙ෴"අහමහනෙත නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං ඉදමෙම හනෙත නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමි"–යි සඟමැදූ මෙ මෙසේ නිසජා පැවිජ්ජෙනකුන්කෙරෙ ඇවැත්දෙසන්නේයි෴මෙසිඛයෙහි සෙසු විනිස අනතුරුසිඛයෙහි කීසෙයින් දන්නෙ෴

පස්සහධැමියන් හා මිසැ දෙමාපියන්ගෙ කැපවතකුදු තමාගෙ කැපවතින් මෙ ගෙනැ මෙ දෙවයි වැවහර කොටැ ගනීනම් නිසැගි වෙ෴මෙ ගෙනැ මෙ බිඳු මෙ කා මෙ දෙ මෙ කාර මෙ ගෙනෙ යි කියා එවු මෙගන්වතුආදී කෙරෙ නම් නිසැගි වෙ෴ මෙ අපට ගෙනැ දෙයි අතිකක්හු ලවා වැවහර කරවා එවු අපගෙවත් ඇති ඇපි තෙලෙ කැමැත්තම්හයි කීසඳ මෙරමා තුඩුන්වතක් ගනී එවු තෙමෙ මිලනොකොට මෙරමා කළ මිලයෙන් ගනී එවු මෙ කුමක් අග්ගි අග පුළුවුයි එවු ඇවැත් නැති෴නිස

1 රන්රිදී පිළිගත්.

ජනසඳ—"අහම්භන්තෙ නානප්පකාරකං කායවිකාරකං සමාපජ්ජිං. ඉදම්මෙ නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි"-යි පැවිජි කෙනෙක්නට නිසජා ඇවැත් දෙසන්නෙ෴ පස්සහඩැමියන්හා කැපවතින් බැවහර කළාගටද උමතුආදීනටදු ඇවැත් නැති෴ නොඉටූ නොවිසැදූ පමණින්යුත් පා ලදදවස් එකැයි ගැණැ දසදවසක් ඉකුම්වා එකළොස්වන අරුණු නඟා නම් නිසැගි පවිති වෙ෴ නිසජනසඳ–"අයම්මෙ භන්තෙ පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි"-යි පැවිජි කෙනෙක්නට නිසජා ඇවැත් දෙසන්නෙ෴

මෙහි පමණින්යුත්පා නම්:-[1] මොනවට සුදු කොට පැහැසි නොකඩ පරණහැල්සාල් මගධනැළියෙන් දෙනැළියක් ගෙනැ නොඋයා ලා නොවිලිකුන් නොකැවිවූ නියනාපක් කොඳකැකුළු සුදුසුවූ සවක්බතුදු-මෙබත් සතරකොටසින් කොටසක් පමණ අතින් ගෙනැයාහැකි මුඟුහුජු අවසන්පිඬු දක්වා පිඬට සෑහෙන මස්මසාදි බ්‍යජනුදු පයකා එවැ හිරටක්හෝ හුයක්හෝ ගෙනැ මුවවිටින් ගහනසඳ හිරට නොපහරීනම් මෙ උකටහිඋකටපා නම්෴ පහරීනම් උකටප නම්෴ හිරටින් ඉතිරිවැ තුබූයේ නම් උකටෙහි ඔමුපා නම්෴ මෙකීතාක් බත් සූපව්‍යඤ්ජන සමහරක් ගෙනැ පයකා ලා හිරටක්හෝ හුයක් හෝ ගෙනැ මුවවිටින් ගහනසඳ හිරට නොපහරීනම් මෙ මැදුමෙහි උකටපා නම්෴ පහරීනම් මැදුම්පායි෴ ඉතිරිවැ තිබී යේ නම් මැදුමෙහි ඔමුපා නම්෴ මැදුම්පයට කිතාක් බත් සූප ව්‍යඤ්ජන සමහරක් ගෙනැ පයකා ලා හිරටක් ගෙනැ මුවවිටින් ගහනසඳ හිරට නොප හරීනම් ඔමුයෙහි උකටපා නම්෴ පහරීනම් ඔමුපා නම්෴ ඉතිරි වැ තිබීයේනම් ඔමුයෙහි ඔමුපා නම්෴ මෙ නවපය උකටහිඋකට පාහා ඔමුයෙහිඔමුපාහා මෙදෙපය තබා සෙසු සත්පය පමණින් යුත් ඉටන්පොහොනා පායි෴ මෙහි මගධනැළි නම් මැදුම්පිරිමි නියක්හු අතින් අටපතක් ගන්නා නැළියයි෴

සිවිනහා පක් පයක් ලදින් තමාකොරෙ ඇති පොරණපා පසුදුරා දසදවසක් නොඉකුම්වා ඉටන්නෙයි෴ දෙපං ඉටත් නො වවී෴ පය [2]හේකාරම්හයි [3]පිසත් නො වවී෴ පයමුවවිටින් යව දෙ අඟුලෙන් ඔබ්ඛබ් එක්තණඔලක් නික්මෙන සිදුරෙකිනිදු යව සිවුරැ සිබයෙහි කියූ අනිකක්හට දීමෙක් යනආදි [4]අටකරුණෙ නිජු පය ඉමන් බිඳ෴ බදුලුආදිනෙන් පය සිල් හැසවා නැමැනැ ඉටාගන්නෙ෴ ඉමනවිභාපනවිධි සිවුරුසිබයෙහි කීසෙයින් මැ දන්නේ෴

1 මෝනොවට. 2 හෙතු. 3 පිසින්. 4 අටකුරුනිජු.

උනුපස්බාන් ඉටන් පොහොනා පා ඇතියා වැ නොනැ නොපැවැරූ ගිහිමිනිසුන් අයත් පයක් විනවා ගත නිසැගි පචිති වෙ෴මෙහි උනුපස්බාන්පා නම්: මුවවිටින් යට වඩුඅඟුලෙන් දස ඟුලෙන්උනු වැ බුන් පාසි෴නන්නන් නෙත බුන දෙදෙඅඟුලෙ එකි එකි බාන් බැවින් ගැණැ ගන්නෙ෴පස්බාන් එවු අසිරුපස් බාන් එවු ඇතිවූ පා බදුලුආදිනෙන් නරකළද දූපපරිභොග කරත් එවු අනෙක්පයක් විනවාගනුත් එවු වටී෴යපා වූව බොහො ගෙඩි හෙළුවද සනහිඩි නොසිටීනම් අතික්පයක් විනවා ගනුත් නො වටී෴සනහිඩි නොසිටිනාක් නොහටහැකිවුව අතික්පයක් වින වා ගනුත් වටී෴උනුපස්බාන් පාඇතියාවැ එවු අමිස්නොසිටිනා පාඇතියාවැ එවු විනවාගත් පා සඟමැදැමැ නිසැජියයුත්තේ෴ නිසජන පැවිජ්ජන් මිසැ යටත්පිරිසෙසින් [1]සතරපැවිජිකෙන කුන් තමන් තමන් පරිභොග කරන පා ගෙනැ මළුවට නැඟී අත්පස් නො පියා හිඳිනෙ෴පා විනවාගත් පැවිජ්ජන් විසින්— "අයමෙම භන්තෙ පත්තො ඌනපඤ්චබන්ධනෙන පත්තෙන චෙතා පිතො නිස්සග්ගියො ඉමාහං සංඝස්ස නිස්සජාමි"—යි—නිසැජියැ යුත්තේයි෴ඉක්බිති ඡන්ද දෙස මොහ භයාගති [2]නොවූ ගැන්වූ නොගැන්වූවා ජන්නා පැවිජකෙනකුන්—"සුණාතු මෙ භන්තෙ සංඝො යදි සංඝස්ස පත්තකල්ලං සංඝො ඉත්ථන්නාමං භික්ඛුං පත්තගාහාපකං සම්මන්නෙය්‍ය එසා ඤත්ති෴සුණාතු මෙ භන්තෙ සංඝො ඉත්ථන්නාමං භික්ඛුං පත්තගාහාපකං සම්මන්නාති යස්සා යස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො පත්තගාහාපකස්ස සම්මති සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය෴සම්මතො සංඝෙන ඉත්ථන්නාමො භික්ඛු පත්තගාහාපකො ඛමති සංඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි—යි සමජනෙ෴මෙහි,— "ඉත්ථන්නාමං" යනාදි තැන්හි ඒ ඒ පැවිජ්ජන් නම් කියා යොජන්නෙ෴

මෙසේ සැමැජිපැවිජ්ජන් සඟමැදැ නිසජූ පය ගෙනැ හංතෙරපැවිජ්ජනට පයැ ඇති ගුණ කියා ගන්වන්නේ෴ගත ඔවුන්ගෙ පය ගෙනැ නොගත එ මැ පය ගෙනැ ඉක්බිති පැවිජ් ජනට පයැ ඇති ගුණ කියා ගන්වන්නෙ෴මෙසෙයින් හැම දෙනා ගන්වා කෙළවර ලදපා ගෙනැ මෙ පා බිඳෙනතාක් නොප පරිභොග කටයුතුයැයි නිසජූ පැවිජ්ජහට දියැයුත්තෙ෴ මළුවටනැඟි බික්සඟ නපුරැ පා දී මනා පා ගතැවි වැ නපුරැ පා ගෙනැ යෙන් නමුදු ඔහුකෙරෙහි අනුකපියෙන් නොගනීනමුඳු දුකුළා වෙ෴අපිසින් නොගත වරද නැති෴

---

1 සතරපස්. 2 නොනගැන්වූ.

පාතිසජ්ජ පැවිජි සඟ පා නිසජා සඟින් ලද පා දුප්පරිභොග
කෙරෙ එවු නසන්නට නිසිතන්හි තබා එවූ අන්නම දේ එවූ
දුකුළා වෙ෴ අන්හු අතික් පයක් දී එපය ගනිත් නම් වරද නැති෴

වැළැඳියැයුතු ගිතෙල් මී වෙඬුරු තෙල් සකුරු පිළිගන්වා
ගෙනැ සත්දවසක් ඉකුම්වා නම් නිසැගි පචිති වෙ෴ මෙහි වැළැ
ඳියැයුත්තෝ නම් ගිතෙල්ආදි [1]උග්හු පිළිග්හු නොවූයේසි෴
පිළිගතයුතුවතක් නොපිළිගත්බව දූනැ දූනැ නගාගත මෙ උග්
හු නම්෴ බිමැ බහා තබසිජු නොබහාතබසිජු නැවැතැ ඒ පිළි
ගන්වාගනී නම් මෙ පිළිග්හු නම්෴ මෙකීසෙසින් [1]උග්හු
පිළිග්හු වූ ගිතෙල්ආදී පිළිගන්වාගත් සත්දවසක් ඉකුම්වූව
නිසැගි නො වෙ—වළඳත් නොවටී෴ සිරුරුගඟනආදි බැහැර
පරිභොග වටී෴ මස්නොවැරූ සතුන්ගෙ වෙඬුරුදූ ගිතෙලුදූ
නිසැගිවත් වෙ෴ සෙසු වෙඬුරුදූ ගිතෙලුදූ දුකුළාවත් වෙ෴
තලතෙල් මීතෙල් එරැඬුතෙල් සිද්දතුතෙල් වසාතෙල් නිසැගි
වත් වෙ෴ සෙසුතෙල් දුකුළාවත් වෙ෴ කාණවේමැස්සඟ දඹුළුල්
බැමැස්සඟ මහබමරමැස්සඟ මිහිමැස්සඟ යන මෙතෙක්දෙනා
විසින් ඔත් මී නිසැගිවත් වෙ෴ සෙසු මී දුකුළාවත් වෙ෴ පක්
නොපක් උක්රස නිසැගිවත් වෙ෴ සිහිල්දියෙ මීප් ලා තබා
නොමැඩැ [2]පරහාගත් මීප් දුකුළාවත් වෙ෴ ගිතෙල්ආදිවූ සතැවු
කැලිවත් පිළිගැන්වූදවස් එකැයි ගැණැ සත්දවසක් ඉකුම්වා
අටවනඅරුණු නැඟුව නිසැගි පචිති වෙ෴ නිසජනසඳ—"ඉදමෙම
භතෙත භෙසජ්ජං සත්තාහාතිකකනතං නිස්සග්ගියං ඉමාහං
ආයසමතො නිස්සජාමි"—සි පැවිජිකෙනෙක්නට නිසජා ඇවැත්
දෙසන්නෙ෴ නිසජා ලද බෙහෙද් සතී ඇතුළු බැහැර සිරුරු
පරිභොගයට නොවටී෴ වැටුප්පහන්ආදියට එවූ අනුපසපනක්
හට දෙනු එවූ වටී෴ [3]සතීඅහතුරෙහි සුඬසිතින් උපසපන් පැවිජි
කෙනෙක්නට නිසජුව පිළිගත් සත්දවස් ඉකුතසි නිසැගිජු ඇවැ
තුදු නො වෙ෴ දෙදෙනහට ද වළඳත් නො වටී෴ සෙසු හැම පරි
භොගයට වටී෴ සතීඅතුරෙහි අනුපසපනක්හට ශුඬසිතින් පියා
ලද්දේ නැවැතැ සතියකට වටී෴

කිරි දිහි උක්දඹු තල එවු පෙරවරු පැවිජ්ජෝ පිළිගන්වා
ගෙනැ වෙඬුරු ගිතෙල් සකුරු තෙල් කොළෙෝ නම් පස්වරු පවා
වළඳත් නො වටී෴ එදවස් පෙරවරු නිරාමිසමෙ වටී෴ නො
මුහු ගිනියැ නොපිසැ කොළො නම් එදවස් පෙරවරු සාමිසවැයි
දූ වටී෴ කිරි එවූ උක්දඹු ආදිඑවූ යවිකැලිවත් පස්වරු පිළිගන්වා

---

1 උග්ගුහු පිළිග්ගුහු. 2 පරාගත්. 3 සතිඅතුරෙහි.

ගෙනැ කළ වෙඬුරු සකුරුආදි නොවටී෴අනුපසපනක්හු හිගුරු ආදි යව්දිව් කැලි මුසු කොටැ පෙළැ උක්රස නිරාමිස වැ සත්දව සක් වටී෴ලුණුමිරිස්ආදි යව්ජිව්කැලි මුසු කොටැ මැඩි දඹපැනු ආදි පස්වරු වටී෴අනුපසපනක්හු කිරිආදියට යව්ජිව්කැලි වත් ලා තෙල් පක්හු නම් එහි කහා නො වටී—තෙල් වටී෴ බෙහෙද් අඹියෙහි වලස්තෙල් හූරුතෙල්ආදි සැමැතිතෙලක් එවූ බොත් වටී෴අයප කිරි දියි වෙඬුරු ගිතෙල් නම නැති෴පිළිගත් වෙඬුරුහි සියුම් දීගුළිකාදු තක්බිඳුදු සිහාලඳ ගිතෙල් මීතෙල් වෙඬුරුහි සහල්හුළුආදි වී නම් අබෙබාහාරිකයි—ගිනියැ නො තබා එහැරැ පෙරවරුපස් වළඳත් වටී෴බියල් සිද්හතුආදි යව් ජිව්කැලිවත් තෙල් තකා පිළිගන්වා තබා සත්දවසක් ඉකුමවා නම් නිසැගි නො වෙ—දුකුළා වෙ෴ගිතෙල්ආදී වත් නො මුසු කොටැ වෙන වෙන තබා සත්දවසක් ඉකුම් වුව වත්ගණිනින් නිසැගි වෙ෴එක්බජනෙක්හි මුසු කොටැ තබා සත්දවසක් ඉකුම්වුව එක්නිසග්ගෙක් වෙ෴සතව්කැලි යව්දිව්කැලි වත් පස්වරු ඇති පසයෙහි පස්විකා වළඳත් වටී—පසඇත නොපස් විකා වැළැඳුව එවු පස්නැති වැ පස්විකා වැළැඳුව එවූ නො වටී෴දුතියදවස් පවා පෙරවරු පස්වරු නිරාමිස කොටැ වළඳත් මෙ මෙ නියෙ෴පෙරවරු පිළිගත් සතරකැල්ලන් එදා පෙරවරු මුසු කොටැ නො මුසු කොටැ වළඳත් පස නැත ද වටී෴පතු පස්වරු පැන්පවස්මාත්‍රා ඇත වටී෴සකුරුපැන් සකාළදු නොකකාළත් පස් නැතදු වටී෴බැහැර සිරුරුපරිභොග නිසා පිළිගන්වාගත් සතැවුකැලි සත්දවසක් ඉකුම්වුව වරද නැති—වැළැදියැටි වැ වළඳත් වටී—පටනැ නොපිළිගත පිළිගන්වාගෙනැ වළඳන්නෙ—වැළැඳූසත්දවස් නොඉකුම්වා පුන පියන්නෙ෴

උපසපන්පැවිජ්ජක්හට සිවුරු දී එක්තරාකරුණෙකින් නොවිසියමනා වැ මාගේ සිවුරු මම්මැ ගන්මී යන සකාසඤ්ඤ යෙන් විකාපුන්පොහොනා සිවුරු වුව ගත වත්ගණිනින් නිසැගි පචිති වෙ෴අනිකක්හට හැරගනැයි ඇණැවූසඳ දුකුළා වෙ෴ යම්තාක් ගනැයි ඇණැවීද ඔහු ගත්සඳ එවත්ගණිනින් නිසැගි පචිති වෙ෴

උපසපන්පැවිජ්ජාගෙ කීසිවුරු තබා සෙසුපිරිකරක් එවූ අනුපසපනක්හුගෙ සිවුරක් එවු සෙසුපිරිකරක් එවූ සකාසඤ්ඤ යෙන් ගනී එවු ගන්වා එවු වත්ගණිනින් දුකුළා වෙ෴නිසජන සඳ—“ඉදමෙම භනෙත චීවරං භිකඛුසස සාමං දතවා අචඡිනනං නිසසගගියං ඉමාහං ආයසමතො නිසසජාමි”-යි පැවිජ්කෙනෙක්

නට නිසජා ඇවැත් දෙසන්නේය. විස්වසින් ගනී එවු නොදුහැ වැ ඔහු අරවා ගනී එවු මෙරමා දුහැ වැ නොදුහැ වැ [1]දුන්නේත් ගනී එවු වරද නැති.

නොනැ කොපැවැරූ ගිහිමිනිසක්හු අයත් හු විගවා ගෙනැ නොනැ කොපැවැරූ පෙහෙරකු ලවා සිවුරු වියවනසද පෙහෙරගේ හැම්පියොවින් පැවිජ්ජනට දුකුලා වේ. ඒ සිවුරු ලද කල නිසැගිපවිති වේ. නිසජනසද—"ඉදමෙම භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි"යි පැවිජිකෙනෙක්හට නිසජා ඇවැත් දෙසන්නේය.

'සඞ්ඝට දෙම්හ'යි පිරිණැමූ ලාභයක් සඞ්ඝට පිරිණැමූබව දැනැ දැනැ 'අපට දෙව'යි තමහට පිරිණමාගත නිසැගිපවිති වේ. නිසජනසද—"ඉදමෙම භන්තෙ ජානං සංඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි"යි පැවිජි කෙනෙක්හට නිසජා ඇවැත් දෙසන්නේය. නොදැනැ පිරිණැමූව ඇවැත් නැති.

## තුදුස් නිසැගි විනිස නිමි.

වසැකිසාටැවි වැ මුසවා කිව මෙරමා දත පවිති වේ. මෙහි වසැකිසාටැවිබව නම් නැත්තා ඇති කරන ඇත්තා නැති කරනබැවිය. කියනපෙරටුදු [2]කියනසණසිදු කිසක්ජු මුසවා කියන සිතින් කිව මුසවා වේ. උතුරු මිනිස්දම් කියැවිවැ මුසවා කිව පරිජ්වේ. සස්නෙන් ගැළැවියැටිසිතින් මුල් නැති පරිජ්වත් කියා මුසවා කිව සඟවෙසෙස් වේ. නැති සඟවෙසෙස්වත් කියා මුසවා කිව පවිති වේ. නැවියැටි වැ සත් ඇවත්කඳින් මුසවා කියා හැමූව පවිති වේ. සස්නෙන් ගැළැවියැටි සිතින් නැති ආචාර විපත්ති කියා මුසවා කිව දුකුලා වේ. තමාකෙරෙ නැති උතුරු මිනිස්දම් පරියායෙන් කියැවිවැ "තාගේ සෙනසුනේ වසනා පැවිජ්ජෙජා උයම්පිඬින් දුතියාඩින් ලදහ" යනාදි විසින් මුසවා කිව මෙරමා දත පුලුයි වේ. නොදත දුකුලා වේ. කෙළ නාරිසින් නම් ඉයොත් ආදී අවක්ස මුසවා කිව දුබැසි වේ. මෙසේ සින් මුසම් කීයපය්‍යෙන් [3]පිළිදෙස්න් තබා සෙසු සඇවැත්කඳ වේ. මුසවා කියැවිසික් නැත්යා වැ ලාහෙළා අනිකක් කියා එවු සියැටි තබා අනිකක් කියා එවු ඇවැත් නැති. උම්තු ආදීනට ද ඇවැත් නැති.

---

1 දුන්නේත් ම. 2 කියනසදැසිඡු නිසදදු. 3 නිසැගි පිළිදෙස්නී.

උපසපන්පැවිජ් උපසපන්පැවිජ්ජක්හු දූ නම් හොත් නම් [1]සිල්ප ආබාධ ලිඟු කෙලෙස් [2]ආපතැයි [3]ඇකෙස්ලී යන මෙ දසවත්අතුරෙන් එක්සරාමතෙකින් හවනරිසින් ඉදුරා හවා නම් තෙපුලෙහි තෙපුලෙහි පවිතිඇවැත් වෙ෴ මෙහි මම්වැති දූ ඇත්තු ඇති යනාදිවිසින් පරියායෙන් හවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුලාඇවැත් වෙ෴ අනුපසපනක්හු ඉදුරජු පරිය, යෙනුජු හවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුලා ඇවැත් වෙ෴ උපසපනක්හු එවු අනුපසපනක්හු එවු නොදුනාරිසින් ඉදුරා එවු පරියායෙන් එවු දූනම්ආදීනෙන් බෙණෙහිනම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි වෙ෴ සොතරහි ගැඩමිායෙහි යනාදීන් පෙළ නොඅා හැවිලින් එක්තරක්හු හැඟියැටී වැ ඉදුරා නොඉදුරා හවානම් තෙපුලෙයි තෙපුලෙහි දුකුලා වෙ෴ නොළිඟැටී වැ කිව දුබැසි වෙ෴

මෙහි දූනම්ආදී මෙසෙයින් දත්නෙ:—සැඩල්හි, නැත යෙහි යනාදී හීන උකට දූයි෴ වැගුල, බුදුල, යනාදී හීන උකට නම්෴ කොයියගොත්, නොයුම්ගොත්, ආදී හීන උකට ගොති෴ කොටරකිනම් වෙණෙසුජුනම් යනාදී හීන උකට නම්෴ නළාර සිල්ප ගණන් සිල්ප ආදී හීන උකට සිල්පයි෴ හැම රෙග හීනආබාධයි; මධුමෙහ උකට ආබාධයි෴ ඉනාදිගුල්ලෙහි සම සිරුරුඇත්තෙහි යනාදී හීන උකට ලිඟි෴ රා දෙස් මොහ ආදී හැමකෙලෙස් හීනයි෴ පරිජිආදී හැම ඇවැත් හීනයි෴ සොතාපත්තිසමාපත්තිආදී හැම උකටි෴ ඔටුයෙහි, එළුයෙහි, ගොන්හි, ගඩුබුයෙහි, තිරිසන්ගියෙහි, නෙරියත්හි, තට [5]සුගති නැති, තට [6]දුගති ඇති, මෙවුන්දම් පිළිබැදි කොට හවා එවු මාගම්පිරිමිනිමිත් පිළිබැදි කොට හවා එවු මේ හීන ඇකෙස්ලි නම්෴ පඩිතයෙහි, වියත්හි යනාදී උකට ඇකෙස්ලි නම්෴ අත්ධම්ම අනුසස්ලී පෙරදූරි කොට කියන්නාහට ද උම්තු ආදීනට ද ඇවැත් නැති෴

දූ ආදී අකෙස්ලීවතින් හවන පැවිජ්ජනතුන් [7]තොරෙන් අසා අතික්පැවිජ්ජක්හු ඔහුතොරෙහි බිඳැවී වැ එවු කල්බවක් කැමැති වැ එවු පිසුණු කියා නම් පවිති වෙ෴ අනුපසපනක්හට කියා නම් දුකුලා වෙ෴ අනුපසපනක්හුතොරෙන් අසා උපසපනක්හට එවු අනුපසපනක්හට එවු කියා නම් දුකුලා වෙ෴ පාප ගරහී වැ කියා නම් වරද නැති෴

1 සිප්. 2 ඇවැත්. 3 අකෙලෙස්ලි, අකෙස්ලි, අකොස්,
4 "වණ්ණකිසාමම්මා සීතිම වෙජ්ජකම්මං සීතිච ආදි හීනුකස්සකම්මං."—
5 සුගි. 6 දුගි, 7 අතින්. [සික්ඛාපදවලඤ්ජන.

අනුපසපන්නක්හට පදසොධම් කියාපාම් පිටිති වේ෴ මෙහි පදසොධම් නම් අනුපසපන්නක්හු තමා කෙරෙහි පෙළදම් කියවා ගන්නාසඳ ඔහු හා සමග එක්පදයක් මුළුල්ලෙන් එවු ඒ ඒ පෙදෙහි පටන් අකුරක් එවු අවසන් අකුරක් එවු එක්වැ [1]කියා නම් පෙදෙහි පෙදෙහි එවු අකුරෙහි අකුරෙහි එවු පචිති ඇවැත් වේ෴ අනුපසපන්නක්හු කෙරෙහි තමා කියවාගන්නාසඳ එවු ඔහු හා තමා එක් වැ පිරිවණනාසඳ එවු එක් වැ ගදුරනසඳ එවු ඔහු හෝ තමා හෝ පිළිවිස්නාසඳ එවු බොහොසුයෙන් ඔහට පුහුණු පෙළක් එවු එක් වැ [1]කියා නම් වරද නැති෴

සමත්පිරිසෙසින් හෝ [2]මුහුපිපරෙවියන් ඇතුළු කොට අනුපසපන්නක්හු හා සහසෙය්‍යපොහොනා ගෙහි හෙවැ තුන්අරුණක් ඉකුම්වා සතරවනදවස් හිරු [3]හවාමට ගියසඳ [4]පවා රූ එක් වැ බැසැ හොවී නම් පචිති වේ෴ මෙහි සහසෙය්‍ය පොහොනාගෙ නම් නොඑක්බුමුඇති නොඑක්ගබ්ඇති සෙනසුන් එවු බුමුදු ගබුදු නැති සෙනසුන් එවු එක්දොරකින් නික්මෙන සෙනස්ති෴ සබ්බච්ඡන්න සබ්බපරිච්ඡන්නයෙහි පචිති වේ෴ සබ්බච්ඡන්න-යෙභුය්‍යපරිච්ඡන්නයෙහිදු සබ්බච්ඡන්න-උපඩ්ඪපරිච්ඡන්නයෙහිදු, සබ්බපරිච්ඡන්න-යෙභුය්‍යච්ඡන්නයෙහිදු, සබ්බපරිච්ඡන්න-උපඩ්ඪච්ඡන්නයෙහිදු, යෙභුය්‍යච්ඡන්න-යෙභුය්‍යපරිච්ඡන්නයෙහිදු, යෙභුය්‍යච්ඡන්න-උපඩ්ඪපරිච්ඡන්නයෙහිදු පචිති වේ෴ මෙ සත්පචිත් තෙක් වේ෴

සබ්බච්ඡන්න-චූළහපරිච්ඡන්නයෙහි දුකුළා වේ෴ යෙභුය්‍යච්ඡන්න-චූළහපරිච්ඡන්නයෙහිදු, සබ්බපරිච්ඡන්න-චූළහච්ඡන්නයෙහිදු, යෙභුය්‍යපරිච්ඡන්න-චූළහච්ඡන්නයෙහිදු, උපඩ්ඪච්ඡන්න-උපඩ්ඪපරිච්ඡන්නයෙහිදු දුකුළා වේ෴ මෙ පස්දුකුළෙක් වේ෴ අනුපසපනු හෝ තමා හෝ නැගිහෝනා පියෝ ගැණැ ගැණැ ඇවැත් දත්නේ෴ බොහොඅනුපසපනුන් හා හොත අනුපසපනුන් ගණනින් ඇවැත් දත්නේ෴ දෙදවසක් එක් වැ හෙවැ අනුපසපනු හෝ තමා හෝ දෙජනා හෝ අරුණුනැගෙන සඳ හිඳැ අරුණු නැගුව ඇවැත් නැති෴

මෙහි සබ්බච්ඡන්න නම් හැම සෙවූයේයි෴ සබ්බපරිච්ඡන්න නම් හැමඅවට කොඩවර ඇත්තේයි෴ යෙභුය්‍යච්ඡන්න නම් මදක් තබා හැම සෙවූයේයි෴ උපඩ්ඪච්ඡන්න නම් සමයරක් සෙවූයේයි෴ චූළහච්ඡන්න නම් කුඩාතනක් සෙවූයේයි෴ යෙභුය්‍යපරිච්ඡන්න නම් මදතනක් තබා හැම කොඩවර ලූයේයි෴ උපඩ්ඪපරිච්ඡන්න නම් සමගරක් තැනැ කොඩවර ලූයේයි෴ චූළහපරිච්ඡන්න නම් කුඩාතනක කොඩවර ලූයේයි෴ මිනිස්මාගමන හා තිළුකුණු ඇති සෙනස්නෙහැ හිරු හවාමට ගියසඳ [4]පවා රූ එක් වැ

1 කියවා නම්. 2 මුහැටි 3 අවාමට. 4 පමා.

හොවී නම් හොත් විගසමැ පවිති වෙ෴පඬුවා හා එවු මෙවුන්ධමට වත් [1]මූහවි හෝ පරෙවියසා හා එවු දිස්මනුවූ සැකිති පෙතියතකා එවු හොවීනම් හොත්විගසමැ දුකුළා වෙ෴ මිතිස්මාගම හෝ තමා හෝ නැඟී හෝනා පිළියෝ ගැණෑ ගැණෑ පවිති වෙ෴මාගමුන් බොහො වුව මාගමුන් ගණතින් පවිති වෙ෴ සෙසු [1]මූහවිආදී මාගමුන් හෝ තමා හෝ නැඟී හෝනා පිළියා ගැණෑ ගැණෑ දුකුළා වෙ෴ඔවුන් බොහොවුව ඔවුන් ගණතින් දුකුළාවෙ෴රගස් නොකැමැති වැ හැම මාගමුන් එවු තමා එවු හුන සිපිය ඇවැත් නැති෴

තුළුල්තෙපුල් දන්නා විඤ්ඤූපිරිමිනියක්හු නැති වැ මිතිස් මාගමතට සපෙදෙන් වඩා පෙලුඹම් එවු අටුවාඬම් එවු කියා නම් තෙපුලෙයි තෙපුලෙහි පවිති වෙ෴මාගමුන් බොහො වුව මාගම්ගණතින් පවිති වෙ෴මෙහි සපෙදෙක් නම් සියුපෙදිගසින් ගෙළගයෙක් වෙ෴පඬුවහට යක් පේ මාගම්තට මිතිස්වෙස්ගත් තිරිසන්මාගම්තට දු කියාතම් දුකුළා වෙ෴සපෙදෙන් උතු කොට කියත් විඤ්ඤූපිරිමිතියක්හු ඇත වඩා කියත් ඇ හෝ තමා හෝ නැඟී සිටැ නැමැතැ හිඳැ සපෙදෙන් කියත් 'දික්සගියැ කුමක් කීහ' යනාදිවිසින් [2]පුසකළු හැමබණ කිවද ඇවැත්නැති෴

පරිජ්ජනොඅවත් උපසපන්පැවිජ්ජක්හු බොහො සහවෙසෙස් [3]ඇවැදුම් මත්තෙ ඔතට සැවුරැ නිසා මෙ පැවිජ්ජන්ගෙ මෙතෙක් ඇවැත් මෙතෙක් සුළෙහි සියැයුත්තෙයැයි බික්ඛනහු කාන්නා සොරෙන්෴මෙස් සාළ නතිනායැයි ගත් සම්මුති නැතියා වැ 'මෙපැවිජ්ජජා අසුචි මූද සගවෙසෙස් අවත්හ'යනාදී විසින් වත හා සමග ඇවැත් අනුපසපනක්හට කීහු නම් පවිති ඇවැත් වෙ෴සසු සඇවැත්කඳ එවු අනුපසපනක්හුගෙ පණිවා විකුම්ආදී පස්තුළුල්වරද එවු සෙසු නොතුළුල්වරද එවු කියා නම් දුකුළා වෙ෴වත්මාත්‍රාවක් ඇවැත්මාත්‍රාවක් කියා එවු මහණසම්මුති නොඉකුම්වා කියා එවු ඇවැත් නැති෴හැමසිඛ ඉයෙහි උමතුආදීතටදු ඇවැත් නැති෴

පොළෝකණී නම් පහරු පහරු පවිති ඇවැත් වෙ෴තණවා නම් තෙපුලෙහි තෙපුලෙහි පවිති වෙ෴මෙහි පොළෝ නම් තුන්වැදෑරුම් වෙ෴යෙ කෙසෙනි යත්:-සුදුපස් සුදුමැටි පොළොව, මද වැලි සකුරු පසණ කළුකලා නැබිලිති ඇති බොහොපස්ඇති මැටිඇති පොළොව,නැප කොට තුබූ මැටිරැස් පස්රුසියෙහි එකදවසක් වැසිවට නාරමස් [4]ඉකුත් පොළොව යන

1 මූහැවි. 2 පුසතාකල, පුසනාකළ. 3 අවදනෙ එසින් මත්තෙ. 4 ඉකුම්,

මෙතුන් ඇවැත්වන අයපපොළොවි෴ තුන්කොටසින් දෙකොට සක් වැලිඇදී වීනම් එක්කොටසෙක් පස් වීනම් එවූ මැටි වීනම් එවූ මේ ඇවැත් නොවන කැපපොළොවී෴ කී අයපපොළෝ දැගිය කැපපොළෝ වෙ෴ මෙතාණයි මෙමූල තාණයි එවූ මෙතෙන වළක් ළිඳක් පොකුණක් වැවක් තාණයි එවූ මෙතෙන හිරක් අද මෙතෙන ගිනිදලව මෙතෙන තාණුවක් [1]කොළ මෙතෙන සසු යනාදිවිසින් නියම කොට කීසඳ දූකුළා වෙ෴ ඔහු තාණන ආදි තාළසඳ පවිති වෙ෴ මෙතෙන තාණයි නියම නොකොට වළක් ළිඳක් පොකුණක් වැවක් තාණයි එවූ කැප කරයි එවූ වතාසේ දනයි එවූ කිව මැටි ගෙන, කැපකරයි එවූ මෙ වැඹව වළක් වනසේ දන, කැප කරායි යනාදී කිව වරද නැති෴ පොළෝ හා එක්බැදී නොවූ වියැළිමඩ ආදිජු නොබොල් ගන්වා ගතහැකි මඩජු කලකුරුවත් වරජ නැති෴

මිපස් සිතිපස් වේපස්ආදි පසුජු ගලතුළු ආදිතන්හි ඇලීගිය රජ බුලිජු අලුත නැඟු තුඹසුජු ගඩවුල්පසුජු කැප කොට අබ වසැ තුබු මැටිජු අබවසැ සිටි මැටිපවුරුජු එක්දවසකුදු වැසි වැසැ සාරමස් නොඉකුත කැපපොළෝ වෙ෴ ඉකුත අයප පොළෝ වෙ෴ මෙ කී මීපස්ආදිය වැස්සෙන් තෙත්තැන් අයපපොළෝ වෙ— ඇතුළු නොතෙත්තැන් කැප පොළෝ වෙ෴ [2]සෙවිතිආදී අනික්නොතෙතැ වටදියෙන් යාවත් තෙමේ නම් කැපපොළෝ වෙ෴ අබවසැ සිටි උළුපවුරෙහි මැටි කොටාගනුත් වටී෴ වැඹ තාණුආදි සොලවා බිම් නොවා එවූ දියවතුආදී දියඬරින් කොවා එවූ [3]වසම්තැන් සම කෙරෙම් සි මූසුන්ආදීන් ගසා එවූ කටුහිරවූ ආදී පෙළෙව්හි මෙනෙයා එවූ මා ඇවිදිතැන් පාඹිසි [4]බිම්බිදිමින් පා ඔබා එවූ කසන්නට [5]වෙරැපස්ආදීතැන්හි සිරුරු ගහා එවූ අත්දෝනා නිසා අයපපොළොව අත් ගහා එවූ දරපිදුරුආදී මත් තෙහි ගිනි තබා එවූ නොවටී෴ පොළෝ කොවනු සිත් නැති වැ ශුඬසිතින් වැඹතාණුආදී උපුරා එවූ පහණ්දූවැ අතුලියආදී වටනු පලනු අදනාආදී කෙරෙ එවූ දියවටනු දියඬරආදී පවත්වා එවූ තෙත්අත් ඔබා රජ ගනී එවූ අත් දනසඳ [6]නොඉසයෙන් බිමැ ගිනි පියා එවූ දමින් නොයතා [7]පහණකබල්ආදී මත්තේ ගිනි තබා එවූ ඇවැත් නැති෴ අයපපොළෝ කැපපොළොවැයි නොවන්නාහට ඇවැත් නැති෴

ගස් තුරු ලිය කලකුරැවා නම් පවිති ඇවැත් වෙ෴ මෙහි ගස් තුරු ලිය දීයාවූ නැගාවූබැවින් දෙමදූරුම ගවෙ෴ නැම නිලි පිසඹූ

---

1 කොළෙ. 2 සිම්නි. 3 නොසම්තැන්. 4 බිඹුනුම්න්.
5 වෙරනුළුව, වෙරසාස්. 6 නොඉවසයෙන්, නොඉවැසියෙන්. 7 පහණ කැටල.

රුදු [1]පරණලා මාහැල්ල සම්ලියආදි පත්ඇති තැන්හා දිමෙයෙහි මැ
තබා සිඳුනා බිඳුනාක් එවූ දියෙන් තෝරු තහන්නාක් එවූ
තොරෙතම් පවිති වේ෴ දියෙන් නැගුවා නොමලා කලකුරුවා නම්
දුකුළා වේ෴ දියෙන් නොනගා අතින් පහ කොට තබා එවූ දිය
හා මූසු කොට දෙහොත්ආදීන් දියෙන් නහා දියෙහි මැලා එවූ
ඇවැත් නැති෴ සිදුනාආදී කොට අනුන් කලකුරුවූ පිසඹුරුආදී
තෙමේ පුන කලකිරුවා නම් දුකුළාඇවැත් වේ෴ තලාවියෙහි
දෙන ගස්තුරුලිය එවූ කැපුසඳ වඩනා කේල් නුග ඇඹලෙළු ආදී
බිම තුබූ කණු එවූ කලකුරුවා නම් පවිති ඇවැත් වේ෴ කැපුසඳ
නොවඩනා තල් තෙරලුආදී බිම තුබූ දෙන කණු එවූ සපාජීසඳ
වඩනා නුග [2]ඉත්සලුආදි අතු එවූ කලකුරුවා නම් දුකුළා
වේ෴ පුහුන් කේල් නල හුණුආදී නිගත්සඳ කලකුරුවා නම්
පවිති ඇවැත් වේ෴ මියමින් සිටි දෙන කේල් නල හුණු ආදී කල
කුරුවා නම් දුකුළා ඇවැත් වේ෴ හිහුරු [2]ඉත්සලු නුගආදී හිඳුවූ
සඳ මූලුජු පතුජු දුන්යා කලකුරුවා නම් පවිති ඇවැත් වේ෴ මුල්
එවූ පත් එවූ දෙකින්තෙකක් දුන්සඳ කලකුරුවා නම් දුකුළා
ඇවැත් වේ෴ පවුරුආදීතන්හි සෙවෙල් දෙකක් තුනක් පත්
දුන්සඳ කලකුරුවා නම් පවිති ඇවැත් වේ෴ පත් නොදුන්සඳ
කලකුරුවා නම් දුකුළා වේ෴ මනා ඕ වියැළිසඳ ගහාපියන්
වටී෴ කල නොහලාආදීය බැහැර සෙවෙල් එවූ නොපිපි සතු එවූ
කලකුරුවා නම් දුකුළා වේ෴ කලුකොතලාආදීය ඇතුළු
සෙවෙල් එවූ පිපිසතු එවූ දුහැටුආදීය පුස් එවූ කලකුරුවා නම්
ඇවැත් නැති෴ ගස් තුරුලියෙහි සුඹුළු නොකොවා එහි ලහබූ
ආදී ගනී එවූ දෙනතැන් තබා මලදඹුආදී බිඳ ගනී එවූ දෙන
ගසාදී මෙලේසයි බිදී එවූ කලකිරුවම් යන රිසිතැන්වැ කල
කිරුවා එවූ වරද නැති෴ මෙහි කලකිරුවිම් නම් සිඳුනා බිඳුනා
දවන [3]නියඑබීම ආදී෴ දෙන පත අකුරුගා හිරි අදී එවී නිය
ඔබා එවූ මල් පක් විලිකුත් පතාදීන් රුක්ආදී සලා ගලවා නම්
පවිති වේ෴ පක්ඇති අතු කැප කරන අනුපසපනක්හට නමා
දෙත් වටී—එ පක් නමා නත් නො වටී෴ අනෙකකුලවා ඔසවා
ඔහු ලවා කැප කරවා වළඳත් වටී෴ මල්පල්ලේ විනිස මෙ
කැප විනිසයේ කීසයින් දත්වෝ෴

රුක් ලිය අල මුල් සිඳැ බිඳැ කැණැ ගෙනෙවයි මෙයස් අනි
යම කොට කියත් වටී෴ මෙ රුක් කප සිඳ බිඳ දව අල මුල්
කණවයි මෙසේ නියම කොට කියත් නො වටී෴ මූළු කොට තුබූ
කැපකටයුතු පතාපැතිජු කපා තුබූ [4]නැමෙහන අබුආදීදු එක්
දෙසෙසකැ කැපැ කැරවුව හැම කැප වේ෴ දරමුසු උක්කලබ

1 පරඹලාමහල්ලසල්ලිය. 2 ඉම්සලු. 3 නියඑවිම්. 4 නොහදන, නොනෙන.

කැප කරවනසඳ කැප කරන අනුපසපන් තියසැතාදී දඬෙ
ඔබා කැප කොරෙ නම් වේ෴බදවැල විජැ කැපකරත් නො
වේ෴අරළු ආදි පතෙකලා පත කැපකරත් නො වේ෴අරළු
ආදි මත්තෙහි තිලිගත් පතක් තබා පත විඳ කැප කරත් වේ෴
බත්මුසුපක් කැප කරවනසඳ [1]බත්හුලු විඳ කැප කරතුදු වේ෴
උතු හා එක්බැඳිවූ විලිකුන්බිජුඇති ගිමුලුආදී උත්තේ විඳ
කැප කරවත් වේ෴උතු හා එක්බැඳි නො වුව උතු අරවා කැප
කරවත් වේ෴පනුහඹුආදිය ලුමූ කැප නොකල හිඟුරැ ආදී
දිය හරවා කැප කරවත් වේ෴මෙ බිදිම් යනාදී නො දූනැ එවු
සිඟි නො එළුවා එවු සිඳුනාබිඳුනාදි කළු ඇවත් නැති෴

බිස්සනහු අයත් ඇඳ පුටු බිසි බදවෙළු යන මෙසැතරින්
එකක් වසාවන සාරමස් දවස යම් රටෙක්හි [2]හිමවැසි වසීනම්
හිමත් සාරමස යන මෙ අටමස අබවසැ එවූ කවුඩුකොක් ආදීන්
පියවින් ලග්නා රැප්පයැ එවු අතුර එවු අතුරුවා එවු සඟවනු
නොකොට අබවසැ තුබූ පිරිකරින් දෙලෙඩුපා එක්පියවරින්
ඉකුත දුකුලා වෙ෴දෙපියවරින් ඉකුත පචිති වෙ෴මෙකි සතර
පිරිකරතබා සෙසු පිරිකර යටත්පිරිසෙසිහ් පත්වලල්ලකුදු කි
අබවස ආදියැ තබා දෙලෙඩුපාවක් ඉක්මෙතම් දුකුලා වෙ෴
මෙකි බදවෙළුනම් කුසතණ බබුස්තණආදී මූළුකොටගෙනැ
පාසිස්හිසේ මැඳහුරේ වෙළා [3]සලාතුරැසේ දෙකෙළවර පුජ්පා
බැන්දේසි෴මෙකි දෙලෙඩු පා නම් බලමැදුම් පිරිමිනියක්හු තමා
බෙලෙන් තහාලූ පහණක් හුණුතැනින් වැටෙමින් ගියතැන්
නොගන්නෙ*෴තමාගෙ පිරිකර එවු තමා හා විස්වස්ඇති පුග
ලාගෙ පිරිකර එවූ අබවසැ තබා යේ නමුදු සඟවනුආදී කොට
යේ නමුදු වියැ ලන්නට තබා පස්සේ නගා තබම් යේ නමුදු
එක්තරා අනතරායෙකින් පියායේ නමුදු ඇවැත් නැති෴

සඟසතු එවියන් නැගෙන ගබාදි සෙනස්නෙහි සඟසතු "භිසි
චිලිමිකා උත්තරත්ථරණං භුම්මත්ථරණං තට්ටිකා චම්මඛණ්ඩො
නිසීදනං පච්චත්ථරණං තිණසන්ථාරො පණ්ණසන්ථාරො" යනමෙ
දශශය්‍යාවන් අතුරෙන් එක්තරාවක් තබා ගමනීවැ සඟවනුආදී
නොකොට උවසරහිම් එක්පයකින් ඉක්මෙතම් දුකුලා වෙ෴
දෙවනපයින් ඉකුත පචිති වෙ෴මෙහි භිසි නම් සිවුරැ පියැලි
කොලාදී ඇතුළලා බැහැරැ සිවුරැආදී පාරවා කරනලද්දේසි෴
චිලිමිකානම් සිවුරැ පියැලි ආදී ගෙත්නම් කොට පිරියම්කල බිම
රක්නට කරනලද්දේසි෴උත්තරත්ථරණනම් ඇඳදුටු මත්තේ
අතුරන අතුරි෴භුම්මත්ථරණනම් චිලිමිකා ඇත එමත්තේ අතුරන
චිලිමිකා නැත [4]සිස්බිමැ අතුරන [5]කළ පැදුරැආදී෴තට්ටිකානම්

---

1 වැරදහුලු, වැරුදුහුලු. 2 මැදව සීතම. 3 සලාතුරාසේ, සල්තුලාසේ
4 සිස්බිමැ. 5 කළාල්. * මෙකි උඟ්‍ර නාඩියක් පැනේ.

තල්පත් ආදීන්කළ මැඩිලිපතාදියි෴වම්මබණ්ඩ නම් හිඳුනා යම් කමරි සමෙක්෴සෙනසුන් පරිභොගවැ නොවටනා සම් නැති෴ නමහට පස්වටත් එළුසම් මුවසම් මතු වයි෴නිසීදන නම් ලොමින් කඩින් කළ නිසජුන්සිවුරි෴පච්චත්ථරණ නම් කොජුකා පවුරි෴තිණසන්ථාර නම් තණඅතුරිලි෴පණ්ණසන්ථාර නම් පත් තුරිලි෴උවසරහිමි නම් හැම සෙනසුන් ඇතුළුවනොට එවු පිරිවෙන් ආදී ඇත හැම පිරිවෙන් ඇතුළුවනොට එවු ලූ වුරුආදි පිරිවෙබෙවු දූ පිරිවෙබවු නැත බික්සඟනට [1]වැළඳුම්න බොජුන් හලාදි අවසන් සෙනස්නෙන් දෙළෙඩුපායි෴දෙකිනෙසයින් පිරිවෙවු එවූ දෙලෙඩුපා එවූ උවසරසිමැයි දතයුතුයි෴වයන් නොනැගෙන සෙනස්හෙන් තබා යන් ඇවැත්නැති—සඟවනු ආදී කරවනු වති෴ බික්සඟුන් එළඹෙන වැළැකැ රුක්පා බොජුන්හලාදි තෙන තබා සඟවනු ආදී නොකොට යේ නම් දුකුළාවෙ෴සෙසු අනතුරැ සිඛපදයෙහි කීසෙයින් දන්නෙ෴

දූනැ එවූ අසා එවූ මෙදියෙහි පණුවො ඇතැයි දූනැ දූනැ එදියැ තණ මැටි [2]උඳුසුනු ආදිය ඉසැ එවු පණුවන් මියනාසේ නගන ආදී විසින් පරිභොගකෙරෙ එවු පියොයි පියොහි පචිති වෙ෴අනුන්ලවා ඉස්වා නම් ඔවුන්ලවා ඉස්වනාසඳ මොහු තෙපු ලෙහි තෙපුලෙහි පචිති වෙ෴පණුවන් නැති දියෙහි ඇ[.]ැයිසිතා පරිභොගකෙරෙ නම් එවු පණුවන් ඇති දියෙහිජු නැති දියෙ හිජු පණුවො ඇති හෝ නැති හෝයි විමතිකා වැ පරිභොග කෙරෙ නම් එවු දුකුළා ඇවැත් වෙ෴අයපදිය නොදූනැ නැප යැයි පරිභොගකෙරෙ නම් ඇවැත් නැති෴

නොනැ මාගම් පැවිජ්ජට විනපුන් පොහොනා සිවුරකුදු ඇ අතින් යටත්පිරිසෙයින් අරළු කඩකුදු නොගෙනැ එවු ගන්මී යන ආභොග නොකොට්න් එවු දේ නම් පචිති වෙ෴මෙ සිඛයෙහි සෙසු විනිස යටිනි නොනැමාගම් පැවිජ්ජ අතින් සිවුරැගත් සිඛයෙහි කීසෙයින් දන්නෙ෴නොනැමාගම් පැවිජ් ජගෙ නැන්දූනැයි පෙරැවියැහැයි සිවුරෙක තමා ගෙන්නම් කරනසඳ බොහො විදසිජු හිදකටු තෙරනාගණතින් පචිති වෙ෴ අනුන්ලවා ගෙන්නම් කරවනසඳ මෙසිවුරැ ගෙන්නම්කරයි එක් වම ඇණැවුව එක්පචිත්තෙක් වෙ෴නැ[.]න නැවත ඇණවන් තෙපුල් ගණතින් පචිති වෙ෴මෙ සිවුරේ සාටුයුතු ගෙන්න[.] හැම කරයි ඇණැවූසඳ බොහො විදසිජු හිදකටු තෙරනාගණතින් දෙ දෙනහට පචිති වෙ෴සිවුරැ තබා ගෙන්නම්කරන් වරද නැති෴ මෙ සිවුරැ පිරිකර තබා සෙසු ගෙන්නම් කරන්නාහටදු නො මාගම් පැවිජ්ජගෙ එවු නැ නො නැ සික්ඛාමාන සෙරණියන්ගෙ එවු සිවුරාදි හැම පිරිකර ගෙන්[.]ම් කරන් ඇවැත් නැති෴

1 මැළඳුම්වන. 2 උණුසුනු.

[1]පැවැරිවැ අසිරිත් නොවූ බොජනක් වළඳන්නට ගත දුකුළා
වෙ෴ පරහලා කළසඳ පවිති වෙ෴ 'ඔදනො, කුම්මාසො, සත්තු,
මච්ඡො, මංසං' යන මෙ පස්බොජුන් අතුරෙන් එක්තරා බොජ
නක් [2]සිඛතු මාත්‍රාවකුදු පරගලා කළසඳ එ මැ වැනි බොජනක්
මියෙහි ඇත වළඳන බජනෙ එවු ඇතිසඳ පස්බොජනෙන්
බොජනක් ගෙනැ දෙරියන්වියත් අත්පසැ සිටැ දෙන්නට එළවූ
සඳ නායින් එවු තෙප්ලෙන් එවූ පිළිබෙව් කෙළෙ නම් මෙපසඟින්
[1]පැවැරි වෙ෴ මෙහි පසඟ නම්:--බොජුන් පරගලා කිරීම් [3]එකැ,
පරගලා නොකළ බොජුන්ඇති බව් [3]එකැ, බොජුන් ගෙනැ අත්
පසට ආබව් [3]එකැ, අත්පසැසිටැ දෙන්නට නතු කොට එළවූබව්
[3]එකැ, පිළිගන්නා පැවිජ්ජාගෙ පිළිබෙව් [3]එකැ යන මෙ පසඟි෴
මෙහි ඔදන නම්:-හැල්, ගොයුම්, වී, යව, තණ, වරු, හැමියැ යන
මෙ සත්ධඤ්ඤයකුදු හුරුහැල් ගොඩහමු වරුදෙරිය යන
අනුලොම් ධඤ්ඤයකුදු ගෙනැ පක්ව බතුදු අත් එරවැ ගත්
තැන්හි වල පැනෙන බොල්හඹුදු ඔදන නම්෴ කුම්මාස නම්:-යව
යෙන් කළ කොමුයි෴ සත්තු නම්:-අනුලොම ධඤ්ඤසහිත සත්
ධඤ්ඤයෙන් සාර කොට බැදූ කළ හති෴ මච්ඡ නම්:-දියමසි෴ මංස
නම්:-ගොඩමසි෴ බතැ කිරි කාඩි දිය ආදී හෙවැ හඹු ගන්වයි
දෙන්නා පිළිබෙව් නොකෙරෙ නම් [1]පැවැරි වෙ෴ [4]බත් කිරි ආදී එවැ
කාකාරා දෙන්නා පිළිබෙව් කෙරෙ නම් බොල්වුව [1]පැවැරිජනවා;
තුනු වුව පැවැරි නොජනවා෴ වළඳන හඹුයෙහිජු පිළිගත් හඹු
යෙහිජු එළවූ හඹුයෙහිජු [2]සිඛතු මාත්‍රාවකුදු මස් ඇත හඹු තුනු
වුවද පැවැරි ජනවා෴ කී ධඤ්ඤ නබා සෙසු හුණුදෙර ආදී සාලේ
බතුදු කී කොමු නබා උදුකොමු මුගුකොමු ආදී කොමුදු සාර
කොට නොබැදී ධඤ්ඤයෙන් කළ හතුදු විලඳදු පුලුජු සාලුදු
විලඳින් කළ හතුදු බතුදු කී පස් බොජුන් අතුරෙන් එක්තෙරෙ
කින් නොමුසුවූ බැජුන් පකාපැකි හැම [1]පැවැරි නොජනවා෴ පස්
බොජුන් එවු බොජුන් මුසු සෙසු දෙයක් එවූ රසහඹු ගන්ව යනාදී
පැවැරි නොජනවන නැමින් කියා එළවූවා පිළිබෙව් කළ පැවැරි
නොවෙ෴ පස්බොජුන් එවූ බොජුන් මුසු සෙසුදෙයක් එවූ බත්
ගන්ව මස්රසහඹු ගන්ව යනාදී පැවැරිජනවන නැමින් කියා එවු
නම් නොකියා මෙ ගන්වයි කියා එළවූවා පිළිබෙව් කළ පැවැරි
වෙ෴ පැවැරිජනවන බොජනක් වළඳමින් පැවැරි නොජනවන
බොජනක් එළවූවා පිළිබෙව් කළ පැවැරි නොවෙ෴ පැවැරි නො
ජනවන බොජනක් වළඳමින් පැවැරි ජනවන බො[ජ]නක් එළවූවා
පිරිබෙව් කළ පැවැරි [5]නොවෙ෴ සීහමස් ආදී අයප මසුදු කුලදුසු
නැමිතිජු වෙජකම් කිරීමෙහුජු උතුරුම්නිස්ඩම් ඇරෙජ්

1 පැවිරි. 2 සිද්ගතු. 3 එකු. 4 පඤ්ඤසිතෙසු උදකාදිසු භනන බීරා දිහි පකකිපිත්වා" සි සික්ඛාපදවළඤ්ජන පාඨයි. 5 ජනවං.

මෙනුජු රත්රිදී ආදී අගප වස්තුවිසින් අගපතම්සතින් වැවෙහි පස්වඩනා ආදී විසින් උපන් බොජුනුදු එළවූවා පිළිබෙව තමයුත්නාකළබැවින් පැවැරි නොජනවා෴මියෙහි වූවා නොගිලි ගැවි වැ අත හා බුජුනා බජනෙ තුබූ බොජුන් හා නොබුදූවි වැ එවු අන්නට දියැවිවැ එවු බැහැර ගොස් බිදූවිවැ එවු එළවූ බොජනක් පිළිබෙව් කළ පැවැරි නොවෙ෴මෙහි අත්පස් නම්:හුන් පැවිජ්ජ පැසුවිඅස්නෙත් සිටි පැවිජ්ජ [1]විළිමින් නොත් පැවිජ්ජ පිළිගන්නාපසතබා මෙරුම්පසින් අනුපසපන්හු දෙන්නට දික්කළ අත්තබා වැළැන් අහෙතින් දෙරියන්වියක් අත්පස් නම්෴නොත් පැවිජ්ජන පාමුලැ සිටැ එවු හීස්දෙරු සිටැ එවු පිළිනන්වා නම් නැගී සිටැ හිඳැ එවු ගටපා හකුළුවා එවු පිළිගන්නෙ෴පිළිගන්නෙ එවු දෙන්නෙ එවු [2]අටුරික්ළිඳු ආදී මත්තෝ වී නම් ගන්නෙ එවු දෙන්නෙ එවු ඇට වී නම් යටවුවහු යිසින් මත්තෝවුවහු ගන්නාට එවු දෙන්නාට එවු දික්කළ අත්තබා වැළැත් අගෙහින් දෙරියන් වියත් අත්පස් නම්෴වැළැතැ හුන් පැවිජ්ජන් බොජුන් අතින් ගෙනැ එවු බජනෙන් නහා එවු එළවූවා පිළිබෙව් කළ අත්පස් ඇති බැවින් පැවැරි වෙ෴බොජුන් නොඑළවා මෙ ගන්මයි කීසඳ පිළිබෙව් කළ පැවැරි නොවෙ෴සරතල්ලෙන් ඇවිසැ නැගුසඳ පිළිබෙව් කළ පැවැරි නොවෙ෴වැළැතැහුන් අතිහක්හට දෙන්නා පිළිබෙව්කළ පැවැරි නොජවෙ෴හිඳැ පැවැරි වුව අසුන් නොනොවා හිඳැ වළඳත් වටී෴අසුන් නොවුව කැප කරවා එවු ගිලන්හට අවක්සා අළුවා එවු වළඳත් වරජ නැති෴කැප කැරුවීම් මෙකියනසේ දන්නෙ:-පැවැරිවූ උපසපන් පැවිජි නොතකුන් බිදූයුතු ධැමින් උපන් කැපබොජනක් පිළිගන්වා එබොජනෙහි ඇති හිගුරු කේල්ආදී කැපකරවාගෙනැ කැපකරවන පැවිජ්ජන් අත් පසැ හිඳැ ඔවුන් "අලමෙතං සබ්බං"යී කීසඳ නාමා අතැ තුබූ බොජනක් මඳක් නහා බහන්නෙ෴කැපක මන පැවිජ්ජන් පැවැරි වූව අස්නෙත් නොනැගී නොපැවැරි වූව පස්බොජනෙන් බොජනක් මඳකුදු පරහලං නොංවින් කැප කරනම නමා අත්පසට එළවූ බොජුන් "අලමෙතං සබ්බං"යි එක්ගලක් කියා කැප කරවන්නෙ෴කැප කළ බොජනෙහි කැප නො කළ බොජුන් මුසු නොම වළඳත් නොවටී෴පළමු කැපකළහු තබා එ මෙ බොජුන් අනෙකකු ලවා කැප කරවා වළඳත් වටී෴කැපකළ බොජුන් පළමු කැපකළහු ලවා කැප කරවත් නො වටී—අනිතකු කැප කරත් වටී යූ නැති෴පළමු බොජුන් කැපකළ බජුන් දෙවාගන්නෙහි එවු පළමු කැප නොකළ බජනෙහි එවු ඔත් අමිස් එක් පැවිජ්නෙතකුන් එවු තන්පැවිජ්ජන් එවු පුනපුනා කැප කරත් වටී෴මෙසේ කැප කළා පළමු කැප නෙලෙහි ලා බුදුත් වටී෴මෙසේ කැප කළ

1 විළිඹිණ්. 2 අටුරික් ළිදුස් ආදිහි.

බොජුන් තැප කළ පැවිජ්ජන් තබා සෙසු හැමදෙනා බොජුන් වරී෴ යම්කැලිආදි තුන්කැල්ලන් පස ඇත තැප නො කරවා අමිස් මුසු නො කොට වළඳත් වරී෴

පැවැරිවූ පැවිජ්ජක්හු පැවැරිවූබැව් දැනැ දැනැ ඔහට නො රුස්නා කටැපිරිසින් කැපනොකළ ගිලන්ගම නොඅළ බොජුන් මෙබුදැ සි එළවා නම් දුකුළා වේ෴ ඔහු පරගළා කළසඳ එළවූවාහට දුකුළා වේ෴ බිඳු නිමියක් කල එළවූවාහට පචිති වේ෴ බුජ්නාහට ඇවැත්ආදී අනතුරුසිඛයෙහිකී සෙයින් දත්තේ෴ සවනසික් නැත්තාහට ජු නොදන්නාහට ජු ඇවැත් නැති෴

[1]විකාලැ යව්කැලිබොජනක් වළඳන්නට [2]පිළිගත් මහණ හට දුකුළා වේ෴ දැනැ නොදැනැයිදු පරගළා කළසඳ පචිති වේ෴ පෙරවරිණයෙහිදු පස්ඇති හෝ නැති හෝයි වළඳත් දුකුළා වේ෴ මෙහි විකල් නම් [3]හිරිමැදුම්තෙන් ඉකුත්සඳ [4]පටා අරුණු නැඟෙනතාක් සඳි෴ පිළිගත්වා ලග්වා සනාතිබි කළ යව්කැලි යම්කැලි කැපබොජනක් වළඳන්නට ගත්සඳ දුකුළා වේ෴ දැනැ නොදැනැ පරගළා කළසඳ පචිති වේ෴ මිනිස්මස්හා මුසු වූව ථුල්ලැසි හා සමඟ පචිති වේ෴ විකල් වළඳත් කැපබොජනෙහි සනාතිබිපසයෙනුදු විකල්පසයෙනුදු දෙපචිත්තෙක් වේ෴ මිනිස් මස් හා මුසු වූව දෙපචිත්තෙක් හා ථුල්ලැසි වේ෴ සෙසු අයපමස් හා මුසු වූව [5]දුකුළා හා සමඟ පචිති වේ෴ සනාතිබිවූ කැපබොජන් පැවැරි වැ කැප නො කරවා පෙරවරු වළඳත් දෙපචිත්තෙක් වේ෴ මිනිස්මස් හා මුසුවූව දෙපචිත්තෙක් හා ථුල්ලැසි වේ෴ සෙසු අයපමස් හා මුසු වූව දෙපචිත්තෙක් හා දුකුළෙක් වේ෴ විකල්හි වළඳත් කැපබොජනෙහි සනාතිබිපසයෙනුදු විකල්පසයෙනුදු දෙපචිත්තෙක් වේ෴ මිනිස්මස් හා මුසු වූව කී දෙපචිත්ත හා ථුල්ලැසි වේ෴ සෙසු අයපමස් හා මුසු වූව කී දෙපචිත්ත හා දුකුළා වේ෴ සනාතිබිවූ යම්කැලි පෙරවරු පසඇති වැ වළඳත් හුදු පචිත්තෙක් වේ෴ අනතිරිත්පසයෙන් ඇවැත් නැති෴ විකල්හි පස් ඇති මැ වළඳත් හුදු පචිත්තෙක් වේ෴ පස නැතිවැ වැළඳූව දුකුළාවක් හා සමඟ පචිත්තෙක් වේ෴ සනාතිබිවූ සතැවිකැලි යව්දිවිකැලි පෙරවරු පස්වරු පස නැති වැ අමිස් නො මුසු නොකොට වළදත් දුකුළා වේ෴ අමිස් මුසු වූව පචිති හා සමඟ දුකුළා වේ෴ මෙහි අමිස් නම් යවුකැලි යම්කැලි යි෴ පෙරවරු පිළිගත්වූ සතරකැලි මුසු වූව පෙරවරු මතු වරී෴ පස්වරු පිළිගත්වූ යම්කැලිආදි තුන්කැලි මුසු වූව එදවස් රැ අරුණු ඉක්මෙනතාක් වරී෴ සතැවිකැලිමුසුවූ යව්දිවිකැලි පිළිගත්වූ සත්දවසකට මතු

1 විකාලයෙහි. 2 පිළිගත්තම පිළිගත්. 3 හිරුබුදුතෙන්. 4 පවා.
5 දෙපචිත්තෙක්හාදුකුළෙක්.

වී෴යව්කැලි මුසුවූ මෙරුම් තුන්කැල්ලන් දෙවැ හෝ පිසපියා හෝ පිරිසුදු කොට තොර කළ යම්කැලි යමෙතට, සතව්කැලි සත්දවසකට, යව්දිව්කැලි දිවිහිමියෙන් වී෴යම්කැලි මුසුවූ සතව්කැලි යව්දිව්කැලි කිසෙසීන් තොර කළ කී කී කලට වී෴සතව්කැලි මුසුවූ යව්දිව්කැලි කිසෙසින් තොරකළ දිවිහිමියෙන් වී෴සතව්කැලි කොට තල්සකුරු පුලුප්සකුරු නො ගනුව-මෙ දෙක පෙරමරුමුත් පස්වරු නො වී෴[1]වතනය නොහසල බාලයන් සකුරු වුව කිමැ නො පිවාරා මධුරතාව පිණිසැ වැලැදුව නො වී෴[2]මෙයට කාරණ [3]කුරුදුවුවාහි වැලැදුව විකල් බව් කිවු෴කල් ඉකුම්වූ යව්දිව්කැලි සතවුකැල්ලෙහි ලුව පත නො පතැසිදු සත්දවසකට වී෴සතවුකැලිජු යව්දිව්කැලිජු අයප කිලියැ තුබූවා අයප කිලියැ [4]කමා පතාසිජු වී෴යව්කැලිජු යම් කැලිජු අයපකිලියැ තුබුවා අයප කිලියැ [4]කමා පතාසිජු නො වී෴පිළිගන්වා සක්දවසක් ඉකුම්වූ සතව්කැලිජු යව්දිව්කැලිජු එමෙ දවස් පිළිගැන්වූ යව්කැලි යම්කැලි හා මුසු කොට වැලැදුව පවිති වෙ෴

සතරකැපකිළි අන්නෝයි—ගෙ කවරුයත්:—සම්මුතිකිළියැ, උස්සාවනන්තිකා කිළියැ, ගොනිසාදි කිළියැ, ගහපතිකිළියැ යන මෙ සතරකිළි෴ලග්නාගෙනක් සග් සඳහාහිදෙවනතැමින් සමජ් නම් ගෙ සම්මුතිකිළි නම්෴ලග්නා සෙනසුන් කරන්නට තිමවා රූ කළ බිමැ පළමුහි පිහිටුවන වැඩැ එවු උළුයෙ එවු බොහො බික්සගුන් අත්ලා—"කප්පියං කුටිං කරොම, කප්පියං කුටිං කරොම" යී වදන් පිහිටුවා කළ සෙනසුන් උස්සාවනන්තිකා නමු෴බොහොසුයෙන් පිරිබෙව් නොකෙළෙහි එවු සියලු පිරිබෙව් නොකෙළෙහි එවු අරම්හි ලග්නට කළ සෙනසුන් ගොනිසාදි නම්෴පැවිජ්ජන් තබා සෙසු [5]සහධැමියන් එවු ගිහිමිනිසුන් එවු මෙකැප කිළී දුන්නොයැයි දුන්නෙ එවු ඔවුන් අයත්වූයෙ එවු ගහපතිකිළී නම්෴මෙ සතරකිළිද් ලග්නට නොකළ බොජුන්හල් දුහැටිපැල් දියපැල් ගිනිපැල් දෙරොටු බත්ගෙයැ යන මෙ හැම කැපකිළී නම්෴මෙනෙක් තෙනැ තුබූ පැවිජ්ජන් අයත්වූ යව්කැලි යම්කැලි අනොනා වුළු නම් නො වෙ යී වී෴මෙහි මැ පැක්තෙ අනොනාපකක නම් නො වෙ යී වී෴මෙකී කැපකිළි තබා සඟහුගෙ එවු පැවිජ් තෙකකුන්ගෙ එවු අයත් ලග්නට කළ සඟසෙයකපාහොනා සෙනසුන් අයප කිළී නම්෴අයපකිළියැ තුබූ පැවිජ්ජන් අයත් සතව්කැලි යව්දිව්කැලි මෙරුම් දෙකැල්ලන් හා මුසු කොට

1 නැ නොනැහසල බාලයෝ. නැනොනැනොහසල බාලයෝ.
2 මෙට. 3 කුරුදුවුවාවෙහි. 4 පකතමාපකාසිජු. 4 සහධැමියනක්.

වැළැඳුව දුකුළා වෙ෴සතවීකැලි යවිදිවිකැල්ලන් පැවිජ්ජෙ පිසැ මෙරැම්දෙකැල්ලන් හා මුසු කොට වළඳත් නම් සාමපාකයේ දුකුළා වෙ෴අයපකිළියෙහි අනුපසපනුන් අයත් කොට තුබූ සතර කැල්ලනුදු පැවිජ්ජෙ වළඳත් නම් වරී෴

පිණීබොජුන් නොලදප් යැපෙනබැවින් නොගිලන් වැ පිණීබොජුන් විනවා වළඳත් පචිති වෙ෴මෙහි පිණීබොජුන් නම් මස්වටනා සතුන්ගෙ කිරි දිහි වෙඬුරු ගිතෙල් යට කී ලකුණුඇති මී සකුරු තෙල් දියමස් ගොඩමස් යන මොවුන් හා මුසුවූ සත්ධඤ්ඤමුවා බති෴'කිරි එව බත් දෙව' යනාදි විසින් මුසු කොට විනවුව මෙ සිඛයෙන් පචිති වෙ෴නොගිලන් වැ වැළැඳියැ යුතු ගිතෙල් මී වෙඬුරු තෙල් සකුරු විනවුව මහානාමසිඛයෙන් පචිති වෙ෴මෙ පස් බෙහෙසද් තබා සෙසු බොජනක් විනවත් සිඛකරණීයැ කී දුකුළා වෙ෴දූහැවී දිය තබා සෙසු නොපිළිගත් සතරකැල්ලන් වළඳන්නට ගනී නම් දුකුළා වෙ෴දූනැ නොදූනැ පරගලා කළසඳ පචිති වෙ෴මෙහි දූහැටි කාපියන්නට [1]අනුදත්තෙ෴නොපිළිගත් දූහැවී කමින් තෙල ගිලූව පචිති වෙ෴මෙහි පිළිගත්තේ නම් පැවිජ්ජන් තබා එක්තරා සතක්හු අත්පසැ සිටැ කායින් එවූ කාපිළිබද්දෙන් එවූ නිසග්ගෙන් එවූ දෙන කිසි වතක් පැවිජ්ජෙ ගන්මීසි යන සිතින් කායින් එවූ කාපිළිබද්දෙන් එවූ මියෙහි ඕනාකුදු ගන්මී සි යන [2]සිත් එළවූ නම් පිළිගත්තෙ වෙ෴පිළිගන්වන්නහු එළවූ වත් පැවිජ්ජන් අතැ එවූ බජනෙහි එවූ පැහැරුදු හිණී නම් පිළිගත්තෙ වෙ෴ඇවිස්නා ලූවින් පෙරම වැ එවූ පස්සෙ එවූ හුණූ [3]පිඩකුදු එළවූ බජනෙන් හුණූ දූළිආදීදු පිළිගත්තෙ වෙ෴වැළතැ පැවිජ්ජන් පිළිගත් පය පැහැරු තමා පය හුණ ඔවුන් පිළිගත්බැවින් වරී෴පයැ හුණූ [4]පත්කසළ ආදී මුසු නොකොට හුණූතැනින් හැරුපියා වළඳත් වරී෴සැනාදීන් උග්දඹුආදින් [5]කපකසඳ මල පත්තෙ නො වරී෴පිළිගන්වා තුබූ සැක අලුත්මල නැංග පුන පිළිගන්වාගනුත් වරී෴රුක්මඹුආදිය වට කිලුටූ දිය පිළිගත්තෙහි වගුල අපිළිගතූ වෙ෴සතීවාරයේ ගස්ආදීන් වගුළ පිරිසුදු දිය එවූ හැමසඳ අබවසැ වැසි දිය එවූ වරී෴මැදුම් පිරිමිතියක්හු එසෙවියහැකි බරක් අනුපසපනක්හු නොනහා බිමැ තබා වටා පිළිගන්වන්නාක් තමා බිමැ එබූ අත එක්දෙසෙකින් පහළ පිළිගත්තෙ෴ගිතෙල් බඳුන්ආදී හැඳවල් ආදියැ එල්වා තුබුව එ හැඳආදියැ පැවිජ්ජන් නැඟීහුණ ජු වරජ නැති෴පිළිගත් තෙල්බඳුන්ආදී යම

1 අනුදත්තෙ, 2 සිතින්, 3 පිසාකුදු, 4 පස්, 5 කැපකරනසඳ, කපාකනසඳ.

තබා නොපිළිගත් බජුන් මත්තේ තුබුව පැවිජ්ජෝ මතු බජුන් බහා තබා යටබජුන් ගනිත් නම් මත්තේ බජනෙ තුබූයේ [1]උග්ගුනු වෙ෴ [1]උග්ගුනු වූවා පිළිගත්වයිදු වළඳත් නොවටී෴ අපිළිගතුව යට වුව මත්තේ පිළිගත් බජුන් තබාගනුත් වටී෴ අනුපසපනක් හට තකා නොපිළිගන්වාගත් පසා පැකිආදීජු පැවිජ්ජන් බැහැරැ සිරුරු පරිභොග නිසා නොපිළිගන්වාගත්තා ජු වැළැඳි යැපි වුව නැවැත පිළිගන්වාගෙනැ වළඳත් වටී෴ ඉදින් පළමු පිළිගත එ පිළිගහණ වටී෴ මඳක් බොල් දිය නොපිළිගතද වටී෴ ඉතා බොල් වුව දියෙහි ඈ අත ඇලැළී පැනෙ නම් නො වටී෴ සහව නැත බොල්දිය නො වටී෴ රොන් කොදු කිරුඇති මල් ලූ දිය පිළිගත වටී෴ එ පිළිගත් දිය අල්ලේ අමිස් මුසු නොව වළඳත් නො වටී෴ කඳුලු කෙල මූකුණු දියවනු සෙම් සෙද කාරුදු සිරුරැ නැගි ලුණුජු සිරිරු හා එක්බැදි වුව වටී෴ සිරිරින් මුත පිළිගත වටී෴ හැම යව්කැලිවත් අගුරුසේ දැවූව දැමූ යව්දිව්කැලි වෙ෴

සතරකැලි නම්:- යව්කැලි, යම්කැලි, සතව්කැලි, යව්දිව්කැලි෴ මෙහි යව් කැලි නම්:- හැම පූ, බත්, හඹුදු, අනුලොම්ධඤ්ඤසහිතවූ සත්ධඤ්ඤ, උඳු, මුඟු, සාලත්, අඟරකිස සාගත හැමපතාපැකිදු, අල-මුල්-පත්-මල්-පක්මස්-කිරි-දිගි ආදියි෴ යම්කැලි නම්:- අඹපනු දඹපනු කෙල්පනු [2]ඇටිකෙසෙල්පනු මිදිපනු හොලුපනු බොරොලුදමුන්පනු මීපනුආදී පන්නි෴ මෙහි මිදිපනු නම්:- [3]සියදු මිදිඉසි- මෙ මිදි පන්නෙහි දියත්තක් එවැ වළඳත් වටී෴ හැම පනු පැන්පමස්සතුවජු වටී෴ අනුලොම්ධඤ්ඤසහිත සත්ධඤ්ඤ රසයිජු, තල්පක්, හෙරලුපක්, පණාපක්, දෙල්පක්, ලබුපක්, හොමොඹු-පුසුල්-[4]තිහඹරු-කැකිරිපක් යන මෙ නම මාඑල ඉසුජු උඳු-මුඟු-තලතලත් ආදී අපරණණ ඉසුජු ගිතියේ පක් යව්කැලි පලා ඉසුජු මිහිප් ඉසුජු තබා හැමපත් පත්මල් ඉසු ගිතියේ හුණු නො කොට අව්වේ තබයිජු නො තබයිජු අනුපසපනක්හු විසින් මොනොවට පරුගත්තෙ වටී෴ සතව්කැලි නම්:- මස්වටතා සතුන්ගෙ වෙඬුරු ගිතෙල් යට කී ලකුණුඇති සකුරු තෙල් මී යන මෙ පස්බෙහෙසදි෴ යව්දිව්කැලි නම්:- හැමඅගරකිස [5]කොයහෙන අල මූල් සාද හර [6]බොර සුඹුළුපත් මල් පැකි෴

මහණ, මෙහෙණ, සික්මන්, මහරණ, හෙරණි යන මෙ පස්සහධැමියන් තබා සෙසු තිඵයක්හට යටත්පිරිසෙයින් ජමා බද්දක්හටජු තමා අතින් දුහැටු දිය තබා සෙසු පරගලා තවගුතු වතක් දේ නම් ළදත පිළියෝ හැණෑ හැණෑ පවිති

---

1 උග්ගු. 2 ඇටිකෙසෙල්. 3 සියජ. 4 සියඹරා, තියඹරා. 5 කොසාගස. 6 බෙර.

වේ෴ දූහැවූ දිය දුන දුන් පියෝ ගැණෑ ගැණෑ දුකුළා වේ෴ අනුපසපනකු ලවා දුනජු ඔවුන් බිමැ තුබූ බජනෙ ලා දුනජු ‘මෙ ගන්ව’සි නමා බිමැ තබා දුනජු බැහැර සිරුරුගහන තෙල් ආදී දුනජු ඇවැත් නැති෴

දෙනමිතිස්මාගමක හා පිළිසන්තන්හි එවූ දෙළොස්රියනින් ඇතුළු නොතාණ නොබිහිරි විඤ්ඤූපිරිමිනියක්හු නැතියා වැ අබවසැ එවූ රහස් කැමති වැ එවූ හුදෙකළා වැ හිඳී නම් හොවී නම් පචිති වේ෴ රහස්කැමති වැ මාගම කරා යාවී වැ සිවුරු හදනා පොරෝනා අජුන් අඳනා බොජුනා හැම පියොවිහි දුකුළා වේ෴ නොතාණ නොබිහිරි විඤ්ඤූපිරිමිනියක්හු ඇති වැ හිඳි එවූ විඤ්ඤූවක්හු නැතියා වැ සිටී එවූ රහස් නො කැමැති වැ හිඳී එවූ ඇවැත් නැති෴

රහමෙර දූනැ නො දූනැ පරහලා කළසඳ පචිති වේ෴ නොරහයැයි බෝ එවූ රහවෙයි හො නො වෙයි හො බෝ එවූ දුකුළා වේ෴ සූත් එවූ වාසි තකා එවූ පිපිහූආදියලූ [1]ලොණසොවිර්ආදිය රහ ගඳ රස නැතිකොට ලුහුනු තෙල්ආදිය ලා [2]පක්කා එවූ වළඳත් වටී෴

ගිරිතිකවතරිසින් පැවිජ්කෙනකුන් ගිරිති කවා එවූ සිරුරුහි පහරනාමාත්‍රාවක් එවූ කළ සාළ පියොව පචිති වේ෴ සෙසු සතරසහධැමියනු දු හැමසතුනු දු ගිරිතිකවතරිසින් පහළ පහළ පියොව දුකුළා වේ෴ වතාවත් කරනුආදිරිසින් පහළ වරජ නැති෴

බොලවින් මත්තේ දියෙහි කෙළනාරිසින් කුමුඳුනා පිහිනනු ආදී කරනසඳ [3]අත්වර පාවර හැමපියොවිහි පචිති වේ෴ බොලවින් [4]බටදියෙහි කෙළනා එවූ යටත්පිරිසෙයින් බොන හැඹියෙහි කෙළනාරිසින් පහරී එවූ පියොවිහි පියොවිහි දුකුළා වේ෴ සිනානාආදීකරුණෙන් දියෙහි පහරනා කුමුඳුනා පිහිනනුආදී කළ ඇවැත් නැති෴

පැවිජියකෙනකුන් සිඛපද පැ ඔවා දෙන සඳ පැවිජ්ජන් කෙරෙහි එවූ කී සිඛපදයෙහි එවූ තිහරසරසින් අනාදර කෙරෙ නම් පචිති වේ෴ පැවිජ්ජන් සිඛපද තබා සෙසුධැමකින් එවූ මෙ නොසරුපම වැටෙයි එවූ කීයෙහි අනාදරිය කෙරෙ නම් දුකුළා වේ෴

අනුපසපනක්හු සිඛපද පැ එවූ සෙසු ධැමකින් එවූ මෙ නොසරුපම වැටෙයි එවූ ඔවා දුන් සඳ අනාදරිය කෙරේ නම් දුකුළා වේ෴ අනාදරියසිත් නැති වැ පිළිවිසැ දන්මහයි එවූ නො දූනැ එවූ කී ඔවා නො ගත ඇවැත් නැති෴

---

1 ලොණසොරමල්. 2 පක්ක හා. 3 අත්වැරු පාවැරු. 5 බටි.

උපසපන්පැවිජ්ජක්හු බවනරිසින් එක්තරුදූයක් කොටින් එවූ කියා එවූ බවා නම් ඔහු බතු ජු නොබතු ජු පචිති වෙ෴ අනුපසපනක්හු බවත් ඔහු බතු ජු නොබතු ජු දුකුළා වෙ෴ බැව්යැටි [1]සිත් නැත්තාහට ඇවැත් නැති෴

ගිනිතැප්පෙසින් වහල්වන රොගයක් නැතියා වැ ගිනි එළනු එළවනු කරන හැමපියොව්හි දුකුළා වෙ෴ජල්වූ ජල්වූසඳ පචිති වෙ෴වැටී හුණු දිලියෙන පෙනෙහෙළි නහා ලූවාහට දුකුළා වෙ෴ නිවි පෙනෙහෙළි තහා දල්වත් පචිති වෙ෴බිම්ආදී දනවා දූ නැ තහාලා එවූ අතික්තෙනකුන් නිසා එවූ සෙනසුන් නිසා එවූ පහන් නිසා එවූ ගිනි එළුමත් එළුවවත් වරජ නැති෴දූවූඅඟුරු එළවා තපී එවූ අනුන් පිළියෙළ කළා හපී එවූ වරජ නැති෴

හඳනට ඉපාරෝනට නිසි අලුත් සිවුරු අහුරු [2]පස්ආදී එක් තරු කළුවක් ගෙනැ මකුණුපිටුසා හෝ මොනරඇස්පමණ හෝ එයට මදක් මහත්කොටැ හෝ කප්බිඳු සිවුරෙහි නො ඔබා පරි භොග කෙරෙ නම් පචිති වෙ෴එබූ කප්බිඳු නට වරජ නැති෴

උපසපන් පැවිජ්ජක්හුගෙ පාසිවුරු නිසජුන් හිදී [3]කද කාබාන් හි යන මෙසින් එක්තරු දෙයක් සොළනා රිසින් පැව් කෙරෙ එවූ පැවි කරවා එවූ පචිති වෙ෴මෙ කී සිවුරුආදී පැවිජ්ජන්ගෙ පස්පිරිකර නබා සෙසු පිරිකරක් එවූ අනුපසප නක්හුගෙ එක්තරු පිරිකරක් එවූ පැවි කරනු කරවනු කෙරෙ නම් දුකුළා වෙ෴හොසෙ තුබුවාක් සේනබන්නට එවූ මොහට ඔවාදී දෙමොනොයි එවූ සහවා තුබුම ඇවැත් නැති෴

තිරිසන්ගිය සතක්හු මරමි යන සිතින් [4]මරන්නට පියෝ කළසඳ දුකුළා වෙ෴එපියොවින් සතු මළසඳ පචිති වෙ෴ නොදන්නාහුගෙ එවූ මරමි යන සිත් නැත්තාහුගෙ එවූ එපියො වින් සතු මළ ඇවැත් නැති෴

උපසපන්පැවිජ්ජක්හුගෙ සඟවෙසෙස් ඇවැතක් එක්තරු සෙසෙකින් දූනැ පිළිසොයමි යන සිතින් අතිකක්හට නො කියමි බුරතිබෙවු කළ කලැ පස්සේ අන්නට කිව පචිති වෙ෴ මෙ මෙ නියායෙන් පිළිසොයනු නිසා කීනම් බොහොදෙන ඔවුනොවුනට කියක් නමුදු පිළිසොයන්නට කී නාක් ජනාහට යම කෙළවරයෙ නුසුන පචිතිවෙ෴අවන්නෙ පිළිසොයන්නට අතිකක්හට කීනම් හෙයිජු අනිතක්හට පිළිසොයනුනිසා මෙ කී නම් මෙතුන්වන පුඟුල්

1 රිසි, 2 මඩ, 3 කමු. 4 මරන්නට මරවන්නට.

පෙරළී තමහට දෙවන පුහුල්හට පිළිසොයනු නිසා කී නම් කෙලවර සිදෙ෴ ඉක්බිති පිළිසෙව්වාහට වරජ නැති෴ සෙසු ලහුකාපත්ති පිළිසෙව්වාහට දු අනුපසනක්හුගෙ කායසගරු සුක්විසැටියයි ගත් තුළුල්වරජ එවු [1]සෙසු දු තුළුල් වරජ එවු පිළිසෙව්වාහටදු දුකුළා වෙ෴ ඔහු කළ කම් ඔහු [2]අස්සී එවු පිළිසොයන රිසි නැති වැ එවු අන්නට නොකියා නම් වරජ නැති෴ තමාගෙ සඟවෙසෙස් ආදී එක්තරා ඇවැතක් 'නො අරෙජම්' 'නො දෙසම්' පිළිසොයත් දුකුළා වෙ෴

මිනිස්මාගමකා හා අසොදවස් අසො තැනට යම්හයි සසැදි නම් දුකුළා වෙ෴ සසැදි දවස් නො වරජවා අනෙක් ගම්හිමකට වජනාසඳ එක්පියවරෙකා දුකුළා වෙ෴ දෙවන පියවරින් වන්සඳ පචිති වෙ෴ සෙසු ගම්හිමට වජනා සඳදු මෙ මෙ නියෙයි෴ ගම් නැති තෙන දෙදෙ ගවු එක් පියවරින් ඉකුත් ඉකුත් සඳ දුකුළා වෙ෴ දෙවන පියවරින් ඉකුත් ඉකුත්සඳ පචිති වෙ෴ [3]ඇහසැදූලි නැත පැවිජ්ජෙ මතු සසැදැ යෙත් නම් දුකුළා වේ෴ බියඇති මහ සසැදැ යෙත් නමුදු ඇවැත් නැති෴

උපසපන් පැවිජ්ජක්හු දූහැ වැ පහරී නම් පචිති වෙ෴ මරම් යන රිසි නැති බැවින් ඔහු මළදු ඇවැත් නැති෴ එක්තරක්හු විසින් තමා වෙහෙසන ලබන සඳ මිස්සැටි වැ පැහැර යත් ඇවැත් නො ජ ඇති෴

උපසපන් පැවිජ්ජක්හට දූහැ වැ කයින් එවු කාපිළිබද් දෙන් එවු පහරනා බඳු වැ අත් සැත් ආදී නගා නම් පචිති වෙ෴ එනැගු අත් ආදීනෙන් වැරුජැ පහළ නො පැහැරියැටි වැ පහළ බැවින් එපහරින් අත්පාආදීන් බුනදු මළදු දුකුළා වෙ෴ අනුපසපනක්හට දූහැ වැ අත්සැත්ආදී කිය පා නම් දුකුළා වෙ෴ තමා වෙහෙසන සත්කෙනකුන් කෙරෙන් මිස්සැටි වැ අත්දඬු ආදීනෙන් බවා පලවා නම් ඇවැත් නැති෴

උපසපන් පැවිජ්ජක්හු දූකුම් ඇසුම් සැකකිරීම් යන මූල් නැති සඟවෙසෙසින් සොයා නම් ඔහු එවිගස දත පචිති වෙ෴ නොදත එවු පස්සෙ දත එවු දුකුළා වෙ෴ උපසපනක්හු එවු අනුපසපනක්හු එවු ලහුඇවැතෙක්නි දු [4]මිසදිඝියෙනුදු සෙවුව දුකුළා වෙ෴ ඇවැතැයි සිතා සෙවුව ඇවැත් නැති෴

---

1 සෙසු නොතුළුල් වරජ. 2 අසයි. 3 ඇසසැදූලි දන. 4 මිසදිට්ඨියෙනුදු.

නොරුස්නා කටැපි වැ උපසපන් පැවිජ්ජක්හට [1]තෙපි උනුවිස්වස් උපසපුම ලදුවහ යි සිතුයෙම් යන ආදී කියා කුකුස් උපයා නම් පවිති වෙ෴ අනුපසපනක්හට කුකුස් උපයා නම් දුකුළා වෙ෴ කුකුස් උපයන රිසි නැති වැ හිතකැමැති වැ කියා නම් ඇවැත් නැති෴

උපන් කලහඇත්තවුන් අබියෙසැ සිටැ තමා නොදක්වා කලහ කටැපි වැ ඔවුන් කියනු අසා නම් පවිති වෙ෴ ගමන් යන සඳ පෙරට වැ යන්නන් කියනු අසන්නට වෙලෙම් වැ යේ නම් දුකුළා වෙ෴ ඇසූ සඳ පවිති වෙ෴ පසු වැ යන්නන් කියනු අසන්නට පනු වේ නම් දුකුළා වෙ෴ ඇසුව පවිති වෙ෴ තමා හුන්තැනට නො දැනැ අවුදු සැඳෑනා සඳ තමා හුන්බව දැන්වියැ යුත්තේ යි෴ නොදන්වා අසා නම් පවිති වෙ෴ අනුපසපනුන් කියනු ඇසුව දුකුළා වෙ෴ මොවුන් කියනු අසා සන්සිඳුවම් යන අදහසින් එවු තමා වරද පිළිගන්මි එවු [2]මොවුන් කියන දෑ වමනෙයැ යි එවු අසා නම් ඇවැත් නැති෴

සඟහට මෙ දෙම්හයි කරම්හයි පිරිණැමූ සතරපසයෙන් පසයක් දැනැ දැනැ අනික්පුගුලක්හට පිරිණමා නම් පවිති වෙ෴ සඟහට පිරිණැමීගිය ලාභයක් අනික් සඟ ගණ මහසෑතවාමට එලවා නම් දුකුළා වෙ෴ ගණහට පිරිණැමීගිය ලාභයක් අනෙක් සඟගණ පුගුල් මහසෑතවාමටජු තමාටජු පිරිණමා නම් දුකුළා වෙ෴ පුගුලක්හට පිරිණැමීගිය ලාභයක් අනෙක් සඟ ගණ පුගුල් මහසෑතවාමටජු තමාවිජු පිරිණමා නම් දුකුළා වෙ෴ මහසෑයට පිරිණැමීගිය ලාභයක් අනෙක් සඟ ගණ පුගුල් මහසෑතවාම්ටජු තමාටජු පිරිණමා නම් දුකුළා වෙ෴ යටත්පිරිසෙයින් තිරිසනක්හට පිරිණැමීගිය ලාභයක් අනෙක් තිරිසනක්හට පිරිණමා නමුජු දුකුළා වෙ෴ කහිතක්හට නොපිරිණැමීගිය ලාභයක් කාහට දෙම්හයි පුළුවුත්සඳ නොප සිත් පහන්තැනකට දෙව යි එවු සෙසු අනුසස් කියා එවු ඇවැත් නැති෴

හිරි මුදුනෙත් පහවූසඳ [3]පටා අරුණු දක්වා මෙ දෙ අතුරෙ විකාලැයි දැනැයිජු නොදැනැයි ජු දෙලොස්රියතින් ඇතුළු පැවිජ්තෙනෙක්හට විකාල් ගම්වජනා ඇවිස්ලි නො ඇවිසැ පිරිබෙවු කල හැම පිරිබෙවු නො කල ගැම පිරිබෙවුවට නිසිතැන් එක් පියවරෙකින් ඉකුත්සඳ දුකුළා වෙ෴ දෙවනපියවරින් [4]ඉකුත්සඳ පවිති වෙ෴ නොඅරොජ ගම්වන්සඳ දුටුපැවිජ්තෙනෙක්හට

1 නොප. 2 ඔවුන්කීනාළද, එසින් කියනාලද. 3 පටා. 4 ඉක්මෙන්.

නො ඇරොජුව වරද නැති෴නොඑක්දෙනා කුලගෙන් එවු දැහම් සතින් එවු බිහිගමින් එවු ගමට වැද්දවිවුව [1]අනත්මන අරෙජා ගමම වදුත් වපී෴මෙසේ අරොජා ධුරතිබෙවු නොකොට නොඑක් ගමට වජුතුදු වරද නැති෴එසිතැසි ධුරතිබෙවු නොව පුත එගමට අරෙජා වදුත් වපී෴එගෙන් එගෙට යතුදු අරෙජ යන්නෙ වැළුතු පැවිජ්ජෙනකුන් නැත වපී෴ගම්මැද මගින් යන්නට එවු වැසි ආදී අනතරායෙන් එවු උවදුරකින් එවු නො අරොජ ගම්වන වරජ නැති෴

෴එක්සාලිස්සවිතිවිනිස නිමි෴

---

සඟසතු අරම්, වත යන මෙ දෙක එක් ගුරුබඩෙක්෴ වෙහෙර, වෙහෙරවත යන මෙ දෙක එක් ගුරුබඩෙක්෴හැඳ පුටු, බිසි, කන්වයින් යන මෙ සතර එක් ගුරුබඩෙක්෴ලොහො සැළ, ලොහොපැණ, ලෙහොපණා, ලොහොකටාර, වෑ, පොරෝ, කෙවේරි, හුදලු, තියන් යන මෙ නවය එක් ගුරුබඩෙක්෴වැල්, හුණු, මුදුතණ, බබුස්තණ, සෙසු ගේ සොයන තණ, මැටි, මැටි බජන, දරමුවා පිරිකර යන මෙ අට එක් ගුරුබඩෙක්෴මෙ පස් ගුරුබඩින්. එක්තරාක් මා මිස කෙ දූ යි ඉසුරු පමුණුවා අන්නට දේ නම් ථුලැසි වෙ෴සොරසිතින් පල්පොහොනා වතක් එවු වඩා අගනාක් එවු අන්නට දේ නම් තෙමේ ගනී නම් පරිජි වෙ෴පලින් උනු වියවින් වඩා ඉතිරි අගනාක් දේ නම් ගනී නම් ථුලැසි වෙ෴වියටක් එවු වියවින් උනු අගනාක් එවු ගනී නම් දේ නම් දුකුළා වෙ෴

කුසතණපිළී එවු වැහැරිපිළී එවු පුවරුපිළී එවු කෙස්මුවා පලස් එවු වල්මුවාපලස් එවු තියඇති අදුන් දිවිසම් එවු මහ මුහුණුපියාපතින් කළ පිළී එවු තිඑළද නො ගෙනැ [2]හන් පෙරෙවිය ථුලැසි වෙ෴මෙ කී කුසපිළී ආදී අඩරා තිඑළද ගෙනැ මෙ මැනැව යි රුස්වා නම් තිත්ථියපක්කන්තකපරිජි වෙ෴

වසමඟ එවු පසමඟ එවු අවට දෙඅඟුලක් තන්හි එවු සැත් කටු ආදීන්ජු යළත්පිරිසෙයින් තියෙතුජු කපනු හිරනු කරත් ථුලැසි වෙ෴වසම්ගින් ඇතුළු තෙලාදීන් ලවන මත්කම් කළ ථුලැසි වෙ෴ තමා හඳන් කපත් ථුලැසි වෙ෴

මිනිස්මසුජු ඇටජු සමුජු ලෙයිජු ලොමුජු පරහලා කළ ථුලැසි වෙ෴

කේල්වාපිළිජු එරුපත්පිළිජු තියදින්කළ කැතිරිකඹුදු [2]හන් පෙරෙවිය දුකුළා වෙ෴සව්තිල්වන් සව්රන්වන් සව්ලේ වන් සවමජටවන් සව්කළුවන් පිළී [2]හන් පෙරෙවිය දුකුළා

---

1 අනත්මනත්. 2 හැන්ද.

වෙ෴දෙවැ කැපරජනින් රැජුව වටී෴මෙහි කැපරජන් නම් කවරහ යත්:—කසා කබා හැම මූල්රජන෴මඳට විශොහොල් කබා හැම [1]කඳ රජන෴බෙහෙරැපලා කාසාපලා කබා හැම පත්රජන෴ලොජ්සුඹුළු කඹුල්සුඹුළු කබා හැම සුඹුළුරජන෴වනුක්මල් කැලමල් කබා හැම මල් රජන෴හැම පක්රජන෴මෙ සය කැපරජනි෴

කසුජු හිස්වෙළුජු අඩරත් දුකුළා වෙ෴යට කී කුසපිළී ආදීජු කේල්වා පිළී ආදීජු සොරුන් විසින් ගිනිදියආදී විසින් සිවුරැ නම සිවුරැ ලබනනාක් පරිභොග කරත් වටී෴

ඇත්මස් ලේ ඇට සම් ලොමුජු වැළැඳුව දුකුළා වෙ෴මෙ සෙයින් මැ අස් වළස් තරස් සිහ වග දිවි බලු දිග්දූ සතුන්ගෙ මාංසාදිය පස් පස් දුකුළා වෙ෴

බික්සඟුන් අවක්සා මැරූ මස් මරන්නා තමා දුට එවූ ඇසුව එවූ සැකකළ එවූ වළඳත් නො වටී෴උපාසකයන්විසින් 'දහපා, වත්හිමි සුරත් නිසා මැරූයේ නොම වෙ' යි කිව වළඳත් වටී෴කැප මහුදු පිළිවිසැ වළඳත් වටී෴එකැති තමා දනුත් නුපුළ වුන ජු වටී෴පිළිවිසැ වළඳත් වටී෴

නහනතොවජු සුලුදියවටන්තෙහිජු ඔවස්ගෙහිජු ආ පිළී වෙළ ඉකුම්වා නම් දුකුළා වෙ෴තෙපි පෙරට වැ යව යි සමූ දුන වරජ නැති෴[2]පැන්තොවදිදු වරජ නැති෴සුලුදිය වටන්තෙහිජු පියැවිගෙහිජු ඔකැසි නොපැහැරැ වත දුකුළා වෙ෴සිහි නො එළවා වත වරජ නැති෴ඔවස්ගෙහිජ් සුලුදියවටන්තෙහිජ් පියෙන් බැහැරැ සිටැ සිවුරැ [3]නහා නම් දුකුළා වෙ෴වස් පවත්වමින් නනනා නම් දුකුළා වෙ෴නො ඉසයෙන් [4]උපහත වැ නන නා නම් වරජ නැති෴වස් පවත්වමින් දූහැවි කානම් දුකුළාවෙ෴පුජ්වළැ පුසන් ලා නම් දුකුළා වෙ෴කොරොස් ගැටඇති කටුඇති මුහුරැඇති පුසනින් පුසන්කිස කෙරෙනම් දුකුළා වෙ෴වස්දෙණි යෙහි තෙල ලා නම් දුකුළා වෙ෴ බැහැරැ තමා විසින් එවූ මෙරමා විසින් එවූ කෙළෙසී භියා දග්වනු නොකෙරෙ නම් දුකුළා වෙ෴දූනැ දූනැ බැහැරැ කෙළෙසා නම් දුකුළා වෙ෴එහි කසල දුට නො හරීනම් නොහරවා නම් දුකුළා වෙ෴ලාහෙළාලා වදී නම් දුකුළා වෙ෴නික්මේ නම් දුකුළා වෙ෴හඬවා දියකිස සාහා නම් දුකුළා වෙ෴පහණ ආදී තැන දිය පැහැරැ හැඹුව වරජ නැති෴

1 හර. 2 නහනතොවදිය, නත්තොවදිය. 3 නහාතම ඔහාතම. 4 උපහතව

මහල්ලන් නො ,පිළිවිසැ පාමොක් උසුරුවා නම් දුකුළා වෙ෴ අන්තරාය නැති වැ සැබෙවිනිජ් ඉසුරු වුව දුකුළා වෙ෴ මෙහි අන්තරාය නම්:—රාජන්තරාය, චොරන්තරාය, අග්ගිඅන්තරාය, උදකඅන්තරාය, මනුස්සන්තරාය, අමනුස්සන්තරාය, වාළන්තරාය, සිරිංසපන්තරාය, ජීවිතන්තරාය, බ්‍රහ්මචරියන්තරාය යන මෙ දස අන්තරායි෴

මහල්ලන්කෙරෙ නොපිළිවිසැ [1]යථාසුඛ නොකරවා බණ කියා නම් දුකුළා වෙ෴ කියමින් උන්සඳ නැවත මහලුතෙනෙක් අවුනම් පුන යථාසුඛ කරවන කිස නැති෴ පැන පුළුවුස්නා තැන ජු විසජන් කරන තැනු ජු හදාරන බණ කියන තැනුජු කියවා ගන්නා තැනුජු පාමොක් උසුරුවනසඳ කී නියායෙන් මේ විනිස දන්නෙ෴

මහල්ලන් නොපිළිවිසැ පහන් දල්වා නමුජ් නිවා නමුජ් දොර එවු කවුළු එවු වරී නමුජ් පියා ලා නමුජ් දුකුළා වෙ෴

ළිහිණි වැ වදී නමුජ් වැඳුම් ගනී නමුජ් ගමන්යේ නමුජ් බුදුනා බොනු ආදී කෙරෙ නමුජ් දියෙන් බැහැර සිටැ තමහට පිරියම් කරවා නමුජ් අන්නට තෙමෙ කෙරෙ නමුජ් දුකුළා වෙ෴

නහනසඳ කොඩවරු පවුරුහි ජ් මැඹහි ජ් රුක්හි ජ් නහන තෙනැ හිඳුවූ කොරොස් පුවරුයෙහි ජ් තමා සිරුරු ගහා නම් දුකුළා වෙ෴

අත්සුදුසු කොට තළ දඬු පෙණිනිජු මුහුදුපෙණිනිජු සිරුරු ගහා නම් දුකුළා වෙ෴ තැබලිති හැම උළු පිළිවැටි සිරුර ගහත් වටී෴ පහණපෙණ පය ගහත් වටී෴ සිරුරුගහනතැනැ පය ගහත් වටී෴

කුරුඳුවැළිනුජු ගහා නම් එතෙක් එකක්හු පිටින් පිට ගහා නමුජු දුකුළා වෙ෴ කුරුඳු සුනු ලා මූසු කොට ලතවළිසෙසින් වටා කුරුඳුමල්වැල සෙසින් අවුණා පිට ගහා නහති—මෙ කුරුඳු වැළ නම්෴

නොගිලන් වැ අරමින් බැහැර වහන් ලා යේ නම් දුකුළා වෙ෴

සව්නිල් සව්රන්වන් සව්රත් සව්සුදු සව්කළු වහනුජු වක පිවිවැනි වහනුජු, රත්පියුම්මල්පෙතිසුදුසු වහනුජු,-සව්මදම වන් වහනුජු, විසිතුරුවරඇති වහනුජු, නීලාදි [2]වරඇති වහ

---

1. යථාසුඛ. 2 වර වට ඇති.

නුජ්-[1]තිතිරිවවුපතින් පිරියම් කළ වහනුජ්-[2]තිරෙළුවන් පලෙළු වන් හගුසුදුසු [3]වරපටඇති වහනුජ්,-විළුම් වසාලන වර ඇති වහ නුජ්-පිඹිමස් දක්වා වසාලක වගනුජ්,-සියලු පිපිපා වසාලන වහනුජ්,-මොනොරපිලින් පිරියම් කළ වගනුජ්,-කළුවැදිසමින් සිහි වග [4]මස්වා අදුන් දිවි බළල් ලෙහෙන සම්නුජ් කළ වහනුජ්-දෙමහවුලෙහි නුහුහුනැගුම් ආදී අංකාරයෙන් කළ වරපට ඇති වහනුජ් අධරා නම් දුකුළා වෙ෴සව්නීලාදී වහන් සියලු [5]වර එවු එක්දෙසක් එවු පිසැ පියා සෙසු විකාරවරපටආදිඇති වහනුජ් විකාරහැරැ පරිභොග කරත් වටී෴

[6]පයැ ලා හැවිද්ද හැකි පාදුකා පය ලා නම් දුකුළා වෙ෴ [2]තිරෙළු-පලෙළු-මූවසම්නුජ් පුහුල්සතු කොට පරිභොග කරත් වටී෴මිතිස්සම් තබා සෙසුසම් සෙතසුන් අයත් වුව වටී෴වහන් කසුවහන් ආදියවජ් වටී෴

රූසිතින් මිනිස්-අමිනිස්-තිරිසන් මාගමුන් පෙරටින් පස් සෙන් එවු පිළිසන් වූවා නො වූවා එවු බැලුව දුකුළා වෙ—වැරැජැ දුම වරජ නැති෴බික් දෙන මාගම එවූ පිරිමිතියක්හු එවූ මුහුණු බලා නම් දුකුළා වෙ—වැරැජැ දුට වරජ නැති෴

උජ්ඣානසඤ්ඤ ඇතියා වැ මෙරමා සතප්නා පාආදී බලා නම් දුකුළා වෙ෴උගත්වම් යන සිතින් එවු දියැපී දෙවියැපී රිසින් එවු බලා නම් වරජ නැති෴

කැවපත හඹුආදියැ තමා මුහුණු බලා නම් දුකුළා වෙ—මුහුණුරොග විළිආදිය බැලියැපී වුව වරජ නැති෴

උසසුන්මගඅස්නෙ හිඳී නම් හොවී නම් දුකුළා වෙ෴මෙහි උසසුන් නම්:—වඩුරියතින් ඉකුත් වලින් යට පා ඇති කැඳ පුටු හි෴මෙහි පුටු නම්:—දික්හගලාපුටු හි෴සමසිරීපුටු කී පම ණින් දික්පාඇතිජු වටී෴මහඅසුන් නම්:—පල්ලංක,—තූලික,—[7]පටික,—පටලික,—ගොණක,—චිත්තක,—විකතික,—උද්දලොමික,—එකන්තලොමික,—කුත්තක,—කොසෙය්‍ය,—කඩිස්ස,—හත්ථත්ථරණ,—අස්සත්ථරණ,—රථත්ථරණ,—අජිනප්පවෙණික,—කාදලිමිගපවරපච්චත්ථරණ,—සලොහිතවිතාන,—උභතොලොහිතකූපධාන හි෴මෙහි පල්ලංක නම්:—ඇරූ හිඳුවූ බැළරූ පා ඇති පලකි෴තූලික නම්:—හිඹුල්පුජ් සමන්පුජ්ආදි පුපුජ් පුලුනුජ් ඔත් තිලි හි෴[7]පටික නම්:—එළුලොම්මුවා හෙළඇතිරි හි෴

1 තිතුරුවවුපතින්.
2 තිරෙළු
3 වරවට.
4 වලස්.
5 අඩත.
6 පාසලා.
7 පළික.

පටලික නම්:—ඝනපුප්ඇති ඇතිරි සි෴ගොණක නම්: දික්ලොම් ඇති ඇතිරිසි෴චිත්‍රක නම්:—විමෙන් විසිතුරුවූ ඇතිරි සි෴විකතික නම්:—සිංහාදි වළරූ[1] ඇති ඇතිරි සි෴උද්දලොමික නම්:—එක් පස්හි ලොම්ඇති ඇතිරි සි෴එකන්තලොමික නම්:—දෙපස්හි ලොම්ඇති අතිරි සි෴කුත්තක නම්:—සොළොස්මාගමුන් සිටැ නැටියැහැකි අවන්මනඇතිරි සි෴කොසෙය්‍ය නම්:—රත්කසුකම් කළ තිහිරි අතරණි෴කට්ටිස්ස නම්:—රන්කසුකම් කොට කැතිරිහුයින් කළ අතරණි෴හත්ථත්ථරණ නම්:—ඇත් පිටැ අතුරන ඇතිරි සි෴අස්සත්ථරණ නම්:—අස්පිටැ අතුරන ඇතිරි සි෴රථත්ථරණ නම්:—රියෙහි අතුරන ඇතිරි සි෴අජිනප්පවෙණික නම්:—අඳුන්දිවිසමින් හැඳපමණ හිවා කළ ඇතිරි සි෴කාදලිමිගපවරපච්චත්ථරණ නම්:—සුදුපිළිමත්තේ කෙල්මුවා සම් අතුරා ගෙත්තම් කළ පසතරණ අතුළෙයි෴සලොහිතවිතාන නම්:—රත්වියන් ඇත්තෙයි-රත්වියන් ඇති හෝනායැ යුතැති෴උභතොලොහිතකූපධාන නම්:—හිස්දෙරැ පාමුලැ රත්කන්වයිති෴ආසන්දි තූලික පලලඞක යන මෙ තුන තබා සෙසු අයප ඕනා සහසතු එවු ගිහිසතු එවු පැවිජ්ජන් නො කියවා ගිහිමිතිස්සු මෙ අතුට දෙත් නම් වටී—ධමස්නෙහිජු වටී෴බිම අතරණ කළ තමාගෙ කැපපිරිකරක් මත්තේ ලා [2]දවස් ලත් වටී෴මොහොරුඇඳ මොහොරුපුටු [3]පුලුනුජ් පුපුජ් ඔත ගිහි ගෙයි මිනිසුන් අයත්වුව හිඳුත් වටී,—හොවුත් නො වටී෴හිඹුල් පුප් සමන්පුප් ආදී පුපුජු පුලුනුජු මිතිස්ලොම් නුඹුසු කමල්පතුජු මුහුණුමලාදී සුවඳමලුජු තබා සෙසු ගැම මල් හොත් බිහි ජු බිම්බොහන ජු වටී෴

උක්ඛිත්තකයා වදී නම් අධුපසපනස්හු මහබොහොසතු දූ වුව වදී නම් උක්ඛිත්තකයාගෙ ලද ගත් නානා සංවැස්සා වදී නම් මාගමයිජ් පඬුවයිජ් වදී නම් පිරිවෙස් පුරන්නෙයැ, මානත්තාරහයැ, මානත්තචාරීයැ, මූලාය පටිකස්සනාරහයැ, අබ්භානාරහයැ යන මෙ පස් ගරුකඑයනුජු වදී නම් දුකුළා වෙ෴

පඬුවා හා මාගම හා උභතො බ්‍යඤ්ජනකයිජ් දික් වූ හස්නේ හිඳී නම් දුකුළා වෙ෴

අසමානාසනිකයා හා නොදික්අස්නේ හිඳී නම් හැඳ පුටු යෙහිජු හිඳී නම් දුකුළා වෙ෴මෙහි සමානාසනික නම්:—සමවස්ඇත්තෙයිජ් එක්වසගෙකින් දෙවසගෙකින් එවූ මහලුවූ

---

1. වසාලරූප. 2. දවස් යවත් 3. පුලුනුජ් පුපුඔත්

යෙහිජ් සඟවූයෙහිජ් සමානාසනික නම්෴ සෙසු හැමදෙන අසමානාසනිකයන යි දතයුතු෴ මෙහි තොදික් අසුන් නම් යටත් පිරිසෙහින් තුන්දෙනකු අසරම්ණියලා නොහින්දෑ හැකි අස්ති෴

මල්පතාදි කුලන් සඟන්නා සඳහා දේ නම් දුකුළා වෙ— මෙහි මල්පතාදි නම්:— සපුමල් ඉද්දමල් ආදී මල; අඹපක් දඹ පක් තැඹිලිපතාදී පක; හුණු දඹුආදී දණ්ඩ; මහරී පලාසුනු ආදී සුන්න; තල්පත් තලපත් ආදී පත; දෑහැටි දිය මැටි ආදී හි— මෙ මලාදි කුලන් සඟන්නට දුන් කරුණෙන් උපන් පස පස් සකඩැම්යනට ද නොවටී෴ දෙමාපියන් තබා සෙස්සන් අා සඳ රුවන්තියා පුදන්නට මල් දෙත් වටී෴ සෙසු කරුණෙන් දෙත් නො වටී෴ මලාදී දෙමාපියනට ඇරැ දෙත් දෙවත් වටී෴

කුලන් සඟන්නා නිසා මල් පුජ්නා ගස් තෙමෙ පොළෝ කැණැ හිඳුවා එවු මෙ කැණැ හිඳුවා යි අයපබසින් හිඳුවා රොවා එවු පචිති හා සමඟ දුකුළා වෙ෴ ඵලපරිභොග නිසා එවු සෙවලල් නිසා එවු රුවන්තියාට පුද නිසා එවු කැපබසින් ගස් රුප්වත් වටී෴

කුලසංග්‍රහ තකා තෙමෙ පිසිදී එවු මෙමල් බිදයි පිසිදුවා එවු පචිති හා සමඟ දුකුළා වෙ෴

කැපදිය ඔවුත් ඔවවත් දුකුළා වෙ෴

අයපදිය ඔවුත් ඔවවත් පචිති හා සමඟ දුකුළා වෙ෴ රුවන් තියාට පුද නිසා රුපු ගසැ කැපදිය ඔවුත් ඕවත් වටී෴

මල්ගොතනු ගොතවනු ආදි කෙරෙනම් දුකුළා වෙ෴

මල් තුවටූයෙන් තුවටු එවු දඹූයෙන් දඹූ එවූ ගොතත් දුකුළා වෙ෴

තුවමින් එක් [1]හසු කොටින් එවු දෙ[1]හසු කොටින් එවූ හූ ආදීන් ගොතත් දුකුළා වෙ෴

ඉද්දමල් කදුරුමලාදි මල් අවුණා නම් දුකුළා වෙ෴

ගෙතුමල් වමං එමැ මල්වට මල්කඩ මල්පතාදි කරත් දුකුළා වෙ෴

ගෙතුමලින් මහසැ මහබෝ සිසාරවා පටන් කෙලවර එක් මලෙක්හිජ් ඉකුම් වුව දුකුළා වෙ—අනික් පැවිජ්ජතෙකකුන් ලෙවා ඉකුම් වුව වරජ නැති෴

---

1. හසු, හුසු, හුස.

ගෙතුමලින් රූපාදි වියේ නම් දුකුලා වෙ෴

ගෙතුමල් මුළු කොට මලොලඹු කෙරෙ එවු අඩසඳ කෙරෙ එවු පිටුමුවා [1]කඳමුවා බෙඹුමුවා දම් කෙරෙ එවු මිහිරතුඩු මල් දම් කෙරෙ එවු මල් විදා එල්වන්නට වියනැ කටු එල්වා එවු එල්වූ කටුයෙහි මල් හිඳුවා එවු කේල්කඳ සැත් විඳූ හිඳුවූ කටුයෙහි මල් හිඳුවා එවු මිල්මාලා මෙහෙයා එවු දුකුලා වෙ෴හෝ මල් දෙඹමල් කඩාදී අතුරෙහි මල් මෙහෙයා එවු ධම්රෙජ්අතුරෙහි මල් මෙහෙයා එවු වටී෴අනුපසපතක්හට මෙයේ ගොතත් බඳුත් පුදත් මෑනැවැ යන ආදී කැපතෙපුලෙන් කියත් වටී෴තෙළඹුපතැ [2]තෙළඹුවා මල් හිඳුවා මත්තේ පත බඳුත් වටී—පත දණ්ඩෙ බඳුත් නො වටී෴පැන්කොළෙහි සිස් කොළෙහි මල් ලා පියතින් එවු කඩින් එවූ වසත් වටී—බඳුත් නො වටී෴කස්සෙහි එවු අතරණආදියැ එවු මල් එවැ මූළුකොට ගනුත් වටී—බඳුත් නො වටී෴

බුදුන් වැරූ තාක් පස වළඳ නම් දුකුලා වෙ෴වැරූපස නම් කවරයත්:—එක්විසිඅනෙසුන් ආදීනෙන් උපන් පසයි෴ මෙහි එක්විසිඅනෙසුන් නම්:—වෙළුදානං; පත්තදානං; පුප්ඵ—ඵල—දන්තකඨ—මුඛොදක—සිනාන—චුණ්ණ—මත්තිකදානං; චාටුකම්‍යතා; [3]මුග්ගසූප්‍යතා; පාරිභට්ටකතා, ජංඝපෙසනියකම්මං; වෙජ්ජකම්මං; දූතකම්මං; [4]පහෙණගමනං; පිණ්ඩපතිපිණ්ඩදානං; දානානුප්පදානං; වත්ථුවිජ්ජා; නක්ඛත්තවිජ්ජා; අඞ්ගවිජ්ජා යන මෙ එක්විසිඅනෙසුනි෴මෙහි වෙළුදානං යනු:—කුලසංග්‍රහ කරනු නිසා රතහුණු දීම්—සෙසු දඹුහුණු දීම් [4]වෙළුදානහි මෑ ගැණේ෴පත්තදානං යනු:—තලපත්—තල්පත්ආදී දීම්෴පුප්ඵදානං යනු:—සුවඳ ඇති නැති මල් දීම්෴ඵලදානං යනු:—විලිකුන් නොවිලිකුන් කුඩු මහත් පක් දීම්෴දන්තකඨදානං යනු:—දැහැටිදඬු දීම්෴මුඛොදකදානං යනු:—මුහුණු [5]දේනාහට හුණු දිය [6]සිත්දිය දීම්෴සිනානදානං යනු:—සෙසු දිය දීම්෴චුණ්ණදානං යනු:—මහරීසුනුආදී දීම්෴මත්තිකදානං යනු:—පියැවි මැටි තිල්මැටි ආදී දීම්෴චාටුකම්‍යතා යනු:—උපාසකයන් හුවා තමා ලාමක වැ වැටෙන වැටීම්෴මුග්ගසූප්‍යතා යනු:—හිවූ මුගු නොපැසෙනමුගු මඳසෙයින් තතු මඳ තොටින් අඹුළු බොහො තොටින් කීම්෴පාරිභට්ටකතා යනු:—කිරි දූසකසෙයින් කුලදරුවන් ඔරලනආදි විසින් [7]අධැරීම්෴ජංඝපෙසනිය

1 කාජමූවා. 2 නිළඹුවා. 3 මුග්ගසූපපතා. 3 පහිණකම්ම.,පහිණගමනං. 4 වෙළු දානම හෙ ගැණේ, 5 දෙනාට. 6 සීල්දිය. 7 ආදර කිරීම්, ඇදුරීම්.

කම්මං යනු:—අස්නෙකින් මෙහෙයුවාක්හු සෙයින් එගෙන් එගෙට ඊම්෴වෙජ්ජකම්මං යනු:—පිළියම් කිරීම්෴පස්සඟධැමි යන, දෙමාපියන, දෙමාපියන්ගෙ තමාගෙ මෙහෙකරුවන, තමා නිසූ නො නිසූ නිවිහල්ලන යන මෙනෙක්දෙනා තබා සෙස්සනට පිළියම් කරත් කියත් දූකුලාවෙ෴දූතකම්මං යනු:—හසුන්පත් ගෙනැ යන එන කැමි෴පහෙණගමනං යනු:—නෙත්වත් ආදීතැනට මෙහෙයුවහුගෙ ගමනි෴[1]පිණ්ඩපති පිණ්ඩදානං යනු:—ලාභකැමති වැ එ එ කුලවැස්සනට පිඬු දීම්෴දානානුප්පදානං යනු:—ලාභාශායෙන් අත්ලස් දීම්෴වත්ථුවිජ්ජා යනු:—ළිඳු පොකුණු ගෙවතුආදී කැණියැයුතු තැන් දන්නා විජ්ජා හි෴නක්ඛත්තවිජ්ජා යනු:—නකත් දන්නා විජ්ජා හි෴අංගවිජ්ජා යනු:—අඟපසඟහි ලකුණු දන්නා විජ්ජා හි෴

නොනැ නොපැමැරුවත් විනවා ගත් පසදූ රන්රිදීආදී ඉවසා ලද පසජ් අයපනෙපුලෙන් එළවූ ගම්ආදී ඉවසා ලද පසජ් අයපනෙපුලෙන් [2]වැව්හි පස් මඩනා ලියැදි බඳව ගනාදී නො පින් ලදු පසජ් කුහනා ලපනා නෙමිත්තකතා නිපෙපසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාදීවිසින් ලදු පසජ් වැළැඳුම දූකුලා වෙ෴මෙහි කුහනා නම්:—ලාභසත්කාර උපයනු නිසා අපිස් සනොස්බඳු වැ [3]මනාපස පිළිබෙවී කොට නපුරුපස වළඳන මනාපස නොවළඳන බවකින් විස්මය කිරීම, පරියායෙන් තමාතෙරෙ නැති උතුරුම්නිස්ධම් ඇතිබඳු කොට දැක්වීම්, බුහුමන් කැමැති වැ ගමනාදි ඉරියවු පැවවීම් යන මෙසෙයින් තුන්වැදෑරුම් වෙ෴ලපනා නම්:—පස උපයනු නිසා තමා හුවා උපාසකායන් හුවා එවූ පොලඹනුවිසින් එවූ බිණීම්෴නෙමිත්තිකතා නම්:—තමහට පස එළවනසෙයෙකින් කාවිසින් සලකුණු කිරීම්෴නිපෙපසිකතා නම්:—මෙසේ වුව මට පස උපද්දී සිතා අනුන් ගුණ මකා බැණැ පස ඉපැදූවීම්෴ලාභෙන ලාභං නිජිගිංසනතා නම්:—එකක්හු තෙරෙන් ලද්ද මෙරමාහට දී මෙරමාතෙරෙන් ලද්ද මෙරමා හට දී පස ඉපැදූවීම්෴මෙ බුදුන් වැරූ නාක් පස සඟ ධැමියනට ද නො වපී෴

නිසපිළිබැදි වැ නිස නො ගෙනැ වෙසෙ නම් දූකුලා වෙ෴මෙහි: නිසපිළිබැදි නම්:—උනුපස්වැසි වැ නොවියක්වූයෙ හි෴පස්වස් වැ වියත් වුව නිස නො ගන වරජ නැති෴මෙහි වියත් නම්:—යමත් පිරිසෙකින් අරැත් හා බැඳුන් සහිත කොට දෙමා පිරිවහා පොහොබණ කියන්නට [4]සුතකින් සතරබණවරකුදු සපත්නානට බණ කියන්නට වනකුදූ, මඟුලවම්ගුලෙහි අනු

1 පිණ්ඩපති පිණ්ඩ.
2 වැවහිපස් මඩ යනආදි ලියදිබඳව යනාදී.
3 මදපස බොහෝපස.
4 සුත්තිත්.

මොවනාට රුවන්සුත් මහමඟුල් සුත් තිරොකුඩුසුත් යන මෙ තුන් සුතජ්, පොහොපවුරුණු ආදී දන්නාට කමාකම්විනිසසිජ් මහණුවම් කරන්නට අරහත්ඵල දක්වා පැවැති කමටහනජු නම් රුවිනිසසිජ් උගත්තෙ වියත් නම්෴මෙසේ වියත් නො වුව තමා දිවිහිමියෙන් සැලජ් නිස දෙන්නට නිසි ඇදුරකු නිසා වසත් වටී෴නිස දෙන්නට නිසි ඇදුරු උභතොවිභංග කමාකම්විනිසයැ කඩුවන සහිත් එක් පොතෙකැ යන මෙතෙක් බණවර පිරිවහා ආපත්ති අනාපත්ති දත වටී෴මෙ පොත් සහා නො අරාගියකල කීබැවින් දූත් පොත් සහා කළසඳ ආපත්ති අනාපත්ති දූනැ මෙ ඇදුරහට කීනාක් බණ අසා පොත් බලා කියැහෙත් නිස දෙත් වජ්ජාවජ්ජ කම්ම කරත් වටී යෙත් ලූ෴නිස දෙන ඇදුරු මහලු වුව නිස ගන්නාසඳ සකසා හැඳැ පෙරවැ උක්කුටුකයෙන් හිඳැ අඤ්ජලි පගෙනැ—"ආචරියො මෙ භන්තෙ හොහි ආයස්ම තො නිස්සාය වච්ඡාමි"—යි තුන්යලක් කියා අයජ ගන්නෙ෴ සඟ වුව—"ආවුසො"—යනු෴වත්තෙරුන් කෙරෙ නිස ගෙනැ වසන්නාහට පස්සෙයෙකින් නිස [1]පිළිපසජ් වෙ෴හෙ කවර යත්:-බැහැර යාමැ, ගිහි වීමැ, කළුරිය කිරීමැ, තිඵබවට ගියබවැ, ඇණැවීමැ යන මෙ පස යි෴ඇදුරුතෙරුන් කෙරෙ නිස ගෙනැ වසන්නා හට සයෙකින් නිස [1]පිළිපසජ් වෙ෴හෙ කවර යත්:— බැහැර යීමැ, ගිහිවීමැ, කළුරිය කිරීමැ, තිඵබවට ගියබවැ, ඇණවීමැ, වත්තෙරුන් හා එක්වීමැ යන මෙ සය යි෴මෙහි: බැහැර යීම් නම් ලග්නා නිසා උවසරසිමින් බැහැර යීම්෴ උවසරසිම් නම්:—පිරිවෙවු ඇති වෙහෙර පිරිවෙවු නැති වෙහෙර අවසන් සෙනස්නෙන් එවූ මහසැමහබොයට වෙත්ගෙන් එවූ දෙලෙඩුපායෙකි෴තිඵබවට ගියබව් නම්:-තිත්ථියපක්කන්තක බැවි෴ඇණවීම් නම්:—මා නිසා නො වසා යි කීම්෴මෙසේ කීසඳ දෙදෙනා අතුරෙන් එක්තෙනෙකුද් නො පියැවි වූහු නම් නිස [1]පිළිපසජ් නොවෙ෴නොකරුණෙහි පණමනා කළ ඇදුරුවත් තෙරනට දුකුලාවෙ෴පණමනා කළසඳ නො කැමැති වුව [2]අනැ වැසිසිරියනට දුකුලා වෙ෴ඇදුරුවත්තෙරැ ඉදින් කීම් නො ගනිත් නම් ඔව්නට හිතයත් කරා එළැබැ සමසකුදු වුව කමවන් නට නැත් කටයුතු෴වත්තෙරුන් හා එක් වීම් නම් ඔවුන් දුවුබැවි෴

---

1 පිළිපසඳ, පිළිපසදු. 2 අතැවැසි සැකැරියනට, අතැවැසි සැකැරි සිරියනට.

අනුදත්තනට තබා සෙස්සනට පිළියම් කියා නම් කෙරෙ නම් කරවා නම් දුකුළා වෙ෴ හෙ කෙසෙනි යත්:—මහණ, මෙහෙණ, සික්මන්, හෙරණ හෙරණි, යන මෙ පස්සහධැමිය නටජු දෙමාපියනටජු ඔවිනට මෙහෙ කරන මිනිස්නටජු මහණුන් නිසා වසත් නාහනටජු තමාගෙ මෙහෙකරුවනටජ් තමාගෙ අයතින් එවු සිඟා ගෙනැ එවු පිළියම් කරත් කරවත් වටී෴

සාපතතික වැ දැනැ දැනැ පොහො පවුරුණු කෙරෙ නම් දුකුළා වෙ෴සඟබෙසෙස් අරෙජා තුබුව ලහුකාපතති මලියෙලා සඳහන් කළ මෙයින් නැඟී දෙසම් පොහොදු පවුරුණුදු කරත් වටී෴

දෙරබා දෙරවටු පිරිමැටෙන දෙරඇති සෙනස්නෙහි දෙර නො පියාලා දෙර බලා යි නො පිළිපයා බික්සඟකෙනකුන් එවු ගිහිමිනිස්කෙනකුන් එවු ඇත මොහු රකිත් නො යන අහොග නො කොටින් දවහල් බැසැ හොවීනම් දුකුළා වෙ෴මෙ කී දෙරවටුආදිය එක්තරක් නැත එවු ඇතිදෙර නො පියාලියැ හැකි වුව එවු හිරු අවාමට ගියසඳ එවු බැසැ හොත වරජ නැති෴

මුතුමැණික්ආදී හැමරුවනුදු සාලිවිහියනාදී හැමධඤ්ඤදු මාගම්සැටි [1]පොත්රුදු සිත්තම්රුහුදු යවත්පිරිසෙයින් මාගම අතැ ලූ තල්පත් මුදු කනැ තුබූ පතාදී පලඳනාදු යවත්පිරිසෙයින් [2]සියරුදු ආදී අවුස්බඹුදු දුනුදිය [3]කාල් පලීආදී හැම ආවුධ බඹුදු ගස්හි තුබූ කැහුනු පකාපැකිජු පහරිම් යන සිත් ඇති වැ පිරිමව දුකුළා වෙ෴පක්ඇතිගස් එල්බැ එවු වැතිරැ එවු සිටිය හුන වරජ නැති෴පක් බිඳැ ගන්නා අනුපසපනක්හට අතු නමා දෙත් වටී෴නමා වළඳත් අතු නමා දෙනු නො වටී෴

ගස්හි තිබූ හැල් වී වරා තිරි ආදී පුබ්බණ්ණයෙහිජු උදු මුං තල කළත් කොමඬු පුපුල් ආදි අපරණ්ණයෙහිජු රුස් කොට තුබූ උදු මුඟු ආදි අපරණ්ණයෙහිජු පහරිම් යන සිත් ඇති වැ පහරී නම් දුකුළා වෙ෴

පෙණෙහෙන් එවු අත්පෙණෙහෙන් එවු දියමුසු හිරිමුසු තෙලින් එවු හුදු තෙලින් එවු හිසකෙස් මට කෙරෙ නම් දුකුළා වෙ෴හිවිසිවි කෙහෙ නෙත් අතින් මට කොට හොවා නම් වරජ නැති෴

දෙපැවිජ් කෙණෙනක් එක්හැ දෙනැ හොවිත් නම් දුකුළා වෙ෴

---

1 පොතුරුදු, පොත්රුහුදු. 2 සියල්රු, සියල්රුදුරුවා, සියල්රුදුරුව.
3 කහල් පිළි.

දෙපැවිජිකෙනෙක් එකක් අතුරුවා අතුරෙ සැරයපි ආදීනෙන් නො තොරා හොවිත් නම් දුකුළා වෙ෴

දෙදෙනා එකක් පෙරවැ හොවිත් නම් දුකුලා වෙ෴

එක් [1] බජනෙන් දෙදෙනෙක් බුදූත් නම් දුකුළා වෙ෴

වඩුඅඟුලෙන් අටඟුලෙන් වැඩි සතරඟුලෙන් උනු දෑහිටි කා නම් දුකුළා වෙ෴ මියෙහි සප්ආදී සනාහිඩිවතක් එබු සැතපීසඳ අමිස් එවු නැත දෑහිටි නො කැව වරජ නැති෴

නටනු එවු ගනු එවු වයනු එවු බලසිජු නම් අසසිජු නම් යොදනු යොදවනු කෙරෙ නම් දුකුළා වෙ෴

මෙහි සමත්පිරිසෙසින් මොනොරනැටුමුජු නැටුම් නම්෴ බණමූසු ගීජු ගී නම්෴ දියබොකු [2]අනොනසිජු වයනු නම්෴

නටනු ගනු වයනු බලන්නට ගිය අසන්නට ගිය පියවර පියවර දුකුළා වෙ෴

බලනසඳ අසනසඳ පෙරළී එවු පහ වැ එවු පුනපුනා බලා නම් පියවර පියවර දුකුළා වෙ෴ නටනුආදීනෙන් පුද කරම්හ සි කිව මැනැවැ සි එවු පුද කරවසි එවු කියත් නො වටී෴ බුදුහු පුද යට නිස්සහසි එවු පුද කරනු කමයුත්තෙයසි එවු කියත් වටී෴ අරමැ යෙදූ නැටුම්ආදී එවු තමා සිටිනැනට ඇරැ යෙදූ නැටුම් ආදී එවු බලත් අසත් වටී෴ පෙරමහට ගෙනෙන්නා නො සිටැ බැලූව වරජ නැති෴ අතික් කරුණෙකින් ගියතැන්හි එවු [3]ආපදායෙකින් ගියතන්හි එවු නටනුආදී බලත් අසත් වටී෴

කොඩවරතිජු පවුරෙතිජු බැහැරැ හසරඇතිතැනැ සුළුදිය ටනු එවු මහදියටනු එවු කසළ එවු එක්තරාක්හි ඉඳුල්දියආදිය එවු පියා නම් පියොව්හි පියොව්හි දුකුළා වෙ෴

අනුන් ලවා පියවන්නට කම්සත් ඔනාසඳ තෙප්ලෙහි තෙප්ලෙහි දුකුළා වෙ෴ හසරනැතිතැනැ එවු ඔබ්බෙ සිටි කෙත කුන් බලා එවු පියා නම් වටී෴

ගොයම්හි එවු රකවල්ඇති වත්තෙ එවු සුළුදියටනු එවු මහදියටනු එවු කසළ ඉඳුල් පියා එවු පියවා එවු දුකුළා වෙ෴ මෙහි: හිඳුල් නම්:—හිඳුල්දිය උක්දඬු කැ සප් කසළලොඹුආදී෴ වපුළුසඳ අකුරැ නොනැගි තන්හිදු දවකල් වත් කළ සඳ රකවල් ඇතිවූ රිවිති ඇතිතන්හිදු ඇවැත් වනවා නො දූනැදූ පියා නම්

1. බජනෙකැ. 2. අත්තෙසිජු. 3. ආපදයෙකින්.

දුකුලා වේ෴ [1]නෙරපුකෙත්හිදු ගස්ආදී [1] නෙරපු වත්තෙහිදු කෙත් වත් මුල්ලෙහි දු කෙත්මියර ද ගොයම්නැති කැපතැන් හිදු පී කෙත්හිදු වත්තෙහිදු පිව මරජ නැති෴

දෙඅඟුලෙන් දික් කෙසුදු මසින් ඉතිරි නිය ද නැහැයෙන් බැහැර පැනෙන නැහැලොමුදු නොඅළ දුකුලා වේ෴

හිසකෙස් දෙඅඟුලෙන් නො දික් වුවද දෙමස් ඉකුත දුකුලා වේ෴

නොගිලන් වැ කිසිල්ලෙහිදු නිමිත්පියෙස්හිදු ලොම් අරවා නම් දුකුලා වේ෴ නොගිලන්වැ සෙසුසිරුරු කෙස් හළ වරජ නැති—සරැප් කලි නො වේ෴

[2]නැහැවියත්සෙසින් නියමට කෙරෙ නම් කරවා නම් දුකුලා වේ෴ දූල් හරැත් කැපූතන්හි කොරෙස් හරැත් වරජ නැති෴

සඟසතු [3]කරඬුවම්ආදීනෙන් පිරියම් කළ බිම කෙත්පසින් එවු වහන්ඇතිපසින් එවු ඇක්මෙ නම් දුකුලා වේ෴ කෙත්පා පිසැපියා බිම ඇකුත්සඳ දිය නැති වැ වළඳු පැනෙත් වඩී෴ සිරුරු පහළ වරජ නැති෴

සඟසතු හැඳ පුටු පිරියම් කළ බිතුදු දොරදු කවුළුදු මැඹදු වැතිරැ හිඳුනා පුවරුදු තමාගෙ සිවුරුආදී පිරිකරක් ලා එවූ නැනවන භික්සඟුන් පරිභොග කරනසෙසින් එවු පරිභොග කරත් වරජ නැති෴ නො එසේ සිරුරු පහරී නම් දුකුලා වේ෴ මෙහි හැඳපුටුයෙහි තමාගෙ අතරණ ලා දවස් ලනසඳ පහවූ අතරණ අතුරෙන් සිරුරු පහළ දුකුලා වේ෴ ලොමින් පහළ ලොම්ගණනින් දුකුලා වේ෴

සඟලසිවුරෙන් අකවටු අවුළුවා හිඳී නමුදු ගැටවටු ගන්වා පෙරවිසඳ බැසැ හොවී නමුදු දුකුලා වේ෴ නැකිලවූ සඟලසිවුරු බැසැ හිඳුත් හොවුත් වරජ නැති෴

කිසිදෙයක් නො අතුරා හිඳුනාආදී විසින් සිවුරු කිළුටු වනසෙ දුපපරිභොග කෙරෙ නම් දුකුලා වේ෴

කාබාත් නො බැඳැ ගම් වදී නම් දුකුලා වේ෴ සිවුරු පොරොනාතැනැ මැ සිවැ බැන්දැ යුත්තේ යි෴ සිහි නො එළවා නො බැඳැ වන ඇතුළුගමලා සඳහන්කළ තැනැ මැ එහත්පස් වැ සිවැ ඇත කහබඳන් බැඳැ නැත පියැල්ලක් එවු එක්වැල රැහැණක් ලණුවක් එවු බැඳැ එසිදු නැත ගමින් නික්මැ කිසෙයින් එක්තරක් බැඳැ හමට වැද්දූ යුත්තේ යි෴

1 නිරපු. 2 නැවියත්. 3 කරඬුමල්.

"පට්ටිකා, සූකරන්තං" යන දෙපටි෴'පට්ටිකා' යනු රටා ඇති කොට [1]නැතිකොට කෙළූ පටී සි෴'සූකරන්තං' යනු දූනුකනු සුදුසු හූරු අතුණුපට් යි෴[2]පිළිවැටිදු එක්වැල රෙදුදු කී දෙපටියට අනුලොම්පටි "දෙඩ්ඩුහකං මූරජං මද්දවීණං කලාබුකං"— යන මෙ සතරපටී නො වටී෴මෙහි: දෙඩ්ඩුහක නම්:—බරණැසිස් සුදුසු මල ඇත්තෙ යි෴මූරජ නම්:—බොහො රෙජු එක්කොට [3]ගෙතූ එකරෙජ්ජකින් සිසාලෙ යි෴'මද්දවීණං' යනු:—පමූ කොට ගැවැසූයෙ යි෴'කලාබුකං' යනු—බොහො [4]රෙදි෴බුදුන් කලැ කාබානේ දහයෙන් බඳිති෴දහයෙන් බඳනා බව් පාළියෙහි ද "කායබන්ධනස්ස දසා ජීරන්ති" යුබැවින් දතයුතු෴'දසා ජීරන්ති" යි බුදුනට දැන්වූයෙන් "අනුජානාමි භික්ඛවෙ මූරජං මද්දවීණං" යි අනුදත්හු෴මෙ පෙළැ අභිප්‍රාය මැ පාලු කරන්නට අටුවායෙහි "මූරජං මද්දවීණන්ති ඉදං දසාසුයෙව අනුඤ්ඤතං, පාමඞ්ගදසා වෙණි වතුන්නං උපරි න වට්ටති" යි යුහු෴මෙ ගෙතූ ඇතැම්කෙනෙක් පටිය දෙකෙලවර බොහො පමූ ගවසා රවුළු දත් නමා ගෙත්නම් කෙරෙත්෴හෙ නො වටී යෙත්—කුමටයැ යත්: පටීයැ වුව නො වටී෴"පාමඞ්ග සණ්ඨානං පන එකම්පි න වට්ටති"—යුබැවින්෴දහ වුව නො වටී—"පාමංගදසා වෙණි වතුන්නං උපරි න වට්ටති"—යුබැවින්෴ඔවුන් කියනු නො ඉති෴කරුණු කිමැ යත්:—එ දහ දූ පටි දූ නොවනබැවින්෴දහ නොවත් පටී නො වත් හෙ කුමක් වෙ යි යත්:—හෙ විටූ නම්෴විටූ නම් හමූකරල් වෙණි නො යත් —හෙ විටූනම් නොවෙසි, දියුණුගු නම්෴හෙ දියුණුහු නම් මෙ විටූ නමැ යන්නට කරුණු කිමැයත්:—දියුණුහුතැන්හි වූ බැවින් හෙ දියුණුහු නමැ—විටූ වදුළ තැන්හි [5]වූබැවින් මෙ රවුළුදත් විටූ නම්෴හෙ කොසෙති යත්—"උභොසු පන අන්තෙසු දසාමුඛස්ස පිරහාවාය දිගුණං කායෙට්ටතුං වට්ටති" යුබැවින් දහ කුරුගුලා වැලැත් තරබැව් සඳහා දිගිණුහු ආයෙයැ෴එසේ කී දිගිණුහු තන්හි තරබැවින් එයට අනුලොම් වන බැවිනුදූ ඇජුරෙ හමූකරල්වෙණි ලූහු෴ඉතිබැවින් එහමූකරල්වෙණිජ් දියුණුහුතැන්හි සිටිබැවින් දියුණුහු නම් වෙ—විටූ නම් නො වෙ෴"පවනතො ජීරන්ති" යන අධියරහි සෙසින් මල කෙලවර ජීරන්නෙන් තර බව් සඳහා "අනුජානාමි භික්ඛවෙ වීඨං" යුහු෴උච්චාවචා විටූ අඩරන් නෙන් "න භික්ඛවෙ උච්චාවචා වීඨා ධාරෙතබ්බා; යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" යී—සොවණ්ණමය රජතමය විටූ වරා "අනුජානාමි භික්ඛවෙ වීඨං අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං

1 තනිකොට කළ   2 පිළිපවිදු   3 ගොතා   4 රෙජ්ජ්   5 යුබැවින්

වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සංඛනාභිමයං සුත්තමයං" සි එකළොස් කැප විටක් වදාළහ෴ එඅතුරෙහි මේ රවුළුදත් පාසානන්තයෙහි කරන ලබන සුත්තමය විළු මැ සි෴ ඉති බැවින් විළුයෙ බොහෝ පමුදු වටී—නොවැරැ බැවින්෴ කල් දෙස් කිස කත්තෘන් නතස්බැවිනුදු දියුණුහු හා විටු නතස් බව් දන්නෙ෴ හේ කිසෙනියත්:-දියිණුහු පූජීකාලිකයැ පටියෙහි මැ ලා කෙළියැයුතුබැවින්෴ විටු අපරකාලිකයැ-මලත් දිරුගියකලැ අනුදත් බැවින්෴ මෙසේ කල්විසින් නතස්෴ දියුණුහු කොලා පුන කීපහුයක් කොළනාබැවින් දියුණුහු පටියැ ඇතුළුවැ; විටු බැහැරි—මෙසේ දෙස් විසින් නතස්෴ දකුරුගුලා දෙඅන්තය තර කරන කිස ඇත්තෙයැ දියුණුහු෴ පාසාන්තය හර කරන කිස ඇත්තෙයි විටු;මෙසේ කිසවිසින් නතස්෴ දියුණුහු කොළන්තන් විසින් කැරෙයි;විටි හෙත්තම්කරත්තත් විසින් [2]කැරෙයි;මෙසේ කත්තෘන් විසින් නතස්෴ මෙසේ දියුණුහුය ද විට ද නොරතුරු දතයුතු෴ එ කී ගුණඇති විට මෙ රවුළුදත් නම් විටුබැවින් යම පවිය ද දහයෙහිජ් කිව වරද නොවෙයි෴ එ විට්වුව "මුරජං මද්දවිණන්ති ඉදං දසාසුයෙව අනුඤ්ඤාතං"—යන තැනැ එවකාරයෙන් විළුහි පමුගැවසුම් නො වටී යෙත්෴ හෙ නො ඉති—"දසාසුයෙව"-සි සේසි—"න කායබන්ධනෙ" යි සේසි෴ ඉතිබැවින් එවකාරයෙන් පටියැ මෙ පමු වැළැකෙ; විටැ නො වැළැකෙ෴ "දසාසු යෙව" යන අටුවායෙන් කහබහන් පූජීබැවින් විටු ළුතතර බැවින් එයම සිබනැගි ක්‍රම මෙ පිරික්සියැ යුතු෴

"තෙන බො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචානි කායබන්ධනානි ධාරෙන්ති කලාබුකං දෙඩ්ඩුභකං මුරජං මද්දවිණන්ති෴ මනුස්සා උජ්ඣායන්ති෴ පෙ෴ භගවතො එතමත්ථං ආරොචෙසුං෴ න භික්ඛවෙ උච්චාවචානි කායබන්ධනානි ධාරෙතබ්බානි කලාබුකං දෙඩ්ඩුභකං මුරජං මද්දවිණං, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස—අනුජානාමි භික්ඛවෙ ද්වෙ කායබන්ධනානි පට්ටිකං සූකරන්තකං"—යනු එක් සිඛයෙක්෴ ඉක්බිති෴ "කායබන්ධනස්ස දසා ජීරන්ති෴ පෙ෴ අනුජානාමි භික්ඛවෙ මුරජං මද්දවිණං"—යනු එක් සිඛයෙක්෴ ඉක්බිති෴ "කායබන්ධනස්ස අන්තා ජීරන්ති෴ පෙ෴ අනුජානාමි භික්ඛවෙ සොභනකං ගුණකං"—යනු එක් සිඛයෙක්෴ ඉක්බිති "කායබන්ධනස්ස

---

1. කොළන්තෙන්. 2 කෙරේ.

පවත්තෙන්තා ජීරති෴පෙ෴අනුජානාමි භික්ඛවෙ වීථං"—යනු කොළමර සිඛ සි෴පෙළ මෙසෙයින් [1]නැගිබැවින්—"අනුජානාමි භික්ඛවෙ මූ ජංමද්දවීණං"—යන පෙළට ලී අටුවායෙහි—"දසාසු යෙව"—යන එවකාරය ගෙනැ "තවියෙ'යි ගමත් අවුත්ත අප්පටි යොගී පරමාසමත බැවින් එවකාරයෙන් විවු නො වැළැකෙයි, වුත්තපටියොගි වූ සාබාන් මෙ වැළැකේ෴වූතිබැවින් මෙ "අනිච්චතො අනුපස්සති නො සුඛතො"—යනආදී පෙළෙහි "අනිච්චතොව අනුපස්සති නො නිච්චතො"යි නිත්‍යයා තප්පටි යොගී කොට යෙදුනු෴"නො සුඛතො" යනාදී තප්පටියොගී නොවනබැවින් එවකාරය නො යෙදුහු෴එසෙයින් මැ මෙහි දු— "න සායබන්ධනෙ"යි වුත්ත පටියොගීවූ සායබන්ධනය මෙ පිළි ඝබව් හොරෙයි—"තවියෙ" යනු නොමෙයි෴

සාබසෙහි අටමගලා බැලරූ සිත්තම්රූ ආදිය [3]අකප්පියය අනුලොම් බැවින් නො වටී෴දෙකොළමරෙයි ලණුප් වගපුල් [4]ආකෘතිජු විවූහි බොහො පමුජු සාප්පියඅනුලොම් බැවින් වටී෴

෴සච්චිනිස නිමි෴

සිරුරුකිස කොට ඇතිදියෙහි දියකිස නො සාහා නම් දුකුළා වෙ෴දිය ඇති තැනැ මූවහ නැත කුඹුආදී බජනෙන් ඇර මූවහතැනැ දියකිස සාහන්නෙ෴සෙසු බජුන් නැත සතප්නා පයි නිජු දියකිස සාහත් වටී෴මූවගතැනුජු බජුනුජු නැත ඔබ්බේ එාසුතැනෙකැ දියකිස සාහම් යත් වටී෴දියකිස නොසාහත තෙක් කල සිහියැයුතු වේලා වී නම් සිගත් වටී෴සතප්තුදු බණ කියතුදු වටී෴

පස්සහබැම්යනට නොවටසාබව් දූතැදූතැ මෙ කර මෙ බුද යනආදී විසින් අයපෙයෙහි සමාදන් කෙරෙ නම් දුකුළා වෙ෴

සභාග ඇවැත් දෙසා නම් දුකුළා වේ෴මෙහි සභාග ඇවැත් නම්: දෙජනා විකාල් වැළැඳුම් අපිළිගතු මලඳනා ආදී විසින් අවන් වත් සභාග ඇවැති෴

මෙවෙනි වත් සභාගඇවත් පිළිගනී නම් දුකුළා වෙ෴ අරොජ නම දුකුළා වෙ෴වත් තොර වැ එමෙ ඇවැතුදු වුව දෙසත් වටී෴සභාගඇවැත් දෙසුව දෙසූ පසයෙන් දෙසූ ඇවැතුදු පිළිගත්පසයෙන් අවන් ඇවැතුදු පුන අතන්මත දෙසත්වටී[5]෴

---

1 නැති බැවින්. 2 විටයෙ යි ගමන්, විටැයි ගමන්. 3 අකප්පියභාය, අකප්පභාය. 4 ඇකිතාදිදු, අතතින් ආයාතිජු. 5 මේ ප.ණයෙහි ඌනතාවයක් පැනේ. සික්ඛාපදවලඤ්ඤය බලනු.

මෙසෙනස්නෙහි වසාවන්නෙයැ අප වඳවන්නෙයැ යනාදී තැපතෙපුල් කිසඳ සුඛසිඳින් මැනැවැයි [1]පිළිතදී වසැකි තෙරෙ නම් දුකුළාවෙ෴ගිහි වෙමි, බත් නො නම් යනාදී විසින් වසැකි කල වරජ නැති෴අනාහාරය නැති වැ දෙරඇති සෙනස්නෙහි වසා නො වෙසේ නම් දුකුළාවෙ෴

ඇසළ අවපැළවිදවස් [2]පෙරවසහා වසා නොවූවාහු විසිනුදු සුන්වස් වූවාහු විසිනුදු [3]නිකිම්නියැ අවපැළවිදවස් [4]පස්වසන වසාවන්නේ෴පස්සනධැම්යනුදු දෙමාපියනුදු ගිලන් වූව බෙහෙද් පිරියෙස්නාදී ප්‍රයොජනයෙකින් එවූ වැත්තා දන්නාම එවූ හසුන් දූනද තුදුනද සතිකරුණෙන් යත් වටී෴ගිලන් දෙමාපියනට මෙහෙකරන්නාමදු නොනැ මෙහෙකරුවනටදු බික්සඟුන් වයල්නොට වෙහෙර ගිලන් වැ වසන්නාහටදු බනාදී ඉල්වනු නිසා හසුන්දූන සතී කරුණෙන් යත්වටී෴සෙසුනැයන් දන් දෙම්හ, බණ අසම්හ යනාදී [5]පසනු යමක් නිසා කියෘ එවූව සතී කරුණෙන් යත් වටී෴නැ නොහැයන් බික්සඟුන්ගෙ නමින්ගෙ එවූ සෙනසුන් පිළිබැදි කොටින් එවූ තමන්ගෙ මඟුල් පිළිබැදි කොටින් එවූ දන් දියැටියම්හ බණ ඇසියැටියම්හ යි කියා එවූව සතීකරුණෙන් යත් වටී෴නම්ාගෙ එවූ සෙසු බික්සඟුන්ගෙ එවූ සෙනසුන් මහසැ පිළිබැදි කොට සංඝකරණියෙන් යත් ටී෴සෙසු කරණී සංඝකරණී යැ ගි නොසලකා ලද්දේ෴ බික්සඟුන් කවයුතු වනකාම් නිසා එවූ ඕනට ඔවාදෙනු නිසා එවූ ඔවුන්ගේ කුකුස් දිඹ උකවලී හරනා නිසා එවූ සතී කරුණෙන් යත් වටී෴වසාවූ දවස් එහි අරුණු නොනගා සතිකරුණෙන් යත් වටී෴සතිකරුණෙන් ගොස් අමුද් පුන අරුණ නොනගා සතී කරුණෙන් යත් වටි෴

මෙ සිඛවලඳවිනිසයෙහි සමඟ වරද නො කීහා අටුවා පාළිළිදෙස් බලා [6]වනධරුන් හා ස දැ ගන්නෙ෴

නැ නොනැ යම් කවරි කෙනකුන් දක්නා නිසා එවූ සිවුරු ඡේනාදී කිසයෙන් එවූ බණ කියවා ගන්නාදී කිසයෙන් එවූ සතීකරුණෙන් යත් දුකුළා වෙ෴ඇදුරු වත්තෙරුන් දක්නාම එවූ ඔවුන්ගෙ සිවුරු ඡේනාදී කිසයෙන් එවූ සතීකරුණෙන් යත් වටී෴සතීකරුණෙන් ගොස් එන්නාහු අද නො යා යී වත් ඇදුරෙහි නැවතු නම් සතී ඉකුත ඇවැත් නැති෴පසයෙහි හානියෙකින් එවූ එක්තරා අනතුරයෙකින් එවූ තිදන් දූම සිත් නො රක්නැ හැක්නැ යී සිතුවා එවූ ඕගම් සොර නොසොර නැ නොනැයන් අතුරෙන් එක්තෙරෙක් එවූ රන්රිදී ආදී රුවනින් එවූ තොත්වත් ආදී එක්තරා

1 පිළිගෙනද. 2 පෙරවස්න. 3 නිකින්නයැ 4 පස්වස් වසන්නෙ. 5 පෙරැදු පසතු, මෙරෙදු පසතු, රචිතයධරයන්.

වස්තුයෙකින් එවූ මෙ කොපට දෙමි එක්තරුණයෙකින් පොළොබා නම් සිත් නොරැක්ක හැක්නැ යි සිතුව සුන්වස් වැ යත් වටී෴නොදුරු තෙනකට අද මෙ ගොසින් එම් ගියාහු එකසඳ අතරමඟැ අරුණු නැඟුව ඇවැත් නැති—සුන්වස් නොදවෙ෴වප්මසැ පුරකවවක පටා සතිකරණී ඇත සති කොට යනු වටී—නැවකැ නො අව වරද නැති෴මෙහි වරද නැතිබව කීය—"නවමිතො පඤ්ඤාය ගහාතුං වට්ටති"යි෴සති යට යන්නහු උවසරසිමින් ඇතුළුවැ සිටැ ඇතුළුසතියැ එම් අළුභාගකොට යන්නෙ෴මෙ උවසරසිම් යටැ පෙළෙස් වන පවිතියෙහි කීසෙසින් දන්නෙ෴ආභොග නො කොට උවසරසිම් ඉකුත සුන්වස් වේ෴

උවදුරු නැතියා වැ බඹයෙන් මත්තේ රුකකට නැඟෙ නම් දුකුළා වෙ෴මළ දර බිඳිනාදී කිසයෙන් බඹයකට නැඟෙත් වටී෴උවදුරු ඇත නැමැති නාක් තැනට නැඟෙත් වටී෴

පෙරහන් නැතියා වැ යටත්පිරිසෙයින් දෙගවු [1]අධන්මග [2]පිළිපදී නම් දුකුළා වෙ෴පෙරහන් නැත්තෙන් එවූ ඉල්වා නොලද්දෙන් එවූ සිවුරුකතින් පරහා ගන්මි යන අභොග ඇති වැ යත් වටී෴සිවුරෙන් පැරුහූ දිය වැළැඳියැවිවූව පළමුමෙ සිවුර පිළි ගන්වා ගන්නෙ෴

මඟහි ලා පෙරහන් නැත්නක්හු පෙරහන් ඇරුවූව පෙරහන් ඇතියා වැ දිය පරහන්නට නො දේ නම් දුකුළා වෙ෴

මියැවි සිතියෙන් තමා මරු නම් දුකුළා වෙ෴අනුන් ලවා තමා මරවා නම් දුකුළා වෙ෴ සිත්නම් පොත්රූ කෙරෙනම් දුකුළා වෙ෴[3]දුගවුදම්පියාවත් බුදුනාදී [4]අදවත් වටී෴

එක්තරු නැතෙනැ හිඳ බුදුනාක්හු [5]තිපි අපට සඟයව යනාදී කියා නගා නම් දුකුළා වෙ෴

බුදුනාගෙහි ආ මහල්ලනට හුනස්නෙන් නැඟී උවසර නොපැ හිඳී නම් දුකුළා වෙ෴තමා බුදුනාසඳ මහල්ලන් දූනැ 'කමන් නැ'යි එවූ 'හිඳුව'යි මහල්ලන් දුන් සමුයෙන් එවූ හුන වරද නැති෴

නොගිලන් වැ පිරිම්නීන් උසුලන හිදෙලු ගැල් ඈ යානායෙහි හිඳී නම් දුකුළා වෙ෴ගිලන් වුව වටී෴

රුවන්තියා අරගයා බුදුහු:කී බුදුනැ?පිළිබුදුනැ,සලබුදුනැ; ධම්:කී ධමැ?ගොධමැ,රජධමැ;සඟ: කී සඟැ?ගොසඟ,අජසඟැ යනාදීවිසින් දවයෙන් බෙණෙ නම් දුකුළා වෙ෴

---

1 අඛන්මග. 2 යය්. 3 ජගවු, දුගවු. 4 අනාවත්. 5 තෙපි.

අනුන් පිරිස් ‘පිරිකරදෙම්හ සිවුරුදෙම්හ’ යනාදී විසින් ඔසවා නම් දුකුළා වෙ෴[1]දුස්සිලුන් හොමර වන්නාතට ‘නගන් නම අවුදු මබැහි ගැලීගියාක්හු වැන්නෙහි’ යන ආදී විසින් [2]අවෙන්වා මාත්‍රයක් කියත් වරී෴

සිවුරුනගා කළුවේ ආදී මාගම්පැවිජ්ජනට පවීනම් දුකුළා වෙ෴

අන්නට වෙහෙසයට වැනටන ශාසත්‍රද විනාණ්ඩශාසත්‍රැ සි ගත් ලොකායතද උගනී නම් දුකුළා වෙ෴කියා නම් දුකුළා වෙ෴

නරකෙස් ගනී එවු ගන්වා එවු දුකුළා වෙ෴මහලුබව දන්නාම සංවෙගයෙන් ගන්වා බලානම් එවී෴

තඹලෝ වටලෝ රිදී ආදීනෙන් කළ පාතටු මත්තෙ තබා මළදත් දුකුළා වෙ෴‘ආසිතතකූපධාන’ යනුදු ‘පෙලා’ යනුදු [3]‘වගුලතතපටු’ යනුදු මෙ පාතටිංගහි නම්෴පැන්තල තොතලා වත් මොරවා ආදී මත්තෙ තබා වළඳත් වරී෴ඇතැම් තෙතෙක් තොදූත හිරවත් හගළවත් ලූ පත් තො වරී යෙත්෴තෙ තො ඉති෴

ඉටන්පොහොනා පා අතින් ගෙනැ දෙරකාවුළු වරී නම් පියාලා නම් දුකුළා වෙ෴ඉස්වූ[4]පා දතලා කාඳටලා දෙර වරී නම් පියාලා නම් වරී෴

තෙත් පා දිය තො සිඳූ සභවා නම් දුකුළා වෙ෴අවුයෙහි තබා හුණු කොට වියලා නම් දුකුළා වෙ෴මඳක් වියලා සඟවත් වරී෴

කිසිවතක් තො ලා රද ඇති බිම්හි එවු සිව් නැගෙහ තො රොස්බිම්හි එවු තබා නම් දුකුළා වෙ෴ගොස් බිම්හි එවු සිහින් වැල්ලෙහි එවු තබත් වරද නැති෴මට බිම්හි එවු තබත් වරී෴ හැඳ තබා නම් දුකුළා වෙ෴පුටුයෙහි තබා නම් දුකුළා වෙ෴ හැඳපුටුආදිමත්තෙ තුබූ හෝනා කසුආදී එක්බැදි කොට බැඳ තබත් එවී෴හැඳපුටු වල [5]බැඳ එල්වා තබත් වරී෴[6]හටුනකොට තුබු හැඳපුටුමත්තේ තබත් වරී෴ඔර තබත් තො වරී෴අතින් ගෙනැ එවු [7]පත්තී අස්වදු දතලා එවු කාඳට ලා එවු ඔර තුබුව වරජ නැති෴අතින් තො ගෙනැ [8]හම්වා පිටිපයැ තබා නම් දුකුළා වෙ෴

බත්පිරිණූ පසිඳු අස්වදු කාඳට ලා දත ලසිඳු සතැ තබා නම් දුකුළා වෙ෴දෙරියන්නැති නිසවත්තෙ වලල්ලක් තොලා තබා නම් දුකුළා වෙ෴දෙරියන් නිසවත්තෙ යනා තබා එවු කුඩා නිසවත්තෙ වලල්ලක් තබා එවු වරී෴නිසවත්තෙ කී නාක් විනිස පිළත්තෙහිදු දතයුතු.

---

1 දුසසීලයන්, දුසිලුන්. 2 ආදිනව, ඔවා. 3 හගලාතටු. 4 පාදතලසාර්ලා 5 බැඳුහෙළුමා. 6 අටුකොටුතුබූ, හටුකොටු තුබු. 7 පත්තී අස්වදු තබා 8 හඹා, ලග්වා.

පියැයුතු කවු ඇට [1]සප් ආදී පයැ ලා නම් දුකුළා වෙ෴පුන කෑයැපි වැ එවූ අන්නට දියැපි වැ එවූ තබත් වරී෴පාමත්තෙ අත් දෙවී නම් දුකුළා වෙ෴පා තෙමන්නට [2]අත්මත්තේ දිය ඔත වරජ නැති෴ඉදුල්දිය පයැ එවැ ගෙනැ යේ නම් දුකුළ වෙ෴

යපා මැටිපා තබා සෙසු දඬු—දළ—ලොහොමුවාදී පා පරිභොග කළ දුකුළා වෙ෴මැටි—තඹ—යමුවා තලු තබා සෙසු තලු පරිභොග කළ දුකුළා වෙ෴කද පිළිවහණ කස ලොහොමුවා තැටි ආදී බදුන් පුහුල් සතු වුව නො වරී—සඟසතු ගිහිසතු වුව එවිගස පරිභොග කළ වරී෴රන් රිදී බජනෙන් ගිහි මිනිසුන් බැජුන් එළවුව පහරනෙයිජු නොවරී෴මාගමුන්අතින් ඔනං දීයෙන් අත්දෙනා වටනා බැවින් එළවූ රිදීඉකිළියේ නොපැහැරැ අත් දෙවුත් වරී෴කළ කොතලා තබල් එවිගස පරිභොග කොට පියත් වරී෴

අතුන් කිවුටසඳ ආවඩා නම් දුකුළා වෙ෴තමා කිවුටසඳ අතුන් ආවැඩුම තමා පිළි ආ වඩත් වරී෴

අනාදරිය පිණිසැ සිඛකරණීය නො හික්මෙ නම් දුකුළා වෙ෴[3]උගන්නට නැත් නොකිරීම් මෙ අනාදරිය නම්෴මෙහි [4]සිඛකරණී නම් කවර යත්? සැබෙවින් කියනෙම්:—

අවට නැත්නා කොට සිවුරු හඳී නම් දුකුළා වෙ෴වඩු අඟුලෙන් අටඟුලක් දණමඩලෙන් බහා වමත් පසැ හසුන් කන් තබා එක් කෙළවරෙකින් නොඑල්වා අවට ඇත්නාකොට හැන්දයුත්තේයි෴අවට ඇති කොට හඳනා සැඳැ වැරැද්ද අවම නැති වුව වරජ නැති෴

අවට නැත්නාකොට සිවුරු පොරොවීනම් දුකුළා වෙ෴ඇතුපිමැ ලූ [5]ගොටු සෙයින් දෙකෙළවරින් සමකොට වම්දතින් පත් පිටු බහාලා එක්කෙළවරෙකින් නොඑල්වා අවම ඇති කොට පෙරැවියැ යුත්තේයි෴

සුපිළිසන් නො වැ අතුරුසෙරෙහි යේ නම් හිදී නම් දුකුළා වෙ෴මෙහි අතුරුඝරනම් ගම් එවූ වෙහෙර එවූ මිනිසුන් බිදැ [6]ලක්නා නැති෴මෙ මෙ නතා කියනලද "ගාමෙවා කොතු විහාරෙ වා මනුස්සානං පරිවෙසනඨානං ගච්ඡන්තෙන තිචීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධිත්වා වච්චතීති [7]අළුතමාසු වුතානං"යි෴එබැවින් තුන්සිවුරු හැඳැ පෙරැවැ කාබාන් බැඳැ

1 පස්. 2 අත්මත්තේ. 3 උගන්නා. 4 සිඛකරණීය.
5 ගොමු. 6 ලග්නා. 7 අළුකමුංය.

සුපිළිසන් වැ අතුරු සෙරෙහි හින්දැ යුත්තේයි෴[1] ගලවළු මිණි
බාහුදු පිඩිමසුදු වැසෙනසේ සිවුරු හැඳැ පෙරවැ හුන්නෙ සුපිළි
සන් නම්෴මෙ සිඛයෙහි අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස,
ගිලානස්ස, වාසූපගතස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ඛිත්තචි
ත්තස්ස, වෙදනාට්ටස්ස, ආදිකම්මිකස්ස—යන මේ දස අනාපත්ති
වරී෴ඇතැම් කෙනෙක් අඤ්ඤාතකවිඤ්ඤත්ති සිවුරුසිඛයෙහි
'අනාපත්තිසමයෙ ඤාතකානං පවාරිතානං යි' යන මෙයට
ලි පාඨයෙහි—"යො මය්හං ගෙහං පවාරෙමීති වදති—තස්ස
ගෙහං ගන්ත්වා යථාසුඛං නිසීදිතබ්බං නිපජ්ජිතබ්බං න කිඤ්චි ගහෙ
තබ්බං෴යො පන යං මය්හං ගෙහෙ අත්ථි තං පවාරෙමීති වදති
යං තත්ථ කප්පියං තං විඤ්ඤාපෙතබ්බං, ගෙහෙ පන නිසීදිතුං
වා නිපජ්ජිතුං වා න ලබ්භතීති කුරුන්දියං වුත්තං"—යන මෙ අටු
වා ගෙනැ දුන් ගෙහි සිවුරු ගලවත් වටී යෙත්෴"යථාසුඛං
නිසීදිතබ්බං නිපජ්ජිතබ්බං"යි යුබැවින් සිවුරු නොගැලවුව යෙ
හෙන් හෝනා හිඳුනා උගහට බැවින් සිවුරු ගැලවුව වරජ
නැති යෙත්෴ඉදින් මෙසේ වුව ගෙන් පවරා සෙසුපසයෙන්
නොපැවරූ තැනැ "න කිඤ්චි ගහෙතබ්බං" යි යුබැවින් හෝ
නා හිඳුනා මිසැ ඔවුන් දුන් සිවුරු [2]පිඬුවා ගිලන්පස නො ගත
යුතු වෙත්෴ඉතු හොතුදු—'යථාසුඛං නිසීදිතබ්බං, නිපජ්ජි
තබ්බං'යි යුබැවින් සිවුරු ගලවතු මෙ හැමෙහි යෙත් නම්
හෙ නො ඉති෴කරුණු කිමැ යත්—"අනුජානාමි භික්ඛවෙ
යථාසුඛං මුග්ගං පරිභුඤ්ජිතුං"—යන මෙහි යථාසුඛපරිභොග කී
බැවින් නොපිළිගත් මුගු පරිභොග [3]කරතුදු පස්වරු වළඳතුදු
පැවැරිවුවහු කැප නො කරවා වළඳතුදු [4]වටී නො මෙ වියැ යුතු
෴හෙ නො ඉති෴"අනුජානාමි භික්ඛවෙ යථාසුඛං ගුළං පරි
භුඤ්ජිතුං"—යන ආදී පෙළදු පිරික්සියැ යුතු෴පැවරූගෙහි සුවෙන්
හෝනා හිඳුනා වටී යන මෙ තෙපුල් සාමඤ්ඤයෙන් සිවුරු
ගලවත් අයප[5]කිල්ලෙහිදු නොවිමසූ අස්නෙහිදු හෝනා හිඳුනාදීදු
[4]වටී නො මෙ වියැ යුතු෴හෙ ද නො ඉති෴'වාසූපගතස්ස අනා
පත්ති'යි [6]යුබැවින් බත්කිසයට ද ගිලන්පසට ද වන්නෙ වාසූ
පගත මෙ වෙ නො යත් සුපටිච්ඡන්නසිඛපද මැ නිරත්ථක වනු
෴හෙ ද නො ඉති෴ඉතිබැවින් අඤ්ඤාතක විඤ්ඤත්තිසිඛපදයටදු
සුපටිච්ඡන්නසිඛපදයටදු විරුඬ නොවනසෙයෙකින් පිළිපැද්ද
යුතු෴"කප්පියාකප්පියවිචාරණං ආගම්ම රුන්ධිතබ්බං ගාළ්හං

---

1 ගලවවුදු. 2 පිඬුපා. 3 කමවුතුදු. 4 වටනේ මැනැවියැ යුතු.
5 අයපකිල්ලෙහිදු 6 කීබැවින්.

ඤත්තබ්බං සොතං පච්ඡින්දිතබ්බං ගරුකභාවෙයෙව ඨාතබ්බං" යනුදු "ආවිණ්ණකප්පො ඛො ආවුසො එකච්චො කප්පති එකච්චො න කප්පති" යනුදු පිරික්සියැ යුතු෴ අනාපත්තිවරු නොආහෙසින් සිවුරු ගැළැවීමෙහි බොහො වරද කීයති, ඇපි බොහො [1]වත්තෙත් නො කියමො෴

අතුරුසෙරෙහි අත් එවු පා එවු කෙළවමින් යත් හිඳුත් නො වටී෴

අතුරුසෙරෙහි ඇස් යටිම්තිය නො කොට යේ නම් හිඳී නම් දුකුළා වෙ෴ පෙරට වියදඬු පමණතාක් තැන් බලා යනුදු හිඳුතුදු උවදුරු බලන්නට දුරුතැන් බලතුදු වටී෴ අතුරුසෙරෙහි එක් දත එවු දෙදත එවු සිවුරු නඟාලා යත් හිඳුත් නො වටී෴

අතුරුසෙරෙහි මහසිනා සෙමින් යත් හිඳුත් නො වටී෴

අතුරුසෙරෙහි [2]මහඬ කොට බෙණෙමින් යත් හිඳුත් නො වටී෴

අතුරුසෙරෙහි කා එවු හිස් එවු කොඬ එවු සලමින් යත් හිඳුත් නො වටී෴ අතුරුසෙරෙහි එකුකුළෙ එවු දෙළුකුළෙ එවු [3]වටම්ටි වක් කොට අත් තබා යත් හිඳුත් නො වටී෴

අතුරුසෙරෙහි හිස් [4]වටා පෙරුවැ යත් හිඳුත් නො වටී෴ අතුරුසෙරෙහි අක්පයින් එවු විළුම්න් එවු [5]තෙළ්ළින් සිටිත් යත් නො වටී෴ උගහට කාරුණක් පිණිසැ [5]තෙළ්ළින් සිටිත් යත් වරජ නැති෴

අතුරුසෙරෙහි අතින් එවු පිළි ආදී එක්තෙරෙකින් එවු අතාවටු අවුළුවා හිඳුත් නො වටී෴ වාසූපහඟතයනට වරජ නැති෴

මෙයින් මත්තෙ කියන සිඛකරණී අතුරුසෙරෙහිදු බැහැරුදු දතයුතු෴

සකස් නැතියා වැ බතඅහර පිළිගන්වා ගනී නම් නො වටී෴ [6]පාහි එළවු සඥඤ නැතියා වැ පා පිළිගන්වාගනී නම් නො වටී෴ බත සතරවන කොටසින් ඉතිරි කොට හූ ගනී නම් නො වටී෴ [7]අත් තැත්තෙත් හුමතු එවු සෙසු බැඳුන්මතු එවු බොහො දෙතු දු ගත වරජ නැති෴

---

1 මත්තෙත්. 2 මහහඬ, මහත්හඬ, මහත්. 3 වළම්ටි.
4 වසා. 5 කිළින්. 6 එළවු පාසඥඤ, වාසඥඤ. 7 අත්.

ඉවත්පොහොනා පස මූවවිටියේ යටහිර ඉකුම්වා ඔත් බිත අහර පිළිගන්වාගනුත් දුකුළා වේ෴ගත බුදුනාපසයෙන් වරජ නැති෴යම්කැලි ආදී පසින් ඉතිරි කොට ගත ද ඉවත්[1] නොපොහොනා පා ආදී බජනෙන් බතාදී උස්කොට ඔත්තා ද පිළිගත වරජ නැති෴පාමත්තෙ හුළු ඇත වරජ නැති෴බත්පාමත්තෙ තලූආදියෑ [2]බතාදී එවෑ උස් කොටෑ දුන්නාද පිළිගත වරජ නැති෴

සතස් නැතියා වෑ බිතඅහර බුදී නම් දුකුළා වේ෴පාහි එළවූ සසුඳු නැතියා වෑ බිතඅහර බුදී නම් දුකුළා වේ෴පෙරටීන් පිළිවෙල ඉකුම්වා බුදී නම් දුකුළා වේ෴අනෙක් තෙනෙක් නට දෙන්නට එවූ අනෙක් බජනෙක්හි ලන්නට එවූ අවුළුආදී ගන්නට එවූ බහා හනන්නට එවූ එ එ තැන් පිරිමට වරජ නැති෴

බත සතරවත කොටසින් ඉතිරි කොට හූ බුදී නම් දුකුළා වේ෴බත මැදතුරෙන් හනා බුදී නම් දුකුළා වේ෴එබැවින් බත් යතා තබා පෙරටූ තෙලවරින් හනා [3]බුදුනෙ෴

වඩා කැමති වෑ හූ හෝ වැජුන් හෝ [4]ඔතින් පිළිසොයා නම් දුකුළා වේ෴වඩා කැමතිබැව් නැතියා වෑ අනික් කරුණෙකින් පිළිසෙවුව වරජ නැති෴

නොගිලන් වෑ බත් හො හූ හො විනවා බුදීනම් දුකුළාවේ෴නෑ නොනෑ පැවරූවන් එවු පස්සහඩැමියන් අතුරෙන් එක්තරා ගිලනක්හට එවූ විනවත් වරජ නැති෴

පිඬු මහත් කොට වටා වළඳත් දුකුළා වේ෴[5]කුකුළුබිජුවට කුඩා නො කොට මොනර [6]බිජුවට මහත් නො කොට වැටියෑ යුතු෴මොනර [6]බිජුවට මහත් වුව වරජ෴කුකුළු [5]බිජුවට කුඩා වුව වරජ නැති෴

පිඬු වමවත් නො කොට මලඳත් දුකුළා වේ෴මුවම නොසපත්සඳ දුරලා මූව වරී නම් දුකුළා වේ෴නොලව එළවූ සඳ මූව වරා නොලසා වළඳත් සරුපි෴

හැමඇගිලි හෝ එක් ඇඟිල්ලක් හෝ මියෙහි ගලා බුදී නම් දුකුළා වේ෴පිඬු යතහසැඳෑ වැරජෑ ඇගිලි තෙලවර වත වරජ නැති෴

මියෙහි බත් ත්බා බෙණෙ නම් දුකුළා වේ෴තෙපුල් පිරිහුන් නොවත් අරළුආදී එක්තරාදූයකුදු මියෙහි තබා බණක් නො වම෴[7]තෙපුල් පිරිහුන්වත් මියෙහි එක්තරා [8]දූයක් තබා බණත් වරජ නැති—සරූප් කලි නො වේ෴

---

1 පොහොනා, 2 තබාද් 3 බුදිනෙ. 4 ඔතින්. 5 කිකිළි බිජුවට-බිජට, 6 බිජට. 7 තේපුල් පිරිහුන් නම්-තෙපුල් පිරිහුන් හැත්නම් 8 දූයක් ඇතිනොමදු.

පිඬු මියෙහි දමාලා වළඳත් දුකුළා වෙ෴ පකාපැකි පුවක්කඩ ආදී දමාලා වළඳත් වරී[1]෴

කබල කපා බුදී නම් දුකුළා වෙ෴ පකාපැකි පුවක් කඩ ආදී කපා[2] වළඳත්[3] වරජ නැති෴

චඳුරුසුඹුකු කොට වළඳ නම දුකුළා වෙ෴ පකාපැකිආදී වළඳනසඳ වරජ නැති෴

අත් සලසලා බුදී නම් දුකුළා වෙ෴ කසලකටු ආදී පියනසඳ අත් සැලුව වරජ නැති෴

හුළු ඉසුරුවා[4] බුදීනම් දුකුළා වෙ෴ කසලකටුආදී පියන සඳ හුළු ඉසිරු ගිය වරජ නැති෴

දිව් නෙරනෙරු වළඳ නම් දුකුළා වෙ෴ සප් පැහැරු[5] වළඳ නම් දුකුළා වෙ෴ හඬඇති කොට උරු වළඳනම් දුකුළා වෙ෴

අත එවූ පා එවූ තොල එවූ ලෙවැ වළඳත් දුකුළා වෙ෴ කිරි පායස් සකුරු තෙල් ආදී වළඳනසඳ ඇඟිලි ලෙවැ වැළඳුව වරජ නැති෴ පයැ මඳවූ අහර පිසැ මුළු කොට වළඳත් වරී[6]෴ තොලැ හුළුආදී අහර දිව් නොනෙරු තොලින් මැ ඇතුළු ලා වළඳන්නෙ෴

අමිස්මුසුඅතින් පැන්තළුආදී ගනී නම්[7] දුකුළා වෙ෴

හුළුමුසු පා දෙවිදිය අතුරුසෙරෙහි පියා නම් දුකුළා වෙ෴ ගිහිම්තිසුන් දිය පියනතන්හි එවූ ඉකිළියෙහි එවූ පිව වරජ නැති෴

සත්ගත්අත්ඇත්තාහට[8] බණ කියා නම්[9] දුකුළා වෙ෴ අත් ලෙන් නො ගෙනැ සිරිරින් ධැරුවහට කියත් වරජ නැති෴

චඩුරියතින් සතරරියන් දඬු[10] ගත්තාහට බණ කියා නම් දුකුළා වේ෴ එ දඬු අතින් අළුවාහට බණ කියත් වරජ නැති෴

කඩු[11] කාල් ගත් අත්ඇත්තාහට බණ කියා නම් දුකුළා වෙ෴ එසිදු අත්ලෙන් අළුවාහට බණ කියත් වරජ නැති෴

හීසහිත වුව ද නො වුව ද දුනුදිය ඇත ද නැත ද දුනු ගත්තාහටදු හීදඬු ගත්තාහටදු බණ කියා නම් දුකුළා වෙ෴ අත්ලෙන් ඒ අළුවාහට[12] කියත් වරජ නැති෴

පාදුකා එවූ වහන් එවූ පයැ ලූවාහට බණ කියා නම් දුකුළා වෙ෴ පසින් හරවා කියත්[13] වරජ නැති.

---

1 වරජනැති. 2 කඩා. 3 වළඳනසඳ. 4 හිසුරුවා. 5 පහාරු. 6 වරද නැති. 7 පිළිගනීනම්. 8 සත්ගත්තාහට. 9 කියත්. 10 මුගුරු. 11 දඬු 12 අත්ලෙන් ඇරගත්තාහට ඒ අළුවාහට. "හළු තලතො අපනීතස්ස පත වටටති"-සික්ඛාපදවලඤ්ජා. 13 කිව.

හිදෙළුගැලාදි යානයෙහි හුන්නාහට බණ කියා නම් දුකුළා වෙයි. නැලින් ගලවා තුබූ සැකිදු යාන මෙ වෙයි. තමා ද යානයෙකැ හුනැ මෙරමා හුන් යානය[1] බට යානය පසු වුව කියත් වටීයි. එකයානයෙකැ හුනැ මෙරමා හුන් තැන බට පසු වුව කියත් වටීයි. යටත්පිරිසෙයින් පැදුරැආදි යානයෙකැ හොත්නාහට තමා උස්තෙනෙකැදු හිඳැ සිටැ බණ කියත් නො වටීයි. මෙරමා හොත්තැන් බට තමා හෙවැ බණ කියත් වටීයි.

අත් අකාවටුආදි එක්තෙරෙකින් අකාවටු අවුළුවා[2] හුන්නාහට බණ කියත් දුකුළා වෙයි.

කොසක්[3] නොපැනෙනසේ පිළිවුටුනු[4] ආදීන් හිස වැසුවාහට බණ කියත් දුකුළා වෙයි. කොසක්[3] පැනෙත් වරජ නැතියි.

හිස් වසා පෙරුවියහට බණ කියත්[5] දුකුළා වෙයි. හිස් පැනෙනසේ වරුවා[6] කියත් වරජ නැතියි.

තමා බිමැ හිඳැ පිළිතණඅතුරුණුආදි අස්නෙකැ හුන්නාහට බණ කියත් දුකුළා වෙයි.

බිම්ආදි උස්තැනෙකැ හුන්නාහට තමා බට[7] තැනෙකැ හිඳැ බණ කියත් දුකුළා වෙයි.

සිටැ හුන්නාහට බණ කියත් දුකුළා වෙයි.

මහල්ලො හිඳැ සිටියාහු පැන පුළුවුසිත්නම් නැඟීසිටැ පුළුවුස්ව යනු දුකුළා බැවින් වැළැතැ සිටියාක්හට කියමි කියත් වරජ නැතියි. වැළත සිටියවුන් තැන නොකියන්නෙයි.

තමා පසු වැ පෙරට වැ යන්නාහට බණ කියත් දුකුළා වෙයි. පසු වැ යන තෙනෙක්හට බණ කියමි කියත් වරජ නැතියි.

මඟින් යන්නාහට නොමඟින් යමින් සිටැ බණ කියත් දුකුළා වෙයි. දෙදෙන මැ නොමඟින් යනසඳ බණ කියත් වරජ නැතියි.

සත්ගත්අත්ඇත්තාහට බණ කියනාදි[8] මෙ සොළොස්සිඛයෙහි ගිලන්හට බණ කියත් වරජ නැතියි.

---

නොගිලන් වැ සිටැ සුළුදියටනු මහදියටනු කරත් දුකුළා වෙයි. වැරැද්ද පැවැත්ත වරද නැතියි.

නොගිලන් වැ යම්තවරි දෙක තණමුල්අතුආදියැ පහරනාසේ සුළුදියටනු මහදියටනු කෙළ මුකුණු පවත්වා නම් දුකුළා වෙයි. තණමත්තේ පරඬලාආදි එක්තරක් ලා දියටනුආදී ලන

1 යානයෙන්. 2 අක්අවුළුවා, අකාවඑලවා. 3 කොසග්. 4 පිළිවෙටුනු, පිළිඹටුනු. 5 කියානම්. 6 හිස්වරුවා, හරවා. 7 මට 8 බණකියන්නාදි.

සඳ පරඬලාඅදී ඉක්මැ[1] තණ ආදියැ පහල වරජ නැති෴ තැපබීම් ඉල්වන[2] සැදැ නො ඉවැසිවැ පවතීතම්[3] ගිලන්තැනැ පිහිටා෴ එබැවින් තණාදිමත්තේ කල වරද නැති෴

නොගිලන් වැ දියෙහි සුළුදියවටනු මහදියවටනු කෙල මූකුණු ලා නම් දූකුළා වෙ෴ ඔවස්ගෙහි දියෙහිදු මූහුදුදියෙහිදු මිනිස් නට පරිභොගනොවන දියෙහිදු පැවැත්වූව වරද නැති෴ මහවැසි වස්නාසඳැ දියනැතිතැන් නැත නොඉවැසිවූව[4] වරජ නැති.

෴ සිඛකරණී නිමි. ෴

---

බඩැරිසිසයෙන් ගිහිමිනිසුන් දෙමාපියන් ආදි එක්තරු කෙනකුන්ගෙ පිරිකරක් සඟවා නම් ඇවැත් වෙ෴ දෙමාපියන්ගෙ කැපවත් තමා අයත් කොට සඟවාඃ එවූ මෙ සඟවාදෙවයි කී සඳ නො වටී෴ පිළිබෙව් කලසඳ පියා ගිය සඟවා එවූ රකවල්වන තැනක් පැවී එවු වරද නැති෴ මොහු ගත්හයි පැවිජ්ජන්කෙරෙ සැක කෙරෙ නම් සැක කටයුතුතැනෙකැ පී කැප අයපවතක් හිමිකෙනෙක්නට දෙමි යී ගෙනැ තබත් වරද නැති෴

දුබැසිවිනිස යට මුසවාසිඛපදයෙහි කී විනිසසේ දන්නෙ.

෴ පකිණ්ණකවිනිස නිමි ෴

---

ඇදුරුවත්තෙරුන් නිසා වසන සිල් කැමැති පැවිජ්ජා රුසිම්මෙ නැඟී හුණුදිය සිත්දිය දියැ යුත්තෙ෴ තුන්දවසක් හුණුදිය හෝ සිත්දිය හෝ වළඳත් නම් වැළැඳුදීය මෙ පියැවින් දියැයුත්තෙ෴ දෙක වළඳත් පියැවින් දෙක මෙ දියැ යුත්තෙ෴ මහත් කුඩා මැදිම්[5] දැහිටි එළවා තබා තුන්දවසක් දැහිටි මෙ පියැවින් තබන්නෙ෴ අතියම කොට වළඳත් නම් ලද දැහිටක් තබන්නෙ෴ හිඳුනා අසුන් පතවා දැහිටු කා නැඟිසඳ දැහිටිකොස් පියා හුන්හසුන් නඟාතබා දැහිටිකැතැන හමඳනෙ෴ ඔවුන්[6] එළැබෙන සුළුදියටනුමහදියටනුගෙ ද එයට යන මගුදු හමඳනෙ෴ ඔවුන්[6] ලක්නාගෙය හමඳනසඳ සතරතාන් සම කොට බිත සිවු නො නඟා බිත් පිසැ සතුන් නොමියනසේ මකුළුසටු හැරැ හමදනෙ෴ මකුණන් හැරැ ධූලි ගසාපියා හැඳපුටුආදී දන්නෙ[7]෴ ධූලි ගසනසඳ යටසුළඟැ බික්සඟුන්කෙරෙනුදු දියට පැතට දුරු කොට ගසාපියන්නෙ෴ ගෙහෙ පිරිසේ හමඳනෙ෴ කෙලමලා දෙවැ එළැවියැ යුත්තෙ෴ පියැවින් හිඳිනාඅසුන් පැනැවියැ

---

1 එක්වැ. 2 බලනසඳ 3 [illegible]සැ පැවැතිතම්; 4 නොසැවුම.
5 මැදි. 6 එවුන්. 7 දක්නෙ.

යුත්තෙ෴සිවුරු හඳනාසඳ හඳනාසිවුර දී පලමුහන්සිවුර ගෙන පටි දී පුන පොරෝනාසිවුර දියැ යුත්තෙ෴ඔවුන් නැහැවිසඳ[1] නහනපිළිවෙළහැම එළවා නහනා[2] කඩ දී හන්පෙරෙවිසිවුර නොතෙලෙසෙනසේ තබා වෙරළ පිටැ අත් ගසා නහාවා[3] වෙරදිය පිසැපියා හඳනාසිවුරු දී ඉක්බිති පටි දී පොරෝනාසිවුරු දියැ යුත්තෙ෴ඔවුන් බණනසඳ අතරතුරැ නො බණතෙ෴ඔවුන්ගෙ සිවුරු ගෙත්තම් කරන්නා ධෝනා රඳන්නම් කරන්නා ලතුපිස ආදි කටයුත්තෙ෴මෙ හැම තමා නොකටහෙත් අනුන්ලවා කරවන්නට තැත් කටයුත්තෙ෴ඇදුරුවත්තෙරුන් නොරුස් වන්නාහට[4] පාසිවුරුආදි එක්තරා පිරිකරක් නො දෙන්නෙ෴ඔවුන්ගෙ පිරිකර තමා නො ගන්නෙ෴ඔව්නට එක්තරාමෙහෙ යක් නො කරන්නෙ෴ඔවුන් ලවා තමහට මෙහෙ නො කරන් නෙ෴ගමුදු බිහිගමුදු[5] ආදි යාටි වුව ඇවිසැ යන්නෙ෴තමා හිසැ කෙස්බහනා නිය හරනා සිවුරුධෝනාආදි කිස ඇවිසැ කටයුත්තෙ෴ඔව්නට උපන් කුකුස් දිට්ඨආදී හරනා හරවන් නට උත්සා එවූ කටයුත්තෙ෴ඔවුන් ගිලන් වුව බෙහෙදුද කරන්නෙ෴මෙ කී වත් අනාදරියෙන් කළ දුකුළා වෙ෴

ආගන්තුකයා උවසරසිමින් බැහැරැ සිටැ පයැ වහන් හැරැ සත්[6] පහ කොට ඇත හිසින් සිවුරු හැරැ අරමට වැද්දෑ යුත්තෙ෴පැන්කෙමැ පැන්පොකුණැ පා නො දෙවැ පා දෙවියැයුතුතැනැ ධෝනේ෴තැනැ වූවත් පාධෝනට එළවූ පැනින් එවූ තමා අළ පැනින් එවූ පාදෙවුත් වරද නැති෴තමා නොදන්නා අමුතුතැ නට ගියැ සුළුදියටනු මහදියටනු පියැවිගෙයදු පැන් පරිභොග කරන සෙසු වළඳ කරන කෙමාදීන් පිළිවිස්සැ යුත්තෙ෴තැනැ වැන්දුයුතු මහල්ලන් වැදැ ලක්නාතැන් පිළිවිස්සැ යුත්තෙ෴

ගම්පැවිජ්ජා හැඳ පුටු පිරිකරදු පාන්බඳුන් හා ආදිපිරිකරදු සඟවනු සඟවවනු කොට නොහොත් සඟවනුආදි වතාවත් නෙප කරව යි මොනවට පිළිපයන්නෙ෴

තැනවූ පැවිජ්ජන්විසින් ආගන්තුකමහල්ලන් අතින් පා සිවුරු ගෙනැ හිඳිනාකසුන් පනවා පාධෝනා වඳනා[7] සෙනසුන් පනවන කතිකාවත් කියන සුළුදියටනු පියැවිගෙහෙදු පැන්පො කුණු නහනපොකුණුදු ආදි [කියන] හැමවත් කටැයුත්තෙ෴

සෙනසුන්වත් ඇදුරුවත් කිසෙයින් දන්නෙ෴

පිළිගහනවිනිස පැවැරි සිඛයෙහිදු දනනපොණසිඛයෙහිදු කිසෙයින් දන්නෙ෴පාසිවුරු ඉටන් විකපුන් විනිස සිවුරු සිඛ යෙහි කිසෙයින් දන්නේ෴

---

1 නැහිසිවිසඳ 2 හඳනා. 3 නහා, නගා. 4 නොරුස්සන්නාහට·
5 'බික්ඛිගමුදු' යි පොත්හි පැතේ. "ගාමංවා බහිසිමංවා" යි සිකබා පදවලඤ්ජනයෙහි පාඨයි. 6 සැත්. 7 වලඳනා,

ඇවැත් දෙසනසඳ පැවිජ්ජෙනකුන් කරා එළැඹැ සිවුරු
සකසා හැඳැ පෙරුවැ ඔවුන් වැලනැ හිඳ දෙහොත් මුඳුනේ තබා
අවන් ලහුකාපත්ති කියා: 'මෙ ඇවැත් මුල් කොට මා දූනැ නො
දූනැ අවන් ලහුක විසභාග ඇවැත් තුඹකෙරෙ දෙසමි'යි අරෙ
ජා—"අහං භන්තෙ සම්බහුලා නානාවත්ථුකා"—යනාදිවිසින් සිඛ
වළඳ කීසෙයින් දෙසන්නෙ[1]෴සඟ වුව—"අහං ආවුසො"—යි—
කියන්නෙ෴කරුණු ඇත සකසා හඳනා පොරෝනා නො කො
විතුදු සිටයි දූ දෙහොත් මුඳුනේ නො කොවිතුදු දෙසත් වදී෴

---

"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො අධිඨාමි"—යනාදී
තැනැ තවපොහො තවපවුරුණු දතයුතු෴හෙ කෙසෙනි යත්:—
සයික්සී පණ්ණරසී සමඟපොහො යන තුන්පොහෝ යි෴කර
වනවිසින් සඟපොහොයැ ගණපොහොයැ පුඟුල්පොහොයැ
යන තුන්පොහෝ යි෴කටයුතුආකාරවිසින් සුත්තුදෙදස—පිරි
සුදු—ඉටන්පොහොයැ යන තුන්පොහෝ යි෴මෙහි සමඟපො
හෝ නම් සියලුසඟහු පොහෝබිඳැ[2] සමඟවූදවස් කටයුතු පො
හෝ යි෴මෙහි එක්හිඳු දෙදෙනාදු සිඛවළඳ කීසෙයින් පොහො
කරන්නෙ෴මොවිනට ඤත්ති නැති෴තුන්දෙනා පොහොකර
නා තැනැ—"සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණ
රසො යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරි
සුද්ධිං උපොසථං කරෙය්‍යාම"—යන මෙ ඤත්ති෴සෙස්ස සිඛ
වළඳැ කීසෙයින් දන්නෙ෴ඤත්ති දෙවන සතරවන කැමැ—
"එසා ඤත්ති" යි ඤත්ති පිහිටිවනු ලැබෙ෴සෙසුතැනැ—
"කරෙය්‍යාම"—"කරෙය්‍යාම"—යන ආදීම ඤත්ති෴ හැම ඤත්ති
මෙ ලකුණෙන් දන්නෙ෴ඉටන් පොහො පණ්ණරසීපොහෝ
වුව—"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො"—යන්නෙ෴සයික්සී
වුව—"අජ්ජ මෙ උපොසථො චාතුද්දසී"—යන්නෙ෴සඟපො
හොය මහල්ලෙන් උසුරුවනසඳ පතුරු යි වුව-සුණාතු මෙ ආවුසො
සංඝො අජ්ජුපොසථො පණ්ණරසො"—යනාදිවිසින් උසුරුවන්
නෙ෴සගුන් උසුරුවනසඳ—"සුණාතු මෙ භන්තෙ සංඝො"—
යනාදිවිසින් මහණමැයේ ආසෙයින් පණ්ණරසී වුව—'පණ්ණ
රසො'—යි—සයික්සී වුව—'චාතුද්දසො'—යි—උසුරුවන්නෙ෴

මෙහි;—පූකිස,— පූකරණ[3] නම්:-සැඳැපිරිසුදු, යුකිම්, මහණ
ගණන්, මහගම්පැවිජ්ජන්ගෙ ඔවා යන මෙ පස පූකිසයි෴මෙහි
සැඳපිරිසුදු නම් පොහෝ කරන්තව සඟහු මුළු වූ සිමැ අත්පස්ව
නො ආ කෙනකුන් කෙරෙන් සිඛවළඳැ කීසෙයින් සැඳැ පිරිසුදු
දුන්නා ඇරැ පොහො කටයුත්තෙ෴දෙදෙනා තුන්දෙනා

1 දන්නෙ. 2 බිඳු. 3 පූකරණ.

පොහො කරනසඳ පිරිසුදු ගෙනැ නො ඉඳැයුත්තෙ෴සුතිම්
නම්: පොහොකරන වසන් හිමන් ගිමැ ද සිව්යාසිදු ගියාසිදු
කියා පොහො කටයුත්තෙ෴මහණගණන් නම්: මෙතෙක්දෙන
මො මෙහි මුළු වුම්හ යි කීම්—ඉටන්පොහොයැ මම හුදකලෙම්
යන්නෙ෴මහගම්පැවිජ්ජන්ගෙ ඔවා නම්: මාගම්පැවිජ්ජෝ
පොහොදවස් දුටු පැවිජිකෙනකුන් "දහපා මාගම්සඟවූ පාවදී
ඔවා ලැබීමක් අයජ්ජි අයජිත්"—මෙසෙයින් කියනලද හස්ත
බාල ගිලන් හම් තබා සෙස්සන් නො පිළිගනා දුකුළා වෙ෴
පිළිගෙනැ පොහොඅග්හි[1] කියා ඔවා දෙන කෙනකුන්ඇත
'අල්ලේ අසො ඔවා දෙන පැවිජ්ජන කරහ එළැබෙවැ'යන්නෙ—
නැත"නො පමා වැ"යි යන්නෙ෴මෙසේ නො කියන් දුකුළා වෙ෴
පොහොයට මුළුවූවන්විසින් මාගම්පැවිජ්ජන්කෙරෙ ඔවාහසුන්
අළ කෙනකුන්විසින් ඇරෙජුවමැ නැවැයි පුළුවුස්නෙ෴හුදකලා
වුව 'මාගම්පැවිජ්ජන්ගෙ ඔවා අළුවහු නැතැ'යි ඉටන්නෙ෴

පොහොකරනතැන් හැම[දු]මැ රැවුව වැටුප් පහන් ලීමැ
දිය පරහා තිබීමැ හසුන් පැනැවීමැ යන මෙ සතර පූකරණ[2] නම්.

෴නවපොහොවිනිස නිමි෴

නවපවුරුණු නම්;—සඟික්සීපවුරුණැ, පනරසීපවුරුණැ[3]
සමහපවුරුණැ, තෙවාචිකපවුරණැ, වෙවාචිකපවුරුණැ, එකවාචි
කපවුරුණැ, සහපවුරුණැ, ගණපවුරුණැ, පුහුල්පවුරණැ යන
මෙ නව පවුරුණු෴මෙහි සමගපවුරුණු නම් සියලුසඟහු මහ
පවුරුණු බිඳැ හිල්මසමැදිපොහො එන අතුරේ සමඟවූ දවස්
නො පෝ වුව—'සුණාතු මෙ භනෙත සංඝො අජ්ජ පවාරණො
සාමග්ගි'—කියා පවරන පවුරුණු යි෴තෙවාචිකපවුරුණෙහි
පවරන දවස් අනතරායක් නැත—'සුණාතු මෙ භනෙත සංඝො
අජ්ජ පවාරණා පණ්ණරසී යදි සංඝස්ස පත්තකල්ලං සංඝො
තෙවාචිකං පවාරෙය්‍ය' යි සැතති පිහිටුවා පවරන්නෙ෴
වෙවාචිකපවුරුණෙහි—'වෙවාචිකං පවාරෙය්‍ය' යි සැතති පිහි
ටුවා පවරන්නෙ෴එකවාචිකපවුරුණෙහි පවරණදවස් ඉතාමඳ
වුව—'එකවාචිකං පවාරෙය්‍ය' යි සැතති පිහිටුවා පවරන්
නෙ෴මෙහි—එකවාචික නම්—'සංඝං ආවුසො පවාරෙමි දිඨෙන
වා සුතෙනව වා'—යනාදිවිසින් එක්යලක් කියා පවරන්නෙ෴
වෙවාචිකයෙහි දෙවරක් කියා පවරන්නෙ෴තෙවාචිකයෙහි
මුල්සිඛයෙහි සිඛවලඳැ කිසෙයින් තුන්යලක් කියා පවරන්නෙ෴
පස්දෙනා එවු අසිරුපස්දෙනා එවූ කරන පවුරුණු සහපවුරුණු
නම්෴දෙදෙනා තුන්දෙනා සතරදෙනා කරන පවුරුණු ගණ
පවුරුණු නම්෴එක්කෙනකුන් පවරන පවුරුණු පුහුල්පවු
රුණු නම්.

෴නවපවුරුණුවිනිස නිමි෴

1 පොහොඅක්හි. 2 පූකරණී. 3 පන්නරසීපවුරුණු.

වසාවසනවිධි යට කී සවන විනිසයෙහි කීසෙයින් දන්නේ෴

මෙ සිඛවළඳැ කී සිඛයෙහි සචිත්තක—අචිත්තකවිනිස මෙ කියනසෙයින් දතයුතු:—සත්ථගමවෙසෙසැ-සුරුතුසගමවෙසෙස-අචිත්තක සි෴සෙසුසගමවෙසෙසුදු හැමපරිජ්දු සචිත්තක සි෴ තුදුස්නිසග්ගෙහි දෑලොස්වන අසිදුනාසිඛය හා—තුදුස්වන පරිත්තසිඛය හා—මෙ දෙසිඛය සචිත්තක සි෴සෙසු දෙලොස් නිසැගි අචිත්තක සි෴එක්සාලිස්පචිත්තෙහි සතරවන පදසො ධම්සිඛයැ-එකොළොස්වන සෙනසුන් සිඛයැ-පසළොස්වන සිවූරුගෙත්නම් කරනසිඛයැ—සොළොස්වන පැවිජ්සිඛයැ—අට ළොස්වන විකල්බොජුන්සිඛයැ—එකුන්විසිවන සන්නිධිසිඛයැ—විසිවන පිණ්ඩිබොජුන්සිඛයැ—එක්විසිවන දන්තපොණසිඛයැ—දෙවිසිවන තිථියනට තමා අතින් දෙන සිඛයැ—සූවිසිවන සුරාපානසිඛයැ—අටවිසිවන ගිනි තප්නා සිඛයැ—එක්තිස්වන නප්බිඳුසිඛයැ—එක්සාලිස්වන විකාල්ගම්වදනාසිඛයැ යන මෙ සත ළොස්සිඛය අචිත්තක සි෴සෙසු සූවිසිපචිති සචිත්තක සි෴ පකිණ්ණකයෙහි බික්සඟුන් අවක්සා මැරූ මස් කී සිඛ නබා සෙසු හැම මස්සිඛ දූ—දෙපැවිදිකෙනකුන් එක්හැඳැ හෝනා සිඛදූ—දෙදෙනා එකක් අතුරුවා හෝනා සිඛදූ—දෙදෙනා එකක් පෙරවැ හෝනා සිඛදූ—දෙදෙනා එක්බජනෙහි බුදුනා සිඛදූ—නැටුම්ආදී බලනු සිඛදූ—කුඩවරපවුරෙන් බැහැර දිය ටනුආදී පියන සිඛදූ—ගොයම්ආදිතන්හි දියටනුආදී පියන සිඛදූ—දික්කෙස් අධරන සිඛදූ—කැසැ හඬුපියෙසැ ලොම් හරන සිඛදූ—තිය මට කරන කරවන සිඛදූ—පිරියම් කළ බිමැ නෙත් පසින් වහන්ඇතිපසින් ඇක්මෙන සිඛදූ—සඟසතු හැඳ පුටු සිරිරින් පහරන සිඛදූ—පිරියම් කළ සඟසතුබිත පහරන සිඛදූ—කහබහන් නො බැඳැ ගම්වදනා සිඛදූ—ඉටන් පොහොනා පා අතින් ගෙනැ දෙරකවුළු වරන පියාළන සිඛදූ යන මෙනෙක් සිඛ අචිත්තක සි෴සෙසු හැම සිඛ සචිත්තක සි෴

සිඛපද දත නොදත විකුම් දත විකුම් සිඛ වුව සචිත්තක ඇවැත් අවදි—නොදත නො අවදි෴

සිඛපද දත නොදත විකුම් දත නොදත විකුම් සිඛ වුව අචිත්තකඇවැත් අවදි෴

මෙසෙයින් සචිත්තකඅචිත්තකඇවැත් ඇවද්මෙහි ලකුණු දතයුතු෴

අටුවාපාළිදෙස් බලා සැබෙවින් මුල්සිඛවළඳ හා සිඛවළඳ විනිස හා මාවිසින් කරනලද්දෙසි෴ලිඛිතදෙසෙක් ඇත එ පියාලාහෙළා වරදු නො කියා අටුවාපාළිදෙස් බලා විනයධරයන් ගා සසැඳැගතයුතු෴

෴සිඛවළඳවිනිස නිමි෴

# ග්‍රන්ථිපද විවරණය.

## සි ඛ ව ළ ඳ.

### පළමුවැනිපිට.

1 **රුවන්තිසා,** (බුඞ ධර්ම සංඝ සඞ්ඛ්‍යාත) රත්නත්‍රය; **කාවිසි මුනු තුන්දෙරින්,** කායවචී මනස් (ශරීරය, වචනය, සිත) යන ත්‍රිවිධද්වාරයෙන්. 2 **උපසදුව,** උපසම්පන්නිය, උපසම්පදාව. **පමන්,** පළමුකොට, උපසම්පන්නමණ්ඩලයෙහි පටන්කොට: 3 **සරිත් වරිත් සිඛ,** චාරිත්‍ර වාරිත්‍ර ශික්ෂාපද. "මෙහි චාරිත්‍ර ශික්ෂාපද නම් මෙසේකළමැනැවැයි පැනවූ ශික්ෂාපදය. වාරිත්‍ර ශික්ෂාපද නම් මෙසේ නොකළමැනැවැයි පැනවූ ශික්ෂාපදයි" **සැඛෙවින්,** සංක්ෂෙපයෙන්. 4 **මඟතියායෙහි,** (වර්චස්මාර්ගය, ප්‍රශ්‍රවමාර්ගය මුඛය යන) මාර්ගත්‍රයෙහි. **සෙවිසැවිසිතින්,** සෙවනයකරනු කැමැතිසිතින්. 5 **මෙමෙහෙයුව,** "(තිලබිජු මාත්‍රයකුදු) ප්‍රවේශ කළ." **මෙවුන්දම් පරිජි,** මෛථුනධර්මපාරාජිකා. 7 **පල්පොහොනා,** පාදයක් අගනා, රත්රන් පස්මඳටෙක් වටිනා. **වතක්,** වස්තුවක්. 8 **අසිනාදන්,** අදින්නාදාන, නුදුන්දෙයක් සොරසිතින් ගැන්ම. 9 **පවා,** පවන්. **දිවිගැළවුව,** ජීවිතය චුතකළහොත්, මැරුවහොත්. 10 **මිනිස්විකා,** මනුෂ්‍යවිග්‍රහ, මනුෂ්‍ය ශරීරය (හෙවත් ජීවිතය) පිළිබඳ. **උතුරුමිනිස්දම්,** උත්තරි මනුෂ්‍යධර්මය- "මෙහි උතුරුමිනිස්දම්නම් ප්‍රථම ධ්‍යානාදියයි." 12 **ඉඳුරණ,** සෘජුව. **ඉඳුරණකිව,** "යම්කිසි භික්ෂුවක් තොප වෙහෙර වෙසෙද්ද හෙතෙම ප්‍රථම ධ්‍යානාදි ලාභීය රහත යනාදි ව්‍යාජ කථා රහිතකොට "මම ප්‍රථම ධ්‍යානලාභීමි විතීය ධ්‍යානලාභීමි" යනාදින් ඉඳුරණ කිවහොත්." 15 **සුකුරු,** ශුක්‍ර, **මිදියැවිසිතින්,** මොචනයකරනු කැමැතිසිතින්. **අඳ ඇති බැහැරි වත්හි,** "අධ්‍යාත්මික බාහිර වස්තුයෙහි. මෙහි අධ්‍යාත්මිකවස්තුනම් තමා අත් කළවේ ආදියයි. බාහ්‍යවස්තුනම් තමා සිරුරු අවයවින් පිටත් උපාදින්නකරූපවූ දිවිඇතිවස්තුව හෝ ඇඳපත් කෙසි සිදුරු ඇ දිවිනැති වස්තුයි. 16 **හඳුන්,** (පුරුෂ) නිමිත්ත. **ඝටා,** ඝර්ෂණයකොට, ගෑ. **සඟවෙසෙස්,** සංඝාදිසෙස (ආපත්ති).

17 **සුක් විසැටි**, සුක්ක විසට්ඨි, ශුක්‍රම්දීම පිළිබඳ. 18 **කාසංගරයෙන්**, කායසංසග්ගරාගයෙන්, "කයින් කාහි පහරනාකැමැති රාගසිතින්." මාගම, සත්‍රියක්. සඬ්, සංඝ, හැඟීම. 19 **සමරූවන්වනසිතින්**, "වෛරපහස්විදුනා කැමැති සිතින්." **කයින්** කායි, ශරීරයෙන් ශරීරයෙහි. **තුළුල් තෙපුල්**, දුට්ඨුල්ලවාචා, අසභ්‍ය වචන. **කියැවිරායෙන්**, කියනු කැමැති රාගසිතින්. 22 වසමඟ, වච්ස්මාර්ගය. **පසමග**, ප්‍රස්‍රාවමාර්ගය. 24 **දුබුල්වසු**, දුට්ඨුල්ලවාචා, අසභ්‍ය වචන. 25 **මෙවුන්රාගයෙන්**, මෛථුන රාගයෙන්. 28 **අනනකාම පාරිචරියා**, තමහට මෛථුන ධර්මසෙවනයෙන් මෙහෙකිරීම.

2

1 **එවු**, හෝ. **පිරිමිනියක්හු**, පුරුෂයකු. **කෙලෙස් පිළිබද් කොටින්**, කෙලශ ප්‍රතිබද්ධකොට, රාගසන්නිශ්‍රිතකොට. 2 **ඇරෙජ**, ආරෙචනයකොට, සැලකොට, දන්වා. 3 **පුන**, නැවත, 3 **සසුරූනු**, සංචරිත, පතිවුඩ ගෙනයාම් පිළිබද. 6 **ගැළවිසපි සිත්ඇතියාවූ**, පහතරනු කැමැති සිත්ඇතිව. **වැළැනූ**, සමීපයෙහි, "දෙළොස්රියතින් ඇතුළත." 7 **සොයා**, චොදනය කොට. 8 **අමුල්**, අමූලක, (දැකුම්, ඇසුම්, සැකකිරීම් යන)මුල් හෙවත් කරුණු නැති. 10 **ලෙස්**, ලෙශය, ආකාරය. 11 **ගෙනැ** ග්‍රහණයකොට, තගා. 12 **අඤ්ඤභාගි**, ඡකලකාදි අන්‍ය කොඨාසයක්ඇති. 14 **නොඉටා**, අධිෂ්ඨාන නොකොට. **නොවිකපා**, විකල්පනය නොකොට. **අසල් සිවුරූ**, අකාල චීවර-"මෙහි අකාල චීවරනම් කෙළින් (කඨින) අතුළ වෙහෙර පස්මස්විනා අවශිෂ්ට සත්මසෙක, නො අතුළ වෙහෙර මසක් විනා අවශිෂ්ට එකොළොස්මස යන මේ නොකල්හි ලද සිවුරුයි." **ඉකුම්වා නම්**, අතික්‍රමණය කෙළේනම්, පසුකෙළේනම්. 15 **නිසැගිවෙ**, නිස්සග්ගියවේ. 16 **මහණසම්මුති**, (අධිසිත චීවරයකින් වෙන්ව විසීමගැන) සංඝයාගේ සම්මුතිය (අවසරය.) 17 **විගෝවූ**, වියොගව, වෙන්ව. **එක්අරුණකුදු**, එක අලුයමක්වත්. 19 **මාගම් පැවිජ්ජ**, භික්ෂුනියක්. **පොරණ සිවුරූ**, 'අධමානනයෙන් එක්ද වසකුදු වැළඳගත් පුරාණනම් සිවුරු." **දෙවා**, ධොවනය කරවා, සෝදවා. **රජන්කරවා**, රජනයකරවා, පඬුපොවා. **කොළවා**, ආකොටනයකරවා, (ගලක හෝ පුවරුවක ගසා) අපුල්වා. 23 **නොපැවැරූ**, අප්පවාරිතවූ. **විනවා**, විඥාපනයකරවා, හඟවා. 25 **පිළිබෙව්කොට**, ප්‍රතික්ෂෙපකොට. 27 **වැවහරකරන්**, ව්‍යවහාර කළහොත්, නඩුදෙනුකළහොත්. 28 **පස්සභබැඳියන්**,

**පව සහධාම්මිකයන්**—භික්ඛු, භික්ඛුනී, සික්ඛමානා, සාමණේර, සාමණේරී යන පස්දෙනයි. 29 **බැව්හරකරත්**, ගනුදෙනු කළහොත්, 30 **පමණින්යුක්**, ප්‍රමාණයෙන් යුක්තවූ. **පා**, පාත්‍රය.

3

1 **උතුපස්බාත්**, උභතපච්චත්ථන, පසහට අඩුවූ බැදුම් (හෙවත් පිළියම්) ඇති 5 **නොවිසිසමනාවූ**, සමා නැතිවූ හෙවත් කිපී. මෙය "නොඉවසියමනාවූ" යන්නෙන් සැදුණු ශබ්දයක්මෙන් හැඟේ, විමසියයුතුයි. **සකාසසඤ්ඤයෙන්**, තමාගේය යන සිතින්. 6 **අසිඳු**, අච්ඡින්දනයකොට, පැහැරගෙන. 7 **හූ**, සූත්‍ර, නූල්. 8 **විකපුන්පොහොනාසිවුරක්**, විකල්පනයට යොග්‍යවූ චීවරයක්—"අධමාන්තයෙන් වඩුරියන් දිග හා වඩුරියන් පුළුල ඇති කඩෙකි" 9 **පෙහෙරක්හු**, පෙශකාරයකු, රෙදිවියන්නකු. 10 **පිරිණැමුණු**, පරිණාමිතවූ. 13 **වසැකිකමැතිවූ**, වචාකරනු කැමැතිව, "නැත්තක් ඇතිකොට කියනු කැමැතිව." **මුසවා**, මෘෂාවාද, බොරු. **මෙරමා**, අන්‍යයක්හු, 14 **හවානම්**, ජාත්‍යාදීන් ගවා බණිනම්. 15 **පිසුනු**, පෛශුන්‍ය, කේලාම්. 16 **අනුළපසපනක්හට**, උපසම්පන්න නොවූවක්හට. **පදසොධම් කියානම්**, "පාළිධර්මය එක්ව කියානම්," 20 **විඤ්ඤූවක්හු**, දැනමිති පුරුෂයකු, "සභ්‍යාසභ්‍ය තෙපුල්දන්නා පුරුෂයක්හු." **සපෙදෙන්**, ෂට්පදයෙන්, පදසයකින්. 22 **තුළුල් ඇවැතක්**, දුට්ඨුල්ලාපත්තියක්, සංඝාදිසෙසාපත්තියක්. 25 **කළකිරුවානම්**, සිදුම් බිදුම් කෙරේනම්. 26 **අබවසැ**, අබ්භවකාශයෙහි. 27 **සගවනු ආදී**, සුරක්ෂිත කිරීම් ආදිය.

4

1 **පැවැරිවූ**, කතපවාරිතවූ—තල ප්‍රතිකෙෂප ඇතිව. **අසිරික්නුවූ**, අතිකතුවූ. **පරගලාකෙරේනම්**, ගිලීනම්—වළඳනම් 2 **සමනරිසින්**, චොදනාකරනු කැමැත්තෙන් 5 **සපාඩිබිබොජුන්**, පිළිගෙන රැයක් ඉකුත්වූ භොජන. 6 **විනවා**, විඥපනයකොට, ඉල්වා. 10 **නොරඹුරෙහි**, අප්‍රකාශනන්හි, රහස් තැන්හි. 13 **ගිරිතිකවානම්**, කිතිකවානම්. 15 **අනදුරු**, (දෙවදෑරුම්) අනාදරිය. 16 **බවානම්**, බියගන්වානම්. 21 **පැවිකරනු**, සැඟවීම. 23 **පිළිසොසනරිසින්**, සඟවනු කැමැත්තෙන්, 25 **සසදැ**, සංසන්දනයකොටගෙන, එක්ව කතාකරගෙන. **ගම් අතුරකට**, ගාමාන්තරයකට, අනික් ගමකට. 26 **දූහැවූ**, කිපී. **අත්හැත්කියපානම්**, "ගසන ආකාර දක්වා අතහෙ1 දබු ආදිය

උඩට නගානම්.” 30 **කුකුස් උපසානම්,** “(තෙපි උනුවිස්සෙහි උපසම්පදා ලදගයි සිතම් යනාදීන්) සැක උපදවානම්.” 32 **අබිසෙස,** සමීපයෙහි, “බණනබස ඇසෙන තෙන.”

5

3 **ඵබඳුකරුණක් නැතියාවූ,** “නොපිළිවිස ගම් වැදීමට නිසි වෘෂ්ටිආදි අනතුරය) කාරණයක් නැතිව.” 4 **නොඇවිසූ,** නොපිළිවිස. 6 **ඉසුරුපමුණුවා,** “මෙමට මාමුත් කවුරුදැයි තමාම ප්‍රධානකොට නොහොත් තමාම හිමිකොට.” **ගුරුබඩ,** ගරුභාණ්ඩ—59 වෙනි පිට බලනු. **ජුලැසි,** ජුල්ලවච්ගාපතති. 9 **කුස,** “කුසතණ හෝ කුසතණවැනි සෙසු තණ ගොතාකළ ..වුරුද.” **වැහැරි,** වල්කල හෙවත් රුක්සිවියෙන්කළ සිවුරුද. **පුවරුපෙළඳු,** “දඹු තුළල්කොට සැස තුන්කොන්කොට හෝ සතරකොන්කොට හෝ කපාගෙන විද හෝ ගොතා හෝ කළ සිවුරුද.” **කෙස්වල්මුවා පලසුදු,** කෙශමය වාලහිමය කම්බල,—මෙහි කෙශමය පලස්නම් ඉසකෙසින් කළ පලසි, වාලහිමය පලස්නම් අශ්ව වාලධියෙන් කළ පලසි.” 10 **මහමුහුණු පිඤාඳු,** බකමූහුණන්ගේ පක්ෂ පත්‍රයෙන් (කළසිවුරු). **තිරළදු,** තිර්‍ය්‍යකයන්ගේ ලබධිය. 12 **සැත්කම්වත්කම්,** ශස්ත්‍රකර්මවස්තිකර්—සැත්කම්නම් වර්ච්ස්මාර්ගයෙහි සිසාරා දෑඟුලක් තැන සැත්කටු ආදියෙන් කැපීමය, වත්කම්නම්, වර්ච්ස්මාර්ග ප්‍රස්‍රාව මාර්ගයෙහි තෙල් විදුනාදි කැරවීම්. 15 **කේල්වාපිළි,** “දික් කෙහෙල් වැහිරෙන් කළ පිළිද.” **නියඳින්කළ කැතිරි කඩුදු,** “නියඳ කළා වලුහුකොට එයින් බුමුතුරුණුමෙන් පලල්කොට කළ කඩද.” 16 **සබනීල,** “හැමතැනම දිය මෙරලිය මලක්මෙන් සතව නිල්වූ පිළිද.” **පීත,** “හැම තැනම කිණිහිරිමලක්මෙන් සතව රන්වන්වූ පිළිද.” **ලොහිත,** “හැමතැනම බදුවද මලක්මෙන් සතව රත්වූ පිළිද.” **ඔදත,** සුදු. **මඤ්ජෙට්ඨ,** මඳවිය පැහැ ඇති. 18 **තරජ්,** තරච්ඡ, කරබානාවලස්. **වග,** ව්‍යාඝ්‍ර. **දික්ඳු,** දීපීජති, සැපී. 19 **අවක්සා,** උදෙසා. 20 **නුපුළුවුන්,** නොවිචාරනලද. 21 **සුළුදියවටන් ගිදු,** “මූත්‍රකෘත්‍යය සපයන ගෙහිදු” **පියෙවිගෙහිදු,** “මුවාපස් ගෙහිද.” **උකැයිගනාසැහැරු,** නොකැස. 25 **වස්පවත්වමින්,** මලපහකෙරෙමින්. 27 **පුජ්වල,** වැසිකිළිවළෙහි, “මූවාපස්වළ.” **පුසන්,** “මලපිසන දඹු.” **කොරොස්,** තොරසැබි, මටතොවූ. 29 **වස් දෙණියෙහි,** ප්‍රස්‍රාව දෙණියෙහි හෙවත් මූත්‍රකෘත්‍යය සපයන පිණිස ශෛලමය හෝ ඉෂ්ටිමයකොට කරනලද ස්ථානයෙහි

## 6

1 **ලාහෙලාලැ**, සුහුව, ඉක්මන්ව. 2 **හඬවා**, ශබ්ද පවත්වා. **දිසකිස**, ජලකෘත්‍යය. 3 **පාමොක්උසුරුවානම්**, ප්‍රාතිමෝක්‍ෂය දෙසානම්. 4 **විසදුන්කෙරේනම්**, විසර්ජනයකෙරේනම්, **විස**දුනම්. 6 **වඩීනම්**, විවෘතකෙරේනම්, හරිනම්. **පියාලානම්**, වසානම්. 7 **ළිඟිණිවැ**, නගනාව. 9 **පිරිසම්**, (ඇඟඉලීම් ආදී) පරිකම්. 11 **කොඩවර**, කුඩාපවුරෙහි, භිත්තියෙහි. 12 **පුවරුයෙහි**, ඵලකයෙහි, පෝරුවෙහි. "පොහොරුවක්මෙන් දූවයක් සැස සුනු පුරා එහිපිට ගහා තහනුසඳහා ද්‍ර පෝරුආකාරයෙන් හිරිසිඳ තහනතොට හිඳුවන පොහොරුවයි"–(කුදුසිඛසන්න). මේ පෝරුව අඬානඵලකනම්. 13 **දඬුපෙණිනුදු**, "අතුල්සැටියේ තළ" දණ්ඩෙන්. **කුරුඳුවැළිනුදු**, කුරුවිඳක සුනුයෙන්ද,—කුරුඳු ගල් සුනු ලාකඩ හා මිශ්‍රකොට කරනලද "ගුලිකකලාපය" කුරුඳුවැලනම්. **අනන්මන**, ඔවුනොවුන්ගේ. 17 **බික්දෙන්නිය**, භික්‍ෂුව දෙන සත්‍රියගේ. 18 **උජ්ඣානසැඳැ**, "කිපි සිත්." 19 **සතජ්නා**, වලඳන. 22 **උක්ඛිත්තකයා**, "උක්ඛෙපනීය කම්මලද්දහු." **නානාසංවාසකයා**, ලබ්ධිනානාසංවාසකයා. 23 **පඬු**, පණ්ඩකයා. **ගරුකණ්ඩකයා**, ගරුකාපන්නයා—"පරිවාසනුරකාදී විසින් සඟවෙසෙසට පිළියම් කෙරෙමින් සිටියේ ගරුකණ්නම්." 26 **අසමානාසනිකයා**, සමානාසනික නොවන්නාහු—"මෙහි සමානාසනිකනම් තමා හා සමවස් ඇත්තෝය, එක්වසකට බාල වැඩිමාලු තැනැත්තෝය. තමාට දෙවසකට බාල මහලු තැනැත්තෝය. මෙකීවවුන් කෙරෙන් පිටත් සෙස්සෝ අසමානාසනිකයෝත්." **නොදික්අස්නෙහිදු**, "අධමානනයෙන් තුන්දෙනකු පලක්බැඳ නොහින්දහැකි ආසනයෙහිද." 28 **මල්පක්ආදී**, පුෂ්පඵලාදිය. **සඟන්නාසඳහා**, "සිත්ගන්නාසඳහා," සංග්‍රහපිණිස. 30 **වැරූ**, වර්ජිතකලාවූ. 31 **සාපත්තිකව**, "අවත් ඇවැත් ඇතිව හෙවත් අවත් ඇවැත් නොදෙසා."

## 7

1 **දෙරමවු**, දොරහා දොර අගුල් හෙළන පාසකය. **පිරිවැමෙන**, "පියාලිය වරාලිය හැකිසේ පවත්නා." 2 **නොපිළිපෙයා**, "(ගෙය බලම යනාදී වචනයෙන්) ප්‍රතිපාදනය නොකොට හෙවත් පාවානොදී." **ආභොගනොකොට**, "(විශ්වාසපුරුෂයකු තකා 'මෙතෙම ගෙය රකියි හෝ ගෙය බලයි') සිතින් නොසලකා. 5 **අවුස්බඩුදු**, තූර්‍ය්‍යභාණ්ඩද. **ආයුධබඩුදු**, ආයුධභාණ්ඩද—"මෙහි ආයුධ භාණ්ඩනම් දිවිනස්නා සඳහා කළ භාණ්ඩයි." **පකා**

**පැකිඳු,** එලා එළද. 6 **පුබ්බන්නඅපරන්නඳු,** හැල් ආදිය හා මුං උඳු ආදිය. පෙරවරු ආහාර පිණිස ලද හැල් ආදී ධාන්‍ය විශෙෂය පුබ්බන්න නමින්ද පස්වරු ලද උඳු මුං ආදිය අපරන්න නමින්ද ව්‍යවහාරයි. 7 **පෙණෙහෙන්,** පණාවෙන්,—'දළහඬ මී අං ආදියෙන් කළ පෙණහෙන්." **අත්පෙණෙහෙන්,** අත්පණාවෙන්. 8 **මමකෙරේනම්,** මට්ටම්කෙරේනම්. 15 **දිසමනු,** මුනු. 19 **නැහැලොම්,** නාසයෙහි රෙම. 21 **කැසැ,** කච්ඡයෙහි, කිසිල්ලෙහි. **අඩුපිහෙසැ,** නිම්නප්‍රදෙශයෙහි. 27 **අකාවමූ අවුළුවා,** දුස්සපල්ලත්ථිකව, දෙදණ ඇවිළිම් ඇතිව. 28 **දුපපරිභොගකෙරේනම්,** නපුරුකොට පරිභොගකෙරේනම්. 29 **කහබහන්,** කායබන්ධනය, සිවුරුපටිය. 30 **පිරුරුකිසකොට,** ශරීර කෘත්‍යයකොට, මලපහකොට. **ඇතිදියෙහි,** ජලයඇති කල්හි. **නොසාහානම්,** නොසාධානම්, සම්පාදනය නොකෙරේනම්. 31 **අකැපයෙහි,** අකැප ක්‍රියායෙහි. 32 **සභාගාපත්ති,** සමානවූ අවත් ඇවැත්. **ඇරෙණනම්,** ආරෙවනයකෙරේනම්—"ඇවැත්නි, ඇවැතක් අවන්මි යනාදි කියානම්." **පටිසාව,** ප්‍රතිඥව

8

2 **සනිකරුණෙන්,** සන්නාහකරණියෙන්. 4 **අඩන්මග,** අර්ධමාර්ගයෙහි,—යටත්පිරිසෙයින් දෙගව් මාර්ගයෙහි. 5 **ඇරළුවුව,** ඉල්වුව. 8 **සිත්නම්,** චිත්‍රකර්ම. **පොත්රු,** පුත්තලීරූප, පෙතැලිරූ. 9 **බුදුනක්හු,** වළඳන්නක්හු. **අවසර,** අවකාශ. "උවසරයි"ද පාඨයි. **උවසරනොපෑ,** උපචාර (ආදර) නොදක්වා—"නැගීසිටිනා ආකාර නොදක්වා." 11 **සිදෙළු,** දේලා, පල්ලැක්කි. 14 **ඔසවානම්,** නළවානම්. 16 **ලොකායත,** විතණ්ඩ ශාස්ත්‍රයයි නම්ලත් තිරශ්චීන ශාස්ත්‍රය. 17 **නරකෙස්,** පලිත, පැසුණු ඉසකෙස්. 19 **වදීනම්,** විචෘතකෙරේනම්. 24 **ඔර,** ඇතයෙහි. **සැක,** ඡත්‍රයෙහි, කුඩයෙහි. **නිසවත්තෙහි,** පරිභණ්ඩනතයෙහි, ගෙවත් පිටිපස තැළ තුනී පිල් තෙළවර. **පිළඅගි,** මිණ්නනහෙි ගෙවත් පිල්තෙළවර. 30 **කිවුම,** කිබිසිකල. **ආවධානම්,** ආයුබෝවාසී කියානම්. 32 **බඩැරිසියෙන්,** භාණ්ඩාගාරික ශිෂියෙන්. **සගවානම්,** පටිසාමනයකෙරේනම්, නබා රකීනම්. 33 **දනම්ගොත්,** ජාතිය, නාමය, ගොත්‍රය. **දුබැසිඅව,** දුබඟීෂිතා (පතාහි)වේ. 34 **පකිණණක,** මිශ්‍ර.

9

1 **ඇදුරුවත්,** ගුරුන්ට කළමනා වත්. **තෙරවත්,** උපාධ්‍යායන්ට කළමනා වත්. **ආගනතුකවත්,** "තමා හුන්තැනට එළැඹි ආගන්තුකයන්ට කළමනා පාදධොවනාදි වත්." **ගමිකවත්,** තමා

හුන් සෙනස්නෙන් බැහැර යන්නවුන් විසින් කළමනා සමමජ්ජනාදි වත්." **සෙනසුන්වත්,** " තමාවසන ගුරුන්වසන සෙනස්නෙහි කළමනා සෙනසුන් සොධන වත්." 2 **ගිලන්වත්,** රොගීවූ පවසහ ධාම්මිකාදීන්ට කළමනා වත්. 4 **නිසග්ගෙන්,** "පිළිගන්නහු හසනාදියට දමාලා." 15 **පිහිකාරසොළ,** පරික්ඛාර චොළ. 16 **පසුදුරන්නේ,** පච්චුද්ධරණය කරන්නේ. 22 **පණ්ණරසී,** පසළොස්වක්ලත් පොහොය. 23 චාතුද්දසී, තුදුස්වක්ලත් පොහොය 25 **තුන්යලක්,** තුන්වරක්. 26 **සඟහු,** බාල (භික්ෂුව).

## 10

6 **සඟහුවිසින්,** "සතරදෙනාපටන් සංඝයා විසින්." **පා මොක්,** ප්‍රාතිමොක්ෂය. 7 **පවුරුණු,** පවාරණා. **පුකිස,** පූර්වකෘත්‍යය–සැදහා පිරිසිඳු ගැනීම, සෑතුකීම, මහණගණන් කීම, භික්ඛුනොවාද යන පසයි. විස්තර සඳහා 12 වැනි 85 වැනි පිටු බලනු. **පුකරණී,** පූර්වකරණ—පෝයගේ හැමදීම, පහන්දැල්වීම, පැන් පරහා තැබීම, අසුන් පැනවීම යන සතරයි. 23 **අසිරපස් දෙනා,** පස්දෙනෙකුට වැඩි. 33 **අනුමෝවන්නේයි,** අනුමෝදන් වියයුත්තේයි.

## 12

7 **විකුම්,** ව්‍යතික්‍රම. **අවදි,** අවදනේය. 21 **අනුමතියෙන්,** කැමැත්තෙන්.

## 13

7 **පියෙවිසිරිත්,** ප්‍රකෘතිචාරිත්‍රය හෙවත් සවභාවය. 11 **නෙවාසිකයන්,** විහාරයෙහි වසන භික්ෂූන්. 29 **උදෙකලාවැ,** තනිව.

---

# සිඛවලඳ විනිස.

## 17

5 **මියෙ,** මුඛය. **නෙවෙක්,** නවයෙක්. 6 **උභතොබ්‍යඤ්ජනකයෝයි,** ස්ත්‍රීපුරුෂ නිමිත්තවයෙන් යුක්තවූවෝයි. 9 **පඬුවෝයි,** පණ්ඩකයෝයි—මෙහි පණ්ඩකයෝනම් පක්ඛපණ්ඩකය, ඔපක්කමික පණ්ඩකය, ආසිත්තපණ්ඩකය, උසූයපණ්ඩකය, නපුංසකපණ්ඩකය, යන මේ පස්දෙනයි. 14 **පියැලිතුඹුආදියෙන්,** "කබපියැලිතුඹපම ආදියකින්." 15 **සිඛනොපස්විකූ,** ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාත නොකළ. 17 **නමූයේයැ,** චුතවූයේය, පහවූයේය. 19 **නොනම,** නොනැමුණු. **කායප්‍රසාද,** කායින්ද්‍රිය. **සම්,** චර්ම කිළ. **පිළිකා,** පිළකා. 22 **දිමුනු,** ජීවමාන. **උපුල,** උත්පාටනය කරනලද. 24 **වණසංබෙපයෙන්,** "(මෙකීදෙය නැනැත) වණය

යන බැවහාරයෙන්." **ඵුලැසි**, ඵුල්ලවවයාපතති, "**ලහුකාපතති** පයින් මහාවරදයි." 25 **ඇස්වල**, අක්‍ෂිකූපයෙහි, **නැහැ**, නාසා පුටයෙහි. **තොලි**, ඔෂ්ඨයෙහි, තොලුයෙහි. **වත්කොසැ** වස්ති කොෂයෙහි. **සැත්ආදීන්**, ශස්ත්‍රආදියෙන්.

## 18

**සටනපිසින්**, සම්‍ක්ෂණයකරනු කැමැත්තෙන්. 7 **පිළිසැණිශෝ**, ප්‍රත්‍යනීකයෝ, ප්‍රතිපක්‍ෂයෝ, පසමිතුරෝ. **ගුගුශෙන්**, බලාත්කාරයෙන්. **විකුම්කරවත්නම්**, ව්‍යතික්‍රමකරවත්නම්, වරදවා හැසිරීමෙහි යොදවත්නම්. 8 **වැඳුම්**, ප්‍රවෙශය. 11 **බොහොසුයෙන්**, බොහෝසෙයින්. 14 **විගඳපත්**, "(පූතිභාව යට ගොස්) දුර්ගන්ධභාවයට පැමිණි." 17 **අහාල**, "විවරව ඇබූ." 22 **මුළුලුකොට**, රැස්කොට. 24 **සුඹුනා**, චුම්බනයකරන. **සිප ගන්නා**, වැළඳගන්නා. 26 **අපා**, අපාද, පාතැති. **දිග්දැහැ**, දීර්ඝජාතිභුය, සර්පයෝය. **දිපා**, ද්විපාද, පාදෙකක්ඇති. 27 **සිගුපා**, චතුෂ්පාද, පාසතරක් ඇති. **ගොහ**, ගොධ, තලගොයි. 28 **වත්ගුසි**, සුදුස්සෝයි, සමර්ථයෝයි. 29 **සාමනතාපතති**, "පාරාජිකා වට ආසන්නයෙහි අවදනා ඇවැති." 34 **අවහාරයත්**, ගැනුම්. 10 **කාවිසිපිශෝගි**, කායප්‍රයොග වචීප්‍රයොගයෙහි. 12 **ධුරනිබෙව්නිද්‍ර**, ධුරනිඃක්‍ෂෙපයෙන්ද,—නිරුත්සාහබවට පැමිණීමෙන්ද. **එසිතශන**, "ඉන් කිම්ද යන." 13 **සමත්තුඹුවතින්**, "යුක්තිබැණ මධ්‍යස්ථවතුඹු වස්තුවෙන්." 1i **ඔත්සවුත්කෙරේනම්**, "තුඹුනැතින් පහකෙරේනම්." 19 **ඇරවුසඳ**, ඉල්වූකල. **අසිනාදන්පුහාබැවින්**, අදින්නාදානයට පූර්වභාගහෙයින්. 21 **ඉරිසවුකොවන**, ඊර්ෂ්‍යාපථ කොපනයකරන, "**යෙමින් සිටි ගමන** වළක්වන." **පියොවහි**, ප්‍රයොගයෙහි. 25 **ඉකුම්සඳ**, අතික්‍රාන්තවූකල්හි. 29 **සවිඤැඤුණක** අවිඤැඤුණක, "ද්විඇතිනැති." 32 **පස්ශෙසින්**, පස්ආකාරයෙන්. 33 **ගත**, ගත්කල්හි.

## 20

5 **නෙකාගැන්මි**, සොරාගැනීමයි. 7 **නෙකානැකයි**, සොරාගනුවයි. 8 **ඇණැවිම්**, අණකිරීමයි. 9 **සුක්වත්**, සුංගම්, 10 **අසෝනැනට**, අසවල්ස්ථානයට. **පිරිකැපු**, පරිකල්පිත, නියම කරගන්නාලද. 12 **අසෝසැඳ**, අසවල්තාලයෙහි. 14 **නා ශෙහෙනාසැඳ**, තම පුළුවන්කල. 15 **එකත්තෙන්**, එකාන්තයෙන්. 21 **තාවුකාලිකොට**, තාවකාලිකකොට, කාලනියමයක්ඇතිව. **නනස**, නානාභාවය, වෙනස.

## 21

2 **පිසොල්හි**, ප්‍රයොගයෙහි. 5 **සැසඳ**, සංසන්දනයකොට, "බැණගෙන" 8 **සකුල්**, සංඝාත, සලකුණු. 12 **නිමිත්**, නිමිත්ත, සංඥ 21 **තුලාකූට**, සොරකිරුම්. මානකූට, සොරමිනුම්. **කූළු කහවණු**, කූටකාර්ෂාපණ, සොර කහවණු. 22 **පෙරළනවිසින්**, පරිවර්තනයකිරීම්වශයෙන්, මාරුකිරීම්වශයෙන්. 24 **ගම්ගොලෝ ගන්නවුන්සෙයින්**, ග්‍රාමඝාතකයන්මෙන්, ගම් පහරන සොරුන්මෙන්. 25 **කරව්වවශින්**, අයබද්දෙන්. 26 **රජහටයන්සේ**, රජපුරුෂයන්මෙන්, 27 **තෙනන්නට**, සොරකමට. 28 **හූ**, සූත්‍ර, නූල්. **පිරිකපා**, පරිකල්පනයකොට, නියමකොට ගෙන. **පිවා**, හසත්‍රාව, පසුම්බිය. 29 **ලද්දෙක් මැනැවි නො**[illegible], යමක් ලදද එය (ගත) මනා නොවේදැයි. 31 **එන්සවුන්කෙණෙකි**, තුබූතැනින් නාගාගත් ක්ෂණයෙහි. "එන්සවුනෙහි" යනුත් පාඨයි. 32 **අනුබඳනාලද්දේ**, පසුපස්සෙහි **ලුහු** බඳනාලද්දේ.

## 22

2 **සකසඤ්ඤයෙන්**, තමාගේය යන කල්පනාවෙන් 3 **පසුල්සඤ්ඤයෙන්**, පාංශුකූලය යන කල්පනාවෙන්. 14 **පිළිසොයා නම්**, පරිච්ඡාදනය කෙරේනම්, වසානම්. 19 **අරවහනම්**, ඉල්වත්නම්. 21 **ගලා**, නිදන්කොට. 22 **මතුකෙළවර**, උපරිභාගය. **පාත්පමුණුවා**, යටකොට. 24 **පෙරළීකොට**, පරිවර්තනයකොට, මාරුකොට 28 **නව**, ඒතාක්. 34 **විස්වසින්**, විශ්වාසයෙන්.

## 23

6 **සමා**, පමන්. **තවන**, තාපනයකරන. **හඩන**, මඩින 8 **හොරොක්මුන්සැඳ**, ප්‍රසූතකාලයෙහි. 9 **සපියොවුන්**, සප්‍රයොගයන්. 11 **සිරිරින්**, ශරීරයෙන්. 12 **පැහැරැ**, පහරදී. 17 **යම්කවරිවෙක්**, යම්කිසිවෙක්. 18 **මෙලෙසින්**, මළහෙයින්. **කලාතුරකින්**, කාලාන්තරයකින්, කල්පසුව. 23 **ඇණෑවූවාහට**, නියොගකළ තැනැත්තාහට. 25 **මුස්සි**, (ඇවැතින්) මිදේ 32 **නොහසුරුම්වන**, අසංවාරිමවූ; එකතැනම පිහිටි. **උවාරණින්**, "(කණනලද වළ ආදි)උපකරණයෙන්."35 **උවා**, උපාය.

## 24

2 **හි**, පතිනව,වැටී.11 **ජැපිම්**,ජල්පනයකිරීමයි,දූපිමයි.14 **ඉඹ**, සෑඩි. **කම්විවාඉඹ**, කම්විපාකසෑඩි. **දළකොළන**, දත්කන.

15 **දැහැවෑ,** කිපී. 26 **බුහුමන්කැමැති සිත්නෙන්,** "ආදර ගෞරව කැමැති සිතින්." **පරියාමුද,** පර්‍යායයෙන් තොරව, ව්‍යාජකථාවෙන් වියුක්තව. **ඉදුරු,** ඍජුව. **වැළැනෑ,** ("දෙළොස්රියනින් ඇතුළු") සමීපයෙහි. 28 **ලසා,** ලස්ව, කල්පසුව. 31 **මෙමෑ නිෂය,** මේ නයමැයි, මේ ආකාරයමැයි.

## 25

4 **අධිමනින්,** අධිමානයෙන්, ආරබ්ධවිදර්ශක භික්ෂුහට උපදනා අධිගත ධර්ම ඇත්තෙමි යන අධිමානයෙන්. 7 **ඇරැජීමෑ,** ආරෙචනය කිරීම. 14 **කල නැත,** "ප්‍රයොග කලකල්හි". **නුමුත,** (ශුක්‍ර) මොචනය නුවූවත්. 16 **ආසඬාද,** රසවිඳීම්. 19 **පසශෙන්,** ප්‍රත්‍යයයෙන්, කාරණයෙන්. 25 **නොරඹුරේ,** ප්‍රතිච්ඡන්නස්ථානයෙහි, රහස්තැන. 28 **තුළුල් තෙපුල්,** ධූර්තවචන. 34 **අල,** එලවනලද. **පිරිමටසඳ,** පරිමාර්ජනයකළකල්හි, අතගෑකල.

## 26

12 **නිසග්ගෙන්,** දමාගසන යමකින්. 17 **ඔකදකරනසැඳෑ,** (පහරනට) උපක්‍රම කරනකල්හි. "උපක්කම කාලෙ"—සික්ඛාපදවළඤ්ජන. **හවා,** භයගන්වා. 24 **නාමනාදන්නා,** සුභාෂිත දුර්භාෂිත දන්නා. 26 **ඛිඹිගිය මස්ඇන්තීය,** උස්වසිටි මස්ඇත්තීය—සිඛරිණීය. 27 **මුසුවු හදන්ඇත්තීය,** මිශ්‍රවූ ව්‍යඤ්ජන ඇත්තීය—සම්භින්නාය. **දෙහඳන ඇත්තීය,** ස්ත්‍රී පුරුෂ නිමිති ඇත්තීය—උභතොබ්‍යඤ්ජනකය. **හවානම්,** ආක්‍රොශකෙරේනම්. 29 **නෙතුසෑ,** "ති වසමඟ පසමඟ සුභය, මනාවූ සටහන් ඇත්තෙහිය." **නොනෙතුසෑ,** "නිමිත්ත නැත්තෙහි, නිමිත්තමාත්‍රා ඇත්තෙහි." 30 **ගුණඅගුණුවිසින්,** ගුණාගුණවශයෙන්.

## 27

2 **එක්තෙරෙකින්,** එක්තරා (වචනයකින්.) 8 **සපදඅතුරෙන්,** "සිඛරිණීය, සම්භින්නාය, උභතොබ්‍යඤ්ජනකය, තව වච්චමග්ගෙ සුභෙ සුසණ්ඨානෙ, තව පස්සාවමග්ගෙ සුභෙ සුසණ්ඨානෙ, දෙහි මෙථුනධම්මං" යන මේ ෂට්පදය අතුරෙන්. 11 **පඬිශෙකෑ,** පණ්ඩකස්ත්‍රියක. **කාපිළිබඳ්ජෙහිදු,** ශරීරවයවයෙහිදු.

## 28

3 **වත්කැමින්,** වස්තුකාමයෙන් 19 **පිළිපශන්නේය,** ප්‍රතිපාදනය කරන්නේය. 23 **නොපිවවුන්,** අත්නොහැරියවුන්—"පත්බොල් දී නොහළවවුන්." 31 **තෙත්නි,** "තෙමූණී," පිළිබඳ සිත්ඇත්තී.

## 29

1 **පරිජිඅවන්,** පාරාජිකාපන්න, පාරාජිකාපත්තියට පැමිණි. 5 **උබෙව්නිකම්කළ,** උත්ක්ෂේපණීය කර්මය කළ,—උත්ක්ෂේපණීය කර්මය නම් අවන් ඇවැත නොදක්මෙහි හෝ ඊට ප්‍රතිකර්ම නොකිරීමෙහි හෝ ගත් ලාමක ලබ්ධිය නොහැරීමෙහි හෝ සමානසංවාසක සභාගත්වයෙන් තොර කිරීමයි. **ලද,** ලබ්ධිය. 6 **කම්වදන්,** කර්මවාක්‍යය. 8 **උක්ඛිත්තානුවත්තක,** උත්ක්ෂේපණීය කර්මය කරනලද භික්ෂුවක්හු අනුව පවත්නා. 12 **පිළිසන්තැනට,** ප්‍රතිවජ්ජනස්ථානයට, මුවාතෙනට. 13 **අටවන්,** අෂ්ටවස්තු, කරුණු අට. 15 **හෙළපිළි,** ශ්වේතවස්ත්‍ර, සුදුරෙදි. 20 **අභබ්බපුග්ගලයෝයි,** අභව්‍යපුද්ගලයෝයි—මහණ මහලු පැවිදිධර්මය නුසුදුස්සෝයි. 23 **මිනිස්රහතා,** මනුෂ්‍යවූ රහත්කෙනකුන්. 24 **සමග සඟහු,** සාමග්‍රිසංඝයා. **බිඳ්ශෝයි,** භෙදකරවූයේය. 26 **නිපුසඳ,** නපුංසකද. 28 **කසා,** කාෂායවස්ත්‍ර. 29 **සෙරිශෙන්,** රහසින්. **හෙරණපැවිජිවූ,** සාමණේර ප්‍රව්‍රජ්‍යාවට පැමිණි. 29 **ලිංගත්ථෙනකයෑ,** ශ්‍රමණ ලිංගය(ලක්ෂණ)සොරාගත් තැනැත්තේය. **මාලු පැවිදිකිස,** උපසම්පන්න භික්ෂුවකගේ කෘත්‍යය. 31 **සංවාසත්ථෙනකයෑ,** භික්ඛුවස්සගණනාදි ක්‍රියා භෙද සංඛ්‍යාත සංවාස සොරාගත් තැනැත්තේය. 33 **මාලුපැවිජ්ජෙහි,** භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙහි. 35 **පුවතත්,** පකතත්ත, අනුක්ඛිත්තවූ, පාරාජිකානුවූ, සිල්වත්.

## 30

4 **අනුලොම්පරිජි,** අනුලොමපාරාජිකා—"මෙවුන්ධමට අනුකූල පාරාජිකා." 14 **කම්ණ්‍යවූ නිමිත්,** රාගාදි පස්ආකාරයෙන් එක් ආකාරයකින් කර්මණ්‍යවූ අඟජාතය. 23 **සොයා,** චොදනය කොට. 24 **සොයවා,** චොදනයකරවා. 26 **දිවසෝඩයින්,** දිව්‍ය ශ්‍රොත්‍රධාතුයෙන්, දිවකනින්. 34 **සමරවීම විසින්,** "ආඝ්‍රාණය කිරීම්වසයෙන්."

## 31

4 **පිළිදෙස්නි,** පාටිදෙසනීය ආපත්ති. **දුබැසියෙන්,** දුබ්භාෂිතයෙන් 5 **සත්ඇවැත්කඳින්,** සප්තාපත්තිස්කන්ධයෙන්–"පාරාජිකා, සංඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට, දුබ්භාසිත යනමේ සප්තාපත්ති ස්කන්ධයෝයි. **හටනුනිසා,** ආක්‍රොශ කරනුපිණිස. 14 කැතයක්හු, ක්ෂත්‍රියක්හු. **දෑ,** ජාති, 22 **ගොරෝක්හයි,** ගරුකයෝයි—"ආචාර්‍ය්‍ය උපාධ්‍යායෝයි." 29 **නික්ඛිත්තකාලකොපසාය,** "වත්තුබූතැන් පමන්ගෙන." **පකතඝාතෙ,** "සිල්වත්බැව්හිම." **තිණනි,** "සිරි." **සුබැවින්,** වදාළ බැවින්. **පිළිසම්**

**කරෙමින්**, ප්‍රතීකාරකෙරෙමින්. 30 **නොනිපන්සඳ**, නොනිමි කල්හි. 31 **එමුල්නෙන්**, ඒ හෙතුයෙන්. **සගටමොකට**, සවගී මොක්‍ෂයට. **ඩැහැ**, බාධා,නිවාරණ. **වත්නුබූසඳ**, වත්තනිකඛිත කාලයෙහි—වත්නුබූකල්හි. **ඩහන්**, බාධාවක්. 34 **නොකල්හි සිවුරු**, අකාලචීවර—"මෙහි නොකල් සිවුරුනම් වප්මස අව පැලවියපටන් කෙළින් නොඅතුළ වෙහෙර මසෙකි, අතුළවෙහෙර පස්මසෙකි යනු සිවුරට කලි, සෙසුකල උපන් සිවුරුද කල්හිදු උදෙසා දුන් සිවුරුද නොකල් සිවුරුනම්."

32

2 **පසුදුරු**, පච්චුද්ධරණයකොට. 9 **අන්පස**, දෙලොස්රිය නින් ඇතුළත් තැන්යි. 11 **විසිබේකොට**, වවීහෙදකොට, 15 **පිරිකරසොළ**, පරික්ඛාරචොළ. 19 **උඩස්පිරිසෙයින්**, උත්තම පරිච්ඡෙදයෙන්. **අතුරුවසාසිවුරට**, අන්තරවාසක චීවරයට, අඳනාසිවුරට. 32 **තෙසිවිරි**, තෙචීවරික. 34 **දූවිසින්**, ජාතිවශයෙන්. **සසිවුරි**, ඡීවරසයෙකි. **කොමුමුවාසිවුරු**, "බොමනම්ගස වැහිරියෙන්කළ සිවුරු." **තිඟිරිමුවාසිවුරු**, "තිඟිරිවකැ හුයින් කළ සිවුරු." 35 **සැණමුවාසිවුරු**, සාණනම් ගස් වැහිරියෙන්කළ සිවුරු. **පටදු**, "සොමාරදෙශයෙහි වැහිරියෙන්කළ පටය, චීන දෙශයෙහි වැහිරියෙන්කළ පටය, පතතුණ්ණදෙශයෙහි පාණක ජතින්ගේ හුයින් කළ පටය, දුල් පටය යන මේ සතර පටද." **නෙත්‍රඳු**, සෘඞිවශයෙන් නිර්මිත සිවුරුදු. **දෙවාගඳු**, "අනුරුත් මහතෙරුන්වහන්සේට දෙවඟනන් දුන් සිවුරුසෙයින් දෙව දිනන සිවුරුද."

33

1 **කඩ**, වසත්‍රකැබැලි. **පත්නි**, පාත්‍රාපසිය. 2 **කන්වසින්**, බිමෙබාහන, කොට්ට. **බිසි**, ඇඳ අතුරන බිහි (ගුදිරි). **කොඳු**, කොජව,"කොදුපලස්." **හිඳෙලු**, ඡේලා,පල්ලැක්කි,**පවුරු**,පාවාර, "පීඩාම්." 5 **ඇසිඳගැන්මෙන්**, "සොරආදීන්විසින් පැහැරගැන්මෙන්." **ලිඟුපෙරැළිමෙන්**, "පිරිමි සඟුන් මෙහෙණන් වීමෙන්." 7 **දිගන්**, දීඝාන්තයෙන්— "දිගිනැයිසේයි." 10 **සිල්න්දු**, ඡිද්‍රයෙනුදු, සිදුරෙන්ද. 18 **විකපුන්**, විකප්පනය. 25 **මයනං සයානකං**, "මාසතුදෙය." **පටිභූජෙපිවා**, "වැලඳගනැයි කියා වේවයි." **විසසජෙජපිවා**, "අන්තට දෙවයි කියාවේවයි." 26 **සඵාපවමසං කරෙගි**, "කැමැත්තක් කරවයි." **මෙසෙස්පසුදුලසඳ**, "මෙසෙයින් විකපින් පච්චුද්ධරණය කළකල." 32 **කිළින්නොඅතුළ**, කඨිනාසතරණය නොකළ. 33 **හිමන්**, හෙමන්ත සෘතුව—ඉල්මස අව පැලවියෙහි පටන් මැදිම්දින මැදි[illegible]හොය දක්වා සාරමාසය.

34

4 **අසල්සිවුරුනමින්**, අකාලචීවරනාමයෙන්. 5 **පසුල්විසින්**, පාංශුකූලවශයෙන්. 9 **නිසඳ**, හැරපියා. පරිත්‍යාගකොට, 13 **බඩුතුඹුසෙසින් පරිජිආදිඇවැත්වෙයි**, භාණ්ඩයෙහි අගයවූ පරිද්දෙන් පාරජිකාආදි ආපත්ති සිඩවේ—'දූකපවත් පාරාජිකාවෙයි, දූකින් අඩුවුව ථුලසිවෙයි, මඳවුව දුකකට ෙවයි යේසි.'' 18 **නොකලැසි**, අකාලයයි. 20 **පිටිබෙව්**, පරික්ෂෙප. 24 **හැමැතිනෙතනක**, "සිවුරුතුඹූගෙයි දිය හෙළුමෙන් ඇතුළත යයි දතයුතු.''

35

1 **අල්ලේ**, අලුවූකල, පහන්වූකල. 4 **සිකෙල්නැකම්නැති**, "**සත්මූතතක** පරම්පරායෙන් නැතම්නැති.'' 5 **උභතොසඟහි**, "මගණ මෙහෙණ සංඝයාකෙරෙහි.'' 13 **අරළුපතාක්මාත්‍රා**, අරළුගෙඩියක්පමණ. 4 බැරපිවා, බැහැර යළු (සිවුරක්). 20 **අසුන්සිවිපි නවසිවිපි නොවැ**, අචඡිනනචීවරීක නෂට චීවරීක නොව, සොරආදින්විසින් පැහැරගන්නාලදහෝ නැසුණු සිවුරුනැතිව. 21 **අරවාගනීනම්**, ඉල්වාගනීනම්. 28 **කිඟිවක්හු**, කිසිවකු. **තමහට තකා**, "තමා පිණිස.'' 30 **හම්යේ**, සමුඛයෙහි, "මැදයෙහි.'' **පරවිවිලිගෙහි**, පරාඞ්මුඛයෙහි, "නොමැදයෙහි.'' '**පරවිපීයෙහි**' යනුත් පාඨයි.

36

4 **වෙරළුමිණි**, වෛදූර්‍ය්‍යමාණික්‍ය. **රන්තසු කම්කල**, සවර්ණඛචිත කර්මකරනලද, රනින් කැටයම් කළ. **රත්මිණි**, ලොහිතංක මාණික්‍ය. **විරිවන්මිණි**, මැසිරිගල්. 7 **කැල කී**, පූජියෙහි කියනලද. 8 **නවාමටද**, නවකර්මයටද. 9 **පිළිබෙව නොකොට**, ප්‍රතිකෙෂපනොකොට, "නොවළකා.'' **ඇරුම්ආදීනම**, ආරාමිකාදීන්ට. 11 **කුකුස්**[illegible]**රන**, සැකකරන. 12 **පිසාගිසා**, දමාගිය (වස්තුවක්). 13 **රුක්සේවලල්ලෙහිජු**, වෘක්ෂචජායාවලයෙහිද, රුක්සෙවණද. 16 **බැවහරකල**, පරිවත්තනයකළහොත්, ගනුදෙනුකලහොත්. 27 **අකතුරුසිඛයෙහි**, අනනතර ශික්ෂාපදයෙහි, මිළඟ ශික්ෂාපදයෙහි. 30 **මෙබිඳු**, මෙවළඳ, මෙය අනුභවකර. 35 **අශ්හි**, අගනේද, වටීද. **අඟ**, අගය, වටිනාකම.

37

10 **මොනවට සුදුකොට පැහැසි**, "කුඩු ඇස් නැතිකොට මනාකොට පැහැසි'' 12 **කොළසාලා**, "සාල්නොකොට''. **නොවිලිකුණ්**, අකලිනත[illegible] **පක්**, පිසනලද. 14 **මුගුහුජු**, මූඅඟ

සූපද, "මුංකොමුද". 15 **පයක**, පාත්‍රයක. **එවැ**, බහා. 16 **උකට හිළකටපානම්**, උත්කෘෂ්ටයෙහි උත්කෘෂ්ටපාත්‍රනම්. 18 **ඔමුපා**, ඔමකපාත්‍ර. **සමහරක්**, භාගයක්. 20 **මැදුමෙහි**, මධ්‍යමයෙහි. 21 **ඔමුයෙහි**, ඔමකයෙහි. 29 **සිවි**, ජිවි 31 **ගේකරම්හයි**, සුදුපැකරම්හසි. 32 **තණඔලක්**, තෘණශූලයක්, තණහුලක්. 34 **බඳුලුආදිනෙන්**, "බඳුලුලාවූ ආදි බඳමින්". **සිල් හැසවා**, සිඳුරු වසා.

38

5 **අසිරපස්බාන්**, පසකටවැඩි බන්ධන 7 **සපා**, අයෝමය පාත්‍රා, යකඩ පාත්‍ර. **බොහො ගෙඩි හෙළුවද**, "(සිදුරුවසන්නට) බොහෝගෙඩි ලුවත්." 8 **සපාකිබි නොසිටිනම්**, ආමිස නොරඳ නම්-බත්තුලු නොලැගේනම්. 17 **ගැන්වූ නොගැන්වූවා ජන්නා**, "පා ගත් නොගත්තැන් දන්නා." 25 **සමජනෙ**, සම්මත කට යුතුය. 28 **සැමැජී පැවිජ්ජන්**, සම්මතකළ භික්ෂූන්. 29 **හංකෙර**, සංඝසර්විර. 30 **ඉක්බිති පැවිජ්ජකට**, "වැළත පැවිද්දන්ට". දෙවැනි තෙරුන්ට. 35 **අනුකපිසෙන්**, අනුකම්පායෙන්, කරුණාවෙන්. 36 **අපිසින්**, අලේපවර්ජිතායෙන්, "ආලයනැති හෙයින්."

39

3 **අන්ගු**, අන්‍යයෝ. 6 **උග්ගුගු පිළිග්ගුගු**, උග්ගහිත පටිග්ගහිත. 11 **සිරුරුගහන**, ශරීරයෙහි ආලේපකිරීම හෙවත් ගෑම. 12 **මස්නොවැරු**, මස්නොකැයුතුයයි නොවළකතලද. 14 **සිද්දතුතෙල්**, අබතෙල්. **වසාතෙල්**, "(මිනිස් වසාතෙල්) තබා සෙසු මස්නොවරු සතුන්ගේ) මස්තෙල්". 17 **පක්නොපක්**, පචනය කළ නොකළ, පිසුනොපිසූ. 18 **මීජ්**, මධුපුෂ්ප, මීමල්. 19 **සත වුකැලිවත්**, සත්තාහකාලිකවස්තු, සතියක් නිරාමිෂ පරිභොග යෙන් වැළඳියයුතු දෙය. 25 **වැමුජ්පහන් ආදිසට**, ප්‍රදීපාදියට. 26 **සතිඅහතුරෙහි**, සත්තාහභ්‍යන්තරයෙහි, සත්දවස ඇතුළත. 27 **නිසජුව**, පරිත්‍යාගකළහොත්. 32 **පවා**, දක්වා. 33 **නිරාමිසවෙ**, ආමිෂ (ආහාර) නැතිවම. 34 **සාමිසවැදු**, ආමිෂසහිත වද. 35 **යව්කැලිවත්**, යාවකාලික වස්තු, පෙරුවරු පිළිගෙන පෙරවරුයෙහි වැළඳියයුතු ප්‍රවෘත්ති ආහාරද්‍ය.

40

**2 යවදිව්කැලි**, යාවජ්විකවස්තු, පිළිගත්තැන්පටන් දිවි ඇතිතාක්කල් වැළඳියයුතු කසා හිඟුරු ආදි ද්‍රව්‍ය. 3 **දඹපැනු**, ජම්බුපාන, ජම්බු ඵල මිරිකාගත් පැන්. 5 **පක්හුනම්**, පිසූනම්.

**කහා,** "(පත්ලට බට) කල්හ." 6 **බෙහෙත්අඹියෙහි,** ඖෂධශා ගුයෙහි, බෙහෙත් කැදෙහි. 7 **අසප,** අකපපිය, කැපනොවන. 8 **දිගුලිකාඳු,** දඟිගුලිකද, "දිකැපිද". **තක්බිඳුදු,** තකකබිඤුද, "මොහොරුපෙද්ද". 9 **අබෙබාහාගිකයි,** "ඇවතට අඟනොවෙ තිසිසේසි". 11 **තෙල්නකා,** තෙල්පිණීස. 16 **ඇතිපසඟයෙහි,** කරුණු ඇතිකල්හි. 19 **සතරකැල්ලස්,** චතුර්විධකාලිකවස්තූන්. "හඹුබත් ආ යව්කාලිය, මිදිපැනු ආදි යම්කාලිය, ගිතෙල් ආදි සතවුකාලිය, කසා හිගුරුආදි යවදිවි කාලිය යන මෙසි." 20 **පසනැකද,** කරුණක් නැතද. 20 **පනු,** පාන. **පැන්පවස්,** පානපිපාසා, පැන්බොනුකැමැත්ත. 24 **පටනැ,** පලබුනොම. 25 **පියන්නෙ,** පරිතහාගකටයුතුයි. 27 **නොවිසියමනාවැ,** "කෂමානොකොටහී–කිපියයි සේයි". 30 **සම්නාක්,** යම්පමණක්.

41

11**පිරිණැමු ලාහසක්,** "දෙම්හ කරම්හයි කියා වාක්හෙද කොට පිරිණැමූ චීවරාදි ලාභයක්". 20 **සණයිදු,** කෂණයෙහිදු. 24 **හැවිසැපිවැ,** ආක්‍රොශකරනු කැමැතිව. 25 **ආචාරවිපතති,** "පව ආපතතිසකඛවහතික්‍රම සංඛ්‍යාත ආචරවිපතති". 27 **පරිසාසෙන්,** පයහීායයෙන්, "ලෙශයෙන්". 30 **අවක්සා,** අරභයා. 31 **නිසැගිපිළිදෙස්නි තබා,** "නිසසගගිය පාචිදෙසනිය හැර". 32 **ලාහෙලා,** හුහුව.

42

2 **ඇකෙස්ලි,** ආක්‍රොශ. 5 **දුඇත්හු,** ජතිමත්හු. 10 **ගැමවාසෙහි,** ගණ්ඩිහෙදකයෙහි, සොරෙහි. 11 **හැවිලින්,** ආක්‍රොශයෙන්. **නොසිඳුරු,** සෘජුනොව, පරියායෙන් 14 **සැඩලෙහි,** චණ්ඩාලයෙහි. **කැනයෙහි,** කෂත්‍රියෙහි. 15 **හීනළකටදූයි,** හීනොතකෘෂට ජතීයි. 15 **මැහුළ,** "යනු අවකණ්ණක ජවකණ්ණකාදී ගැත්තනට නම්". **බුදුළ,** "යනු බුඩරකෂිතාදි නම්". 17 **කොමරුකිකම්,**'වඩුකම්'. **වෙණෙජුකම්,** වණික්කම්, වෙළඳම. **සිකඛාපද** වළජනයෙහි, "වෙජජකමෙමාසි"යි පැනේ. **තළාරසිල්ප,** "තළකාර–කුලුපතු–ශිලපය."19**මධුමෙහ,**වෙදනාරහිත එනම් රොගය. **ඉකාදිගුල්ලෙහි,** අතිදීඝයෙහි,"ඉතා උස්වූයෙහි".23 **ගඩුබුයෙහි,** ගදුහයෙහි, කොමළුවෙහි. **තිරිසන්ගියෙහි,** තිරශචිනගතියෙහි. **නෙරිසත්හි,** "නාරකික සතවයෙහි". 27 **අපවධමමඅනුසස්ලි,** අත් ධර්මානුශාසනා. "අත් නම් අටුවායි. ධම් නම් පෙළයි. අනුසස්ලි නම් තොප පෙර මෙතියායෙන් කම්කළ හෙයින් වෙද මෙවැනි ජති ඇත්තේ යනාදි විසින් කියා අනුශාසනාකිරීම්". 30 **බිඳු**

**පිවෑ,** හෙළකරනු කැමතිව. **සල්බවක්,** "තමංහා පියබවක්". 33 **පාපගරහිවෑ,** පාපයට ගර්හා කරන්නෙක්වෑ.

## 43

4 **මවක් අකුරක්එවු,** "ආදි අක්ෂරයෙක් වේවයි". **අවසන් අකුරක්එවු,** "අන්තයෙහි අක්ෂරයක් වේවයි". 11 **සහශෙසශ්‍ය ශෙෂාඛ්‍යාතා,** එක්ව සයනයකිරීමට ප්‍රමාණවූ. 12 **හිරුහවා මටගිසඳ,** සූර්‍ය්‍යයා අස්තංගතවූ කල්හි. 14 **බුමු,** භූමත, මහල් 30 **සෙවුණේයි,** ඡාදනය කෙළේයි. 31 **කොඩවර,** කුඩා පවුර, "මූවපාගිතානි".

## 44

3 **දිස්මනු,** දෘශ්‍යමානවූ "පෙනෙන්නාවූ රූඇති". 11 **සපෙදෙන්,** ෂට්පදයෙන්. "පදයෙක්නම් අට අකුරෙකි". 13 **සිහුපෙදිගසින්,** චතුෂ්පද ගාථාවෙන්. 14 **සෙලගෙසෙක්,** ගාථාවක්හා ගාථාඕයක්. 18 **පුසකල,** පිළිවිස්සහොත්, ඇසුවහොත්. 21 **සැවුරූනිසා,** "සංවරයෙහි පිහිටනුපිණිස," ආයතිසංවරය සඳහා. 24 **අසුචි,** ශුක්‍ර. 26 **පණ්වාවිකුම්,** ප්‍රාණාතිපාත ව්‍යතික්‍රම. 27 **තුළුල්වරද,** (ප්‍රාණඝාතාදි) මහත්වරද. **නොතුළුල්වරද,** "(විකල්බොජුන්ආදි) නොමහත් වරද". 34 **සකුරු,** ශකීර, ගල්කැට. **පහණ,** පාෂාණ, ගල්. **කල සකල කැබිලිති,** කට සක්ඛරා කඨලා, කැට ගල් කැබිලිති.

## 45

6 **කණු කොළු,** කණුවක් ගස. 13 **කලකුරුවත්,** විකොපනය කරත්හොත්. 14 **මීපස්,** මීයන්විසින් නගනලදපස්. **සිනිපස්,** සින්නන්විසින් නගනලද පස්. සිනි යනු කුහුඹු වර්ගයකි. 15 **රජ,** රජස්. 19 **සිවීන්,** ඡදන, පියසි. 20 **වටදියෙන්,** වර්ෂජලයෙන්. **සාවන්,** "යම්තාක්තැන්". 21 **උළුමවුරෙහි,** ඉෂ්ටිකාමය ප්‍රාකාරයෙහි, ගඩොලින්කළ භිත්තියෙහි. 22 **කොවා,** කොපනයකොට. 22 **දියදරින්,** ජලධාරාවෙන්. 23 **වසම්තැන්,** නොසම තැන්. 24 **බිඩුනුමින්,** බිමබිදිමින්. **වෙරකස්ආදි තැන්හි,** ශරීරයෙහි කැසීම් ඇති තැන්හි. 28 **උපුරා,** උඬරණයකොට, උදුරා. 30 **නොඉවැසියෙන්,** ඉවසියනොහෙන හෙයින්- 31 **දමින්නොයන,** "ගිනිඇවිළගෙන දගෙන ඔබ්බට නොයන". **පහණකඨල,** පාෂාණකඨල, ගල්කැබිලිති. **35 දියාවු,** ජලඨ, දියෙහිවූ. **තලාවූ,** ථලඨ, ගොඩබිම්හිවූ. **නිලී,** ශෛවාල, දියසෙවෙල්. **පිසඹුරු,** හරිත සෙවාල, සෙවෙල් ජාතියක්.

46

1 **පරණලා මහසල් ලසල්ලිය,** 'නම් දියෙහිම හටගන්නා ජාතියෙකි." 2 **තෝරාගන්නාක් එවූ,** තොරකොට ගන්නාක් හෝ, උදුරාගන්නාක්හෝ. 7 **කලාපිසෙහි දෙන,** ගොඩහටගෙන ජීවත්වන. 8 **කේල්,** කදලි, කෙසෙල්. **ඇඹලල,** අම්බාටක, ඇඹැල්ල. 10 **දෙන,** ජීවත්වන. 11 **ඉන්සලු,** ඉඳසාල. 12 **පුහුණ්,** පලගත්(.?) නල, රතහුණ. **හුණ,** "සත මහහුණ". 13 **මිශ මිත්සිවි,** මියලෙමින්සිටි. 15 **මුලුජු පතුජු දුන්නා,** මූල්ද පත්ද ජනිතවූ. 16 **දුන්සඳ,** ජනිතවූ කල. 23 **දෙනතැන් තබා,** තොමලතැන් හැර 27 **විලිකුණ් පතාදීන්,** ඉදුණු කොලආදීන්, පණ්ඩුපලාසාදීන්. 31 **මල්පල්ලේ,** පුෂ්පපල්ලවයෙහි. 35 **මුළු කොට,** රැස්කොට. 36 **පකාපැකිජු,** ගඩාගෙඩි. 36 **නොදෙන,** ජීවත්නොවන, මල. **එක්දෙසඤැ,** එක් කොටසෙක.

47

1 **නියසැනාදි,** නඛශස්ත්‍රාදි. **දඬෙ,** (උක්) දණ්ඩෙහි. 2 **බඳ වැල,** බන්ධනවල්ලිය, (උක්මිටිය) බැදි වැල. **විජැ,** විජ්ඣනය කොට, විද. 4 **නිලිගත්,** නිල්වත්වූ. 5 **සබඳගුලු,** සම්බන්ධවූ බත්හුලු. 6 **උතු,** කපාල, (ගිවුලු ආදියෙහි) පිටකටූ. 8 **පනුහඹු ආදිය,** පානයාගුආදිය, පැන්හා කැඳආදිය. 11 **බඳවෙළු,** කොසු. 14 **සගවනුනොකොට,** පටිසාමනය නොකොට, රක්‍ෂා කොට නොතබා. 15 **දෙළඹුපා,** ලෙඩ්ඩු පාතමයක්. 19 **පා පිස්නිසේ,** පාදපුඤ්ඡනයක්සේ. 30 **දශශඝාවන්,** හිසිවිලිම්කාදි දසවැදෑරුම් සයනාසන. **ගමනිවැ,** "අනික්තැනකට යනු කැමැතිවැ". 31 **උවසරකිම්,** උපචාර සීමාව. 48 වෙනිපිටේ 5–10 පෙළ බලනු. 32 **සිවුරු පිසැලි,** චීවර පිලොතිකා 34 **පිරිසම් කලබිමැ,** පරිකම්කල භූමියෙහි. 37 **සිත්බිමැ,** ශෙවත භූමියෙහි, පිරිසුදුබිම. **කලපැදුරු,** කටසාරිකා, කලාල්.

48

1 **මැඹිලිපතාදිසි,** මඹුලු යොදකල තල්පත්ආදිය. 2 **සෙන සුන්පරිභොගව,** "සෙනාසන පරිභොගයෙන්." **නොවටනා සම් නැති,** "(මිනිස්සම්තබා) සෙසු නොවටනා සම්නැති. **තමහටපස් වටත්,** "පුද්ගලිකකොට පරිභොගකරත්." 3 **ලොමන්කඩින් කල;** "එළලොම් කොඖසයෙන් කල". 4 **නිසජුන් සිවුරි,** දසසහිතවූ හිඳින සිවුරැයි". **කොදු,** කොජව, "එළලොමින්කල කොදු පලසි". **පවුරි,** පාවාරයි, පිඩාමි. 5 **පනාතුරි,** පනුයෙන් කරනලද ඇතිරි. 21 **විමතිකව,** වෙමතිකව, සැක සහිතව. 37 **සිකඛාමානා,** උපසමපදාවට පිළිවෙත් පුරන මෙහෙණි. **මෙහෙණින්ගේ,** සාමණෙරීන්ගේ.

49

4 **සිද්හතු මාත්‍රාවකුදු**, සමීප මාත්‍රයක්වත්, අබ ඇටයක් පමණවත්. 8 **පරගලාකිරීම**, "සමහරක් වැළඳීම." 9 **පරගලා නොකල බොජුන් ඇනිබැව්**, "වලඳන බජනෙහි තිමනොකළ බොජුන් ඇතිබැව්." 12 **ගොයුම්**, ගොධූම, තිරිඟු. **වරා**, වරක නම් ධාන්‍යවර්ගය. **හැමිණැ**, ධාන්‍යවර්ගයක්, අමු 13 **වරාදෙපිණැ**, සීන් වරා. 14 **එරවැගත් නැන්හි**, ඔබාගත් තන්හි. 21 **තුනිවුව**, තුනීවුවහොත්, 23 **හුණුදෙර**, "හුණගස වී." 36 **කුලදුසුකැමි නුඡු**, කුලදූෂක කම්මයෙන්ද, කුලදූෂක කර්මනම්:—කුලසංග්‍රහ පිණිස මල් ආදිය දීම හා ගිහීන්ගේ පනිවිඩගෙනයාම ආදී මනුෂ්‍යයන්ගේ ශ්‍රද්ධාව විනාශයට පමුණුවන අෂ්ටවිධ ක්‍රියායි.

50

1 **අශප සම්සනින්**, අනැප නියොගයෙන්. **නොබුදැම්වැ**, කනු නොකමැතිව. 5 **බිදැම්වැ**, කනු කැමැතිව. 6 **හුන් පැවිජ්ජා**, නිෂණ්ණ භික්‍ෂුවගේ. 7 **පැහුම් අස්නෙන්**, ආසනයෙහි පශ්චිමාන්ත යෙන්—"ආසනස්ස පච්ඡිමන්තතො පඨාය." **විළිම්න්**, පාෂ්ණි යෙන්. **හොත්**, නිපන්න 8 **මෙරැම් පසින්**, අතික් පාශ්වයෙන්. 9 **නබා**, හැර. **වැළැක් අගෙකින්**, සමීපවූ ශරීර අවයවයකින්. 11 **ඔටපා**, අධොපාදය. 12 **අමුරික්ළිඳු ආදිහි**, නොෂට වෘක්‍ෂ කූපාදියෙහි. "නොඛතරුකඛකූපාදිසු" යි සික්ඛාපදවළඡනපාඨයි. 18 **සරනල්ලෙන්**, මලාවෙන්, පැසෙන්. **ඇම්ස නැඟුසඳ**, ගත් වසි එළවූකල. 20 **අසුන්**, ආසනය. 21 **ගිලන්හට අවක්සා**, 'ගිලන්හට දෙනු පිණිස '' **නොකොවා**, විකොපනය නොකොට. 22 **කොවුව**, විකොපනය කළහොත්. 23 **බිදුයුතු**, බුදියයුතු, වැළඳිය යුතු. 24 **කෝල**, කදලීඵල, කෙසෙල්ගෙඩි. 32 **හු**, **සූප**.

51

13 **හිරිමැඳුම්නෙන්**, මධ්‍යාහනයෙන්., "හිරි මැදුම්තෙන් ඉකුත් සදප්වා යනුමෙන් හිරිමුදුනෙහි සිටිකල වැළඳිය හැකිබව කීවා වෙත්". 14 **සඳි**, කාලයයි. **සංඝාධිකාල**, "එක් අරුණකුදු ඉකුත්වුව." 28 **අනතිරික්පසයෙන්**, නැපනොකළ කාරණයෙන්.

52

1 **මෙරැම් තුන් කැල්ලන්**, අතික් තුන්කාලිකයන්. **දෙවැ**, ධොවනයකොට. 2 **නොකරකළ**, මෙන්කළ. **සමකට**, යාමයකට 6 **පුලුප්සකුරු**, පොල්සකුරු. 7 **විනයකිස නොහසල**, විනය කර්මයෙහි නුපුරුදුවූ "විනයකිරියව අපරිචිතෙ"යි සික්ඛාපද වළඡන පාඨයි. 9 **කුරුදමුවාහි**, කුරුන්දඅඨකථාහි. ලඞකාවීප යෙහි කුරුන්දිවෙලලිනම් විහාරයේදී ලියූ හෙයින් කුරුන්දි නම්

ලද අඤ්ඤතථාව. **කාල් ඉකුම්වූ,** "බොහෝකල් ගිය." 10 **පක,** පාකය. **නොපසැසිදු,** නොපිසුවද. 11 අයපකිලිශ්‍යැ, අතපපිය කුටියෙහි. 19 **ලග්නාගෙකක්,** "සාංඝික හෝ ලග්නානිසා නැගූ ගෙයක්" **සඟ,** සංඝයා. ඝදතාතිඉදවන **කෑමින්,** ඝදතත්දුතිය කම්යෙන්. **සමජීකම්,** සමමතකොළේ්කම්. **රූකල බිම,** 'සමකොට තැනූ බිම." **පලමුපිහිටිවන... උළුගෙ,** "යනුවෙන් තලවුවෙහි ගැලෙන උළු නොගෙන හිටෙහියට පලමු පිහිටුවූ උළුගතයුතු. මෙම තැනා "රූ කල බිමැ"හි යුහු." 22 **බොහෝ භික්සගුන් අත්ලා,** බොහෝ භික්ෂු සංඝයා අත්ගසා. 24 **බොහොඩුසෙන් පිරිබෙවු නොකෙළෙහි එවු,** "සතර කොටසින් තුන්කොටසක් පවුරු ආදීන් පරික්ෂිපත නොකෙළහි වේවයි." 25 **අරමිහි,** සංඝාරාමයෙහි. **ලග්නම,** ලැගුම්ගෙය පිණිස. 26 **පැවිජ්ජන් නබා,** "මහලු පැවිජි සගුන් මුත්," භික්ෂූන් හැර. 31 **අනෙතාවුනු නම් නොවෙයි,** "අකැප කිළියෙහි ලැග්ගාතම් නොවෙයි." 32 **පැෂ්නෙ,** පචනය කරන ලදදේ, පිසූයේ. **අනෙතාපකා නම් නොවෙයි,** "අකැප කිළියෙහි පිසූයේ නම් නොවෙයි." 34 **සභසෙසය පොහොනා සෙනසුන්,** සබ්බවජ්ජනාදි සිවුවැදෑරුම් සෙනාසන.

53

2 **සාමපාකයේ,** තමන්විසින් පිසීමෙහි. 12 **පස් බෙහෙසද්,** පචභෙසජ්ජ, ගිතෙල් මී වෙඬුරු තෙල් සකුරු යන පසයි. 21 **ඕනාකුදු,** පතිතවන දෙයකුදු. 23 **ලුවින්,** සැත්දෙත්. 26 **පඝ ගුණු,** පාත්‍රයෙහි වැටුණු දෑ. 27 **සැනාදීන්,** ශස්ත්‍රආදියෙන්. 28 **මලපත්නෙ,** මලකඩ වැටුණේ. 29 **අපිළිගතුවෙ,** අප්පටිග්ගහිතවේ. 30 **සතිවාරයේ,** වැසිඇතිකල්හි. 'ඇති දියෙහි' **මෙන්** මෙයද 'ඇති වාරයේ"සී ගතයුතුදැයි විමසිය යුතුයි.

54

4 **අපිළිගතුව,** නොපිළිගත් දෑය. 10 **රෙණ්,** රේණු. 11 **අල්ලේ,** දෙවන දවස්, පසුවද. 12 **තෙල මුකුණු,** තෙල හා සොවූ. **සෙද,** සෙවදජලය, දහඩිය. **කාරුදු,** කරිස, අහරමල. 14 **දමු,** දගබහකන, දමුතඩ. 16 **පූ,** පූප. 17 **කලත්,** කුලත්, කොල්ලු. **සාහන,** සාධනයට යොග්‍යවූ. 18 **පක්මස්,** පිසූ මාංශ. 19 **පනු,** පානය, පැන්. 20 **පැන්නි,** පානයයි. 21 **මිදු ඉසි,** මිදිපලින් පරකාගත් දිය. 22 **පැන්පවස්සනුමජු,** පැන් පිපාසාවමද. 23 **පණසපක්,** කොස්ගෙඩි, 24 **නවමාළුල,** නව

මහාඵල—තල්, පොල්, කොස්, දෙල්, ලබු, කොමඬු, පුසුල්, තියඹරු, කැකිරි යන මේ නවයයි. 26 **ගිනියේ,** ගින්නෙහි. 30 **නොසහන,** නොහැකිවූ. 33 **ජටාබද්දක්සමජු,** ජටාබැඳි තැනැත්තෙකුටද.

**55**

5 **දෙනම්නිස් මාගමක හා,** ජීවත්වන මනුෂ්‍ය ස්ත්‍රියක හා. 9 **අඳුන්,** අඳනා සිවුර. 13 **රහමෙර,** සුරාමෙරය. "රහමෙරනම් කවරයත්—පිෂ්ටාදින් කළ මජ්ජය රා නම්. පුෂ්පාදීන් කරනලද ආසවතෙම මෙරනම් ආසවනම් බොහෝකලක් තුබූයේයි." 14 **නොරහ රහසැඩි,** අමද්‍යය මද්‍යයයි. **බෝඑවු,** බොන්නෝ හෝ. **වෙසි නොවෙඩි,** මද්‍යයද අමද්‍යයදැයි වෙමතිකව. 15 **සුන්,** "අරිෂ්ට. අරිෂ්ටනම් අරළු ඇඹුලුආදි රසයෙන් කළ ආසවයයි." **වාසි තකා,** සුවඳගන්වන පිණිස. **සූ,** "උඳු මුං ආදීන් කළ සූපය." **ලොණසොවීර,** "සියලු ශෂ්‍ය ඵලාදීන්හා සියලු බෙහෙත් ධාන්‍ය පාකයෙහි පිස සියලුරොගයට වළඳනා එක් භෙසජ්ජයෙකි." 24 **බොලපින්,** ගොප්ඇටයෙන්. **කුමුදුනා,** නිමගනවීම, ගිලීම. 25 **හැඹිසෙහි,** යාගුයෙහි, කැඳෙහි. 27 **සිනානආදි කරුණෙණින්,** ස්නානයකිරීම්ආදි කාරණයෙන්. 30 **නිහරසර සිතින්,** අගෞරව කළපනාවෙන්. 31 **සෙසු සමකින්,** "අපපිවජ සන්තුඬ සලෙලබාදියට [අනුරූපව] නොපවත්තියි යනාදි විසින් අවමාදකළ ධර්මයෙන්." 32 **නොසරුප්කොට වැටෙයි,** (ශ්‍රමණ) සාරූප්‍ය නොවන පරිද්දෙන් පවතී.

**56**

1 **බවකරිසින්,** භයගන්වනු කැමැත්තෙන්. 2 **බතුජු,** භයවූවද. 5 **වහල්වන,** උපකාරවන. 10 **දැවු අගුරු,** "කාලගුරු," 11 **පිළියෙළ කළා,** "සැපයූවා." 16 **කිදිනද,** සුවිසරය. 21 **නොසෙස් තුඹුවාක්,** "නුසුදුසු තැන තුඹු දෙයක්." 23 **තිරිසන්ගිස,** තිරශ්චින ගතික. 22 **කොසුක,** නොසිඳුණ හොත්.

**57**

14 **ඇ සසැදිලි නැත,** "ඇ විසින් බැණගැන්මක් නැත හොත්." **පැවිජ්ජෝ මතු,** භික්ෂුහු පමණක්. 19 **මිස්සැඹිවැ,** මිදෙනු කැමැතිව. 24 **බුනජු,** බිඳුණත් 31 **ලහු ඇවැතෙක් නිජු,** ලහුකාපත්තියකිනුත්. **මිසදිට්ඨසෙනුජු,** මිථ්‍යාදෘෂ්ටියෙනුත්.

**58**

1 **උනුවිස්සේ,** විසිඅවුරුද්දකින් අඩුවයස්හි. 2 **කුකුස් උපසා නම්,** සැකඋපදවානම්. 15 **වටනෙසැසි,** යහපතැයි. 18 **මහ**

සෑ නවාමට, මහාචෛත්‍යයෙහි නවකර්මාන්තයට. 25 කඩිනක් හට, කවරකුහට. 30 ගම්වජ්ජනා, ගමට වදනා. ඇවිස්ලී, ආපුච්ඡනා. නොඇවිසෑ, ආපුච්ඡනානොකොට, නොදන්වා. 31 පිරිබෙව්වට නිසි තන්, "ගම්කෙළවර ඝරවාරයෙහි සිට බල මැදුම් පිරිමියක්හු ගැසූ ගලක් හෙන පමණ තැන්. දියහෙළ මෙන් ඇතුළත ඝර නම්වෙයි. මාගමක ගෙයි සිට පියවින් දමාලූ කුලුමොහොල් හෙන තැන් ඝරූපචාර නම්වෙයි සුපටිච්ඡන්න ශික්ෂාපදයෙහිමුත් මෙහි ගාමූපචාරයෙහි නිරවැතියි. යමකී ලකුණුඇති ඝරූපචාරයෙහි සිට ගැසූ ගලක් හෙන තැන් 'ගම්' නම්වෙයි. එතැන්හි සිට ගැසූ ගලක් හෙන තැන් "ගාමූපචාර" නම්වෙයි".

59

1 කුලගෙන්, කුලඝරයෙන්, කුලගෙයින්. දහම්සනින්, "භොජන ශාලායෙන්; ආසන ශාලායෙන්". 2 බිහිගමින්, ගමින් පිටතසිට. 3 ධුරනිබෙව්ෂාකොට, "උත්සාහ තබා නොපියා." 4 එසිතසි, "එතෙක් පමණසි." 10 අරම්, පුෂ්පාරාම ඵලාරාම. අරම්වත, පුෂ්පාරාම ඵලාරාම කරන්නට නිසි බිම්. 13 ලොහොපැණ, "මහත්වූ මුවවිටිඇති බොහෝ දිය ගන්නා මහසැලයි." ලොහොපණා, ලොහවාරක, ලොහඝට. ලොහොකටාර, ලොහකටාහ. 16 දරමුවා, දණ්ඩෙන් කළ. 17 මාම්ස කොදූයි, මාහැර කවුරුදූයි. 20 පලින් උකු, පාදයකට අඩු වටිනාකම් ඇති. 26 තිත්ථියපක්කන්තපරිජී, තීර්ථක ලබ්ධිය ගැන්මෙන් වත පාරාජිකා. කේල්වා පිළිජු, කෙහෙල් වැහිරියෙන් කළ පිළිද. එරුපත්පිළිජු, එරක වැහිරියෙන්කළ පිළිද.

60

2 කසා, හලිද්දි, කහා. තබා, හැර. මදට, මජ්ඡට, මදවිය. පිගොහොල්, තුගහාරනම් කටුඇති ගස් වෙසෙසක්. පිගොල් යසිද ව්‍යවහාරයි. 3 බෙහෙරපලා, තිලලීපත්‍ර, බේරුකොළ. කසාපලා, අලලීපත්‍ර, සිහින් කසා කොළ. 4 ලොජුසුබුළු, ලොත්ගස්හි පොතු. කඩුල් සුඹුළු, කඩොල්පොතු. 7 කසුජු, තැසපමද. නොහොත් කමුකද (අබසිගද). හිස් වෙළුජු, සීසවේඨන- "මුදුනෙන් උස් නොප්පියයි." 14 වත්ගිම්සුරණ්නිසා, "සවාමීන් පිණිස." 16 එකැතියෙන්, එකාන්තයෙන්. 18 බවස්ගෙහිජ, වැසිකිළියෙහිද. 22 පියෙන්, පාදුකාවෙන්. 24 නොතුසයෙන්, "දුක් හැම්මිය නොහෙන හෙයින්," ඉවසිය නොහැකිවීමෙන්. උපහආව, ජීවිතව. 26 ඕහුරුඇති, "සහුන් ඇති," සිදුරුඇති.

## 61

3-5 "**රාජන්තරායනම්,** භික්ෂූන් පොහෝ කරම්හයි රැස්ව හුන්කල්හි රජ ආයේ වීනම් මේ රාජන්තරායනම්. **චොරන්තරාය** නම් පොහො කරම්හයි හුන් තැනට සොරහු අවුනම් මේ චොරන්තරායනම්. **අග්ගිඅන්තරාය** නම් සෙනාසනය ගිනි ගත් නම් මේ අග්නි අන්තරායනම්. **උදකඅන්තරාය** නම් පොහො කරම්හයි හුන් තැනට වතුරු ආයේනම් හෝ වැසි නැඟී නම් හෝ මේ උදකාන්තරායනම්. **මනුස්සන්තරාය** නම් බොහෝ මිනිස්සු අවුනම් මෙ මනුස්සාන්තරායනම්. **අමනුස්සන්තරාය** නම් භික්ෂූහු යකෙකු ගත මේ අමනුස්සාන්තරායනම්. **වාලන්තරාය** නම් පොහොකරම්හයි හුන් තැනට ව්‍යාඝ්‍රාදිවූ චණ්ඩමෘගයෝ අවුනම් මේ වාලාන්තරාය නම්. **සිරිංසපන්තරාය** නම් භික්ෂූන් සර්පාදීහු දෂ්ටකොළෝ නම් මේ සිරිංසපාන්තරාය නම්. **ජීවිතන්තරාය** නම් මහණ ගිලන්වීනම් හෝ මළනම් හෝ මරනු කැමැතිව ගනිත්නම් හෝ මේ ජීවිතාන්තරායනම්. **බ්‍රහ්මචරියන්තරාය**නම් මිනිස්සු එක් භික්ෂුවක්හෝ බොහෝ භික්ෂූන්හෝ බ්‍රහ්මචරියාවෙන් මුතකරනු කැමැතිව ගනිත්නම් මේ බ්‍රහ්මචරියාන්තරායනම්." 7 **ඡන්දාසුද්ධිංනොආහරවා,** "ආපුච්ඡානොකොට." 26 **හත්මෙ,** හස්තයම ( ? ). 31 **වහපිටිවැනි,** රත්වැයන්ගේ පිට බඳුවූ. මහවග චම්මක්ඛන්ධකයෙහි අකැප වහන් පිළිබඳ ශික්ෂාවෙහි "සබ්බ මහාරඞ්ගරත්තා උපාහනායො" යන පෙළට ලී අටුවායෙහි "මහාරඞ්ගරත්තා සතපදීපිට්ඨිකවණ්ණා"සීද කුදුසිඛ සන්නයෙහි "මහාරඞ්ග, රත්වායන් පිට පැහැසේ" සීද පැනේ.

## 62

1 **තිත්ථිවටුපතිය්,** "තිත්වටුවන්ගේ පතින්," 2 **භගුසුදුසු,** අංබඳුවූ. 5 **මස්වා,** උද්දය, දියබල්ලය. 6 **දෙමහවුලෙහි,** දෙඇළයෙහි. **කුඹුසුකැඟුම්,**හෝනුසුතඟුව. 7 **අධරනම්,** "වැළඳගනීනම්." 11 **කඤු,** කාංචුක, කෙසිපහිය. 22 **විලි,** වළි, රැලි. 24 **ඉකුත්,** අතික්‍රාන්තවූ, අධිකවූ. 25 **සමසිරි,** සමශ්‍රවූ, සමාන පැතිඇති. 31 **ඇරැ ඹිඳුවූ** බැළරු, "ශෙතභිදුවූ ව්‍යාඝ්‍රරූප, කපා තොරතොකොට එම දණ්ඩහිම තෙලා තීමවූ ව්‍යාඝ්‍රරූප." 32 **පලකි,** පලංකයකි. 33 **හෙළු ලොම්මුවා,** සුදු එළුලොමයෙන් කළ.

## 63

3 **වලරු,** ව්‍යාලරූප. **එක්පස්සි,** එක්පිටෙක. 6 **අවන් මහ ඇතිරිසි,** "විශාලවූ මහත් ඇතිරිසි". 11 **හිවා,** සිබ්බනයකොට, මසා. 16 **රත්කන්වැනි,** රතුකොට්ටයි. 17 **ඕකා,** අංසන. 18 **ධමස්සෙහිජු,** ධර්මාසනයෙහිත්. 20 **මොහෝරු** අ.ඳ **මොහෝරුපුමු,** මකරරූපයුක්තවූ ඇඳ පුටු, "වෙච්චලීත් වී කැඳ පුටු." 23 **බිහිජු,** හිසිද. 25 **නානා සංවැස්සා,** (ලබති) නානාසං

වාසකයා. 26 **පිරිවෙස් පුරණ්නෙයැ**, "සඟ වෙසෙසට ඇවද පබ්බජ්ජනකොට පබ්බජනකලතාක්කල් ගණතින් වත් පුරන් නේය." 27 **මානත්තාරහසැ**, "යට කිසෙයින් වත් පුරන්නේ තුබූවත් ඇතිව සරුයක් මනත් පුරන්ට නිසිව සිටියේය". **මානත්තචාරීසැ**, "සඟ වෙසෙස් සඟවා වත්පුරා සරුයක් මනත් පුරමින් සිටියේ හෝ සඟ වෙසෙස නොසඟවා සරුයක් මනත් පුරමින් සිටියේහෝයි." **මූලාය පටිකස්සනාරහසැ**, "වත් පුරමින්සිට අතුරෙහි එම සඟවෙසෙසට හෝ අතික්සඟවෙසෙසට හෝ අවන්නේයි. එයින් පිරුතාක් වත් නැතිව නැවත නැවත මුලට අවදනාව නිසිව සිටියේයි". 28 **අබ්භානාරහසැ**, "පිරිවෙස් මනත් නිමවා අවන් ඇවැතින් නගාගන්ට නිසිවූයේය." **දික්බූහස්ණේ**, දීඝාසනයෙහි— "යටත්පිරිසෙයින් තුන්දෙනකු අසරමිනිය ගසාලා හින්දහැකි ආසනයෙහි. මෙහි 'ගස්න' නම් කලාලපැදුරු ආදියයි.'

64

12 **මල් පූජ්නා**, මල් පිපෙන. 13 **රුවා**, රුපණය කරවා. 15 **සෙවලල්නිසා**, ඡායාවලය සඳහා, සෙවණ පිණිස. 17 **පිසිඳැ**, ප්‍රව්‍රජිතනකොට, බිඳ. 19 **ඔවත්**, සිවනය සාරත්හොත්. **රුපු**, රොපිතවූ. 23 **තුවමුසෙන්**, වණටයෙන්, නැවියෙන්. 27 **කඳුරුමල**, "හිදි ගුසමල්." 28 **මල්කඩ**, "මල්වැටි". 30 **පටන් කෙලවර**, ආදි කෙළවර.

65

3 **පිවිමුවා**, "පිවියෙන් කෙළේයි". **කඳමුවා**, "කදමැවියෙන් කළේයි." **බෙඩුමුවා**, "සිරිදඬෙන් කෙළේයි." සිබවලඳවිනිස පොත්හි "බෙරමුවා" යී පැනේ. 6 **මලා මල් මෙහෙසා එවූ**, "මල්නැවියෙන් මල්පෙත්තේ සිදුරෙක ප්‍රවෙශකෙරෙ නම්වේවයි." 7 **ධම්රෙජ්අතුරෙහි**, ධම්මරජ්ජුයෙහි. **චෛත්‍යය හෝ බොධිය මල්මෙහෙයනු** සඳහා විද බඳනාලද **ලණුව ධම්ම රජ්ජු නම්**. 16 **එක්විසි අනෙසුනෙන්**, එකවිංශති අනෙවෂණයෙන් 25 **විලිකුන්**, ඉදුණු. 58 **සිත්දිය**, ශීතජලය. 30 **හුවා**, උස්කොට. 31 **ලාමකවැ**, නීචව, පහත් ස්ථානයෙහි තබා. **වැමෙනා**, පවත්නා. 32 **නතු**, තත්වය, "සබාතෙපුල්." **අඹුලු**, බොරු, අමුලකවවන. 33 **කිරිදූසකසෙයින්**, ධාත්‍රියකමෙන්, දරුවන් කිරිපොවන දෑගියක්මෙන්. 34 **ඔරලන**, උරයෙහි තබාගන්නා. **ඇදූරීම්**, ආදරකිරීම්

## 66

**4 කමානිසු නොනිසු නිවහල්ලහ,** තමාතිසා රැකෙන නොහොත් තමාඋන්තැනට පැමිණි අනාථයෝය. 12 **අගපස ගහි,** අංගප්‍රත්‍යංගයෙහි. 14 **පසජ්,** ප්‍රත්‍යයද. 18 **අපිස්සතොස් බඳුවැ,** අල්පෙච්ඡ සන්තුෂ්ටියෙන් යුක්තවූවක්හුමෙන්. 19 **මනාපස,** යහපත්වූ ප්‍රත්‍යය. 22 **ඉරියවු පැවැතුම්,** ගමනාදි ඉරියවු පැවැත්වීම. 25 **කා විසින්,** කයින්හා වචනයෙන්. 31 **නිසපිළිබැඳිව,** නිශ්‍රයමුක්තනොව. 34 **අරුත්හා බැඳුණ්සහිතකොට,** "අර්ථහාව්‍යඤ්ජන හා එක්කොට–අර්ථනම් අටුවායි, ව්‍යඤ්ජනනම් පාලියි." **දෙමා,** උභයමාතෘකා, භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂවය. 35 **සුනතින්,** සූත්‍රාන්තයෙන්, සූත්‍රපිටකයෙන්. **සපත්නානට,** පැමිණියවුන්ට. 36 **අනුමොවුනාම,** අනුමෝදනා කිරීම පිණිස.

## 67

2 **කමාකම්විනිසයුජ්,** කර්මාකර්මවිනිශ්චයත්, "පරිවාර පොත් අන්තයෙහි කියනලද අපලෝකන කර්මාදි චතුර්විධ කර්ම විනිශ්චයයි." **මහණුවම්කරන්නට,** "භාවනාකරන්නටයයි සේයි." 3 **කමටහනකුජ්,** කර්මස්ථාන භාවනාවකුත්. **නම්රූවිනිසයිජ්,** නාමරූප විභාගයත්. 4 **සැලජ්,** "දූනදූන ඇවැත් නොඇවජීම් ආදිවිසින් ලජ්ජාසම්පන්නවූ." 6 **උභනොවිභංග,** පරිජී පචිති දෙපොත, 8 **පොත් සගා නොඅරු ගිසකැ,** පොත් සංගායනා නොකළකල. වළගම්අබාරජහුකල අටුවාසහිත තුන්පිටකය අලූලෙණදී පුස්තකාරූඪකරනලදි. 12 **අඤ්ජලිපගෙනැ,** ඇඳිලි බැඳගෙන. 16 **පිළිපසජ්වේ,** ප්‍රතිප්‍රශ්‍රබ්ධියවේ. 24 **වෙහෙන්,** "භික්ෂූන් අනුභවකරන ගෙයින්." 31 **අනවැසිසිහිනට,** "අන්තෙවාසික සද්ධිවිහාරික දෙදෙනාහට." 33 **සමසකුඳු,** ෂට්මාසයක්වුවත්. "මාසමත්තං'සි සික්ඛාපද වලජ්ජ පාඨයි. **කමවන්නට,** ක්ෂමාකරගැනිම පිණිස.

## 68

4 **මහණුන්නිසා වසන්නාහටජු,** "භික්ෂූන්ගේ සියලු කටයුතු කොට භික්ෂූන්නිසා වසන්නාහටද." 12 **දොරබලායි ව ාපිළිපසා,** "දොරබලවයි නොකියා." 20 **සිණරොදු ආදි අවුස් බඩුදු,** "වීණා ආදි හෙරි භාණ්ඩද." **24 කම්සන් ඕසාසඳ,** නියොගකරන කල්හි.

## 69

1 **අතුරු,** ආභරණ. 2 **නොනොරා,** වෙන්නොනොම, නොබෙදා. 6 **සැනපිසඳ** "අහර වැළඳූකල්හි." 8 **ගනු,** ගීතිම.

11 **බණමුසුගිජු**, ධම්යෙන් යුක්තවූ ගීතිකාද. ආයසීයන්ගේ පරිනිර්වාණ කාලයෙහි රත්නත්‍රය ගුණ සංයුක්තවූ සාධු ජනයන්ගේ ක්‍රීඩා ගීතිකාහෝ අසංයත භික්ෂූන්ගේ ධම්මභාණක ගීහෝ ධම්මයුක්ත ගීත නම්. **දිසබොකු අශොභාසිජු**, දියබුක් ගැසීමද. "උදක සඥ තරණම්පි වාදිතං" යනු සික්ඛාපදවලඤ්ජන පාඨයි. **ආසඳශෙකින්**, අන්තරායකින්. 21 **භසර්‍ඇතිකෑෂෑ**, සංවරණස්ථානයෙහි.

70

1 **නෙරපූ**, රෙපනය නොකල "නිරප්පු" සීද පාඨයි. **නැහෑ වියත්සෙසින්**, නෑමාපිතයන් සෙයින්, සාරතෑවෑමිගන් සෙයින්. 31 **කරඬුවම් ආදිතෑන්**, සුඹුබදම් ආදීන්. 32 **පිඟැල්ලක්**, රෙදිකඩක්.

71

1 **රමා ඇතිකොට නැතිකොට කාලපම්**, "හිදිපත් රමා හෝ මස්කටු රමා හෝ ඇතිකොට වේවයි හැඳපටාදීන් සෙයින් රමා නැතිකොට වේවයි ගැසූ පටි." 2 **දුනුකාසු සුදුසු**, දුනුපසිසෙයින් සිදුරු ඇති. 3 **රෙදු**, රජ්ජු, වැල. 5 **බරණාගිස් සුදුසු** දියබරණුන්ගේ හිස්වැනි. 6 **මල**, පාස. 7 **සිඝාලේසි**, වෙලතලද්දේසි. 19 **කොකුනි**, "යුක්තිනොවෙයි." 23 **දියුණුගු**, විගුණසූත්‍ර. 25 **රවුළුදක්**, රුවණදත්ත, රකබසදාත. 26 **දහකුරුෑගුලා වැලෑන්**, දසාමූබසම්පයෙහි. 33 **උච්චාවචා විවූ අධරක්නෙන්**, "මාහැගි විටු වැලඳගන්නා හෙයින්" 35 **වරා**, වලකා

72

5 **නන්ස්**, නානත්වය. 7 **කොලිඝසුතු බැවින්**, කොටියසුතු හෙයින්. **මලක්**, පාසාන්තය. ‥14 **කොරකු ෑ**, විශෙෂය, නානත්වය. 22 **උත්තර බැවින්**, පශ්චිම හෙයින්, පසුබැවින්.

73

4 **විටසී ගමක්**, "විට පමු නොවටතියි භගවත්හොත්." 5 **අවුනන අපපම්ශෙගී පරාමාස වන බැවින්**, "නොකියනලද අප්‍රතිපක්ෂවූවහුගේ ගැන්මවන බැවින්." 13 **අටමඟලා**, අෂ්ට මඞ්ගල (රූප). අෂ්ටමඞ්ගල වස්තු නම්:-ශඞ්ඛය, චක්‍රය, පූර්ණකලසය, ගදාවය, ශ්‍රී වත්සය, අංකුශය, ධවජය, ස්වස්තිකය යන අටයි. 14 **මඟුල් ආකෘතිදු**, "මඟුල් සැමිද." 19 **සතපජනා සඩිතුජ**, වලඳනා පාත්‍රයෙන්ද. 22 **සනජනූදු**, වලඳක්හොත්, අනුනවකරත් හොත්. 24 **නොවටනාබැව්**, සාරූප්‍ය නොවනබව්, අකැපබව.

74

1 **වසාවක්නෝස**, වාසයකරන්නෝය. **මබෙහෙද් පිරිසස් නාදි ප්‍රභොජනශෙකින්වූ**, "බෙහෙත් සෙවීම්, ආහාර සෙවීම, ගිලානුපස්ථායකයන්ම ආහාර සෙවීම, උපස්ථාන කිරීම, යන ප්‍රයොජනයකින් වේවයි." **වෑන්නා දන්නාවමූ**, "පවත් විචාරන්ම වේවයි." **පසනුගමක්නිසා**, ප්‍රස්තුථ කාසයිකයක් සඳහා (?)

'පෙරුදු' 'වෙරෙදු' යනුත් පාඨයි. ගැටපදයෙහි 'පෙරුතු යමක් නිසා, ප්‍රයොජනයක්නිසා'යි පැනේ. විමසියයුතුයි. 18 **සෙනසුන් මහසෑ පිළිබැඳිකොට**, "සෙනාසන දාගැබ් යන මෙදෙක්හි කර්මාන්ත ප්‍රතිබද්ධකොට." 20 **වනකම්නිසා එවූ**, "පිරිවෙණ් පුරනු ආදි විනයකර්මනිසා එවුවයි." 21 **උකටලී**, **අනභිරතිය**, කලකිරීම. 25 **සමඟ වරද නොකියා**, "වහා වරද නොකියා." 34 **සොඬසොර**, "ධූර්තයන් හා රජදරුවෝයි."

75

23 **පොත්රූ**, පුත්තලීරූප, "ස්ත්‍රී පුරුෂ රූප." 24 **දහමු දහම්පියාවන්**, ජාතකට්ඨකථා ධම්මපදවස්තු 25 **බුදුනාදී**, බුද්ධරූපාදිය. 35 **දවසෙන්**, කෙළියෙන්.

76

2 **අවෙන්වා**, ආදීනව. 6 **අන්නට වෙහෙසට වැටෙන**, **ශාස්ත්‍රද**, "මෙරමාහට හිංසාවට පවත්නාවූ භික්ෂූන්ට අනනුරූපවූ නිමිත්තාදී ශාස්ත්‍රද." 14 **හිරවන් හගලවන් ලූපන්**, "දෙපත දෙඅඟ එක්කොට හිරත්ලා කළ පති." 17 **ඉස්වූපා**, "අංසවට්ටයෙන් යුක්තවූ පසියෙහිලූ පාත්‍රයයි, අංසවට්ටනම් පාත්‍රාපටියයි." **දනලා**, දසරියෙහිලා. **කඳමලා**, බන්ධයෙහිලා 22 **රද**, රජස්, ධූලි. 26 **හෝනා කසුආදී එක්බැඳිකොට**, "හැඳඇතිරිලි හා පාත්‍රාපසියලා හෝ පටියලා හෝ එකාබද්ධකොට." 27 **හවුකොට්තුඹු හැඳ පුවු වල්මග්සෝ**, "හැඳපුටු ආදියෙහි තුඹු පා නොහෙනසේ වල්මුදුනෙහි වටා වියළගැසූව හැඳපුටුඅටුනම් —ඒමත්තෙහි." 28 **ඔර**, ඇතයෙහි. **පත්තී**, පාත්‍රාපසිය. **අස්වදු**, අංසවට්ටය. 31 **සත්ගි**, ඡත්‍රයෙහි 32 **නිසවත්තෙහි**, "පරිමණ්ඩලයෙහි." 35 **පිළත්තෙහිදු**, වෙදිකාවෙහිද.

77

8 **පිළිවහණ**, දැවාණමයවූ, සළුපිතමයවූ. **කස**, කංසලොහමයවූ. 26 **ගොටුසෙයින්**, සණ්ටාසෙයින්, මිණිගෙඩිමෙන්. **වම් දතින්**, වාමජත්‍රුයෙන්, වාමාංශකූටයෙන්. 29 **අතුරුසෙරෙහි**, අන්තරඝරයෙහි, "ගම්අතුරෙහි." 30 **බිඳෑ**, අනුභවකොට, කාබී. **ලන්නා තැනි**, වසන තැනයි.

78

18 **පිඬුවා**, පිණ්ඩපාත. 28 **කෙපුල් සාමසැදෙසෙන්**, වචන සාමාන්‍යයෙන්. 28 **අසප තිල්ලෙහිදු**, අතැප බිසිආදියෙහිද. **නොවිමැසූ අස්නෙහිද**, "අත් ආදි ඔබා පරීක්ෂානොකළ ආසනයෙහිද."

79

9 **ඇස්සම්මිනිසකොට**, "ඇස් යට බලා නොහෙළා." 11 **එක්දනඑවු**, එක් ජත්‍රැයෙක හෝ, එක් දසරුවෙක හෝ. 15 **කාඑවු**, කය හෝ 16 **එකුකුළෙ**, එක්කටියෙහි. 17 **වටම්පි වක්කොට**, වැළම්ට නමා. 19 **අක්පසින්**, පාදග්‍රයෙන්. **කොළින්**, සෘජු ගාත්‍රයෙන්. 23 **වාසූපගනාසහට**, වාසයපිණිස එළඹියහුට. 27 **සකස් නැතිසාව**, "සිහි නොඑළවා." 29 **ඉහිපිකොට**, අඩිකනොට. **හු**, සූප, "උඳු මූං කලතින් කළ කොමු" 30 **අන්**, අන්න, බත්.

80

25 **වටවන් නොකොට**, පරිමණ්ඩල නොකොට. 26 **වරිනම්**, විවෘතකෙරේනම්. 27 **සරුසි**, සාරුප්‍යයි, සුදුසුයි. 28 **හලා**, ප්‍රක්ෂෙපකොට, බහා 29 **පිඩු යනාන සැඳෑ**, පිණ්ඩය (මුඛයට) ප්‍රවේශකරනකල්හි

81

3 **කබල**, ආහාරය, තනද. 5 **වඳුරැ සූඹුකුකොට**, වඳුරකු මෙන් ආහාරය හකුවෙහි තබාගෙන. 11 **සජ්පැහැරැ**, චපුචපුහා, තලු ගසගසා. 14 **කිරිපායස්**, ක්ෂීරපායස, කිරිබත්. 22 **සන්ගන්**, කුඩගත්. 25 **කොල්**, සජී. 31 **සාදුකා**, මරවැඩි.

82

2 **සැකිළු**, වක්‍රයද. 3 **බට**, පහත්වුවහොත්, මිපිවුවහොත්, 10 **කෙසන්**, කෙශාන්නය. **පිළිවුමුහු**, දුඃසමෙවයත. 13 **වරුවා**, විවෘතකරවා.

83

2 **ඉල්වනඤද**, සොයනකල. **ශනාඉසයෙන්**, "නොකැමැති පරිද්දෙන්." 10 **බඩැඊසිසයෙන්**, "ගෙ බලන්නක්හු සෙයින්." 11 **සගවානම්**, පරිසාමනය කෙරේනම්. 15 **පී**, කළ. 19 **සිල් කැමි**, "ශික්‍ෂාකාමීවූ." 21 **පියැවින්**, ප්‍රකෘතියෙන්. 28 **දූහැවි කොස් පියා**, "දූහැවිකෑ මල හැර." 28 **සිවු**, ඡවි. 30 **ගෙපිරීසෙ හමදනේ**, "ගෙහි තිසවත්න සිසාරු හමදනෙයි."

84

2 **නෑහැවිසද**, නහනුකැමතිකල්හි. 13 **බිසිගමුදු**, ගමින් පිටතමද. සික්ඛාපදවළජනයෙහි "බහිසීමං"යි පැනේ. **ඇවිසෑ**, ආපුච්ඡානොම. 20 **පැන්කෙවැ**, පානීය සොණ්ඩියෙහි. 21 **නෑනෑ මුවන්**, ආවාසිකයන්. 26 **ගම් පැවිජ්ජා**, ගමික භික්ෂුව, "තමා හුන් වෙහෙරින් අනික් වෙහෙරකට එළඹෙනු කැමැති භික්ෂුව.

## 85

11 **සඞ්ඝිපොහො**, චාතුද්දසී පොහොය, තුදුස්වක් කරන පොහොය. 13 **සුත්තුද්දෙස**, "නිදානුද්දෙසය, පාරාජිකුද්දෙසය, සංඝාදිසෙස උද්දෙසය, අනියතුද්දෙසය, විත්ථාරුද්දෙසය යන මේ පස්වැදෑරුම්වූ පාමොක් උදෙසියි." 21 **ඤත්තිදෙවන සතරවන කැමැ**, ඤත්තිදුතිය ඤත්තිචතුත්ථ කම්මයෙහි. 29 **සඟුන්**, නවකයන්. 3) **මහණමෑණෙස්**, භික්ෂුමාතෘකාවෙහි, භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි.

## 86

5 **මුළුවුම්හ**, රැස්වීමු. 6 **දහමා**, සවාමිනි. **මාගඞිසගවූ**, භික්ෂුනීසඞ්ඝයා. 7 **ඔවා එළැඹිමක්** "අවවාද පිණිස තමාගේ ඒමක්." 9 **පොහොඅග්ගි**, උපොසථඝරයෙහි, පොහෝගෙහි. 10 **සාරන**, සාරා. **සන්නෙ**, කියන්නෝය, කියයුතුයි.

# පරිශිෂ්ට සංග්‍රහය.

## 12

12—19 "සම්මජ්ජනී පදීපො ච" යනාදී පූර්වකරණ පූර්වකෘත්‍ය දක්වන ගාථාත්‍රය සමන්තපාසාදිකා විනය අටුවාවෙන් උපුටා ගන්නා ලද්දේයි. ඒ ගාථාවල අර්ථ මෙසේයි:—

**සම්මජ්ජනී,** හැමදීම(ද); **පදීපො ච,** පහන්දැල්වීමද, **ආසනෙන උදකං ච,** අසුන් පැනවීම හා (පානීය පරිභොජනීය)පැන් තැබීමද යන; **එතානි,** මේ සතරවත්. **උපොසථස්ස,** පෞෂථ කම් යට; **පුබ්බකරණන්ති,** පූර්වකරණයයි; **වුච්චති,** කියනු ලැබේ.

**ඡන්දපාරිසුද්ධි,** ඡන්දය හා පාරිශුද්ධිය (ගෙනඊමය); **උතුක්ඛානං,** ඍතු කීමය; **භික්ඛුගණනා,** (රැස්වූ භික්ෂූන් මෙපමණ යයි) ගණන කීමය; **ඔවාදො,** (භික්ෂුණීන්ට) අවවාද කිරීමය (යන); **එතානි,** මේ වත්පස; **උපොසථස්ස,** පොහෝ කිරීමට; **පුබ්බකිච්චන්ති,** පූර්වකෘත්‍යයයි; **වුච්චති,** කියනුලැබේ.

**උපොසථො,** (තුදුස්වක් පසළොස්වක් සමගි යන තුන් පොහෝයන් අතුරෙන් අද) එක් පෝයක් වීමය; **යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා,** යම් පමණ භික්ෂූහු ඒ පොහෝ කර්මයට පැමිණියාහු නම් යටත් පිරිසෙයින් සතරනමක්වූ සිල්වත්වූ සංඝයා විසින් අනුඥාතවූ ඔව්හු අත්පස නොහැර එක සීමාවක සිටින්ය යන බවය; **සභාගාපත්තියො ච න විජ්ජන්ති,** ඒ භික්ෂූන් අතර සභාගාපත්තිකයෝ නොවෙත් නම් එයද; **වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති,** අත්පසින් බැහැර ලියයුතු ගිහිය, මෙහෙණිය යනාදී එක්විසි පුද්ගලයෝ එහි නොවෙත්ය (යන මේ සතරින්); **පත්තකල්ලන්ති වුච්චති,** සංඝයාගේ පොහෝ කර්මය ඇතුළත් වන හෙයින් පැමිණිකල් ඇත්තේයයි කියනු ලැබේ.

23—32 "දිනකාරකකතතබ්බා" යනාදී ගාථාපස විනය විනිශ්චයෙන් ගන්නා ලද්දේයි. අර්ථ මෙසේ දතයුතු:—

**ආදිච්චබන්ධුනා බුද්ධෙන,** සූර්යබන්ධුවූ බුදුන් විසින්; **දිනකාරකකතතබ්බා කාරණං තු වසාපන,** දිනය, කාරක පුද්ගලය,

කළයුතු ආකාරය වශයෙන් වනාහි; නවෙව උපොසථා වුත්තා, පොහෝ නවයක්ම වදාරන ලදහ.

චාතුද්දසො, තුදුස්වක් පෝය; පණ්ණරසො, පසළොස්වක් පෝය; සාමග්ගි උපොසථොච, සමගිපෝයද යන; එතෙ තයොපි උපොසථා, මේ පොහෝ තුනම; දිවසෙනෙව, දින වශයෙන්ම; නිද්දිට්ඨා, දක්වන ලදහ.

සඞ්ඝෙ උපොසථො චෙව, සංඝ උපොසථය; ගණෙ, ගණ උපොසථය; පුග්ගලූපොසථො, පුග්ගල උපොසථයයි; තයො උපොසථා, (මේ) තුන්පෝය; කාරකානංවසෙනෙව; පොහෝ කරන්නන්ගේ වශයෙන්ම; වුත්තා, වදාරන ලදහ.

සුත්තුද්දෙසාභිධානොච, සුත්තුද්දෙස නම්වූ නිදානොද්දෙසාදී පස්වැදෑරුම් පාමොක් දෙසීම්නම් සඟපෝය; පාරිසුද්ධි උපොසථො, පාරිශුද්ධිපොසථය; අධිට්ඨානොච ඉති, අධිට්ඨාන උපොසථයද යන; තයො උපොසථා, (මේ) පොහෝ තුන, කම්මෙන; කම්මවශයෙන්; නිද්දිට්ඨා, දක්වන ලදහ.

සත්ථුනාපන, ශාස්තෲන්වහන්සේ විසින්; පාතිමොක්ඛො, සුත්තුද්දෙස උපොසථය; සඞ්ඝස්ස, සංඝයා වශයෙන්ද; පාරිසුද්ධි, පාරිසුද්ධි උපොසථය, ගණස්ස, ගණයාගේ වශයෙන්ද; අථ, ඉක්බිති; අධිට්ඨානං, අධිට්ඨාන උපොසථය; එකස්ස, එක් පුද්ගලයක්හුගේ වශයෙන්ද; නිද්දිට්ඨං, දක්වනලදී.

14

4—11 "චාතුද්දසීපණ්ණරසී" යනාදී ගාථා සතරද විනයවිනිශ්චයෙන්ම * ගත්බැව්හැඟේ. අර්ථ මෙසේ දතයුතු.

චාතුද්දසී, තුදුස්වක් පවාරණය; පණ්ණරසී, පසළොස්වක් පවාරණය; සාමග්ගි පවාරණාච, සමගිපවාරණය; තෙවාචී, තෙවාචික පවාරණාය; ද්වෙ, ද්වෙවාචික පවාරණය; එකවාචීච, එකවාචික පවාරණය; සඞ්ඝෙ, සඞ්ඝයා විෂයෙහි පවාරණය; ගණපුග්ගලෙ, ගණයා විෂයෙහි හා පුද්ගලයා විෂයෙහි පවාරණයයි; එතා නව පවාරණාපන, මේ නවපවාරණාවෝ වනාහි; මුනින්දෙන, බුදුන් විසින්; වුත්තා, වදාරන ලදහ.

එකාවාසෙ, එක් ආවාසයෙක්හි; චත්තාරොවා, සතර නමක් හෝ; තයොපිවා, තුන් නමක් හෝ; වසන්තිචෙ, වෙසෙත් නම්; පුබ්බකිච්චං සමාපෙත්වා, පොහෝගෙහි පූර්ව කෘත්‍යය

* විනයවිනිශ්චයෙහි මේගාථා මීට වෙනස්ලෙස දක්වා තිබෙන බැව් සැලකිය යුතුයි.

නිමවා; **ඤත්තිං වත්වා**, ගණඤත්තිය කියා; **පවාරෙය්‍යුං**, පවාරණාකර්මය කරන්නාහුය; **ද්වෙ ජනා**, (එක් තැනෙක්හි) දෙනමක් වෙත්නම්; **ඤත්තිං විනා**, ගණඤත්තිය හැර (නොකියා); **අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යුං**, ඔවුනොවුන් පවරන්නාහුය; **එකොපි**, එක් නමක් වනාහි; **අධිට්ඨෙය්‍ය**, අධිෂ්ඨාන පවාරණ කර්මය කරන්නේය; **සෙසා**, ශේෂවූ පවාරණාතොමෝ; **සංඝපවාරණා**, සංඝපවාරණා නම් වන්නීය; **මුනිදෙසිතා**, බුදුන් විසින්; **එතා නව පවාරණා**, මේ නව පවාරණාවෝ; **වුත්තා**, වදාරන ලදහ.

16

6—8 **සකුණො**, පක්ෂිතෙම, (වඩිය); **රූපසම්පන්නො**, (මතු කියන) රූපයෙන් සම්පූර්ණවේ; **මනොරමා**, සිත් කළුවූ; **සිසා**, හිස් (සතු): **තීණි**, තුනක් වෙත්. **පාදානිචෙව**, පාදයෝද (මාසයෝ); **චාදස**, දෙළොසක් වෙත්; **පක්ඛානි**, පක්ෂපත්‍රයෝ (පක්ෂසංඛ්‍යාත උපොසථයෝ) **චතුවීසති**, සූවිස්සකි.

9—10 “වස්සූපගමනං චාපි” යන ගාථාවද විනයවිනිශ්චයෙහි පැනේ. එහි අර්ථ මෙසේයි:—

**වස්සූපගමනං**, වස් එළඹීම; **ජානං**, දනිමින්; **අනුපගච්ඡතොවාපි**, නොඑළඹෙන්නාහටද; **තෙමාසං අවසිත්වාන**, අධිෂ්ඨානකළ තුන්මස නොවැස; ***චරන්තස්සපි**, සැරිසරන්නාහටද; **දුක්කටං**, දුකුළාවේ.

11—12 **නයඤ්ඤුනො**, විනයක්‍රම දන්නෝ; **තිණ්ණන්නං උතූනං පන**, තුන් සෘතූන්ගේ; **තතියෙ සත්තමපක්ඛෙ**, තුන්වන සත්වන පක්ෂයෙහි (පෝයෙහි); **චාතුද්දසො ඉති**, තුදුස්වක් පෝයයි කියා; **පාතිමොක්ඛං උද්දිසන්ති**, පාමොක් උදෙසත්.

16 වැනි පිටේ පැනෙන “පොහෝ පවුරුණුවිනිස නිමි,, යන්නෙන් සිඛවළද අවසාන වූ ලෙස සැලකිය යුතුයි. බොහෝ පුස්කොළ පොත්වල “සකුණොරූප සම්පන්නො” යනාදී ගාථා තුන පැනේ. ඇතැම් පොත්වල සූවිසි පාරාජිකාදී තවත් කරුණුද අන්තර්ගතයි. ඒ මෙහි ඇතුළත් නොකෙළෙමු.

71

10 “**කායබන්ධනස්ස**, කාබාන්හුගේ; **දසා**, දෙදනත්හි; **ජීරන්ති**; දිරති” 11—12 “**භික්ඛවෙ**, සඟිනි, **මුරජංමද්දවීණං**, මුරජමද්දවීණාදෙක; **අනුජානාමි**, අනුදන්මි” 13—15 “**මුරජංමද්දවීණන්ති ඉදං**, මුරජය මද්දවීණාය යනමෙ; **දසාසුයෙව අනුඤ්ඤාතං**, දසයෙහිම අනුදන්නාලද; **එත්ථ**, මෙහිලා, **පාමංගදසාව**,

* විරතස්සාපි, වැලැක්කාහටද.

පමුසටහත් ඇති දැයද; **චතුන්නං උපරි නවට්ටති**, සතරින් වැඩියක් නොවටී ’෴17—18 “**පාමඞ්ග සන්ධානකංපන**, පමුසට හත් වනාහි; **එකම්පි නවට්ටති**, එතකුදු නොවටී”෴25—26 **උභොසු පස්ස අන්තෙසු**, පටියෙහි දෙකෙළවර; **දසාමුඛස්ස ථිර භාවාය**, දහතක් තරකරවන පිණිස; **දිගුණං සොවිබෙතුං වට්ටති**, දියුණු (කොළතත්කට) වටී ”෴ 30 “**පවනන්තෙනා**, පාසානනයෙෝ, ජිරන්ති, දිරති” 31 **අධිකරණි** සෙසින් “ප්‍රස්ථාවවූ පරිද්ඡෙදන්.” 33 “**භික්ඛවෙ**, සඟිනි; **උච්චාවචා විධා**, මහඇඟි විටුහු; **න ධාරෙතබ්බා**, වළඳනොගත යුතුනාහුයි; **සො**, **යම්** මහණෙක්; **ධාරෙය්‍ය**, වළඳගනීනම්; **ආපත්ති දුක්කටස්ස**, ඔහට දුකුළා ඇවැත් වන්නේය”෴

## 77

31—34 “**ගාමෙවා හොතු**, ගමමවේවයි; **විහාරෙවා හොතු** විහාරයේවේවයි; **මනුස්සානං පරිවෙසනට්ඨානං ගච්ඡන්තෙන**, මිනිසුන් වළඳන තැනට එළැඹෙනුවනු විසින්; **තිචීවරං පාරුපිත්වා**, තුන් සිවුරු හැඳැ පෙරවැ; **කායබන්ධනං බන්ධමෙව වට්ටතීති**, කබාන් [1] බැඳම වටනේයි; **අට්ඨකථාසු වුත්තං**, අටුවාහි කියනලදී.”෴

## 78

3-5 **අසඤ්චිච්ච**, සුපිළිසන්ව වැළඳගත්මියන සිත් ඇත්තාහටද; **අසතියා**, සිහිනැතිව මරදවා වැළඳගන්නා හටද; **අජානන්තස්ස**, සුපිළිසන් නොවනසෙ නොදන්නා හටද; **ගිලානස්ස**, ගිලන්හටද; **වාසූපගතස්ස**, ගිහිගෙය ලැගුම්පිණිස එළැඹියා හටද; **ආපදාසු**, චඩසතුවයන් විසින් ලුහුබඳනාදී ආපදයෙහිද, **උම්මත්තකස්ස**, පිත්කිපීම් ආදීවූ උන්මාද ඇත්තාහටද; **ඛිත්තචිත්තස්ස**, යකුන් විසින් මැඩකළ සිත් බෙවූ ඇත්තාහටද; **වෙදනට්ටස්ස**, බලවත් දුඃඛ වෙදනායෙන් ආතුරයා හටද; **ආදිකම්මිකස්ස**, ඒ ඒ සිඛපද විකුම්හි ආදීවූවාහටද.” 6 “**සමයෙ**, අච්ඡින්න චීවර නඨ චීවර සමයෙහිද, **ඤාතකානං පවාරිතානං**, නෑ පැවැරුවන් සිවුරු ජනවන්නා හටද; **අනාපත්ති**, ඇවැත්නැති. 8—13 **සො**, යමෙක්; **මය්හං ගෙහං පවාරෙමීති වදති**, මාගෙ ගෙන් පවරමියි කීයේනම්; **තස්ස ගෙහං ගන්ත්වා**, ඔවුන්ගේ ගෙට එළඹැ; **යථාසුඛං**, කැමැති පරිද්දෙන්—සුඛපරිද්දෙනැයි යේයි; **නිසී**

---

1 බඳනේම.

දිතබ්බං, සින්දුයුතු; නිපජ්ජිතබ්බං, හොතයුතු; න කිඤ්චිගහෙතබ්බං, අන් කිසිවක් නොවිනවියයුතු, යොපන, යමෙක් වනාහි; මඤ්චං ගෙහෙ, මාගෙ ගෙහි; සංඅජ්ජි, යමෙක් ඇද්ද; තං පවාරෙමීති වදති, එයින් පවරමි කියේවීනම්; තස්ස, එහි යං කප්පියං, යමෙක් කැපද; තං විස්සජ්ජෙතබ්බං, එ වීනවියයුතු; ගෙහෙපන, ගෙයි වනාහි; නිසීදිතුංවා හිඳීමෙක් වෙවයි; නිපජ්ජිතුංවා, හෙවීමෙක් වේවයි; කප්ලබ්භන්ති, නොලැබෙන්නෙයැයි; කුරුන්දියං, කුරුඳුටුවාගෙහි; වුත්තං, කියනලදී."෴
34 "කප්පියා කප්පිය විචාරණං ආගමම, කැප අකැප විචාරණයට පැමිණ; රුන්ධිතබ්බං, කැපදෙහො අකැපදෙහො සැක උපන්කල නොකොට වැලැකියයුත්තේය; ගාළ්හං කාතබ්බං, අකප්පිය පක්ෂය දැඩිකටයුත්තේය; *සොතං පච්ඡින්දිතබ්බං, කප්පියයයි †විනවාගැන්ම සිඳැපිය යුත්තේයි"෴

87

රිදීවිහාරෙන් ලැබුණු පැරණි පුස්කොළ පොතේ සිබවලද විනිස අවසානයෙහි ගීයක් පැනේ. ඒ ගීය මෙසේයි:—

මෙහි පෙලෙන් සුරලෝ-පඩෙර කිත් විමන්හි
දකිම්වා අනාගේ-[illegible]රිපිඬු මෙතෝ හිමියා

මේ තව පොත ලිපිකල ඔබ්ල්ලේ රතනජෝති සවාමීන්ගේ කෘතියකැයි හගිමු෴

* මෙය විමසියයුතුයි. † ගෙන්වාගැන්ම.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු